# SIYABAS MALDAMA.

## සිතුයම් සහිත

# සියබස්මල්දම.

---

මාගම්නුවර යටාල මැණික් විහාරාධිපති, තංගල්ලේ ජිනරතන
මහාස්ථවිරයන්වහන්සේ විසින් අභිනව කරණලද

## පදාර්ථ සන්නයෙන්

හා විවරණයෙන්ද යුක්තයි.

---




ධීරම ධම්මානන්ද මහාස්ථවිරයන්වහන්සේ විසින් රචනාකරණලදි.

---

Printed at the Lankaloka Press,
GALLE.
1894.

# සංඥපනය.

සියඹලාමල්දම, සකල කවිජන නිවාසීභූත, ගිරිවාපත්තුවේ කිරමනම්වූ ග්‍රාමයෙහි ජාතව ශාසනයෙහි පැවිදිව මාතර ගඟබඩ පත්තුවේ ගොඩපිටියනම් ග්‍රාමයෙහි මහාවිහාරයෙහි මෙයින් (73) හැත්තෑතුන් වර්ෂයකට පමණ ඉහත කාලයෙහි විසූ "කිරම ධම්මානන්ද" ස්ථවිර ස්වාමීන්වහන්සේ විසින් නානාවිධ මධුර මනෝහර කර්ණරසායන වෘත්තාන්විතව ඡන්දස් ව්‍යාකරණ කාව්‍යාලංකාරාදියෙන් සමලංකෘතව රචනාකරණලද මෙනම් ප්‍රබන්ධය උගත් නූගත් බොහෝදෙනා සමාදරයෙන් භාවිතාකරණ බැවින් මෙය සන්නසහිතව අච්චුගසා ප්‍රසිද්ධකලහොත් ඉමහත් අභිරසයද විදිත්‍යයි කල්පනාකොට මෙයකල ස්ථවිරයන්වහන්සේ විසින්හෝ අන්කෙනෙකුන් විසින්හෝ පෙර මෙයට නාදනලද සන්නයක් ඇද්දැයි හෝපි පරීක්ෂාකොට එබඳුසන්නයක් ඇති ආරංචියක් පමණවත් දැනගන්ට නොලැබුණහෙයින් කීපදෙනෙකුටම සන්නකර දෙන්ටකියාත් එය ඉෂ්ටනුවූ බැවින් කළුතර පූර්ණතලාරාම විහාරාධිපති ගෞරවනීයවූ ගණාචාර්‍ය්‍ය වැලිගම ශ්‍රීසුමංගලාභිධාන මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍යවූ මාගම්නුවර රජමහාවිහාර සංඛ්‍යාත යටාල මැණික් විහාරාධිපති තංගල්ලේ ජිනරතන ස්ථවිර ස්වාමීන් වහන්සේ ගාල්ලේ දන්ගෙදර පුෂ්පාරාම විහාරාධිපති දීපේගොඩ ශීලස්කන්ධාභිධාන නායකස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ ආරාධනාවෙන් එහි වැඩමවා සංඝයා වහන්සේලාට ශාස්ත්‍රාගම උගන්වන කාලයෙහි මේපොත සන්නකර ලැබෙණමෙන් ආරාධනාකලවිට පිළිගෙණ උන්වහන්සේට සිංහල ඉගැන්වීමේ එක්තරා ආචාර්‍ය්‍ය කෙනෙක්වූ මාතර වල්ගම පදිංචිසිට කාලයාක්‍රියාකල එළු පාලි වෛද්‍ය කාව්‍ය ශාස්ත්‍රාදියෙහි දක්ෂ දෙන්තෝනිස් විජේසිංහ ජයවර්ධන මුහන්දිරම් අප්පුහාමිගේ පුත්‍රවූ උගත් දෙන් කරෝලිස් විජේසිංහ ජයවර්ධන අප්පුහාමි සමගද කතාකර මේ කාව්‍ය ප්‍රබන්ධයගැණ දෙදෙනාගේම අදහස සමානකරගෙණ මේ පදවිසන්නය සහ විවරණයද ලියාදෙන්ට යෙදුනා ඇත. මේපොතේ කර්තෘවූ ධම්මානන්ද ස්ථවිර ස්වාමින්වහන්සේ ගැණද මෙය ප්‍රබන්ධකිරීම් පිණිස ආරාධනාකල මුදලිම

ත්‍රීශ්වරයන් ගැණද මෙහි සඳහන්ව තිබෙණවාට වැඩි විස්තරයක් කියන්ට අපි නොදනිමු. මේ ධම්මානන්ද ස්ථවිරයන්වහන්සේ විසින්ම කාව්‍යප්‍රබන්ධ වශයෙන් රචනාකරණලද තවත් කවිපොත් බොහොම තිබෙයි, එනම්, "මහාකණ්හජාතකය," "දෙවධම්ම ජාතකය," "නන්දියවේලඳ කථාව," කඩනදෙවිකථාව" යනාදී පොත්ය, ඒසියල්ලක් මෙසේමමධුර මනොහර කර්ණරසායන වෘත්තාන්තරයන්ගෙන් සමාකීර්ණය. මේ 'සියබස්මල්දමේ' භාවය නම්, ලංකාවෙහි පළමුව විසූ යක්ෂසෙනාව පහකොට මනුෂ්‍යවාසය කළ විජයරජ තුමානන්ගේ පිළිවෙළ කථා ප්‍රවෘත්තිය වෙයි, එය සුවසේ තේරුම් ගැණීමට හැකි පරිද්දෙන් මහාවංශයෙහි ආ පිළිවෙළ ගාථාසහිත භාවසන්නය මුලට 'සියබස්මල්දම් විවරණය' යනනමින් යොදා සතරදස බුදුනැණද යනාදි දසවෙනි කවියෙහි සඳහන්වූ තුදුස් බුද්ධඥනාදී ධර්‍මයන්ගේද මදක් විස්තර 88 වෙනි පිටේපටන් වෙනමයොදා අච්චුගසාද ඇත, දැනට ලංකාවේවැසි සිංහල මනුෂ්‍යයෝ විජයරාජ පරම්පරාවෙන් පැවතඑන්නෝ බැවින් සිංහලමනුෂ්‍යයන් විසින් මෙය භාවිතාකළ යුතුමවේ, තවද ගැටපදසන්න ආදියක්නැති අන් කෙණෙක් විසින් සාදනලද මේබඳු පොත්පත් ආදිය අන් කෙණෙක් විසින් සත්නකරණකල්හි කර්තෘහුගේ සම්පූර්ණ අදහස තේරුම් ගතනොහී සමහරතැන් වරදින්වත් හැකිවෙන බැවින් එබඳුදෝෂ මෙහිද විද්‍යමානවීනම් එය නැවත පරීක්ෂාකොට ශුද්ධකාරණවාමිස එකවරටම ශුද්ධනොකොට හැකිබව පණ්ඩිතලොකයා දන්නවා ඇති, එබැවින් එබඳුයම් ප්‍රමාද භ්‍රමාදියක් මෙහි ඇත්තේනම් එය පණ්ඩිතොත්තමයන් විසින් ශුද්ධකරගණු ලැබේවා

මෙහි න, ණ; ල, ළ; යනාදී අක්ෂරයන්ගේ ආකූලතාවය ඇතත් එය ශුද්ධිපත්‍රයට නොගත්බවද දතයුතුයි.

---

මෙහි අඩංගුකරතිබෙන සිතුයම් ආර්. ඈස්. මර්තොස් උන්නැගේ විසින් කැටයම් කළබව සතුටින් ප්‍රකාශකරමු.

---

# ශුද්ධිපත්‍රය

| පිටේ. | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 8 | * | මෙම අධොලිපියෑ[එම]පිටේ 10පෙළේ දක්‍වයකලාවූ යත්න ලඟට ගළපනු |
| | 14 | දිනකර | දීනරද |
| 2 | 14 | සර්විරාදී | සර්විරාදී |
| | 22 | ශැක්‍ර | ශක්‍ර |
| | 28 | සත්‍වයන්ට | සත්‍වයන් |
| 3 | 15 | සුඛප්‍රතිලාභය | සුඛප්‍රාප්තිය |
| | 16 | ආයුශ්‍රියා | ආයුශ්‍රිය |
| | 21 | පලමුවර | පළමුවරජ |
| | 27 | උජ්ජවලිත | උජ්වලිත |
| | 29 | ප්‍රකාශකරමි | ගෙණ ප්‍රකාශකොට දක්වමි |
| 4 | 16 | නානගුණෙන්මහව්‍යත්, | නානගුණෙන් මහව්‍යත |
| | 18 | කිරුළු | කිරුළු |
| | 23 | මහව්‍යත | මහාව්‍යක්තයන්ද හෙවත් මහත් පණ්ඩිත ජනයන්ද නොහොත් මහත්වූ අවකාශයද යනු අබුයි |
| 4 | 25 | ගම්භිර | ගම්භීර |
| | 28 | නිවරද, නිරවද්‍යකොට; හරණ, පහකොටහරින්නාවූ; | නිවරද,නිරවද්‍යවූ; මිතුරන්, මිත්‍රයන්ද; හරණ, සමාන වූයයිද ඇතම් අ චා ය්‍යී මතයි |
| | 29 | මානික්‍ය | මාණික්‍ය |
| | 30 | සර්ජිත | සජ්ජිත |
| 5 | 3 | අවෙනික | ආවෙනික |
| | 9 | සිව්පිළිසිඹියාවන්ද | සිව්පිළිසිඹියා ප්‍රාප්තිය හෝ මාර්ගයන්ද |
| | 20 | මාරයාසහිතවූ | දෙවියන්සහිතවූ කියාත් කියහැකිවේ |
| | 22 | ලක්‍ෂණශ්‍රීය | ලක්‍ෂණශ්‍රිය |

| පිටේ. | පෙලේ. | අශුඬ. | ශුඬ. |
| --- | --- | --- | --- |
| 6 | 9 | කුසල | කුසල් |
| | 19 | කුසල | කුසල් |
| | 33 | පඩකති | පඩකානී |
| 7 | 22 | බ්‍රාජිත | භ්‍රාජිත |
| | 35 | කුමභිලශන්ද | කුමභිලයන්ද |
| 8 | 9 | බිකතිනා | භිකතිනා |
| 9 | 4 | මෙත් | මෙත් |
| | 10 | සනාමහාද | සනාමහද |
| | 18 | විශුශුය | විසුසුය |
| | 23 | (යුගමයක්) | (යුගම) |
| 10 | 30 | උලැගි | උලැඟි |
| 11 | 3 | නෙදෙසෙහි, අනෙක දිශාවෙහි හෙවත් නොයෙක්දික්හි යන් න වෙනුවට, | නෙවණ, නොයෙක් වර්ණයෙන්; වරුණ දෙසෙහි, වාරුණ්‍යදිශාවෙහි යයි කියාදක්යහැකිවේ |
| | 19 | සවණ්ධවජ | සවණ්ධවජ |
| 14 | 9 | සත්‍යවචනයට | සත්‍යවචනයෙන් |
| 15 | 19 | ඔවුන්සමග | ඔවුන්ගේ සඝාය නැමැති |
| 17 | 12 | පත්කුම් | පිත්කම් |
| 19 | 4 | කරසගල | කරසහලා |
| 20 | 7 | බැබැලී | බැබලී |
| 21 | 23 | ලාවනය | ලාඤ්ඡණය |
| 22 | 25 | ෂළුටික | ෂළුපික |

73 ඉ ඳු ව ර. ඉඳු නිල්මිණිසරි එකුමරි දිගු නුව නා
සි ර ස ර දෙඅදර දලදිව් කෙම්මුවසර රඳ නා
සු දු ත ර දත් මුවරදපෙළ සමවය නිතිදිලෙ නා
ජ ය ස ර තුන් හිරිරුදිගෙළ සකජයගෙණසොබ නා

73 එකුමරි, ඒ කුමාරිකාවගේ; දිගුනුවනා, දික්වූ නෙත්‍රයෝ; ඉදුවර ඉදුනිල් මිණිසරි, නිල් මහනිල්හා ඉන්ද්‍රනීල මාණික්‍යයන් හාද සමානවූවාහුය; සිරසර, ශ්‍රියාවෙන් සාරවූ; දෙඅදර, අධර යුග්ම නැමැති; දල, පත්‍රයෙන්ද; දිව්, ජිහවා නැමැත්; කෙමි කර්ණිකාවෙන්ද යුක්තවූ; මුවසර; මුඛනැමැති පද්මයෙහි; රඳනා, රංජිතවූ; සුදුතර, අතිශයින් ශුභ්‍රවර්ණවූ; දත්, දන්තයෝ; නිති, නිරන්තරයෙන්; දිලෙනා, දිලියෙන්නාවූ; මුවරදපෙල සම

මච්ඡා, මකරන්ද පඩකන්‍යක්හා සමාන වූවාහූය; පියකර, ප්‍රියක රුවූ; තුන්හිරිරැඳි, රෙඛාත්‍රයෙන් රංජිතවූ; ගෙල, ග්‍රීවයතෙම; සකජයගෙණ, සංඛය පරාජය කොට; සොබණා, ශොභමානවූ යේය. මේකවිය මෙසේද අර්ථ කියහැකි වෙයි.

| පිටේ | පෙළේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 39 | 16 | (ලඟානොවම) | ලගනානොවීම |
| | 18 | බල | බලා |
| 41 | 17 | දූරුගැබෙක් | දරුගැබෙක් |
| 42 | 27 | ක්ෂිරාණීවය | කෂීරාණීවය |
| 47 | 25 | ලදපස්මල් | ලදැපස්මල් |
| | 31 | ලදපස්මල් | ලදැපස්මල්, ලාජාදි පච පුෂ්පගේද සමහරුකියති |
| 51 | 14 | තර | තිර |
| 52 | 28 | නිෂ්ඨාවක් | නිෂ්ඨාවක් |
| 56 | 15 | මදකුත් | පිකකුත් |
| 57 | 3 | වත | වනි |
| 58 | 25 | පෑපිවිස්වරතෙමේ | පෑපිවිස්වරොත්තමතෙමේ |
| 60 | 1 | විධවංශනය | විධවංශනය |
| 61 | 12 | ඒහිතිෙයන් | ඒහිතිෙයන් |
| 70 | 23 | මෙමදුඛය | මෙමදුඃඛය |
| 76 | 8 | ලද්දීයයි | ලද්දහුයයි |
| 79 | 28 | ඵලපත්‍රාදිය | මුහුකල ඵලාඵල |
| 80 | 17 | නොවරදවා | නොනවත්වා |
| 81 | 5 | ජවලිතව | ජ්වලිතව |
| | 6 | හැඬුවෝය | හැඬුවාය |
| 85 | 35 | වලස්මුලු තානායමේ | කිරම්තානායමේ |
| 87 | 22 | සැම | සැව |
| | 29 | මමද උතුන් | මමද එමෙන් |
| | 30 | බලන | සොබන |
| | 32 | දලදීනු | දලනිදු |

විවරණය 1 පිටේ සහ සියදූතන්හිම සියබස්මල්දම් විවරණය කියාද, 1පිටේ 6පෙළේ මල්ලවයනු මල්ල කියාද සලකනු.

# සියබස් මල්දම විවරණය.

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

"සියබස් මල්දම විවරණය" යනු කවරෙක්දයත්?

ශ්‍රීලංකාද්වීපවාසී මේ සිංහල මනුෂ්‍යයෝ වනාහි, අප සම්‍යක්සම්බුද්ධ රජානන් වහන්සේ නිරුපධිශේෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන් පානාපිණිස කුසිනාරා නුවර මල්ලව රජදරුවන්ගේ උපවර්තන නම් සල්උයනෙහි සාලවෘක්ෂයන් දෙදෙනාගේ අතරෙහි පණවනලද පරිනිර්වාණ මඤ්චකයෙහි නොනැඟිටිනා ශෙය්‍යාවෙන් වැඩහුන්දවස්හි, සත්සියයක් අමාත්‍යයන්හා නැව්නැගී අවුත්, පළමුවෙන් මේ ලංකාවෙහි වාසයකළ යක්ෂසේනාව පහකොට මනුෂ්‍යවාසය කෙරෙව් විජයරජ ප්‍රධානකොටඇති සෙස්සන්ගේද පරම්පරාවෙන් පැවතඑන්නෝ නමුත් ඔහු තමන්ගේ පරම්පරාවහා සිංහල යන නාමයද තමන්ට කෙසේව්‍යවහාර වූයේද යනු නොදනිති, එහෙයින් ඒ දැනගැනීම පිණිස එය මෙහි විස්තර කරණුලැබේ, ශේකෙසේදයත්? "සීහසලාතත්තාසීහලො"සිද,

"සීහබාහු නරින්දොසො සීහමාදින්නවාඉති,
සීහලොතෙන සම්බන්ධා ආහුසබ්බෙපිසීහලා."

යනුවෙන් ඒ සිංහබාහු රජතෙම සිංහයා ගත්තේනුයි, සිංහලනම් වේයි; ඔහුහා සම්බන්ධවූ සියල්ලෝද සිංහලයෝනමැයි කියනිසි කීහෙයින්, කාලිංගචක්‍රවර්ති රජහුගේ වංශයෙහි උපන් රාජකන්‍යාවගේ කුසයෙහොත් සිංහයාට ජාතවූ සිංහබාහු කුමාරතෙම තම්බාගේ පියවූ සිංහරාජයා විදැමරා හිසකපාගත්තේනුයි, සිංහලනම්වූයේය. භගීරථ ශබ්දයෙන් භගීරථයාගේ වංශයෙහිවූ කපිලවස්තු පුරවාසී රජදරුවෝ කියනුලැබෙද්ද, එසේම සිංහයා ගත්තාවූ සිංහබාහු කුමාරයාගේ පුත්‍රවූ යක්ෂමර්දනයකොට ලංකාද්වීපයගත් විජයරජතුමානෝද ඔහුමල් සිංහපුරයෙහි රජකළ සුමිත්‍රද්‍ද ඔහුපුත් සිංහපුරයෙන් අවුත් ලක්දිව රජවූ පඬුවස්දෙව්රජද ඔහුම දරුමුනුබුරුහුද සිංහලනම්වෙති, යම්සේ ශක්‍යයාහට නිවාසභූමිපුරය ශක්‍යපුර නම්විද, එසේම සිංහලයන්ට නිවාසභූමිවූ දීපයද සිංහලද්වීප නම්වූයේය. යම්සේ මගධෝවූ ජනයෝ මගධශබ්දයෙන් කියනුලැබෙද්ද, එසේම සිංහලදෙශෝවූ ජනයෝද සිංහල ශබ්දයෙන් කියනුලැබෙත්, ඔවුන්ගේ කථාවද සිංහලභාෂා නම්වෙයි, එහෙයින් එය ප්‍රකාශ කිරීම පිණිස විජයරජහුගේ කථාප්‍රවෘත්තිය මහාවංශයෙහි දක්වනලද පරිච්ඡෙදත් හා එසහිත භාවාර්ථයහා "සියබස්මල්දම්" නම්වූ කාව්‍යයෙහි පෙරෙණ එම අදහස සුවසේ තේරුම්ගතහැකි භාවාර්ථයද "සියබස්මල්දම විවරණය" නම් වන්නේවෙයි.

ඒ මෙසේ දක්වනලදී මහාවංශයෙහි.

1 වංගෙසුවංග නගරෙ වංගරාජා අහුපුරෙ
කාලිඞ්ගරඤ්ඤොධීතාසි මහෙසීතස්ස රාජිනො.

2 " සොරාජා දෙවියා තස්සා එකංඅලභි ධීතරං,"
" නෙමිත්තාව්‍යාකරුංතස්සා සංවාසං මිගරාජිනා."

3 " අතිවරූපිනීආසි අතිවකාමගිද්ධිනී,"
" දෙවෙහදෙවියාචාපි ලජ්ජායාසිජිගුච්ඡිතා."

4 " ඒකාකිනීසා නික්ඛම්ම සෙරිචාරිසුඛත්ථිනී,"
" සත්ථෙනසහඅඤ්ඤාතා අගාමගධගාමිනා."

5 " ලාළරට්ඨෙ අටවියා සීහොසත්ථ මභිධාවි,"
" අඤ්ඤත්ථසෙසා ධාවිංසු සීහාගතදිසන්තුසා."

6 " ගණ්හිත්වා ගොචරංසීහො ගච්ඡංදිස්වාතමාරකා,"
" රත්තොඋපගලාලෙන්තො ලංගුලංපණ්ණකණ්ණකො."

7 " සාතංදිස්වාසරිත්වාන නෙමිත්තවචනංසුතං,"
" අභීතාතස්සඅංගානි රඤ්ජයන්තිපරාමසි."

8 " තස්සාඵස්සෙනඅතිරත්තො පිට්ඨිංආරොපියාසුතං."
" සීහොසකංගුහංනෙත්වා තායසංවාසමාචරි."

9 " තෙනසංවාසමන්වාය කාලෙනයමකෙදුවෙ,"
" පුත්තඤ්චධීතරඤ්චාති රාජධීතාජනෙසිසා."

10 " පුත්තස්සහත්ථපාදෙසු සීහාකාරාතතොඅකා,"
" නාමෙන සීහබාහුන්තං ධීතරංසීහ සීවලිං."

11 " පුත්තොසොළසවස්සොසො මාතරංපුච්ඡිසංසයං,"
" තුවංපිතාචනොඅම්ම කස්මාඅසදිසාඉති."

12 " සාසබ්බමබ්‍රවීතස්ස කින්නුයාමාතිසොබ්‍රවි,"
" ගුහංථකෙතිතාතාතෙ පාසාණෙනාතිසාබ්‍රවී."

13 " මහාගුහායථකනකං ඛන්ධෙනාදායසොඅගා,"
" ඒකාහෙනෙවපඤ්ඤාස යොජනානිගතාගතං."

14 " ගොචරායගතෙසීහෙ දක්ඛිණස්මිංහිමාතරං,"
" වාමෙකණිට්ඨිංකත්වාන තතොසීඝංඅපක්කමි,"

15 " නිවාසෙත්වාතසාඛායො පච්චන්තගාමමාගමුං,"
" තත්ථාසිරාජධීතාය මාතුලස්සසුතොතදා.

16 " සෙනාපතිවංගරඤ්ඤො ඨිතොපච්චන්තසාධනෙ,
" නිසින්නොවටමූලෙසො කම්මන්තංසංවිධාපයං."

17 " දිස්වාතෙපුච්ඡිතාවොචුං අටවිවාසිනොමයං,"
" ඉතිසොදාපයීතෙසං වත්ථානිධජිනීපති."

18 " තානාහෙසුංඋලාරානි භත්තංපණ්ණෙසුදාපයි,"
" සොවණ්ණභාජනානාසුං තෙසංපුඤ්ඤෙනතානිච."

19 " තෙනසොවිම්හිතොපුච්ඡි කොනුතුම්හෙචමූපති,"
" තස්සසාජාතිගොත්තානි රාජධීතානිවෙදයි."

20 " පිතුවිජාටිනරංතංසො ආදායඩජ්ජිපනි,"
" ගන්ත්වානවඞ්ගනගරං සංවාසංතායකප්පයි."

21 " සිංහාසීසංගුහංගන්ත්වා තෙඅදිස්වාතයොජනෙ,
" අට්ඨිතොපුත්තසොකෙන නචඛාදිනචාපිවි;"

22 " දුරකෙතෙගවෙසන්තා අගාපච්චන්තගාමකං,"
" උබ්බාපියනිසොසොව යංයංගාමමුපෙතිසො."

23 " පච්චන්තවාසිනොගන්ත්වා රඤ්ඤොතංපටිවෙදයුං,"
" සීහොපීළෙතිතංරට්ඨං තංදෙවපටිසෙධය,"

24 " අලභංනිසෙධකංතස්ස හත්ථික්ඛන්ධගතංපුරෙ,"
" අදෙතුංසීහදායිකාති සහස්සංසොපවාරයි."

25 " තථෙවවෙසහස්සානි තීණිවාපිනරිස්සරො,"
" වීසුවාරෙසුවාරෙසි මාතාසීහබාහුංහිතං."

26 " අග්ගහීතහියෙවාරෙ සීහබාහුංඅපුච්ඡිය,"
" මාතරංහිසහස්සංතං ඝාතෙතුංපිතරංසකං."

27 " රඤ්ඤොකුමාරංදස්සුං තංරාජාඉදමබ්‍රවී,"
" ගහිතොයදිසීහොතෙ දම්මිරට්ඨංතදෙවතෙ."

28 " සොතංගන්ත්වාගුහාවාරං සීහංදිස්වාවආරකා,"
" එන්තංපුත්තසිනෙහෙන විජ්ඣිතුංතංසරංඛිපි."

29 " සරොනලාටමාහච්ච මෙත්තචිත්තෙනතස්සතු,"
" කුමාරපාදමූලෙව නිවත්තොපතිභූමියං."

30 " තථාසියාවතතියං තතොකුජ්ඣිමිගාධිපො,"
" තතොඛිත්තොසරොතස්ස කායංනිබ්භිජ්ජනික්ඛමි."

31 " සකෙසරංසීහසීසං ආදායසපුරංඅගා,"
" මතස්සවඞ්ගරාජස්ස සත්තාහානිතදාඅහු."

32 " රඤ්ඤොඅපුත්තකත්තාව පතීතාවස්සකම්මුනා,"
" සුත්වාචරඤ්ඤොනත්තුත්තං සඤ්ජානිත්වාචමාතරං."

33 " අමච්චාසන්නිපතිතා අඛිලාඑකමානසා,"
" සීහබාහුකුමාරස්ස රාජාහොහීතිඅබ්‍රවුං."

34 " සොරජ්ජංසම්පටිච්ඡිත්වා දත්වාමාතුපතිස්සතං,"
" සීහසීවලිමාදාය ජාතභූමිංගතොසයං."

35 " නගරංතත්ථමාපෙසි අහුසීහපුරන්තිතං,"
" අරඤ්ඤෙයොජනසතෙ ගාමෙචාපිනිවෙසයි."

36 " ලාළරට්ඨෙපුරෙතස්මිං සීහබාහුනරාධිපො,"
රජ්ජංකාරෙසිකත්වාන මහෙසිංසීහසීවලිං.

37 " මහෙසීසොළසක්ඛත්තුං යමකෙචදුවෙදුවෙ,"
" පුත්තෙජනයිකාලෙන විජයොනාමජෙට්ඨකො."

38 " සුමිත්තො නාමදුතියො සබ්බද්වත්තිංසපුත්තකා,"
" කාලෙනවිජයංරාජා උපරජ්ජාභිසෙචයි "

39 " විජයොවිසමාචාරො ආසිතංපරිසාපිච,"
" සාහසානිඅනෙකානි දුස්සහානිකරිංසුතෙ."

40 " කුද්ධොමහාජනොරඤ්ඤො තමත්ථංපටිවෙදයි,"
" රාජාතෙසඤ්ඤාපෙත්වාන පුත්තංඔවදිසාධුකං."

41 " සබ්බංතථෙවදුතියං අහොසිතතියංපන,"
,, කුද්ධොමහාජනොආහ පුත්තංඝාතෙහිතෙඉති.

42 " රාජාථවිජයංතඤ්ච පරිවාරඤ්චතස්සතං,'
" සත්තසතානිපුරිසෙ කාරෙත්වාඅඩ්ඪමුණ්ඩකෙ."

43 " නාවායපක්ඛිපාපෙත්වා විස්සජ්ජාපෙසිසාගරෙ,"
" තථාතෙසඤ්චභරියායො තථෙවචකුමාරකෙ."

44 " විසුංවිසුංතෙවිස්සට්ඨා පුරිසිත්ථිකුමාරකා,"
" විසුංවිසුංදීපකස්මිං ඔක්කමිංසුවසිංසුච."

45 " නග්ගදීපොතිඤායිත්ථ කුමාරොක්කන්තදීපකො,"
" භරියොක්කන්තදීපොතු මහිළදීපකොඉති."

46 " සුප්පාරකෙපට්ටනම්හි විජයොපනඔතරි,"
" පරිසාසාහසෙනෙත්ථ භීතොනාවංපුනාරුහි."

47 " ලඞ්කායං විජයසනාමකො කුමාරො,
ඔතිණ්ණොථිරමති තම්බපණ්ණිදීපෙ;
සාලානං යමකගුණාන මන්තරස්මිං,
නිබ්බාතුංසයිතදිනෙ තථාගතස්සාති."

---

## මෙහි සංක්‍ෂෙප අභිප්‍රායනම්.

---

1 අතීතකාලයෙහි වඞ්ගරට වඞ්ගනුවර වඞ්ගරජකෙනෙක්වූයේය, ඒ වඞ්ගරජ්ජුරුවන්ට කාලිඞ්ගරජහුගේ දියණියක්තොමෝ අග්‍රමෙහෙසිකාවූවාය.

2 ඒ වඞ්ගරජතෙමේ ඒ දෙවියගෙන් එක් දියණියක් ලැබූයේය, නිමිත්තපාඨක බ්‍රාහ්මණයෝ ඒ රාජකුමාරිකාවගේ උපන් නක්ෂත්‍ර මුහූර්තාදිය බලා ඒකුමාරිකාව සිංහරාජයකුහා සංවාසය කරණබව කීවාහුය.

3 ඒ කුමාරිකාතොමෝ ඉතාම යහපත් විශිෂ්ටවූ රූඇතිවූවා, අතිශයින්ම පචකාමයෙහි ගිජුවූවා, ඔතොමෝ රජ්ජුරුවන්හා රාජදෙවිය යන දෙදෙනා විසින් ලජ්ජාවෙන් පිළිකුල්කරණ ලද්දීය.

4 ඔතොමෝ තමාගේ කැමැත්තෙන් වසන සුලුවූවා, සැපකැමතිවූවා, හුද

නලාව අප්‍රසිඩ වෙශයෙන් පිටත්ව මගධරටබලා යන වෙළඳ සමූහයක්හා සමග ගියාය.

5 ලාටරට අරණ්‍යයෙහිදී සිංහරාජයෙක්තෙම ඒ වෙළඳ සමූහයාගේ සමී පයට දිවගෙණ ආයේය, (ඒ වෙළෙන්දෙ හිස්ලූලූඅත දිවත්නාහු) සෙස්සෝ අනික්අතකට දිවූහ, ඒ රාජකුමාරිකාතොමෝ සිංහරාජයාආදිසාවට දිව්වාය.

6 සිංහරාජතෙමේ ගොදුරු ගෙණ (පෙරලා) යන තැනැත්තේ දුරදීම ඒ රාජකුමාරිකාව දැක සිතින්ආලය ඇතිවූයේ කන්සෙලාගෙණ නගුටසලම් න් සමීපව ආයේය.

7 ඒ රාජකුමාරිකාතොමෝ ඒ සිංහරාජයා දැක අසනලද නිමිත්තපාඨක බ්‍රාහ්මණයන්ගේ වචනය සිහිකොට බියනූවූවා, අභාවඩවම්න් ඒ සිංහරාජයා ගේ ශරීරාවයවයන් පරාමර්ශනය කළාය ගෙවත් අතගෑවාය.

8 සිංහරාජතෙමේ ඒ කුමාරිකාවගේ ස්පර්ශයෙන් ඉතා ඇලුණේ,"(තමාගේ) පිට සිදුවාගෙණ වහා තමාවසන සවකීය ගල්ගුහාවට ගෙණගොස් ඒ කුමා රිකාවහා සමග සංවාසය කෙළේය.

9 ඒ රාජකන්‍යාතොමෝ ඒ සිංහරාජයාහා සමග සංවාසයට පැමිණ ඒ සංවාසය කරණකොටගෙණ සුදුසුකාලයෙහි පුතෙක දුවකැයියි නිඹුල්දරු දෙදෙනෙක් වැදුවාය.

10 ප්‍රතුවූ කුමාරයාගේ හස්තපාදයෝ සිංහයාගේ ආකාරවූවාහුය, එහෙයින් ඒ කුමාරයාහට "සිංහබාහු" කුමාරයායයි නම්කලාය, දියනියන්ට 'සිංහසිවලී' යයි (යන) නාමය කලාය,*

11 සොළොස් අවුරුදුවයස් පිරුණාවූ ඒ පුත්‍රවූ කුමාරතෙමේ මෑනියෙනි නුඹහා අපගේ පියාතෝත් කවරකාරණයක් හෙතුකොටඒකාකාර සමානවූවෝ දැයි (කියා) සිත්හිඋපන් සැකය (තමාගේ) මෑනියන් අතින් විචාළේය.

12 ඒ මෑනිතොමෝ ඒ කුමාරයාහට සියලු ප්‍රවෘත්තිය කීවාය, ඒ කුමාරතෙමේ කුමක්හෙයින් මිනිසුන්වසන ප්‍රදේශයට නොයමෝදැයි කියේය, ඒ රාජකුමාරිකාතොමෝ තාගේපියවූ සිංහරාජතෙමේ ගලෙකින් ගුහාව වසන්නේය, එහෙයින් යියනොහැක්කෙම්යි කීවාය.

13 ඒ කුමාරතෙමේ මහ ගල්ගුහාදොර වසනගල කරට නගාගෙණ එක්ද වසින්ම පණස් යොත්නක් යාම්ඊම් කෙළේය.

14 සිංහයා ගොදුරුපිණිස ගියකල්හි දකුණුකරෙහි මෑනියන්ද, වම්කරෙහි නැගණියන්ද තබාගෙණ වහා ගල්ගුහාවෙන් පලාගියේය.

15 ඔහු කොලඅතු හැඳගණ (එක්තරා) ප්‍රත්‍යන්තගමකට ආවාහුය, එකල ඒ ප්‍රත්‍යන්ත ගමෙහි රාජධීතෘවගේ මයිල්රජහුගේ පුත්‍රවූ වගුරජහුගේ සෙනාප තිතෙමේ සිටියේවිය.

---

* මේගැණ "සියබස්මල්දමකාව්‍ය"යෙහි 103වෙනි කවියෙහි, "කුමරුටසිහබා නම්නා, නං; කුමරිට සිහවල්ලිය යන නම්නා," යන්නෙන්, කුමාරයාට සිංහබා හුනාමයගා ඔහු නැගණිවූ කුමාරිකාවට සිංහවල්ලියයි ව්‍යවහාර කළබව පෙණෙයි. මෙයි ගාථාවෙහිද, "නාමෙන සීහබාහුසාතං, ඨිතරංසීහසිවලිං." යනු පෙණෙයි.

16 ඒ සෙනෙවි තෙමේ කණීයාන සංඛ්‍යාත කෙරෙමින් නුගරුකක් මුල හුන්නේය.

17 ඔවුන්දැක තෙපිකවුරුදැයි විචාළේය, ඔව්හු "අපි වෙනෙහි වසන්න මෝයයි" කීවාහුය, ඒ සෙනානායකතෙමේ ඔවුන්ට වස්ත්‍ර දෙවූයේය.

18 ඒ වස්ත්‍රයෝ මහත් අගයඇතිවූවාහුය, පත්‍රයන්හි බත් දෙවූයේය, ඔවුන්ගේ පුණ්‍යානුභාවයෙන් ඒපත්‍රයෝ රත්රන්භාජනයෝ වූවාහුය.

19 ඒකාරණයෙන් විස්මපත්වූ ඒ සෙනාපතිතෙමේ, "තෙපි කවුරුදැයි'? නැවත විචාළේය. ඒ රාජධීතෘතොමෝ තමාගේ ජාතිගොත්‍රයන් ඒ සෙනෙවි රජහට දැන්වූවාය.

20 ඒ සෙනෙවිරජතෙමේ (තමා) ඇවෑස්ස නෑපදනියන්ගේ දියනිවූ ඒ කුමාරිකාව ගෙණ වගුනුවරට ගොස් ඇයහාසමග වාසයකෙළේය.

21 සිංහරාජතෙමේ වනා ගල්ගුහාවට ගොස්, (භාර්‍යාවූ රාජධීතෘවනා කුමාරයාය කුමාරිකාවය යන) ඒ තුන්දෙනා නොදැක පුත්‍රශොකයෙන් පෙළෙන ලදුව (ආහාර) නොකෑයේය, (පැන්) නොබීයේය.

22 ඒ දරුවන් සොයමින් ප්‍රත්‍යන්ත ගම්වලටගියේය, ඒ සිංහරාජතෙමේ යම්යම් ගමකට වදනේද ඒඒගම සිස්වෙයි.

23 පසල්දනව් වැසි ජනයෝගොස් රජ්ජුරුවන්ට, "දෙවයන්වහන්ස, සිංහරාජයෙක්තෙම නුඹවහන්සේගේ රට පෙළන්නේය, ඔහු වැළැක්කුවමැනවයි,' එපවත් රජහට දැන්වූවාහුය.

24 ඒතෙමේ සිංහයා නසන්නෙකු නොලබමින් දනසින්බැඳි පියල්ලක් ඇත් කඳනබා "සිංහයා දෙනනෑනැත්තෙක් ගණීවයි" කියා නුවර බෙරහැසිරවූයේය.

25 නරෙශ්වරතෙමේ දෙදහසෙක තුන්දහසෙකැයි එසේම බෙරපියවී කර වූයේය, මවුතොමෝ දෙවාරයෙක ඒ සිංහබාහු කුමාරයා වැළකුවාය

26 තුන්වෙනි වාරයෙහි ඒ සිංහබාහු කුමාරතෙමේ මෑනියන් නොවිචාරාම තමාගේ පියවූ සිංහරාජයා මරන්ට ඒ (රන්) තුන්දහස ගත්තේය,

27 රජහට සිංහබාහු කුමාරයා දැක්වූවාහුය, රජතෙමේ ඔහුටඉදින් "තාවිසින් සිංහරාජතෙමේ ගන්නාලැබේනම් එමරට තටදෙමැයි" මෙසේකීයේය.

28 ඒ කුමාරතෙමේ ඒ ගල්ලෙණදොරට ගොස් පුත්‍රප්‍රේමයෙන් එන්නාවූ ඒ සිංහයා දුරදීදැක විදිනට හියක් යවිය.

29 හීයතෙමේ නලලවැද් ඔහුගේ මෛත්‍රීචිත්තයෙන් පෙරලා ආපසුඅවුත් කුමාරයාගේ පාදමූලයෙහි බිමවැටුනේය.

30 තුන්යලක්දක්වා එසේමවිය, පසුව, සිංහරාජතෙම කිපියේය, ඉක්බිත් තෙන් යවනලද හීයතෙම ඒ සිංහරාජයාගේ ශරීරයවිනිවිද නික්මුනේය.

31 ඒකුමාරතෙමේ කෙශරසහිත සිංහයාගේ හිසගෙණ නුවරට ගියේය, එකල්හි වගුරජ කාලක්‍රියාකළාවූ සත්දවසක්වූයේය.

32 රජ තමා අපුත්‍රකබැවින්හා මේ කුමාරයාගේ සිංහයාමැරීම් සංඛ්‍යාත කර්මයෙන් ප්‍රසිඩවූ බැවිනුත් (වගු) රජ්ජුරුවන්ගේ මුනුබුරුබව අසාද මාතෘවූ කුමාරිකාව හැඳිනද.

33 සියලු අමාත්‍යයෝ රැස්ව එක්සිත්ව සිංහබාහු කුමාරයාහට "රජවවයි" කීවාහුය.

34 ඒ කුමාරතෙමේ රාජ්‍යය පිළිගෙණ මෑනියන්ගේ වල්ලභයාහට ඒ රාජ්‍යය පාවාදී "සිංහසීවලී" කුමාරිකාව ගෙණ තෙමේ ජාතභූමියට හෙවත් උපන්නා වූභූමියට ගියේ.

35 ඒ ජාතභූමියෙහි නුවරක් ඉදිකෙළේය හෙවත් සෑදූයේය, ඒ සිංහපුරය නම්වූයේය, සියක්යොදුන් වනෙහි ගම්ද පිහිටවූයේය.

36 ලාටරට ඒනුවර සිංහබාහු රජතෙමේ සිංහසීවලී කුමාරිකාව අග්‍රමෙහෙසි කාකොට රාජ්‍යය කෙළේය.

37 ඒ සිංහසීවලීනම්වූ අග්‍රමෙහෙසිකාතොමෝ සොළොස්වාරයෙක පුත්‍රයන් දෙදෙනෙක් දෙදෙනෙක් බැගින් පුදුසුකාලයෙහි වැදූවාය, (ඔවුන් අතුරෙන්) ප්‍රධාන පුත්‍රතෙම "විජය"කුමාර නම්වූයේය.

38 දෙවෙනි පුත්‍රතෙම "සුමිත්ත" නම්වූයේය, සියල්ලෝ දෙතිස් පුත්‍රකෙණෙක්වූහ, (පිය) රජතෙමේ විජයරාජ කුමාරයා පුදුසුකාලයෙහි උපරාජ්‍යයෙහි හෙවත් යුවරජ තනතුරෙහි අභිෂෙක කෙළේය.

39 (ඒ) "විජය" නම් උපරජතෙම විසමවූ ආචාරඇතිවිය, ඔහුගේ පිරිස්හුද එසේමවූ පැවතුම් ඇතිවූවාහුය, ඔහු ඉවසිය නොහෙන්නාවූ නොයෙක් බලාත්කාරකම් කළාහුය.

40 (ඒනිසා) කිපුනාවූ මහජනතෙමේ රජහට එපවත් දැන්වූයේය, රජතෙමේ ඔවුන්කාටපුතු හඟවා පුත්‍රයාට යහපත්කොට අවවාද කෙළේය.

41 දෙවෙනිවාරයෙහිද සියල්ල එසේමවූයේය, තුන්වන වාරයෙහි වනාහි කිපුනාවූ මහජනතෙමේ "ඔබවහන්සේගේ පුත්‍රයා මැරුව මැනවැයි." රජහට කීයේය.

42 ඉක්බිති රජතෙම ඒ විජයකුමාරයාද, ඔහුගේ ඒ පිරිසද (යන) සත්සියයක් මනුෂ්‍යයන් අඩක් (ඉස්) මුඩුකරවා නැවක දම්මවා සමුද්‍රයෙහි යවූයේය.

43 එසේම අඹියන් අඹියන් ඉසමුඩුකරවා ඔවුන්ගේ භාර්‍යාවන්ද, එසේමඔවුන්ගේ කුමාරයන්ද (මුහුදෙහි යවූයේය?)

44 වෙනවෙනම දමනලද්දාවූ ඒ පුරුෂ ස්ත්‍රී කුමාරයෝ වෙනවෙනම දිවයින්හි බැස්සාහුය, (එසේම) වාසයද කළෝය.

45 කුමාරවරුන් ගොඩබැස්සාවූ දිවයින "නග්නදිවයින" යයි ප්‍රසිඩවූයේය, භාර්‍යාවන් ගොඩබැස්ස දිවයින "මහිළාදිපය"යි ප්‍රසිඩවිය.

46 විජයකුමාරතෙමේ "සුප්පාරක" නම් පටුනට ගොඩබැස්සේය, මෙහිපිරිසගේ බලාත්කාර ක්‍රියායෙන් භයවූයේ, නැවතත් නවනැංගේය.

47 ශාලවෘක්ෂයන් දෙදෙනා නැමැති ගුහාවන්ගේ අතුරෙහි (අප භාග්‍යවත්) තථාගතයන් වහන්සේගේ නිරුපධිශෙෂ නිර්‍වාණ ධාතුවෙන් පිරිනිවන් පෑමපිණිස පණවනලද පිරිනිවන් මචකයෙහිසැතපුනු දවස්හි සපිරවූහූඞිඇති ඒ විජය කුමාරතෙමේ ලංකාවීපයෙහිහෝ තාම්‍රපර්‍ණීවීපයෙහි බටුයේය.

මෙතෙකින් "මහාවංශයෙහි" දක්වනලද කථාව මෙසේදක්වා, ඉක්බිති සියබස්මල්දමේ කාව්‍යයෙන් දන්වනලද අදහසද ඉතා සංක්ෂෙපයෙන් දක්වනුලැබේ; සේකෙසේදයත්.

# සියබස්මල්දම විවරණය.

පූර්ව කාලයෙහි ජම්බුද්වීප තලයෙහි වඞ්ගනම් පුරප්‍රවරයෙහි රාජ්‍යයකළ වඞ්ගනම් රජහුගේ අග්‍ර මහෙසිකාවන්ට දරුගැබක් හටගත්තේය, රජබිසව්තොමෝ රජහට එපවත් දැන්වූකල්හි, රජතෙමේ ඒකාලයෙහි රජවරුන්ගේ සිරිත්ප්‍රකාර ගැබපෙළහර ආදිය කරවා දසළුකඩ මසක් පසුවූකල්හි එමරාජමහෙසිකාව විසින් කුමාරිකාවක්තොම ප්‍රසූත කරණලද්දීය, එකල්හී රජතෙමේ වෙදශාස්ත්‍රයෙහි දක්‍ෂවූ බ්‍රාහමණයන් තමන්වෙත කැඳවා ඒ උපන්නාවූ කුමාරිකාවගේ දෙහ ලක්‍ෂණාදිය බලා "මතුවන්නාවූ ඉෂ්ටානිෂ්ට විපාක තෝරා කියවයි" රජහුවිසින් කියනලද බස්ඇසූ බ්‍රාහමණයෝද ඒ කුමාරිකාවගේ දෙහලක්‍ෂණ බලාදැන, නැවත ප්‍රශූතවූ නක්‍ෂත්‍රහෝරා රාශිහඳබලා මෙසේ කීවෝය. ඒ කෙසේදයත්. "පින්වත් මහරජපුරුෂන්වහන්ස, මේ කුමාරිකාතොමෝ පූර්ණචන්ද්‍රයාමෙන් යෞවනයෙන් අග්‍රභාවයට පැමිණිකල්හි, මේනුවරින් සැහවීගොස් රෞද්‍රවූ සිංහරාජයෙකුහට අයුවී එම සිංහරාජයාහට භාර්‍ය්‍යාව මහවනාන්තරය මැද දුක්විඳින්නීය;" මේකථාව ඇසූ රජ්ජුරුවන්ගේ සිතට මහත් දුක්වැදී එකස්තම්භ මාලිගාවක් කරවා ඒ හාත්පසින් රැකවල්ලා කිරිමවුන්හා කුමාරිකාවද එහිතුළ බහාලූව කිසිපුරුෂයෙකු ඇසින්නොදැක වැඩෙන්නාවූ රාජ කුමාරිකාතොමෝ යෞවනවයසින් සම්පූර්ණව (රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශයයි කියනලද) පඤ්චකාම සම්පත්තියෙහි විශෙෂවිභාග යහලු ස්ත්‍රීන්ගෙන් ඇසූකල්හි සර්වාංගයෙහි රාගගින්න ඇවිලීගොස් එම රැකවලුන්හා කිරිමවුආදි සියල්ලටම සොරාගොස් වනාන්තරයටවැද යනකල්හි වෙළඳ සමූහයක් සම්මුඛව ඔවුන්ගේ ප්‍රධාන වෙළඳහා සමග පඤ්චකාමසම්පත් අනුභවකිරීමෙහි යෙදීයනකල්හි, ඒ කුමාරිකාවගේ රූපශොභාව දුටු සිංහරාජයෙක් ඒ වෙළඳ ජනයන්ගේ මධ්‍යයට පැන සිංහනාදකළකල්හි වෙළඳජනයෝද මහත් භයටපැමිණ ඒ රාජකුමාරිකාව අත්හැර ගියෝය. ඒ සිංහරාජතෙම කුමාරිකාව තමන්පිට හිඳුවාගෙණ ගොස් ගල්ලෙණෙක්හි ලාගෙණ ඈහාසමග පඤ්චකාම සම්පත් අනුභවකොට කල්යවන අතර, සිංහරාජයාහට ජාතකව ඈගේ

කුසෙහි කුමාර කුමාරිකාවයයියන දරු දෙදෙනෙක් උපන්නා
හුය. පළමුව උපන් කුමාරයාහට "සිංහබාහු"යයි යන නාමයද,
කුමාරිකාවට "සිංහවල්ලි" යයියන නාමයද තබා වැඩෙන්නාවූ
දරුදෙදෙනා වැඩිවයසට පැමිණිකල්හි, එක්දවසක් සිංහබාහු
කුමාරතෙම තමාගේ මවුබිසවුන්ගේ සමීපයටගොස් පියවූ සිංහ
රාජයාගේහා තමන්ගේද ඇත්තාවූ වෙනස මෑනියන්ගෙන්අ
සා සියලු තොරතුරු නිරවශෙෂකොට දැනගෙණ වනාන්තර
යෙන් යන්නාවූ පරිදි කල්පණාකොට, එක්දවසක් සිංහරාජයා
ගොදුරු පිණිස නික්ම ගියකල්හී, කුමාරතෙම තමාගේ බලය
විමසා බලා නැවත දවසෙක්හී එසේම සිංහරාජයා ගොදුරුපි
ණිස පිටතගියකල්හි මෑනියන්හා නැගණියන්ද තමන්ගේදෙ
කරෙහි හිඳුවාගෙණ මහවනය මැදින් දිවගෙණගොස් එකල්
හි එම රාජ කුමාරිකාවගේ මයිල්වූ රජ්ජුරුවන්ගේ පුත්‍රතෙම
සෙනෙවිරත් තනතුරට පැමිණ වාසයකරන්නාවූ නුවරට පැමි
ණ එක් ස්ථානයෙක්හි සිටියෝය, එසේ සිටිකල්හි ගම්වැසි ම
නුෂ්‍යයෙක්හට රජබිසව විසින් කියනලද තොරතුරු ඔහුගොස්
සෙනෙවි රජහට සැලකළකල්හි ඉතා සන්තොෂවූ සෙනෙවිරජ
තෙම එම්නුවර අලංකාරකොට සරහා වනයෙන් ආ රජබිසව
හා කුමාරයාද කුමාරිකාවද යනමේ තුන්දෙනා මහපෙළහරින්
තමන්ගේ සමීපයට කැඳවා ගෙණවුත් තිරිසනෙකුට අසුවී දුක්
වින්දවූ බිසව සෙනෙවිරජහට අභිෂෙකකොට සැපසේ දවස්ය
වනකල්හි. ගොදුරු සෙවීමපිණිස වල්ගියාවූ සිංහරාජයා ගල්
ගුහාවට අවුත්බලා තමන්ගේ රජබිසවහා දෙදරුවන්ද නො
දැක සිතතුල හටගත්තාවූ බලවත් ශොකයෙන් පීඩිතව දස
දිශාවට වැනිවැත් නොසිටිසියහැකිව බොහෝසෙයින් විලාපබ
ස්නියා හඬමින් ගොදුරු නොලැබ තන්තන්හිඇවිද පසුවතම
න්ගේ බිසවුන්හා දරුදෙදෙනා සිටින නුවරට පැමිණ ගම්වැසි
ළඟු අතින් ඔවුන්ආ තොරතුරු අසා දැනගෙණ සිංහනාදක
රමින් මනුෂ්‍යයන්ගේහා තිරිසනුන්ගේ කන්පලමින් බොහෝ
සෙයින් මරණකල්හි ගම්වැස්සෝ එකතුව ගොස් තමන්ගේ
රටටපැමිණියාවූ විපත්තිය සෙනෙවිරජහට සැලකළකල්හී සෙ
නෙවි රජතෙමේද ඉතා සොකයට පැමිණ මන්ත්‍රිසමූහයා එක්
කොට සිව්රඟ සෙනඟ රැස්වන පරිද්දෙන් අණබෙරකර "ඒසෙ
නාව පිරිවරාගොස් යුධකොට එමරට වනසන්නාවූ සිංහරාජයා
මරව්" යයි කියා රජහුවිසින් දෙනලද ආඥවට කීකරුව මන්ත්‍රී
සමූහයා විසින් මහසෙනඟ පිරිවරා සිංහරාජයා සිටිතැනට ගො
ස් රණබෙර කරවා යුධඝොෂා පැවැත්වූහ.

එවිටඑම යුද්ධඝොෂාව ඇසූ සිංහරාජතෙම ඔත්පලින් නැගිට අහසටපැන සියදහස් ගණන් විදුලි ලසන පරිද්දෙන් ඔබිනොබ භ්‍රමණයවී සෙනගමැදට පැන ද්‍රුවුද්‍රුවූ ඇත්අස් මිනිස් ආදීන් මිරිකල්හි සෙනග බියගෙණ පසුබැස ප්‍රාණය පමණක් ගලවාගෙන් විකදෙනෙක් දිවගෙණ අවුත් සිදුවූ එපවත් නොහැරම රජහට සැලකළෝය. එවිට රජහුගේ සිතට තදදුක්වැද එවේලෙහිම මන්ත්‍රීන් ගෙන්වා, ඇතෙකුපිට මසුරන් දහසකින්බැඳි පියල්ලක්තබා එම රෞද්‍රවූ සිංහරාජයාගේ ඉසසිඳ යමෙක් ගෙණවුත් දුනහොත් ඕහට මේරන්දහසහා වෙනත්සතු දෙනබවකියා සියලු වගුරට "අණබෙරකරවයි" කියා අණදුන්නේය. එම මන්ත්‍රීහුද එසේ අණබෙරකරවන කල්හි එම සිංහරාජයාහට දාවූ සිංහබාහු කුමාරතෙම තමන්ගේ මෑනියන් වෙතට ගොස් එම අණබෙරලෑවූ ප්‍රවෘත්තිය දත්වා තමන්විසින් පියාවූ සිංහරාජයාගේ හිස කපාගෙණවුත් රජහටදී ඒසියලු ඓශ්චර්ය ලබන්නෙමිදැයි මෑනියන්ගෙන් ඇසූකල්හි, මවු බිසවවිසින් එයින්වන්නාවූ අවැඩකියා දෙවාරයක්ම නැවැත්වූපසු, තුන්වෙනි වාරයෙහි මෑනියන්ටත් සොරාගොස් රජ්ජුරුවන්ගෙන් අවසරලබා වනයටගොස් තමාගේ පියාවූ සිංහරාජයා විදමරා හිස කපාගෙණවුත් රජ්ජුරුවන්ට දුන්නේය. එබව ඇසූ රජබිසවහාකුමාරිකාවද සිංහරාජයාගේ ගුණකියකියා හඬාවැලපී පසුව නුවරුන්හා හැමදෙනම එක්ව එම්හිස මහපෙළහරින් ගෙණගොස් දවාහැර එමනුෂ්‍යරට නුදුරුවූ මහගිම්වත් ප්‍රදෙශයක් යහපත්නුවරක් කරවා සිංහබාහු කුමාරයාහට සිංහවල්ලි කුමාරිකාව අග්‍රමහෙසිකාකොට පාවාදී එම්නුවර රාජෛශ්චර්යයද ඕහටම දුන්නේය.

ඒ සිංහබාහුනම් කුමාරයානෝද ඒ බිසවුන්හාසමග දසරාජධර්මයෙන් රාජ්‍යකරණ සමයෙහි මහත්වූ පින්බල ඇත්තාවූ කුමාරයන් දෙතිසක්ලැබ සැපවිඳ කෙලවර කාලක්‍රියාකළෝය, ඒ කුමාරයන් දෙතිස අතුරෙන් ජ්‍යෙෂ්ඨ කුමාරයාවන විජයබාහුකුමාරතෙම මේ ලංකාද්වීපයෙහි *"තම්මැන්න"නම් පුරයට ගොඩබැස යකුන් දුරුකොට ප්‍රමාණාතික්‍රාන්තවූ ඓශ්චර්යයෙන් විරාජමානව රාජ්‍යයකළේය.

---

* පුරාණකාලයෙහි ප්‍රසිද්ධව තිබුන මේ නුවර, පුත්තලමේසිට සැතැප්ම හයක් පමණ වරුණදිසාවේ පිහිටාතිබුණේයයි සමහරු කියති.

මෙසේ අපවිසින් ඉතා සංක්ෂෙප වශයෙන් දක්වනලද මේ කථා ප්‍රවෘත්තිය විස්තරපශයෙන් ඇසීමට කර්ණ රසායනකොට මිහිරි නොයෙක් වෘත්තයන්හා අලංකාරයෙන්ද යුක්තව කාව්‍යයෙන් රචනාකර නිබෙණ්ඩහසින්, උගත් නූගත් සියල්ලන්විසින්ම මෙම්මතු ප්‍රකාශවන සන්නසහිතවූ "සියබස්මල්දම" නම් කාව්‍යපුස්තකය භාවිතා කටයුතුයි.

**සියබස් මල්දම විවරණය නිමි.**

සි ඛි ර සතු.

---

පිරිවණ බසග ඟ      ණ
විංකැසුරු සව් අිනදී      ත
ලොතර තම පියව      ත
වදිම් සිරිගණ පවර දිනම්      ණ

මෙසේ සකල ලොකොත්තර ගුණ නිධිනිකෙතවූ අප භාග්‍යවත් තථාගත අර්හත්සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේට භය ලොභ කුලාචාරාදීන් විනා භක්ති ප්‍රෙමාති භාරාවනතොත්තමාංගය කරණකොටගෙණ මාගේ කායාදී චාරත්‍රයෙන් සකසාවැඳ, "සුබඅග අපවග දුන් සත්හට සොඳ" යනමේ කවිය ආදිවූ 'සියබස්මල්දම' නම්ලත් මේ මධුර මනොහර කාව්‍ය ප්‍රබන්ධය සම්බන්ධිවූ සියලුම පද්‍යයන්ගේ විදූපි විවර්ණනාකෙරෙමි.

---

ස න් න ස හි ත

# සියබස්මල්දම.

## නමව් මුනිසරණ

1 සු   බ අඟ අපවග දුන් සත්නට සො   ද
බ   ඹ සුර සුරනර මතැ සැදූ සිරිප   ද
පොබ යන විනෙදන ගණසර දිනර   ද
ලොබ බැඳැ නමදිම් එසුගත් දම්ර   ද

1 සුබ, සොභනවූ; සොඳ, සුන්දරවූ; අඟ, අග්‍රවූ හෙවත් උතුම්වූ; අපවග, නිර්වාණය; සත්නට, සත්වයන්ට; දුන්, දානයකළාවූ; හෙවත් දුන්නාවූ; * නොහොත්, සොඳසත්නට, සුන්දරවූ සත්වයන්හට; සුබ, ශොභනවූ; අඟ, අග්‍රවූ; අපවග, නිර්වාණය; දුන්, දානය කළාවූ; බඹසුර සුරනර, බ්‍රහ්ම දිව්‍ය අසුර මනුෂ්‍යයන්ගේ; මතැ, මස්තකයෙහි; සැදූ, සජ්ජිතකළාවූ හෙවත් සැරහුවාවූ; සිරිපද, ශ්‍රීපාද (යුග්මයක්) ඇත්තාවූ; විනෙදනගණ, වෛනෙය ජනසමූහ නැමැති; සර, පද්මයන්; පොබයන, ප්‍රබොධ කරන්නාවූ; හෙවත් සෝවාන් මාර්ගඵලාදිය දීමෙන් චතුස්සත්‍යාවබොධය කරවදළාවූ; නොහොත්; පොබයන, ප්‍රබොධකිරීමට; දිනකර, දිවාකරවූ; හෙවත් සූර්‍ය්‍යදිව්‍යරාජයාවැනිවූ; එසුගත්දම්රද, සොභනගති ඇත්තාවූ ධර්මරාජන්වූ ඒ සර්වඥයන් වහන්සේ; ලොබබැඳැ, ලොභ බන්ධනයකොට හෙවත් ශ්‍රද්ධානැමති ලොභය උපදවා; නමදිම්, (මම) නමස්කාර කෙරෙම්.

2 සු   ර දෙට අයදුම් පිළිගෙණ මොනව   ට
ච   ර දෙසතරමග පල මොක් පලකො   ට
සු   ර නට සූර සුගතිඳු දෙසූ දහම   ට
තොර නොව නමදිම් අදරින් තුතිකො   ට

2 සූරදෙට, සහම්පතී මහා බ්‍රහ්මරාජයාගේ: අයදුම, ආරාධනාව; මොනවට, මනාකොට; පිළිගෙණ, ප්‍රතිග්‍රහණයකොට; චර, උතුම්වූ; දෙසතරමගපල, අෂ්ටවිධවූ මාර්ගඵලයන්; හෙවත්, සෝවාන් මාර්ගය ඵලය, සකෘදාගාමි මාර්ගය ඵලය, අනාගාමිමාර්ගය ඵලය, අර්හත්මාර්ගය ඵලය යනමේ සතරමග සතර ඵලයන්ද; මොක්, මොක්ෂයද හෙවත් නිර්වාණයද; (යනමේ) නවලොකොත්

* යන මෙයින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහා කාශ්‍යපස්ථවිරාදි කෘතාධිකාර ඇති මහොත්තමයන් වහන්සේලා වැනිවූ යහපත් සත්වයන්ගේ සමීපයට වැඩමවා චරිතානුකූලව ධර්ම්‍ය දෙශනා කොට චතුස්සත්‍යාවබොධ කොට ලොකොත්තරවූ නිර්වාණ සම්පත්තියදුන්බව හැඟවූහ.

තර ධර්මය; පළකොට, ප්‍රකාශකොට; සුරනරසුර, දෙවාතිදෙව්වූ; සුගතිඳු, සර්‍වඥයන් වහන්සේ විසින්; දෙසූ, දෙසනාකාර වදාළාවූ දහමට, (ශ්‍රී) සද්ධර්මරත්නයටද; නොරනොව, නිරන්තරව හෙවත් නොරනැතිව; අදරින්, ආදරයෙන්; තුතිකොට, ස්තුතිකොට; නම දිම්, (මම) නමස්කාර කෙරෙම් හෙවත් වඳිමි.

3 සි රි ගණ වදහල සදහම් සිතෙල ට
පි රි සිදු රන්පාවන් සුත දිනිදු ට
සැරි යුත් මුගලන් ඈ මහ සඟන ට
පි රි සතුටින් මම නමදිම් හැමවි ට

3 සිරිගණ, සර්‍වඥයන් වහන්සේ විසින්; වදහල, දෙසනාකරවදාලාවූ; සදහම්, සද්ධර්මනැමැති; සිතෙලට, සිංහ තෛලයට; පිරිසිදු, පරිශුද්ධවූ හෙවත් පිරිසිදුවූ; රන්පාවන්, සුවර්ණභාජන සදෘශවූ; දිනිඳුට, ජිනෙන්ද්‍රයන් වහන්සේට; සුත, පුත්‍රවූ; සැරියුත් මුගලන් ඈ, සාරිපුත්‍ර මෞද්ගල්‍යායන ස්ථවිරාදීවූ; මහසඟනට, මහා සංඝ රත්නයටද; පිරිසතුටින්, සම්පූර්ණවූ සන්තොෂයෙන්යුක්තව; මම, අප්මිත්තෙමේ; හැමවිට, සර්‍වකාලයෙහි; නමදිම්, ප්‍රණාමය කෙරෙම් හෙවත් වඳිමි.

4 බ ඹ සුරපති සුරගුරු න ත
නැබ සර සිරිසර සරකර බරනෙ ත
බ ඹ කත ඈ හැම සුරගණ කරමෙ ත
සු බ සෙතදී රකුමේ හැම ලෙව්ස ත

4 බඹ, මහාබ්‍රහ්ම රාජයාය; සුරපති, ශක්‍ර දෙවෙන්ද්‍රයාය; සුරගුරු, බෘහස්පතිය; අසුරගුරු, ශුක්‍රයාග හෙවත් සිකුරාය; අනත, අනන්තනම් නාගරාජයාය; නැබසර, පද්මනාභිය හෙවත් විෂ්ණු දිව්‍යරාජයාය; සිරිසර, ශ්‍රීකාන්තාවය; සරකර, සූර්‍ය්‍යදිව්‍යරාජයාය; බරනෙත, සකන්දදෙවයාය; බඹකත, සරස්වතීනම්දිව්‍යාංගනාවය; යන ඈ හැමසුරගණ, (මේ) ආදී දිව්‍යසමූහතෙම; මෙත කර, මෛත්‍රීකොට; සව්ලෙව්සත, සකල ලොකවාසී සත්වයන්ට; සුබසෙතදී, ශොභනවූ ශාන්තිදානයකොට; රකු, රක්ෂාකරණ්සේක්වා.

5 තු න් ලොව ඇතිහැම රුවනට නුම්ව න
තු න් සිත සතුටුව වැදැ පිදු හැමදෙ න
තු න් සැපදීමෙන් සුවපත් කරව න
තු න් රුවනට වැඳ පුදමින් මෙලෙසි න

5 තුන්ලොවැ, ත්‍රිවිධ ලොකයෙහි; ඇති, විද්‍යමානවූ, හෙවත් ඇත්තාවූ; හැමරුවනට, සර්වරත්නයන්ට; උතුම්වන, උත්තමවූ;

තුන්රුවනට, (බුඩාදී) රත්නත්‍රයට; තුන්සිත, ත්‍රිවිධචිත්තය, හෙව ත් ආදි මධ්‍ය පර්‍යාවසානයයි කියනලද ත්‍රිවිධචිත්තය; පහද, ප්‍රස න්නකොට, හෙවත් පහදවා; වැඳැපිදූ, වන්දනාකොට පූජාකළාවූ; හැමසඳහ, සියලු ජනයන්ට; තුන්සැප, ත්‍රිවිධසම්පත්තිය, හෙවත් දිව්‍යලොක මනුෂ්‍යලොක සම්පත්තියහා නිර්වාණ සම්පත් යිය‍ද යන මේ ත්‍රිවිධ සැපය; දීමෙන්, ප්‍රදානය කිරීමෙන්; සුවපත් කරවන, සැපයට පැමිණීම කරවන්නාවූ; තුන්රුවනට, (බුඩාදී) රත්නත්‍ර යට; මෙලෙසින, මෙයාකාරයෙන්; වැඳ, නමස්කාර කොට; පුදමින, පූජාකරමින්;.

6 හැ ම ස ද ලෙව්සත සුවපත් කරමි න
සිත ලෙ ද ආසිරිදී රක්නාමෙ න
එක ලෙ ද ලොසසුන රැකනිති බබල න
තද තෙ ද දෙවියන් යදැ මෙත් කරමි න

6 හැමසඳ, සෑම්කල්හි; ලෙව්සත, ලොකවාසී සත්වයන්ට, සුවපත්කරමින, සුඛප්‍රතිලාභය කරමින්; සිතලෙද, සිත්වූපරිද්දෙ න්; ආසිරි, ආයුශ්‍රියා; දී, දානයකොට; රක්නාමෙන, රක්‍ෂාකරණ ප රිද්දෙන්; එකලෙද, ඒකාකාරයෙන්; ලොසසුන, ලොක ශාසන දෙක; රැකැ, රක්‍ෂාකොට; නිති, නිරන්තරයෙන්; බබලන, භ්‍රාජිත වන්නාවූ; තදතෙද, ඝනබ්ධවූ තෙජස්ඇති; දෙවියන්, දෙවියන්ට; යදැ, යාච්ඤාකොට; මෙත්කරමින, මෛත්‍රීකරමින්;

7 පෙ ර මෙම සිරිලක පලමුව ර ජක ල
ව ර තර එව්ජයබා රජහුගෙ දු ල
ප ර පුර ගෙණහැර දක්වමි මනක ල
ක ර ද ර සුදනෙනි සව්එහි පිළිවෙ ල

7 පෙර, පූර්වකාලයෙහි; මෙම සිරිලක, මේශ්‍රීලංකාද්වීපයෙහි; පලමුව, ප්‍රථමකොට; රජකල, රාජ්‍යය කළාවූ, වරතර, අතිශයින් උතුම්වූ; උදුල, උජ්වලිතවූ; එව්ජයබාරජහුගෙ ඒවිජයබාහු නම් නරෙන්ද්‍රයාගේ; මනකල, මනඃකාන්තවූ; පරපුර, පරම්පරාව; ගෙ ණැහැර දක්වමි, ප්‍රකාශ කරමි; සුදනෙනි, සත්පුරුෂ ජනයෙනි; අදරකර, ආදරකොට; එහි, ඒකථාවෙහි; පිළිවෙල, පටිපාටිය; අසව්, ශ්‍රවණයකරව්.

8 සිසි ර කරහර සිසිරහරගිරි පඬර සුරගජ කිරණ කොඳර ස
අම ර ගඟතුඟු තරඟ රඟහෙළ විපුල යසරැස පතළ දසදෙස
තඹර කරසුරු සුගත දිලියෙනඅනත තදතෙදගණදියකුස
සතර මරමත මතගමතබිඳි අනයි විකුමෙන්සදිසි නනප ස

8 සිසිරකර, චන්ද්‍රයාය;හර, මුක්තාහාරය, නොහොත් මහෙ ශ්වරයාය; සිසිර, නීහාරය; හරගිරි, කෛලාස පර්වතය; පඬර

ශ්වේතපද්මය; සුරගජ, ඓරාවණ හස්තිරාජයාද; කිරණ, ක්ෂීරා
ර්ණවය, හෙවත් කිරිමුහුදද; කොඳ, වැකොඳද; රස, රසදියද;
අම්බරගඟ, ආකාශ ගංගාවගේ; තුඟුතරඟරඟ, උත්තුංග තරංගය
හෙවත් උස්වූ රළපඬකතිය යනමේ ලොකසම්මත මංගල්‍ය වස්තූ
න්හා සමානවූ; හෙළ, ධවලවර්ණවූ; විපුල, මහත්වූ; දසදෙස, දශ
දිශාවන්හි; පතළ, ප්‍රසෘතවූ, හෙවත් පැතුරුණාවූ; විපුල, මහ
ත්වූ; යසරැස, යශොරාශියක්ඇත්තාවූ; සුගත, සුගාත්‍රයෙහි; දිලි
යෙන, දිලියෙන්නාවූ; නබරකරසුරු, සුයශී දිව්‍යරාජයාමෙන්; දිය
කුස, ජගද්කුක්ෂියෙහි; අනත, අනන්තවූ; තදතෙද, සන්නද්ධවූතෙජ
සින්; ගහණ, ගැවසීගත්තාවූ; සතරමර, චතුර්විධමාරයන්ගේහෙ
හොත් ශත්‍රුවූ මාරනැමති; මතමතඟ, මත්තහස්තීන්ගේ; මත
බිඳි, මස්තකයන් භෙදකළාවූ, හෙවත් අභිමානය බිඳහැරියාවූ; අ
නගි විකුමෙන්, අනඝීවූවික්‍රමය කරණකොට ගෙණ; නතපසසදිසි,
සිංහරාජයක්හු සමානවූ:

9 දිරිබෙලෙන් දිනු මදුරැගිරිරද සොමිගුණෙන් පිරිසරද දදර ද
නතගුණෙන් මහවියත් ජයගත් ගැඹුරුගුණයෙන් පැරයුසිඳුර ද
ලොවසතුන් හට උතුම්දෙගුරුන් ගුරුන්මිතුරන්හරණන්වරද
සු ර න ර න් මිණිකිරුළු මුදුනතැ සැදූසිරිපද කමල්ඇතිහො ද

9 දිරිබෙලෙන්, ධෛර්‍ය්‍යයහා වික්‍රමය කරණකොට ගෙණ;
මදුරැගිරිරද, මන්දර පර්වතරාජයා; දිනු, ජයග්‍රහණය කළාවූ, හෙ
වත් පරාජයකළාවූ; සොමිගුණෙන්, සෞම්‍යවූ ගුණය කරණකො
ටගෙණ; පිරි, කලාපරිපූර්ණවූ; සරද දදරද, ශරච්චන්ද්‍රයාද; නතගු
ණෙන්, අනන්තවූ ගුණය කරණකොටගෙණ; මහවියත්, මහාව්‍ය
ක්තයන්ද; හෙවත්, මහත් පණ්ඩිත ජනයන්ද; ජයගත්, ජය
ග්‍රහණය කළාවූ; ගැඹුරුගුණයෙන්, ගම්භීරවූ ගුණයන් කරණ
කොටගෙණ; සිඳුරද, සමුද්‍රය; පැරයු, පරාජයකළාවූ; ලොවසතු
න්හට, ලොකවාසී සත්ත්වයන්ට; උතුම්, උත්තමවූ; දෙගුරුන්, මා
තෘපිතෘන්ද; ගුරුන්, ආචාර්‍ය්‍යයන්ද; මිතුරන්, මිත්‍රයන්ද; නිවරද,
නිරවද්‍යකොට; හරණ, පහකොට හරින්නාවූ; සුරනරන්, දිව්‍යම
නුෂ්‍යයන්ගේ; මුදුනතැ, මස්තකයෙහි; මිණිකිරුළු, මාණික්‍යකිරීටා
භරණයෙන්;සැදු, සර්ජිත කළාවූ හෙවත් සරහණලද්දාවූ; සොඳ,
සුන්දරවූ; සිරිපද කමල්ඇති, ශ්‍රීපාද පද්ම ඇත්තාවූ:

10 සතර දසබුදු නැණද සබිනැණ කබලනැණබල දසයදසය ද
සතර දෙකවිදු දසටඅවෙනික දහම් තෙපසක් සරණ දහම ද
සතර වෙසරද සතරඉදිපා සතරසිවටන් බොදඟ සත්වි ද
සතර පිළිසිඹිපතද යනඈ අනතගුණමිණි පිරුණු සිඳුර ද

10 සතරදහබුදුනැණද, චතුදීශ බුඩඥානයද; සබිණැන, ෂඩභිඥ ඥානයද; කබලනැණබල දසයදසයද, කායබල දශකයහා ඥානබල දශයද; සතරදෙකාවිදු, අෂ්ටවිද්‍යාවද; දසට අවෙනිකද හම්, අෂ්ටාදශ ආවෙනික ධර්මයන්ද, හෙවත් අටලොස් ආවේනික ධර්මයන්ද; තෙපසක් සරණදහම්ද, පසලොස් චරණ ධර්මයන්ද; සතරවෙසරද, චතුවෛශාරද්‍ය ධර්මයන්ද; සතරඉදිපා, චතුර්විධ ඍද්ධිපාදයද; සතරසිවටන්, සතර සතිපට්ඨාන ධර්මයන්ද; සත්විද බොදඟ, සත්වැදෑරුම් බොධ්‍යාංග ධර්මයන්ද; සතර පිළිසිඹිපතද, සිව්පිළිසිඹියාවන්ද; යනඈ, කියනලද මේආදිවූ; අනනගුණ, අනන්තවූ ගුණනැමති; මිණි, මාණික්‍ය (රත්න) යෙන්; පිරුණු, සම්පූර්ණවූ; සිඳුරද, සමුද්‍රයවැනිවූ;

11 සතර අවමග අවරණසකර සුරපුරටමග සැරසූ මනහ ර
සමර සුරදෙව පැරයු තුන්සිය විසිඅටක් වරලකුණුසිරිද ර
තඹර කරකුල කමලකර පොබයනට සහමොහඳුරට සැඩකර
සමර කලසත් සමරසමරෙන් මිදෙනසදහම් දෙසූගරුත ර

11 සතරඅවමග, සතරඅපායට යන්නාවූ මාර්ගයන් හෙවත් නරක තිරිසන් ප්‍රෙත අසුරනිකායයි කියනලද සතරඅපායට යනමග; අවරණසකර, ආවරණකොට, හෙවත් වසා; මනහර, මනෝහරවූ; සුරපුරට, දිව්‍යලොකයට; මග (යන්නාවූ) මාර්ගය; සැරසූ, සර්ජිතකළාවූ; සමර, මාරයාසහිතවූ; සුරදෙව, මහාබ්‍රහ්මයාද; පැරයු, පරාජයකළාවූ; තුන්සිය විසිඅටක්, තුන්සිය විසිඅටක්පමණවූ; වරලකුණුසිරි, උත්තම ලක්ෂණශ්‍රිය; දර, ධාරණය කරන්නාවූ; තඹරකරකුල සූර්‍ය්‍යවංශනැමති; කමලකර, පද්මාකරය; පොබයනටසහ, ප්‍රබොධක්‍රිම පිණිසහා මොහඳුරට, මොහාන්ධකාරයටද; සැඩකර, සූර්‍ය්‍යයාබඳුවූ; සමරකලසත්, අනුස්මරණය කළාවූ සත්වයන්; සමරසමරෙන්, මාරයුඩයෙන්; මිදෙන, මිදෙන්නාවූ; ගරුතර, ගෞරව තරවූ; සදහම්, සද්ධර්මය; දෙසූ, දෙශනාකර වදාළාවූ;

12 බු දු පසේබුදු මහරහත්ගණ සමග සක්විති රදහු දියත ද
සු දු කිරණබඳු නිමලගුණවල අනෙකතවසුන් උතුම්පඬිහු ද
රු දු බලැති යෝධලන්ඈ හැම පින්වතුන් ඉපදුනු ඉතාසො ද
ඉ දු රුපුරදිනු මහත්සැපතැති පවර දඹදිව්තෙලෙහි මතනද

12 බුදුපසේබුදු මහරහත්ගණ සමග, බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ මහරහත් සමූහයාසමග; දියතද, ජගත්නාථනියවූ; සක්විතිරදහු, චක්‍රවර්ති රාජයෝද; සුදුකිරණබඳු, චන්ද්‍රයාබඳුවූ; නිමල ගුණවල, නිර්මල ගුණයෙන් ආකූලවූ; අනෙක තවසුන්, නොයෙක් තාපස

සත්හා; උතුම්පඬිනුද, උතුම් පඬිත ජනයොද; රුදුබලැති, මහ ත්බල ඇත්තාවූ; යොබලළන්අෑ, යෝධභටයන් ආදීවූ; හැම පින්ව තුන්, සියලුපුණ්‍යවන්ත ජනයෝ; ඉපදුනු, උපන්නාවූ; ඉතාසොද, අතිශයින් සුන්‍දරවූ; ඉදුරුපුරදිනු, ශක්‍රභවනය පරාජයකලාවූ; මහ ත්හැපතැති, මහත් සම්පත් ඇත්තාවූ; මනනද, සිත් සනෙතාෂ වත්නාවූ; පවර දඹදිව්තෙලෙහි, උතුම් ජම්බුද්වීප තලයෙහි;

13 සව න සුරපුරෙනඩක් මිහිබට විලසහැමපිරි සුරෙන් බබලන
සව න දම්සඟ දෙලොවපිහිටය සිතාතිසරණ දිවිසෙ සුරකි න
සව ණ කරදම් පෙවෙන්වැලකී පුරණදසවිද කුසලඅපම් න
සව න ගුණනැන බරණ සියගත පැලදිදනගණගහනහැමදින

13 සවන සුරපුරෙන්, සවෙනි දිව්‍යලොකයෙන්: අඩක්, අඩ යක් හෙවත් පංගුවක්: මිහිබටවිලස, පෘථිවියට බැස්සාවූපරිද්දෙන්; හැමපිරිසුරෙන්, පිරුණාවූ සකලෙශ්වර්‍ය්‍යයෙන්; බබලන, බබල න්නාවූ; සුවණ දම්සඟ, බුදුන්දහම් සඞ්ඝයායයිතන ත්‍රිවිධරත්නය; දෙලොව පිහිටයසිතා, උභයලොකයට පිහිටයයි සිතාගෙණ; තිස රණ, තුන්සරණය; දිවිසෙ, ජීවිතයමෙන්; සුරකින, මනාව රක්‍ෂා කරන්නාවූ; දම්සවනකර, ධර්‍මශ්‍රවනයකොට හෙවත් බණඅසා; පෙවෙන් වැලකී, පාපයෙන් වැළකී; අපමණ, අප්‍රමාණවූ; පුරණ දසවිද කුසල, පුරණලද දස වැදෑරුම්වූ කුශලධර්‍මය ඇත්තාවූ; සවන, සර්‍වඥයන් වහන්සේගේ, නොහොත් සවණ, ශොභනවූ; ගුණනැණබරණ, ගුණඥානනැමැති ආභරණයන්; සියගත, ස්ව කීය ශරීරයෙහි; පැලදි, පිලඬනයකලාවූ, හෙවත් පැලැන්දවූ; දනගණ, ජනසමූහයාගෙන්; හැමදින, සෑමකල්හි; ගහණ, ගැව සිගත්තාවූ;

14 වි පුල සැපදල සපිරිමනකල දවනහයරල රලැති හැමස ද
නිසල නිලපෙල රසලකැලදුල නනවිදලසර සරණ මනන ද
තුමුල පලහෙළ මනහපෙලනැවී මහගුවරරද බවනගිරිර ද
ලකල වගුනම් පුරවරෙක්විය සිදුරදුගෙසිරි ඉසුලු එකලෙ ද

14 විපුල, මහත්වූ; සැපදල, සම්පත්ති නැමැති ජලයෙන්; සපිරි, සම්පූර්‍ණවූ; හැමසද, සෑමකල්හි; මනකල, මනොකල්‍යවූ, හෙවත් සිත් කැමතිවන්නාවූ; දවන, ධාවනයකරන්නාවූ; හයරළ, අශ්වසමූහ නැමැති; රලැති, තරංග ඇත්තාවූ; නිසල, නිශ්චලවූ; නිලපෙල, ගෘහපඞ්ක්ති නැමැති; රසලකැල, පර්‍වත සමූහයෙන් උදුල, බබලන්නාවූ; නන්අවි, නානායුධ නැමැති; සරණ දලසර හැසිරෙන්නාවූ ජලචරයන් විසින්, හෙවත් මත්ශ්‍යයන් විසින්

මිහිනද, මනොනන්දනයවූ, හෙවත් සිත්සතුටුවන්නාවූ; තුඹුල, මහත්වූ; පලහෙල, ප්‍රසිද්ධවූ ධවලවර්ණ ඇත්තාවූ; මතඟපෙල, මාතඞ්ගපඞ්කති වැනිවූ, හෙවත් ඇත්රලක් වැනිවූ; මහගු, මහාර්ඝවූ; නැවී, නොකානැමැති; වරරදබවන, උතුම්වූ රාජමන්දිරනැමැති; ගිරිරද, මෙරුපර්වතයෙන්; ලකළ, අලංකෘතවූ හෙවත් සැරසුනාවූ; එකලෙද, එකාකාරයෙන්; සිඳුරදුගෙ, සමුද්‍ර රාජයාගේ; සිරි, ශොභාව; ඉසුලූ, උද්වහනය කළාවූ; වගුනම් පුරවරෙක්විය, වගුනම් නාගරොත්තමයෙක් වූයේය.

15 එ පු ර සුපිරි ඉසුරුවතුර එයින් පිටත නොයනවිල ස
ස ත ර වතඹු මවාලූවයි දුටුවන්හට සිතෙනාලෙ ස
වි ත ර නොවන බලැති දසට රියන් උසැති පවුර නිදෙ ස
එ පු ර අවට බැබලූ නිති දවල රසින් විලස කෙලෙ ස

15 එපුර, ඒනගරයෙහි; සුපිරි, මනාව පිරුණාවූ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යනැමැති; වතුර, ජලප්‍රවාහය; එයින්, ඒ නගරය කෙරෙන්, පිටත නොයන විලස, පිටතට නොයන පරිද්දෙන්; සතරවතඹු, මහාබ්‍රහ්ම රාජයා විසින්; මවාලූවයි, නිර්මිතකොට ලූයේයයිකියා; දුටුවන්හට, දර්ශනයකලවුන්ට; සිතෙනාලෙස, සිතෙනපරිද්දෙන්; විතරනොවන, ස්වල්පනූවූ; බලැති, ශක්තිමත්වූ; දසටරියන් උසැති, අෂ්ටාදශරත්න ප්‍රමාණ උසඇත්තාවූ; නිදෙස, නිර්දෙෂවූ. පවුර, ප්‍රාකාරයතෙම; නිදෙස, නිර්දෙෂවූ; දවලරසින්, ධවලවර්ණයෙන්, හෙවත් සුදුපැහැයෙන්; කෙලෙසවිලස, කෛලාසපර්වතයාගේ විලාසයෙන්; නිති, නිරන්තරයෙන්; බැබැලූ, භ්‍රාජිතවූයේය;

16 ඉ දු වර රතු පුල්හෙල්මැලි ඈ පස්පියුමෙන් සුසැදු න
හැමවර නදදෙන බිඟුකැන් දියරට හස රදුන් කෙලි න
බලතර කිඹුලන් දැතිමුවරුන් සහ රුදුම්සුන් ගහ න
පුර දර පොකුණට සමවිය දියගල එපුරෙහි බබල න

15 ඉඳුවර, ඉන්දීවරය, හෙවත් නිල් මහනිල්ය; රතුපුල්, රක්තොත්පලය, හෙවත් රතුමහනිල්ය; හෙල්මැලි, කහ්ලාරය යනු; ඈ, මෙආදීවූ; පස්පියුමෙන්, පඤ්චප්‍රකාරවූ පියුමෙන්; සුසැදුන, මනාව සැරසුනාවූ, හැමවර, සෑමකල්හි; නදදෙන, නාදදනය කරන්නාවූ; බිඟුකැන්, භෘංගසමූහ ඇත්තාවූ; දියරටහසරදුන්, ධෘතරාෂ්ට්‍ර හංශරාජයන් විසින්; කෙළිත, ක්‍රීඩා කරණු ලබන්නාවූ, නොහොත් අටහසරදුන්, අෂ්ටවර්ගීයක හංශ රාජයන් විසින්; කෙළිත, ක්‍රීඩාකරණු ලබන්නාවූ; දියර, ජලයඇත්තාවූ; බලතර කිඹුලූන්, බලවත් කුම්භිලයන්ද; දැතිමුවරුන්, දැතිමුවරුන්හා; රුදු, රෞ

දුවූ; මසුන් ගහණ, මත්ශ්‍යයන් විසින් ගැවසීගත්තාවූ; එපුරෙහි, ඒනගරයෙහි; බබලන, බබලන්නාවූ; දියගල, ජලපරිඛාතොමෝ හෙවත් දියපිරුණු අගල; පුරඳර පොකුනට සමවිය, ශක්‍රදෙවෙන්ද්‍රයාගේ පුෂ්කරණියට සමානවූයේය.

17 ද ස වි ද රුවණින් නිමිබිතු වැඹපේකඩ දැව ගෝනැ ස
දඹ න ද රත්උලු සෙවනැති මිණිකොත් ඇති නේසුවහ ස
සුර ර ද විමනෙව් දිලියෙන නරරද බවනට සිව්දෙ ස
හිර ස ඳ බඳු රැස්විහිදෙන අපමණ නිලපෙල වියය ස

17 දසවිදරුවණින්, දසවැදෑරුම්වූ රත්නයෙන්; නිමි, නිර්මිතකරණලද්දවූ; බිතු, බිත්තිහා; වැඹ, සනමහාද; දැව, දැවද; පේකඩ, පේකඩද; ගෝනැස, ගෝනැස්ද ඇති; දඹනදරන්, ජාම්බොනද ස්වර්ණයෙන් කරණලද්දවූ; උළුසෙවනැති, ඉෂ්ටිකා ඡදන ඇත්තාවූ, හෙවත් උලුංසවෙනි ඇත්තාවූ; අනේසුවහස, නොයෙක් ලක්‍ෂණගණන්වූ; මිණිකොත් ඇති, මාණික්‍යමය ශෘංග ඇත්තාවූ; සුරරද විමනෙව්, ශක්‍රදිව්‍යරාජයාගේ විමානය මෙන්; දිලියෙන, දිලිසෙන්නාවූ; නරරද බවනට, මනුෂ්‍යරාජයාගේ භවනයට; සිව්දෙස, සතරදිසාවෙහි; හිරසඳබඳු, චන්ද්‍රසූර්‍ය්‍යයන් වැනිවූ; රැස්විහිදෙන, ප්‍රභාවිශෘජ්ජනය වන්නාවූ, හෙවත් පැහැය විහිදෙන්නාවූ; අපමණ, ප්‍රමාණයක් නැත්තාවූ; යස, යසපත්වූ; නිලපෙල විය, ගෘහපඞ්ක්ති වූයේය.

18 ම න හ ර සත්රුවනින් කල දොරටු අටලුසහ බිහිදො ර
පු ර ව ර තුර අතුරු නොවන අනත විහිදි සැදිඑකයු ර
පු ව ත ර මිණි නිකර සපිරි නන්වග සුදුරතු නිලඹ ර
දොරදොර වල සදතිබෙණ අවන්හලින් නොවියඅතු ර

18 මනහර, මනොඥවූ; සත්රුවනින්, සප්තවිධරත්නයෙන්; කල, කරණලද්දවූ; දොරටු, දොරටුය; අටලු සහ, අට්ටාල සමග; බිහිදොර, තොරන්ද (ඇති); පුරවරතුර, උතුම්වූ නගරාභ්‍යන්තර යෙහි; අතුරුනොවන, අතරක් නොවන්නාවූ; එකයුර, එකාකාර යෙන්; අනත විහිදිසැදි, කෙලවරක්නැති වීථියෙන් සැරසුනාවූ; පුවතර, අතිශයින්ප්‍රසිඬවූ; මිණිනිකර සපිරි, මාණික්‍යසමූහයෙන් පිරුණාවූ; සුදු, ශුභ්‍රවර්ණවූ වස්ත්‍රද; රතු, රක්තවර්ණ වස්ත්‍රද; නිලඹර, නීලවර්ණ වස්ත්‍රද (යන); නන්වග, නොයෙක් වර්ගවලින්; දොරදොරවල, දොරදොරවල්හි; සදතිබෙණ, සර්ජිතකොට තිබෙන්නාවූ; අවන්හලින්, ආපණශාලාවෙන් හෙවත් කඩපිල් වලින්; අතුරනොවිය, අතරක් නූවූයේය.

19 සු සැ ට කලාසිප් පරතෙර පැමිණි අනෙක විදුදනහු ද
සු ද ට ඉතා නිපුණ සියලු සරම සතර වෙරැනි අය ද
ලොව ට පිහිට රජමැති සිටු ඈතනතුරු ලත් සෙටහු ද
රු ව ට එපුර දෙවියන්මෙන් සැරූ පමණනැතිව යිබ ද

19 සුසැටකලාසිප්, චතුෂෂ්ටි කලාශිල්පයෙහි; පරතෙරපැමිණි, එතෙරට පැමිණියාවූ; අනෙක විදුදනහුද, නොයෙක් විද්‍යාවන්තා ජනයෝද: සුදට, යුධයෙහි; ඉතානිපුණ, අතිශයින්දක්‍ෂවූ; සියළු සරම සතර, සියලු සංග්‍රාම ශාස්ත්‍රයෙහි; වෙරැනිඅයද, වීයඊවත් ජනයෝද; ලොවට, ලොකයාහට; පිහිට, ප්‍රතිෂ්ඨා ඇත්තාවූ; රජ මැති, රාජාමාත්‍ය තනතුරුද; සිටු, ශ්‍රේෂ්ඨිද (යන;) ඈ, මේආදිවූ; තනතුරුලත්, ස්ථානාන්තර ලද්දාවූ; සෙටහුද, ශ්‍රෙෂ්ඨයෝද; එපුර, ඒ නගරයෙහි; රුවට, රූපලක්‍ෂණයෙන්; පමණනැතිව, ප්‍රමාණ රහිතව; නිබඳ, නිත්‍යයෙන්; දෙවියන්මෙන්, දිව්‍යරාජයන් පරිද්දෙන්; සැරූ, සඤ්චාරණය කළෝය, හෙවත් හැසුරුණෝය.

20 ල ක ළ කමලහරණ සරණිදිවි සිලුඑවි යුග දහදු ල
නි ම ල කනක රඹකඳසුරු එවොර මදන රියෙවිඋකු ල
ද ව ල කිරණ සදිසි වතැති දෙනුවන් සරිවනනිලුපුල
ස ක ල රුවින් සුරඟණදිනු පුරඟණ විසූ හුය පුරතු ල

20 ලකළ, අලඞ්කෘතවූ; කමලහරණ, පියුම්සමානවූ; සරණ, පතුල් ඇත්තාවූ; දිවිසිලුඑවි, දීපශිඛාවන්මෙන් හෙවත් පහන් සිලුමෙන්; යුගදහ උදුල, ජංඝායුග්මයෙන් බබලන්නාවූ; නිමල, නිර්මලවූ; කනකරඹකඳසුරු, ස්වර්ණකදලිස්කන්ධ යුග්මයක් වැනිවූ; එවොර, ඌරු (යුග්මයක්) ඇත්තාවූ; මදන, අනංගයාගේ; රියෙවි, රථචක්‍රයවැනිවූ; උකුල, කටිප්‍රදෙශ ඇත්තාවූ; දවලකිරණසදිසි, චන්ද්‍රයාසමානවූ; වතැති, මුහුණුඇත්තාවූ; නිලුපුලසරිවන, නීලොත්පල සමානවූ; දෙනුවන, නෙත්‍රවඤ්ඤ ඇත්තාවූ; සකලරුවින්, (යනමේ) සියළුරූපශ්‍රී විලාසයෙන්; සුරඟණදිනු, දිව්‍යාඞ්ගණාවන් පරාජය කළාවූ; පුරඟණ, පුරාඞ්ගනාවෝ; පුරතුළ, (ඒ) නගරාභ්‍යන්තරයෙහි; විසූහුය, වාසයකළාහුය.

21 අ ග රු සඳුන් දෙව්දුරු කළුවැල් සිරිපල දූරුපොසො න
ම හ රු නෙරලු පණස කුමුකු ඈ මල් පලතුරැනිතොම් ණ
ඉ දු රු නාදුන් උයන විලස සව්ඉසුරෙන් පිරිඅපම ණ
සොඳුරු උයන් පොකුණු දහස් සුවහස් විය එහි තැන තැන

21 අගරු, අගිල්වෘක්‍ෂය; සඳුන්, චන්දනවෘක්‍ෂය; දෙව්දුරු, දෙවදාර

වෘක්ෂය; කළුවැල්, කාලාගරුය; පොහොසද්දෑ, පුෂ්ප ධාරණයකර ත්තාවූ; සිරිපල, බිල්ව වෘක්ෂය; මහරු, මනහරවූ; නෙරළු, නාළිකෙරවෘක්ෂය හෙවත් පොල්ගස්ය; පණස, පණාවෘක්ෂය හෙවත් කොස්ගස්ය; කුමුකු, ක්‍රමුකවෘක්ෂය හෙවත් පුවක්ගස්හ (යන); ඈ මල්පල, මෙම්ආදී පුෂ්පඵල ඇත්තාවූ; නොමිණ, ප්‍රමාණයක් නැත් තාවූ; මල්පලතුරු ඇති, පුෂ්පඵලවෘක්ෂ ඇත්තාවූ; ඉඳුරු, ශක්‍රදෙවේන්ද්‍රයාගේ; නඳුන්උයන විලස, නන්දනොද්‍යානයමෙන්; අපමණ, ප්‍රමාණයක් නැත්තාවූ; සව්ඉසුරෙන්, සකලෛශ්වර්‍ය්‍යයෙන්; පිරී, සම්පූර්ණවූ; එහි, ඒනගරයෙහි; තැනතැන, තන්හිතන්හි; දහස් සුවහස්, සහශ්‍රලක්ෂගණන් ඇති; සොඳුරු, සුන්දරවූ; උයන් පොකුණුවිය, උද්‍යානපුෂ්කරණීහු වූවාහුය.

22 උර ණ තරුණ රඹරණබිඳ හරණ දෙරණ සතහපිහි ටි
තරු ණ කිර ණ හරණ දවල දළඳුරුතද සුදෙහිබුහු ටි
සුර ණ වරණ සදිසි සියලු සුබලකුණෙන් පිරෙමින්හි ටි
වර ණ වරණ සෙන් එපුරෙහි කෙළසුවහස් විසූගැහැ ටි

22 උරණ, කොපව; තරුණ, තරුණවූ; රඹඅරණ, රම්භාරණ්‍යයන්; හෙවත් කෙසෙල් වනයන්; බිඳහරණ, බිඳහරින්නාවූ; දෙරණ, ධරණීයෙහි හෙවත් පෘථිවියෙහි; සතහපිහිටි, සප්තාඞ්ගයක් ප්‍රතිෂ්ඨිතවූහෙවත් පාසතරආදී අවයවසතක් භූමියෙහි පිහිටියාවූ; තරුණ කිරණහරණ, බාලාර්කයාසමානවූ හෙවත් තරුණ සූර්‍ය්‍ය සමානවූ; දවල, ශුභ්‍රවර්ණවූ; දළඳුරු, දංෂ්ට්‍රා ධාරණය කළාවූ හෙවත් දළ ඇත්තාවූ; තදසුදෙහි, තදවූ ළුබයෙහි; බුහුටි, ප්‍රගල්භවූ හෙවත් දක්ෂවූ; සුරණවරණ සදිසි, ඓරාවත හස්තිරාජයා හාසමානවූ; සියලු සුබලකුණෙන්, සකල ශෝභන ලක්ෂණයන් කාරණකොටගෙණ පිරෙමින්, සම්පූර්ණවෙමින්; සිටි, සිටියාවූ; වරණ, උතුම්වූ; වරණසෙන්, හස්තිසේනාව; එපුරෙහි, ඒ (වගුනම්) නුවරෙහි; ගැහැටි, සඞ්කීර්ණයවී; කෙළසුවහස්, කොටිලක්ෂගණන්; විසූ, වාසයකළාහුය.

23 පොරණ න ර ණ මඳරගිරෙන් කිරණමනන කරණකල ට .
ව ර ණ* නෙවණ දෙසෙහි උලැහි නිමලදවලු තරහරග ට
අ ර ණ හ ර ණ උරණරදුන් තදසටනට සපැමිණිවි ට
දෙර ණ ස ර ණ හයපෙළ එහි බැබලූ දිවහසුන්ලෙස ට

23 පොරණ, පූර්වකාලයෙහි; නරණ, විෂ්ණුහුවිසින්; මඳරගි

* වරුණ, පොත්හි.

රෙන්, මන්‍දුරපර්වතයෙන්; ඛිරණ, ක්ෂීරාර්ණවය, (කිරිමුහුද;) මතන කරණකලට, මථනය කරණකල්හි; (අලලනකල්හි,) නොදෙසෙහි, අනෙකදිශාවෙහි හෙවත් නොයෙක්දික්හි; උලැනි, උල්ලංඝිතවූ හෙවත් උඩට නැංගාවූ; වරණ, උතුම්වූ; නිමල, නිර්මලවූ; දවල, ශුභ්‍රවර්ණවූ; (සුදුපැහැඇත්තාවූ) තරහරහව, තරංගාකාරයෙන් හෙවත් රළමෙන්; තදසටනට, තදවූයුධ(කිරීම)පිණිස; සපැමිණි විට, සම්ප්‍රාප්තවූකල්හි; උරණරජුන්, කෝපවූරජදරුවන්; අරණ හරණ, අරණ්‍යයට හරින්නාවූ; හෙවත් බැද්දට එලවන්නාවූ; දෙරණසරණ, ධරණියෙහි සංචාරණය කරන්නාවූ; හෙවත් භූමියෙහි හැසිරෙන්නාවූ; හයපෙළ, අශ්වපඞ්ක්තීහු; එහි, ඒනගරයෙහි; දිවහසුන්ලෙසට, දිව්‍ය අශ්වයන් පරිද්දෙන්; බැබළු, විරාජමානවූවාහුය; (බැබලූවාහුය)

24 සු දු සිඳු යොදමින් මනරම් රන්දදබැඳ තිබෙන අව ට
මු දු විසිතුරු වතුරු අතුරමින් සැරසිලි කල මොනව ට
රු දු යොබළුන් අවි දරමින් උරසදලා සිපි හැමවි ට
ස ඳු රිවිම්ඬලෙව් දිලියෙන රියපෙළ වැඩිවිය කෙලක ට

24 සුදුසිඳු, ශ්වේතවර්ණ සෛන්ධවයන් හෙවත් සුදු අශ්වයන්; යොදමින්, යොදා; අවට, හාත්පස්හි; මනරම්, මනොරම්‍යවූ; රන්දද, ස්වර්ණධවජ; බැඳ, බන්ධනයකොට; තිබෙණ, තිබෙන්නාවූ; මුදු, මෘදුවූ; විසිතුරු, විචිත්‍රවූ; වතුරු අතුරමින්, වස්ත්‍රාස්තරණය කරමින්; (රෙදිඑලමින්) මොනවට, මනාකොට; සැරසිලිකල, සජ්ජිතකළාවූ; (සැරසිලි කළාවූ.) හැමවිට, සෑමකල්හි; උරසදලා, උරච්ඡදබහා; හෙවත් ,සන්නාහලා; අවිදරමින්, ආයුධ දරමින්; සිපි, සිපියාවූ; රුදු, රෞද්‍රවූ; යොබළුන්, යොධභටයන් ඇත්තාවූ; සඳුරිවිමඬලෙව්, චන්ද්‍රසූර්‍ය්‍ය මණ්ඩලයන්මෙන්; දිලියෙන, දිලියෙන්නාවූ; රියපෙළ, රථපඞ්ක්තිය; කෙලකටවැඩිවිය, කෝටියකට අධිකවූයේය.

25 ස ර සනසර සිරි මඬලග සඳසක්අෑ නනවි රැගෙ න
උ ර සදලා සුරබටයන්හුරු උරෙහුරෙ ගැටිසිටි න
ගොර හුදයට වැදූඑඩියෙන් අඩියක්වත් පසුනොතබ න
ම ර සෙනගට වැඩි පාබල සෙන් එපුරෙහි විසූවටි න

25 සරසන, දුනුය; සර, හීය; සිරි, ශ්‍රීකායයි කියනලද අඬසපිය: මඬලග, කඩුවය; සඳසක්, චන්ද්‍රචක්‍රය (යන) අෑ, මේආදීවූ; නන්අවි, නොයෙක් ආයුධයන්; රැගෙණ, ග්‍රහණයකොට; උරස

දලා, උරච්ඡදය බඟා; (සන්නාහදමා) සුරබටයන්සුරු, දිව්‍යභට
යන් වැනිවූ; උරෙන්උරේ, උරයෙන්උරයෙහි; ගැටීසිටින, සඹවණ
ළෙවලා සිටින්නාවූ; ගෞරයුදයට, දරුණුවූ යුඬපිණිස; වැද්ද, ප්‍රවි
ෂ්ටව; එඩියෙන්, එඩිතරභාවයෙන්; අඩියක්වත් පසුනොතබන,
අඩියක් පමණවත් පස්සට නොතිබන්නාවූ; මරසෙනගට වැඩි,
මාරසෙනාවට වැඩිවූ; පාබලසෙන්, පාබලසෙනාවෝ; එපුරෙහි,
ඒනගරයෙහි; අවටින, හාත්පසින්; විසූ, වාසයකළාහුය.

26 ස ත ත සකත තලත තිනෙත බඹකත සිරිකත කිවිගු රු
ස ව ත වතත අනත තරිඳු දියනෙත් බුද රුදුරු මිතු රු
දි ය ත පසිදු අනත නැණැති තෙදබල දුරුසමත මෙමු රු
වි ත ත යසැති එපුර ඉසුරු වණතසමති වේනකොදසු රු

26 සතත, මහා බ්‍රහ්මරාජයාද; සකත, විෂ්ණු දිව්‍යරාජයාද තලත, බලභද්‍රයාද; තිනෙත, ඊශ්වරයාද; බඹකත, සරස්වතීද; සිරි කත, ශ්‍රීකාන්තාද; කිවි, සිකුරාද; ගුරු, බෘහස්පතීහුද; සවත, ස්කන්දදෙව්ද; හෙවත් කතරගම දෙවියෝද; වතත, ගණේශ්වරයා (ගණදෙවියෝ)ද;අනත, අනන්තනම් නාගරාජයාද; තරිඳු, චන්ද්‍ර යාද; දියනෙත්, සූර්‍ය්‍යයාද; බුද, බුදහුද; රුදුරුමිතුරු, වෛශ්‍රව ණයාද; (යන) දියතපසිදු, ලොකයෙහි ප්‍රසිඬවූ; අනත නැණැති, අනන්තවූ ඥානය ඇත්තාවූ; තෙදබලදුරු, තෙජස්හා බලදරූ; සමතමෙමුරු, මේසියළුම දෙවියෝ; විතතයසැති, පතළාවූ ඓශ්ව ර්‍ය්‍ය ඇත්තාවූ; එපුර, ඒනගරයෙහි; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය; වණත, වර්ණනාකරත්හොත්; සමති; සමර්ථවෙත්ද; සුරු, (වර්ණනාකිරීමට) දක්‍ෂවූවෝ; වෙනකොද, වෙනකොයින්ද?

---

27 මෙලෙස පිරිහැම පුරහ සිරි නොමි ණා,
ගරුතර; එවගුනම් පුරවරෙහි මනනද නා
දි සැ ස කුලවර තිලකවන සොබ ණා,
රුපුගජ; වනසකල හරි විකුම්සිරි දර ණා
තු නැ ස රුපු දිනු අනගි තු තු රුවිනා,
සුර පති; සදිසි සව්සිරිබරින් නිති දිලෙනා
ස තො ස කරමින් පමණ නැති නෙද නා,
විගුනම්; රජතුමෙක්විය ගුණ දහම්රකිනා

27 මෙලෙස, මෙයාකාරයෙන්; නොමිණා, ප්‍රමාණයක් නැත් තාවූ; හැමපුරහසිරි, සකල නගරාංගශ්‍රීයෙන්; පිරි, සම්පූර්ණවූ; මන නදනා, චිත්තසන්තොෂය කරන්නාවූ;ගරුතර, අතිශයින් ගරුවූ;

එවගුනම් පුරවරෙහි, ඒ වගුනම්වූ උත්තම නගරයෙහි; සොබනා, සොභනවූ; දියැසකුලවර, උතුම්වූ සූයඝී වංශයට; තිලකවන, තිලකාභරණයක් වැනිවූ; රුපුගජ, ශත්‍රුනැමැති හස්තීන් හෙවත් සතුරු රජනැමැති ඇතුන්; වනසකල, විනාශකළාවූ; හරිවිකුම්සිරි දරණා, සිංහරාජවික්‍රමශ්‍රිය දරන්නාවූ; අනඟි, අනඝිවූ; තුනුරුවිනා, ශරීරශ්‍රිය කරණකොට ගෙණ; තුනැස රුපුදිනූ,(පූරාණ)අනංගයා පරාජයකළාවූ; නිති, නිරන්තර රයෙන්; දිලෙනා, දිලියෙන්නාවූ; සව්සිරිබරින්, සකලෛශ්වය්‍යී භාරය කරණකොට ගෙණ; සුරපතිසදිසි, ශක්‍රදෙවෙන්ද්‍රයාහා සමානවූ; පමණනැති, ප්‍රමාණාතික්‍රාන්තවූ, නෙදනා,නොයෙක්ජනයන්; සතොසකරමින්, සන්තුෂ්ටකරමින්; ගුණදහම් රකිනා, ගුණධර්මය රක්‍ෂාකරන්නාවූ; වගුනම්, වගුනම්වූ; රජතුමෙක්විය, රාජෝත්තම කෙණෙක් වූයේය.

28 ප ව ර දසවිද ලකුණුදැරූ සක සා, මෙම රජ; මෙතින් ජයගෙණ හලේ රුපු නොතා සා
වි ත ර නැති තද තෙදින් සරි දියැ සා, කුළුණෙන්; අමා කිරණෙව් බැබලි හැම දව සා
අ ම ර ගුරු නත සවන කිවි අටැ සා, වි දු ර ත; දිනූ පැනම්ණ රුවන කර සදි සා
නිතර දෙන යදි ගණටඑකවිල සා, තිලිනෙන්; සුරබි සුරතුරු ගණට කළෙඅය සා

28 පවර,උතුම්වූ; දසවිදලකුණු, දසවැදෑරුම්වූ ලක්‍ෂණයන් සකසා, සකස්කොට; දැරූ, ධාරණයකළාවූ; මෙමරජ, මේරජතෙමේ; මෙතින්, මෛත්‍රිය කරණකොට ගෙණ; රුපු. ශත්‍රුජනයන්; නොතසා, සන්ත්‍රාසනොකොට; හලේ, පහකළේය; විතරනැති, ප්‍රමාණයක්නැත්තාවූ; තදතෙදින්, දැඩිවූ තෙජස කරණකොට ගෙණ; දියැසාසරි, සූයඝීයාහා සමානවූයේය; කුලුණෙන්, කරුණාව කරණකොටගෙණ; හැමදවසා, සෑමකල්හි; අමාකිරණෙව්, චන්ද්‍රයාමෙන්; බැබලී,භ්‍රාජිතවූයේය; හෙවත් බැබලූයේය; අමරගුරු, වෘහස්පතිහුද: නත, අනන්තනම් නාගරාජයාද; සවන, කුමාරදෙවියාද; කිවි, සිකුරාද; අටැසා මහාබ්‍රහ්මරාජයාද; විදුරත, ශක්‍රයාද; (යනමේ දිව්‍යරාජයන්) දිනූ, පරාජයකළාවූ; පැන, ප්‍රඥානැමැති; මිණ, මාණික්‍යයන්ට; රුවනකරසදිසා, රත්නාකරයක්හා සමානවිය; හෙවත් සමුද්‍රය සමානවූයේය; නිතර, නිරන්තරයෙන්; යදිගණට, යාචක සමූහයාහට; එකවිලසා, ඒකාකාරයෙන්; දෙන, දානයකරන්නාවූ; තිලිනෙන්, ත්‍යාගය කරණකොට ගෙණ; සුරබි,

සුර හිධෙනුකාවග; සුරතුරු, කල්පවෘක්‍ෂය; ගණට, මෙසය (යන මොවුන්ට;) අයසාකෙළේ, අයසකෙළේය හෙවත් යනමොවුන් පරාජය කෙළේය.

29 නිස ල වන දිරි බෙලෙන් මෙර අයු රා, හ රි ස ඳ; නිරිඳුවැනි සබවසට අති මිහි රා
නකු ල රජ දිනූ හය සරම සත රා, සි ව් සැ ට; කලා සිප් සමුදුරෙහි පත් එත රා
වි පු ල දසවිද දන්වතුන් නිත රා, වෙසතුරු; නිරිඳු මෙන් දුයි සතක් සිත් සපු රා
සක ල රජදම් නොහැර් එක අයු රා, ර කි මි න්; මෙරජසත තුටුකළේ නොමවිත රා

29 නිසලවන, නිශ්චලවන්නාවූ; හෙවත් (ලාභාලාභාදීන්හි)කම්පානොවන්නාවූ; දිරිබෙලෙන්, ධෛර්‍ය්‍ය්‍ය්‍යහා බලය කරණකොටගෙණ; මෙරඅයුරා, මහාමෙරු පර්වතරාජයා වැනිවූ; අතිමිහිරා, ඉතා මිහිරිවූ; සබවි සට, සත්‍යවචනයට; හරිසඳ නිරිඳුවැන්, හරිශ්චන්ද්‍ර නරේන්ද්‍රයාවැනිවූ; හයසරමසතරා, අශ්වසංග්‍රාම ශාස්ත්‍රය කරණකොටගෙණ; නකුලරජදිනූ, 'නකුල' (නම්)නරේන්ද්‍රයා පරාජයකලාවූ; සිව්සැට කලාසිප්, චතුෂ්ෂෂ්ටිකලා ශිල්පනැමැති; සමුදුරෙහි, සමුද්‍රයෙහි; එතරාපත්, එතරට පැමිණියාවූ; නිතරා, නිරන්තරයෙන්; 'වෙසතුරු' නිරිඳුමෙන්, වෙස්සන්තර නරොත්තමයානන් මෙන්; විපුල; මහත්වූ; දසවිද දන්වතුන්, දසවැදෑරුම්වූ දාන වස්තූන් කරණකොටගෙණ; සතන්, සත්වයන්ගේ; සිත්, චිත්තයන්; සපුරා, සම්පූර්ණකොට; සකල රජදම්, සියලු රාජධර්මයන්; නොහැර, අත්නොහැර; එකඅයුරා, එකාකාරයෙන්; රකිමින්, රක්‍ෂාකරමින්; මෙරජ, මේරජතෙමේ; නොමවිතරා, ප්‍රමාණයක්නැත්තාවූ; සත, සත්වයන්; තුටුකළේ, සන්තුෂ්ටකෙළේය.

30 එ පු ර ඹර මැති බදුරු තුරු පබ ඳ, මැ ද නි ති; දිලෙන ලෝවැඩ පිණිස රජතරී ඳ
ප ත ර අම්තුරු සතුරු රජහමු ඳ, සි ය ප ත්; මුකුළුවිය එක ලෙසට ලෙව්සැම ඳ
ප ව ර නෑසිය මිතුරු කොඳ නොම ඳ, පො බ විය; ගුණසුවඳරැස් දෙසනුදෙස විහි ඳ
ලත ර කුබුදුක් අඳුරුහැම නොර ඳ, දු රු වි ය; මෙත්කිරණ සත්ලොවට වැදෑනිබ ඳ

30 එපුරඹර, ඒනගරාම්බරයෙහි; (ඒනුවරනැමැති ආකාශයෙහි) මැති, මිත්‍රීනැමැති; බදුරු, මහාවූ; තුරුපබඳ, තාරකා සමූහයාගේ; මැද, මධ්‍යයෙහි; නිති, නිරන්තරයෙන්; ලෝවැඩපිණිස, ලොකයාහටවැඩ

පිංණිස; රජතරිඳ, රාජනැමැති චන්‍ද්‍රයා; දිලෙත, දිලියෙනකල්හි; ලෙව්, ලොකයෙහි; සැමඳ, හැමකල්හි; පතර,-මහත්වූ; අම්කුරු, අම්‍රුවූ; සතුරුරජසමුඳ, ශත්‍රුරාජසමූහනැමැති; සියපත්, ශතපත්‍ර හෙවත් පියුම්; එකලෙසට, එකාකාරයෙන්; මුකුළුවිය, මුකුලිතවූයේය; හෙවත් හැකිලීමටගියේය; ගුණ, ගුණනැමැති; සුව දරුස්, සුගන්ධසමූහය; දෙසනුදෙසැ, දිශානුදිශාවන්හි; විහිඳ, විහිදීලා; නොමඳ, අමන්‍දවූ හෙවත් බොහෝවූ; පවර, උතුම්වූ; නැසියම්තුරු, සකීය ඤතිමිත්‍රනැමැති; කොඳ, කුන්දයහෙවත්වෑකොඳ; පොබවිය, ප්‍රබොධවූයේය; හෙවත් පිපුණේය; නිබඳ, නිරන්තරයෙන්; මෙත්කිරණ, මෛත්‍රීනැමැතිකාන්තිය; සත්ලොවට, සත්වලොකයාහට; වැදා, වැදීලා; ලතර, විත්‍රාභ්‍යන්තරයෙහි; තුබු, තිබුනාවූ; හැමදුක්අඳුරු, සකල දුඃඛාන්ධකාරය; හෙවත් දුක්නැමැති අන්ධකාරය; නොරඳ, රැඳීමනොකොට; දුරුවිය, දුරුවූයේය.

| | | |
|---|---|---|
| 31 එ ර ද දිනිසුරු තදතෙදින් දිලෙ | නා, ර ද නි ය; | සොඳුරු යුගඳුරු මුදුන්පත් කෙණෙනා |
| නොම ද රෝදුක් දුබික්බිහ නොම් | නා, ග ණ දුරු; | අතුරුදන් විය මිහිතෙලෙහි තිබෙ නා |
| සු හ ද නැසිය චර තඹර අර | ණා, න ද වි ය; | ඔවුන් සහ සපදනට මදුදෙම් නා |
| දු හ ද රුපු මහවත්හු ලෙව්වස | නා, තැනතැන; | ගියෝ මහවනලැහැප් වැදූ සෙදි නා |

31 තදතෙදින්, සම්බධවූ තෙජස කරණකොටගෙණ; දිලෙනා, දිලියෙන්නාවූ; එරද දිනිසුරු, ඒරාජනැමැති දිනෙශ්වරයා; රදනිය, රාජනිති නැමැති;සොඳුරු, සුන්‍දරවූ; යුගඳුරු, යුගන්ධර පර්වතයාගේ; මුදුන්, මස්තකයට; පත්කෙණෙනා, ප්‍රාප්තක්ෂණයෙහි; හෙවත් පැමිණියාවූ කාලයෙහි; මිහිතෙලෙහි, මහීතලයෙහි හෙවත් පොලෝමතුපිට; තිබෙන, තිබෙන්නාවූ; නොමඳ, අමන්‍දවූ; රෝදුක් දුබික් බිහ, රෝගදුඃඛ දුර්භික්ෂ භයනැමැති; ගණඳුරු, ඝනාන්ධකාරය; නොම්නා, නොබෝසෙයින්; අතුරුදන්විය, අන්තර්ධානවූයේය; සුහද නැසිය, සුහෘදයන්හා සකීය ඤතිජනනැමැති; චරතඹර අරණ, උතුම්වූ තාමරසාරණ්‍යය හෙවත් උතුම්වූ පියුම්වනය; ඔවුන්සහ, ඔවුන්හාසමග; සපදනව, සම්පදීන්ට හෙවත් භෘංගයන්ට; මදුදෙම්නා, මල්පැනි දෙමින්; නදවිය, සන්තුෂ්ටවූයේය; ලෙව්, ලොකයෙහි; වසනා, වාසයකරන්නාවූ; දුහද, දුෂ්ටසිත්ඇත්තාවූ; හෙවත් නපුරුසිත්ඇති; රුපු, ශත්‍රුනැමැති හෙවත් සතුරන්නැමැති; මහවත්හු, උළුකපක්ෂීහු හෙවත්

බකමුහුනෝ; සෙදිනා, සිඟුව හෙවත් වහා: මහවනලැහැප්වැදැ, මහා වනලැහැබවලට වැදීලා; තැන තැන, තන්හි තන්හි; ගියෝ, ගමනය කළෝය.

32 පෙ ර සුසිරි නෙලුඹලින් දිනු ලක ලා, ව ගු පු ර; තඹර කරමැද දිලෙන නිති විපු ලා
තො ර නොවම ගුණ සුවඳ පිරිනිම ලා, ද ස ර ද; දහම් පිවිතුරු මුවරදිනි අව ලා
ස ර අටට සිප් කොමල දලි නුදු ලා, සත වෙත; පතල මහමෙත් කෙම් සිරිනි බබ ලා
ව ර මිතුරු තෑ සපද නදකර ලා, දිලු මෙන්; කමල සිරිලදී එරජ කල්සිය ලා

32 පෙර,පූර්වයෙහි (කරණලද්දාවූ); සුසිරි, සුවරිතනැමැති; නෙලුඹලින්, නෙලුඹුදලිය හෙවත් නෙලුම්අලය කරණකොටගෙණ; දිනූ,ජනිතවූ හෙවත් උපන්නාවූ; ලකලා,අලඞ්කෘතවූ; වගුපුර,වංගනගර නැමැති;තඹරකර මැද, තාමර සාකරයාගේ මධ්‍යයෙහි; හෙවත් පියුම්විලමැද; නිති, නිරන්තරයෙන්; දිලෙන, දිලියෙන්නාවූ; විපුලා මහත්වූ; නොරනොවම්, අතුරුනැතිවම්; නිමලා, නිර්මලවූ; ගුණ, ගුණනැමැති; සුවඳපිරි, සුගන්ධයෙන් පිරුණාවූ; දසරදදහම්, දශරාජධර්මනැමැති; පිවිතුරු, පවිත්‍රවූ; මුවරදිනි, මකරන්දයන් කරණකොටගෙණ; හෙවත් මල්පැනිකරණකොටගෙණ; අවලා, ආකූලවූ;(ගැවසීගත්තාවූ)සර, සාරවූ; අටඅටසිප්, චතුෂෂ්ටි සිල්පනැමැති; කොමල, කොමලවූ; (මොලොක්වූ)දලිනි, පත්‍රකරණකොටගෙණ; උදුල, උජ්වලිතවූ;(බබලන්නාවූ) සතවෙත, සත්වයන් කෙරෙහි; පතල, ප්‍රසාරිතවූ; හෙවත් පැතුරුණාවූ; මහමෙත්, මහත්වූ මෛත්‍රීමයවූ; කෙමි, කර්ණිකානැමැති; සිරිනි, ශ්‍රීය (සොභාව) කරණකොටගෙණ; බබලා, බබලන්නාවූ; වර, උතුම්වූ; මිතුරු, මිත්‍රයන්හා; තෑ, ඤාතීන්නැමැති; සපද, ෂට්පදීන්; නදකරලා, සන්තුෂ්ටකොට; දිලුමෙන්, දිලිහිමෙන්; එරජ, ඒරාජතෙම; සියලාකල්, සකලකාලයෙහි; කමල සිරිලදී, පද්මශ්‍රියක් (පියුමක්හුගේසොභාව) ලද්දේය.

33 ස ත ර වතසර රුදු මුවතඹ රා, සි රි ස ද; නිතර විසුවර රුසිරු උරමැඳු රා
ස ත ර සඳහම් තබා සිත අත රා, දු සි රි ත; දුරින් දුරුකර ලමින් එකපැහැ රා
ස ත ර අවදුක් මුලින් සිඳ උදු රා, මොක්සිරි; ලබනුවස් පින් කරවැජඹි නිත රා
ස ත ර සඟරා වතින් දත නිත රා, තුවු ක ර; රජ කරණසඳ එරජ නර පව රා

33 සතරවනපසර, සරශවතී කාන්තාව විසින්; රුදු, රදනා ලද්දවූ; මුවනඹරා, මුඛනැමැති තාමරසයක් ඇතිව; හෙවත් මුවපියුමක් ඇතිව; සිරිසඳ, ශ්‍රීකාන්තාව විසින්; නිතර, නිත්‍යයෙන්; විසූ, වාසයකරණලද්දවූ; වර, උතුම්වූ; රුසිරු, මනොඥවූ; උරමැඳුරං, වක්ෂස්ථලනැමැති මන්දිරයක් ඇතිව; සතරසදහම්, ශාස්තෘන්වහන්සේගේ; සද්ධර්මය; සිතඅතරා, චිත්තාභ්‍යන්තරයෙහි; හෙවත් සිතඇතුලෙහි; තබා, ස්ථාපණයකොට; (පිහිටුවා); දුසිරිත, දුශ්චරිතයන්; එකපැහැරා, එකපැහැර; දුරින්, දුරින්ම; දුරුකරලමින්, දුරුකොටලමින්; සතරඅවදුක්, සතරඅපාය දුඃඛයන්; මුලින්සිඳැ, මුලින් ඡෙදනයකොට; උදුරා, උඩරණයකොට; හෙවත් උගුලා; මොක්පුරි, මොක්ෂශ්‍රීය; ලබණුවස්, ලබණුපිණිස; නිතරා, නිරන්තරයෙන්; පින්කර, පින්කම්කර; වැජඹි, විජෘම්භමානව; නිතරා, අනවරතයෙන්; සතරසඟරාවතින්, චතුස්සඞ්ග්‍රහ වස්තුවෙන්; දන, ජනයන්; තුටුකර, සන්තුෂ්ටකොට; එනරපවරා, ඒ නරොත්තමයා; රජකරණසඳ, රාජ්‍යයකරණකල්හි.

---

34 මෙලෙස කළ දියන ද
එරදුට උතුම් ගුණබ ද
දූවන කලිඟුර ද
බිසෝරුවනක්වීය මනන ද

35 සුරගණ පරදව න
එබිසව රුවැති අපම ණ
නලලතෙහි වරඟ ණ
සැදූතිලකෙව් බැබලිහැමදින

34 මෙලෙස, මෙයාකාරයෙන්; දියනාදකල, ජගත් නන්දනය කලාවූ; (ලොකයාසතුටුකලාවූ) උතුම්ගුණබද, උත්තමගුණයෙන් බඩවූ, හෙවත් උතුම්ගුණයෙන් බැඳුනාවූ; එරදුට, ඒරාජයාහට; කලිඟුරද, කාලිංග රාජයාහට; දූවන, දුහිතෘවූ; මනනද, මනොනන්දනීයවූ; බිසෝරුවනක්, කුමාරිකාරත්නයක්; වීය, වූයේය.

35 සුරගණපරදවන, දිව්‍යාංගණාවන් පරාජයකලාවූ; අපමණ, අප්‍රමාණවූ; රුවැති, රූපලක්ෂණ ඇත්තාවූ; එබිසව, ඒරාජකන්‍යාතොමෝ; වරඟණ, උත්තම කාන්තාවන්ගේ හෙවත් උතුම්ස්ත්‍රීන්ගේ; නලලතෙහි, ලලාටයෙහි; (නළලෙහි) සැදූ, සජ්ජිතකලාවූ; තිලකෙව්, තිලකාභරණයක්මෙන්; හැමදින, සැමකල්හි; බැබලි, බැබලුනාය.

36 සැමතිරි ලකුණු දැ රූ
ගුණයෙන් සපිරි සිසිලු රූ
එබිසවගෙ පියකා රූ
රුසිරු සැකෙවින් කියමි විසිතු රූ

36 සැම ඉතිරිලකුණු දැරූ, සකල සත්‍රීලක්‍ෂණ ධාරණය කළාවූ; ගුණයෙන්, ගුණය කරණකොට ගෙණ; සපිරිසිසියුරූ, සම්පූර්ණ චක්‍ෂුයාවූ තිඳු; පියකරූ, (ප්‍රටුවන්) ප්‍රියකරන්නාවූ; එබිසවගෙ, ඒ රාජ කුමාරිකාවගේ; විසිතුරූ, විචිත්‍රවූ; රුසිරූ, රුචිරභාවය ගෙවත් මනාවූ රූපවිලාසය; සැකෙවින්, සංක්‍ෂෙපයෙන්; කියමි, කථනයකෙරෙමි; හෙවත් කියනෙමි.

---

37 ව ර ල මියුරු පිල් අඳු රා, ප වු,
නළ ල ඩ ඇදරද මෙන් දිලිපව රා
උ දු ල දෙබැම් නිඹ පත රා, දි සි,
ල ක ල ගහණ රණකුස ලෙස නිතරා

37 වරල, කෙශකලාපය; මියුරුපිල්අඳුරා, මයුර පිඡාකලාපයක් මෙන්ද; හෙවත් මොනරපිලි මිටියක් මෙන්ද; පවු, පවුවූ; නළල, ලලාටයතෙම; පවරා, උතුම්වූ; අඩදදරදමෙන්, අර්ධචන්‍ද්‍රයා මෙන්ද; උදුල, උජ්වලිතවූ; දෙබැම, භ්‍රැයුග්මය; හෙවත් බැමදෙක; දිසි, දෘශ්‍යමානවූ; නිඹපතරා, කොසඹපත්‍ර දෙකක්මෙන්ද; ලකල, අලංකෘතවූ; ගහණ, ඝ්‍රාණයතෙම; රණකුසලෙස, ස්වර්ණාංකුසයක්මෙන්ද; නිතරා,නිරන්තරයෙන්; දිලි,දිලිහුනේය.

38 සු නි ල නෙනිඳුවර හර නා, නව
ප බ ල දලසෙ දෙයදර දිලි නොමිනා
නි ම ල දසන් කොඳ පෙලි නා, සුනු
කා ම ල සදිසිවිය එබිසව මුහු නා

38 ඉඳුවරහරනා, නිල්මහනිල්පෙතිගා සමානවූ; සුනීල, ඉතා නිලවර්ණවූ; නෙත්, නෙත්‍ර යුග්මයකින්ද; නොමිනා, බොහෝසෙ සින්; දිලි, දිලියෙන්නාවූ; නව, අභිනවවූ, හෙවත් ලපටිවූ; පබල දලසෙ, ප්‍රවාලාංකුරමෙන්; දිලි, දිලියෙන්නාවූ; දෙයදර, අධර යුග්මයක් ඇත්තාවූ; (තොල්දෙකක් ඇත්තාවූ) නිමල, නිර්මලවූ; දසන්, දන්තානැමැති; කොඳපෙළිනා, කුන්දපඞ්ක්තියකින්ද; සුනු, සූක්‍ෂ්මවූ; එබිසව, ඒරාජකන්‍යාවගේ; මුහුනා, වක්ත්‍රයතෙම; කමලසදිසිවිය, පද්මයක්හා සමානවූයේය.

39 ගෙළ කුමුකුවටසෙ බබ ලා, පිරි,
දු ල පියයුරු රන් ගසපැටි යුව ලා
අ ල ගද රදු කර සහ ලා, වර,
ම ල විය රියසක සිරිගත් උකු ලා

39 පිරි, සම්පූර්ණවූ; ගෙල, ග්‍රීවයතෙම; කුමුකුවටගෙ, පුවක්වට ගක්මෙන්; බබලා, බබලයි; උදුල, උජ්වලිතවූ; පියයුරු, පයොධර නැමැති; රන්හස පැපිසුවලා, සුවර්ණහංශ පොතක යුග්මයකින්ද; අලගදරද, දියබරණරාජයන් දෙදෙනෙකුවැනිවූ; කරසහල,හස්ත යුග්මයකින්ද;වර, උතුම්වූ; මලවිය,අනංගයාගේ; රියසක,රථචක්‍ර සාගේ,සිරිගත්, ශොභාග්‍රහණයකලාවූ; උකුලා,කටිපෙදෙසකින්ද.

40 ව ර ණ කරෙවු මුදු වටො රා, දන,
දි ලෙ න උතුරු ශිඳු බුබුලුසෙ නිත රා
ත රු ණ තැඹිලිමල් අඹු රා, දහ,
ම ද න සතුටුකර බැබලී නොව රා

40 වරණකරෙව්, හස්තිසොඬයක්මෙන්; මුදු, මෘදුවූ; වටොරා, වෘතෝරු යුග්මයකින්ද; ( වටවූ කලවා දෙකකින්ද ) නිතරා, නිත්‍යයෙන්; උතුරුසිඳු, උත්තරසාගරයෙහි ( නැංගා ) වූ; දිලෙන, දිලියෙන්නාවූ; දන, ජානුයුග්මයක්ඇත්තාවූ; තරුණ, තරුණවූ. තැඹිලිමල්අඹුරා, සත්නිර පුෂ්පාකාරයෙන්. දහ, ජංඝායුග්මය. ‍හෙවත් කෙඬාදෙක, නොවරා, නොවලහා. මදන, අනංගයා. සතුටුකර, සන්තොෂකොට. බැබලී, බැබලුයේය.

41 කොම ල සුපිපි සර සදි සා, පද,
යු ව ල මලවිරද තුටුකළ නොලෙසා
නි ම ල කනක පලු විල සා, දිගු,
ල ක ල ඇඟිලි පෙල දිලි පදසර සා

41 නොලෙසා, අනලස්ව; කොමල, කොමලවූ; සුපිපි, මනා වපිපුනාවූ; සරසදිසා, පද්ම යුග්මයක්සමානවූ; මලවිරද. අනංගයා; තුටුකළ, සන්තුෂ්ටකළාවූ; පාදයුවල, පාදයුග්මය; නිමල, නිර්මලවූ; කනකපලුවිලසා. රත්රන් පල්ලවාකාරවූ; දිගු, දිඝීවූ; ලකළ. අලංකෘතවූ; ඇඟිලිපෙල, අංගුලිපඞක්තිය, පදසරසා, පාද සන්සජ්ජිතකොට; දිලි, දීප්තිවූයේය.

42 ව ර වදන සුපිරි සඳි නා, පද,
ස රු ඟිලි දල රුදි අමබිදු ලෙසි නා
තොර නොව දිලි නිය පෙලි නා, යස,
ස ර එබිසව වෙර රූසිරි කෙව ණා

42 වර, උතුම්වූ; වදන, මුඛ නැමැති; සුපිරිසඳිනා, සම්පූර්ණ චන්ද්‍ර මණ්ඩලයකින්හා; පද, පාදනැමැති; සර, පද්මයෙහි; ඇඟිලිදල, අංගුලිනැමැති පත්‍රයන්හි; රුදි, රජිතවූ; අමබිඳුලෙසිනා, අමෘතබින්දු පරිද්දෙන්; තොරනොව, තොරනොවී; දිලි, දිලියෙ

න්නාවූ; නිය පෙළිනා, නබ පඞනීයකින්ද යුක්තවූ; යසසර, කීර්තිසාරවූ; එබිසව, ඒ රාජකුමාරිකාවගේ; වෙර, ශරීරයෙහි; රූසිරි, රූපශ්‍රිය, කෙවණා, කවරෙක් වර්ණනාකෙරේද.

43 හෙ ල් මැලි සිව්මැලි කොම ලී, මිහි,
ප ල් මිහිලොල්ලොබ කළපුල්කම ලී
දු ල් සිරිකල් දිනු ලක ලී, හැම,
ක ල් මුදුනතමල්කඩමෙන් බැබැ ලී

43 හෙල්මැලි, කහ්ලාරමෙන්: සිව්මැලි, සුබුමාලිනීවූ; කොමලී, කොමලවූ; මිහිපල්, මහීපාලනැමැති; මිහිලොල්, හෘඬග යන්විසින්; ලොබකළ, ලොභකළාවූ; පුල්, ඵුල්ලවූ; හෙවත් පිපුනාවූ; කමලී. පද්මයක්වැනිවූ; දුල්උජ්වලිතවූ; සිරිකල්, ශ්‍රීකානතාව; දිනු, පරාජයකළාවූ; ලකලී, අලංකෘතවූ; (ඒ කුමාරිකාතොමෝ) හැමකල්, සකලකානතාවන්ගේ; මුදුනතැ, මස්තකයෙහි; මල්කඩමෙන්, පුෂ්ප බඬයක් මෙන්; (මල්දමක් මෙන්) බැබලී, භ්‍රාජිතවූවාය.

44 සු ර තු ර මනහර හර ණා, යදී,
නඳ ක ර නිරතුර දෙනසර තිලි නා
ගරු ත ර පුරඳර අඟ ණා, යුරු,
හැම ව ර එබිසව ඉසුරෙන් දිලු ණා

44 යදී, යාචකජනයන්; නඳකර, සන්තොෂකොට; නිරතුර, නිරනතරයෙන්; දෙන, දානයකරන්නාවූ; සර, සාරවූ; තිලිනා, ත්‍යාගය කරණකොටගෙණ; මනහර, මනොඥවූ; සුරතුරහරණා, දිව්‍යවෘක්ෂයක් සමානවූ; ගරුතර, ගෞරවතරවූ; පුරඳරඅඟණා යුරු, ශක්‍රදෙවෙන්ද්‍රයාගේ භාර්‍ය්‍යාව්වැනිවූ; එබිසව, ඒකුමාරිකාතොමෝ; හැමවර, සෑමකල්හි; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; දිලුනා, දිලිහුනාය.

45 ස ත ත පමද සිරි ගිරි දු, සරි,
අ න ත ගැඹුරුපැනයෙන්ලොවැපසිදු
ස ම ත කතුන් මත හුසැ දු, මිණි,
ස ගි ත කිරුළුමෙන් දිලි එම රජ දු

45 සතතපමද, වාඬ්වනිතාව්ය; හෙවත් සරශ්වතීනම් දිව්‍යාංගණාවය; සිරි, ශ්‍රීකානතාවය; ගිරිඳු, පාර්වතීය; හෙවත් උමාවය; (යනමොවුන්හා) සරි, සමානවූ; අනත, අනනතවූ; ගැඹුරු, ගම්භීරවූ; පැනයෙන්, ප්‍රඥාවකරණකොටගෙණ; ලොවැ, ලෝකයෙහි; පසිදු, ප්‍රසිඬවූ; සමතකතුන්, සියලු ස්ත්‍රීන්ගේ; මතා, මස්තකයෙහි;

කාශයකී; සුසැඳු, මනාව සජ්ජිතකළාවූ; මිණිසගිත, මාණික්‍යය ඝිතවූ; කිරුළුමෙන්, කිරීටාභරණයක්මෙන්; එමරජඳු, එමරාජසිං හාසනාමෙන්; දිලි, දිලුනාය.

46 සි රි ප ති සුරපති නත නං, ගුරු,
තු රු ප ති පසුපති රතිපති සුමනා
ග ණ ප ති සග මෙ මුරුග නා, හැර,
නොසම ති කීමට වෙනඅය ඇගු ණා

46 සිරිපති, විෂ්ණුය; සුරපති, ශක්‍රයාය; නතනං, අනන්තනම් නාගරාජයාය; ගුරු, බෘහස්පතිය; තුරුපති, චන්ද්‍රයාය; පසුපති, ඊශ්වරයාය; රතිපති, අනංගයාය; සුමනා, සමන්දෙවියය; ගණප තිසග, ගණේශ්වරයාහා; මෙමුරුගණහැර, මේදීසමූහයාහැර; වෙනඅය, අන්‍යජනයෝ; ඇගුණා, ඒ රාජකුමාරිකාවගේ ගුණය න්; කීමට, කථනයකිරීමට; නොසමති, සමර්ථයෝ නොවෙත්.

47 මෙලෙස රුසිරු ගුණ ගහ ණා, සොඳ,
එ බි ස ව අගමෙහෙසුන්කරපෙම්ණා
සතො ස ව සුරපති සිරි නා, නොව,
වෙ න ස සඳේ ලපලෙසවිසු දෙදෙණා

47 මෙලෙස, මෙපරිද්දෙන්; රුසිරු, මනොඥවූ; ගුණගහණා, ගුණයෙන් ගැවසීගත්තාවූ; සොඳ, යහපත්වූ; එබිසව, ඒරාජකු මාරිකාව; පෙම්නා, ප්‍රේමයෙන්; අගමෙහෙසුන්කර, අග්‍රමහෙසි කාවක්කොට; සතොසව, සන්තුෂ්ටව; සුරපතිසිරිනා, ශක්‍රදෙවෙ න්ද්‍රයාගේ ලීලාවෙන්; වෙනසනොව, වෙනස්නොවී; දෙදෙනා, ඒදෙදෙනා; සඳේ, චන්ද්‍රයාගේ; ලපලෙස, ලාංඡනයමෙන්; විසූ, විසූවාහුය.

---

48 පුව ත ර එවගු, නම් නරවර ණා
මන හ ර බිස ව, සමගින් යෙහෙ ණා
පිය ත ර එපස්, කම්සැප නොම් ණා
සිත ගු ර විදින, කල සහතොස් ණා

48 පුවතර, ප්‍රසිද්ධවූ; එවගුනම් නරවරණා, වගුනම් ඒ රාජෝ ත්තමතෙමේ; මනහර, මනොහරවූ; බිසවසමගින්, (ඒ) රාජකු මාරිකාවහාසමග; යෙහෙනා, යහපත්පරිද්දෙන්; නොම්ණා, ප්‍රමා ණයක්නැතිව; පියතර, අතිශයින් ප්‍රියවූ; එපස්කම්සැප, එපඤ්ච කාම සම්පත්තිය; සහතොසිනා, සන්තොෂයෙන්; සිතගුර, සිත් වූපරිද්දෙන්; විඳිනකලැ, විඳිනයකරණ කාලයෙහි.

49 යස පිරි එ රජ්, වෙනුවට සතු වා
කුස දරු ගැබෙක්, විය එබිසව වා
බිස වුන් එ බව, කීකල රජ් වා
අස මින් සතු වු, නරනිඳු එවි වා

49 යසපිරි, ඓශ්වර්යයෙන් පිරුණාවූ; සතුවා, සන්තුෂ්ටවූ; එ රජ්වෙනුවට, ඒ වගුනම් නරෙන්ද්‍රයා පිණිස; එබිසවටා, ඒමහෙසිකාවගේ; කුස, කුක්ෂියෙහි; දරුගැබෙක්, දරුගැබක්; විය, ඇතිවූයේය; බිසවුන්, මහෙසිකාව විසින්; රජ්වා, රජ හට; එබව, ඒභාවය; කීකල, කථනයකල කල්හි; අසමින්, ශ්‍රවණයකරමින්; සතුවු, සන්තුෂ්ටවූ; නරනිඳු, නරෙන්ද්‍රතෙම; එවිටා, එකල්හි.

50 රැස් කරව මින්, නුවරුන් සිය ලූ
දෙස් නොවඑපුර, සරසා ලකු ලූ
තොස් වඩව මින්, සතියක්මමු ලූ
විස් තරව ගැබ, පෙළහර කර ලූ

50 සියලුනුවරුන්, සකල නාගරික ජනයන්; රැස්කරවමින්, එකතුකරවමින්; එපුර, ඒනගරය; දෙස්නොව, නිර්දෝෂව; ලකුලු, අලඞ්කෘතව; සරසා, සජ්ජිතකොට; සතියක්මමුලූ, සතියක් මුලුල්ලෙහිම; තොස්වඩවමින් සන්තොෂ වර්ධනය කරමින්; විස්තරව, විස්තරකොට; ගැබ පෙළහර, ගැබ පෙලහර; කරලූ, කෙළේය.

51 පිළි මිණි මදෙස, තුල දිලි නොමි නා
පිළි බිඹු රුවක්. ලෙස බබලමි නා
පිළි සිඳ පටන්, දසෙකඩ මසි නා
විළි රද පැහැර, එබිසව කුසි නා

51 නොමිනා, බොහොසෙයින්; පිළිමිණි මදෙසතුල, ස්ඵටිකමාණික්‍යමය මඤ්ජුසාභ්‍යන්තරයෙක්හි හෙවත් පළිඟුකරඬුව ක්හුගේ ඇතුලෙහි; දිලි, දිලියෙන්නාවූ; පිළිබිඹුරුවක්ලෙස, ප්‍රතිබිම්බරූපයක් පරිද්දෙන්; බබලමිනා, බබලමින්; පිළිසිඳපටන්, ප්‍රතිසන්ධිය පටන්කොටගෙණ; දසෙකඩමසිනා, දසඑකාර්ධමාසයකින්; විලිරදපැහැර, බඩරුජාව පැහැරී; එබිසවකුසිනා, ඒ රාජමහෙසිකාවගේ කුක්ෂියෙන්.

52 නික් මුනුහදක්සේ මේ ගැබෙ කි න්
දුක් නොව කිසිත් සුබයෝගය කි න්
එක් කුමරියක් පසුතව සැණෙ කි න්
දුක් සිත මිදිය දෙගුරුන් නිසැ කි න්



(23 පිට.) ළදරු සුජපා කුමාරි.

52 මේ ගැබෙහින්, වලාගැබකින්; නික්මුනු, නික්මුණාවූ: සදක්සේ, චන්ද්‍රයාමෙන්; කිසිත්දුක්නොව, කිසිත් දුකක් නොවී; සුබයෝගයකින්, මනාවූ යෝගයකින්; සැණෙකින්, ක්‍ෂණයකින්; එක්කුමරියක්, එක්කුමාරිකාවක්තොමෝ; පසුනව, ප්‍රසූතව; නිසැකින්, සඬකාරහිතව; දෙගුරුන්, මාතෘ පිතෘන් දෙදෙනාගෙ; දුක්සිහ, දුඃඛවිඝාතය; මිදීය, මුක්තකළාහ.

53 තු ට ව න කු මරි වැ දු එ බිසව වා
ක ට යුතු නිමවමින් පෙරලෙස වා
ඉ ට කිරි මවුන් තෝරා සොඳ වා
සැ ට දහසක්ම සලසා එවි වා

53 තුටවන, සන්තුෂ්ටවන්නාවූ; කුමරී, කුමාරිකාව විසින්; වැදූ, ප්‍රසූතකළාවූ; එබිසවටා, ඒ කුමාරිකාවට; පෙර ලෙසටා, පූර්වයෙහිමෙන්; කටයුතු, කටයුතුදෙය; නිමවමින්, නිෂ්පා කරමින්; ඉට, මනාවූ; සොඳටා, සොඳින්; කිරිමවුන්, කිරිදෙනමවුන්; තෝරා, පරීක්‍ෂාකොට; එවිටා, එකල්හි; සැටදහසක්ම, ෂෂ්ටිසහස්‍රයක්ම; සලසා, සලස්වා.

54 පි න් සර කු ම රී, යට එවුපන් දා
ර න් කිරි දෙ මි න්, සුබමොහොත්සොඳා
නන් රැක වලු න්, තබමින් නොම දා
අ න් සියලු දෙය, සිදුකර එම දා

54 එපින්සර කුමරියට, ඒ පුණ්‍යසාරවූ කුමාරිකාවට; උපන්දා, උපන්නාවූ දිනයෙහි; සුබමොහොත් සොඳා, ශෝභනවූ මුහුර්තී සොඳා; රන්කිරිදෙමින්, රන්කිරි දානයකරමින්; නොමඳා, අමන්දවූ; නන්රැකවලුන්, නොයෙක් ආරක්‍ෂකයන්; තබමින්, පිහිටුවමින්; එමදා, එදවස්හිම; අන්සියලුදේ, අනිකුත් සැමදෙයදා, සිදුකර, සිඬකොට.

55 වි සි තු රු ද ව ල, සතයට සුස දා
තුබු තුරු අ න ගි, සිහසුනෙහි මැ දා
සුග ඳු රු මු දු න, බබලන දිති දා
ලෙසග රු එ ර ද, වැඩහිඳ එස දා

55 විසිතුරු, විචිත්‍රවූ; දවලසතයට, ධවලච්ඡත්‍රයාගේ අධෝභාගයෙහි: සුසදා, මනාවසජ්ජිතකොට; තුබු, තිබුණාවූ; උතුරු, උතුම්වූ; අනගි, අනර්ඝවූ; සිහසුනෙහිමැදා, සිංහාසනයමධ්‍යයෙහි;

සුහඳුරුමුදුන, සුගන්ධරපර්වතයාගේ මස්තකයෙහි; බබලන, බබලන්නාවූ; දිනිඳලෙස, සූර්ය්‍යදිව්‍යරාජයා මෙන්; වැඩහිඳ, වැඩහිඳ ගෙණ; ගරුෑ, ගරුවූ; එරද, ඒරාජයා; එසඳ, ඒකාලයෙහි.

56 වෙද සත නිපුණ, බමුණන් මහ රෑ
තමවෙත ගෙන්ව, මින් සිත අඳු රෑ
සෙදබත බුලත, දීලා නතු රෑ
ඇත්සිත මෙලෙස, කී එතරවි රෑ

56 මහරෑ, මහාඝෝරවූ; වෙදසත, වෙදශාස්ත්‍රයෙහි; නිපුණ, දක්‍ෂවූ; බමුණන්, බ්‍රාහ්මණයන්; තමවෙත, තමන්ගේ සමීපයට; ගෙන්වමින්, ගෙන්වමින්; සිතඅඳුරෑ. සිත්දූපරිද්දෙන්; සෙද, එ ක්‍ෂණයෙහි; බතබුලතදීලා, බත්බුලතදී; අනතුරෑ, ඊටඅනතුරුව; එතරවිරෑ, ඒ තරවීරතෙම; ඇත්සිත, ඇත්තාවූචිත්තය; මෙලෙස, මෙයාකාරයෙන්; කී, කථායකළේය.

57

සතර වෙදකෙළ පැමිණිබමුණන් මදුවඇඟඇති ලකුණුබලමින
විතර කර සුබඅසුබ වෙනවෙන සොයාතෝරා සතරනැණැසින
ලතර සැකහැර මෙමට කීසඳ නොපට්තිබෙනා කුසල්තරමින
නිතර රැක්මට මහත්දන දෙමි තිළිණකොටඑම ගණිව්විගසින

57 සතරවෙද, වේදශාස්ත්‍රයෙහි නොහොත් චතුර්වේදයෙහි; කෙළපැමිණි, කොටිප්‍රාප්තවූ හෙවත් දැනගණ කෙළවරකළාවූ; බමුණනි, බ්‍රාහ්මණවරුනි; මදුව, මාගේදුහිතෘවගේ; ඇඟ, ශරීර යෙහි; ඇති, විද්‍යමානවූ; ලකුණු, ලක්‍ෂණයන්; බලමින, අවලෝකණය කරමින්; විතරකර, විස්තරකොට; සුබඅසුබ, ශුභඅසුභ යන්; වෙනවෙන, වෙන්වෙන්ව; සතරනැණැසින, ශාස්ත්‍රඥාන නැමැති අක්‍ෂියෙන්; හෙවත් ශාස්ත්‍රඥාන නැමැති ඇසින්; සොයා, පරීක්‍ෂාකොට; තෝරා, තේරුම්කොට; ලතර, සිත ඇතුලෙහි; සැකහැර, සංකාපහකොට; මෙමට, මෙඅප්මත්හට; කීසඳ, කථ නයකලකල්හි; නොපට, සුප්මතුන්ට; තිබෙනා, තිබෙන්නාවූ; කුසල්තරමින, කුශලප්‍රමාණයෙන්; නිතර, නිරන්තරයෙන්; රැක් මට, රක්‍ෂාවීමපිණිස; තිළිණකොට, ත්‍යාගකොට; මහත්දන, මහ ත්වූධනය; දෙමි, දානයකරමි; එම, ඒ (මමදෙන්නාවූ) ධනය; විගසින්, සුහුව; ගණිව්, ග්‍රහණයකරව්.

58 මෙලෙසට එවගුර ද
පැවිසූ සදෙහි මනන ද
දදවරනු නිවර ද
සතරනැණැසින්බැලූමෙවලෙද

59 එකුමරියගෙ සොබ න
නිසැකින් ඇඟලකුණු දැ න
නැවතද පසුතාවූ න
නැකතහෝරාරැසඳසොයමින

58 මෙලෙසට, මෙයාකාරයෙන්; එවගුරද, ඒ වගුරජ විසින්; පැවසූසඳෙහි, ප්‍රකාශකොට කීකල්හි; මනනද, මනොනන්‍දනවූ; දදවරහු, උත්තමබ්‍රාහමණවරු: නිවරද, නිරවද්‍යවූ, හෙවත් වරද නැත්තාවූ; සතරනැණැසින්, ශාස්ත්‍රඥානනැමැති අක්ෂියෙන්; මෙම ලෙද, මෙපරිද්දෙන්; බැලූ, නිරීක්ෂණයකලෝය.

59 සොබණ, සොභනවූ; එකුමරියගෙ, ඒකුමාරිකාවගේ; ඇඟ ලකුණු, සරීරලක්‍ෂණයන්; නිසැකින්, ශංකාවිරහිතකොට; දැන, ජානනයකොට; නැවතද, පසුවද; පසුතවූන, ප්‍රසූතවූ, හෙවත් උපන්නාවූ; නැකත, නක්‍ෂත්‍රයහා; හෝරා, හෝරාවද; රැසද, රාශියද; සොයමින, සොයමින්.

60 බොලු පඩි ලා එත න
ගැණගෙණ සුබාසුබ දැ න
එරද හට පියව න
මෙසේ පැවසූ අනුණ මතුව න

60 එතන, ඒස්ථානයෙහි; බොලුපඩිලා, බොල්ලන්පඩිබහා; ගැණගෙණ, ගණන්කොට; සුබඅසුබ, ශුභඅශුභලක්‍ෂණයන්; දැන ගෙණ, ජානනයකොට; පියවන, පීතාවූ; එරදහට, ඒරාජයා හට; මතුවන, අනාගතයෙහිවන්නාවූ; අනුණ, අගුණය; මෙසේ, මෙයාකාරයෙන්; පැවසූ, ප්‍රකාශකලෝය.

---

61 හි මි, සඳ එකුමරි තොමො මනක ලා
පි රි, සඳ මෙන් යොවුනග පත්ක ලා
නොම, හිඳ මෙපුරෙන් ගොස් සැඟවි ලා
රැ දු, නද මිගිඳෙක් හට අසුවෙ ලා

61 හිමිසඳ, ස්වාමීන්ද්‍රයානෙනි; මනකලා, සිත්කැමතිකරවන් නාවූ; එකුමරිතොමෝ, ඒකුමාරිකාතොමෝ; පිරිසඳමෙන්, පූර්ණ චන්‍ද්‍රයාමෙන්; යොවුන්, යෞවන භාවයෙන්; අඟපත්කලා, අග්‍ර ප්‍රාප්තකල්හි; නොමහිඳ, නොහිඳ; මෙපුරෙන්, මේනගරයෙන්; සැඟවිලාගොස්, සැඟවීගොස්; රුදුනද, රෞද්‍රභාවයෙන් නදවූ; මිගිඳෙක්හට, සිංහරාජයෙක්හට; අසුවෙලා, අසුවී.

62 එ ම, සිරද හට සරණව තො සා
සැ ම, සැපහැර මහ වනමැදවැ සා
ක ම, නැති දුක් විඳිනෙය පවති සා
මෙම, අගුණය පැමිණෙයි තොවල සා

62 එවසිරදහට, ඒසිංහරාජයාහට; තොසා, තුෂටවී; සරණව,
සරණවී; සැමසැප, සියලුමසැපය; හැර, අත්හැර; මහවනමැද,
මහාවනමධ්‍යයෙහි; වැසා, වාසයකොට; පවනිසා. පාපයනිසා
කමනැති, ප්‍රයොජනයක්නැත්තාවූ; දුක්, දුඃඛයන්; විඳිනෙය,
විඳනයකරන්නිය; නොවලසා, නොවලහා; මෙමඅගුණය, මෙම
අගුණය; පැමිණෙසි, පැමිණෙන්නේය (සි කීවාහුය).

---

63 දදවරහු මෙලෙස    ට
අසා කීබස් එරදු    ට
තද දුක්වැද සිත    ට
මෙලෙස සලකානැණීන් එමවි    ට

63 දදවරහු, බ්‍රාහමණොත්තමයන් විසින්; මෙලෙසට, මෙයා
කාරයෙන්; එරදුට, ඒ (වගු) රජහට; කීබස්, කියනලදවචනයන්;
අසා, ශ්‍රවණයකොට; සිතට, චිත්තයට, තදදුක්, සනබ්ධවූ දුඃඛය
ක්; වැදූ, වැදී; එමවිට, එකල්හි; නැණීන්, ඥාණයෙන්; මේ
ලෙස, මේආකාරයෙන්; සලකා, සල්ලක්ඛණයකොට,

64 සැඟවී නොයනලෙ    ස
එක්ටැඹ ගෙයක් නොවල    ස
සදවමින් කරළ    ස
ලමින් රුකවල් අවට දසදෙ    ස

64 සැඟවී, සැඟවීලා; නොයනලෙස, ගමනය නොකරණපරි
ද්දෙන්; නොවලස, අනලස්ව; එක්ටැඹගෙයක්, එකස්තම්භගෘහ
යක්; හෙවත් එක්කණුවක් මුදුනෙහි සාදනලද ගෙයක්; උසකර,
උස්කොට; සදවමින්, සාදවමින්; දසදෙස, දසදිශාවෙහි; අවට,
හාත්පසින්; රුකවල්ලමින්, ආරක්ෂාලමින්.

65 එවිමන තුළැ ල    මින්
නොදක්වා හැම පිරි    මින්
එකුමරිය වඩ    මින්
සුරුකගත්තෙමි සිතා ලපෙ    මින්

65 එවිමනතුළැ, ඒ විමානාභ්‍යන්තරයෙහි; ලමින්, බහමින්;
හැම්පිරිමින්, සියලුපුරුෂයන්; නොදක්වා, දර්ශනය නොකරවා;
එකුමරිය, ඒකුමාරිකාව; වඩමින්, වර්ධනයකරමින්; ලපෙමින්,
චිත්තප්‍රෙමයෙන්; සුරුකගත්තෙමි, යහපත්ව ආරක්ෂාකරගත්තෙ
මියි; සිතා, චින්තනයකොට.

66 වඩුසත කෙළ පෑ මිණි
වඩුවන් රැස් කරව මිණි
එරදතුම ගුණ. මිණි
ඇරඹි විමනක් කරණ විල සිනි

66 වඩුසත, වඩ්ඪකීශාස්ත්‍රයෙහි; කෙළපෑමිණි, කොටිප්‍රාප්තවූ හෙවත් කෙළවරටගියාවූ; වඩුවන්, වඩ්ඪකීජනයන්; රැස්කරව මිණි, එකතුකරමින්; ගුණමිණි, ගුණනැමැතිමාණික්‍ය ඇත්තාවූ; එරදතුම, ඒරාජෝත්තමතෙමේ; විමනක්, විමානයක්; කරණව ලසිනි, කරණපරිද්දෙන්; ඇරඹි, ආරම්භකෙළේය.

---

67 නොමඳුරු රජ බවනට එක් පෙදෙස ක
පි විතුරු කරබිම සඳමින් විගස ක
වැ ඩකරු මොහොතක සිටවූ වැඹයෙ ක
පු රදුරු පහයෙව් සැදවූ විමන ක

67 රජබවනට, රාජභවනයට; නොමඳුරු, දුරුනුවූ; එක්පෙදෙසක, එක්ප්‍රදෙශයෙක්හි; බිම, භූමිය; විගසක, ක්‍ෂණයෙක්හි; පිවිතුරුකර, පවිත්‍රකොට; සඳමින්, සරගමින්; වැඩකරුමොහොතක. වැඩසිඩකරන්නාවූ මුහූර්තයෙක්හි; සිටවූ, පිහිටුවනලද්දාවූ; වැඹයෙක, ස්තම්භයෙක්හි, හෙවත් කණුවෙක්හි; පුරදුරු පහයෙව්, ශක්‍රයාගේ ප්‍රාසාදයමෙන්; සැදවූ, සජ්ජිතකළාවූ; විමනෙක, විමානයෙහි,

68 සොඳුරු විලස හැම කටයුතු නිමමි න
වි දුරු ගිරසෙ එහි අවපින් බබල න
ප වුරු පදනමුත් බඳවා තරයෙ න
අ තුරු නැතිව මුර සිටුවා තැනතැ න

68 සොඳුරුවිලස, යහපත් ආකාරයෙන්; හැමකටයුතු, සියලු කෘත්‍යයන් හෙවත් සියලුකටයුතුදෙය; නිමමින, නිෂ්ඨාකරමින්; (නිමවමින්) එහි, ඒවිමානයෙහි; අවපින්, හාත්පස්හි; විදුරුගිර සෙ, විදුරුපර්වතයක් මෙන්; බබලන, බබලන්නාවූ; තරයෙන, ස්ථිරවූපරිද්දෙන්; පවුරුපදනමුත්, ප්‍රාකාරපදනම්ද; බඳවා, බන්ධනයකරවා; තැනතැන, තන්හිතන්හි; අතුරුනැතිව, අතරනැතිව; මුරසිටුවා, මුරකාරයන්සිටුවා.

69 අ පමණ කිරිමවහන සහ කුමරි ද
එ විමණ තුළලා වැඩුමට සුතුලෙ ද
නොපමණ මහසැප දී පිරිවරට ද
සු රකිණ ලෙස සැලසී නරනිඳුස ද

69 අපමණ, අප්‍රමාණවූ; කිරිමව්හනසහ, උපමාතෘන් සමග, හෙවත් කිරිදෙන්නාවූ මෑනියන්සමග; කුමරිඳ, කුමාරිකාවත්ද; එවිමනතුල, ඒ එකසතමහ මාලිගාව ඇතුලෙහි; ලා, ප්‍රක්ෂෙපකොට හෙවත් සිටුවා; වැඩූම්ට, වර්ධනයක්‍රියාපිණිස; සුතුලෙද, සුතුවූපරිද්දෙන්; පිරිවරටද, පරිවාරජනයාහටද; නොපමණ, ප්‍රමාණයක්නැත්තාවූ; මහසැපදී, මහත්වූ සම්පත්ති ප්‍රදානය කොට; නරනිඳුසඳ, නරෙන්ද්‍රොත්තමතෙම; සුරකිණලෙද, යහපත්ව ආරක්ෂාකරණමෙන්, සැලසී, සැලැස්වූයේය.

70 මෙලෙ ස විලාතුල වැඩෙනා පුරස ද
වි ල ස කෙමෙන් වැඩෙමින් එකුමරිස ද
ස තො ස වඩන දුටුවන් සිරිකතලෙ ද
සො ල සැ විරිදි වී යොවුනෙන් පිරිස ද

70 මෙලෙස, මෙයාකාරයෙන්; විලාතුල, විලාහකාභ්‍යන්තරයෙහි; වැඩෙනා, වර්ධනයවන්නාවූ; පුරසඳවිලස, පූර්ණචන්ද්‍රයාගේ විලාශයෙන්; එකුමරිසඳ, ඒකුමාරිකාඋත්තමිය; කෙමෙන්, ක්‍රමයෙන්; වැඩෙමින්සිටිසඳ, වර්ධනයවෙමින්සිටිකල්හි; දුටුවන්, දර්ශනයකලවුන්විසින්;සතොසවඩන, සන්තොෂ වර්ධනයවන්නාවූ; සිරිකතලෙද, ශ්‍රීකාන්තාව පරිද්දෙන්; සොලසැවිරිදිවී, ෂොඩශවර්ෂඇතිව; යොවුනෙන්, යෞවනස්වභාවයෙන්; පිරිසඳ, සම්පූර්ණවූකල්හි.

---

71 සොබන කනක ගිරිමුදුනත රඟදෙන රන් මයු ර
හ රණ සුමුදු දිගුවරලස නිල්වබැබලි නොව ර
වැ සුන අඩක් මේගැබකින් සඳුගේ සිරි අයු ර
න ද න වේය දුටුදනමන ඇගෙ නලලත පව ර

71 සොබන, ශොභනවූ; කනකගිරි මුදුනත, ස්වර්ණපර්වතයක්හුගේ මස්තකයෙහි; රඟදෙන, නෘත්‍යදනයකරන්නාවූ; රන්මයු රාහරණ, ස්වර්ණමයූරයක්හුහා සමානවූ; සුමුදු, යහපත්වමෘදුවූ; දිගු, දීඝිවූ (දික්වූ); වරලස, කෙශකලාපයතෙම; නොවරා, නොවලහා; නිල්ව, නීලවර්ණව; බැබලී, බැබලූයේය; මේගැබකින්; වලාකුලකින්; අඩක්, අර්ධයක් හෙවත් කොටසක්; වැසුන, වැසුනාවූ; සඳුගේ, චන්ද්‍රයාගේ; සිරිඅයුරා, ශොභාවගේ ආකාරයෙන්; ඇගේ, ඒකාන්තාවගේ; පවරා, උතුම්වූ; නලලත, ලලාටයෙහි හෙවත් නලලෙහි; අයුරා, ආකාරය; දුටුදන, දර්ශනයකලාවූජනයන්ගේ; මන, චිත්තයතෙම; නඳනවේය, සන්තොෂවන්නේය.

72 බ ඹ කතඳිඳු එකතගෙ දෙව් දුනුසරි බැමසඟ ලා
නි ඹ පතමෙන් බබලසි දුටු ලෙව්සත සිත ලොබ ලා
ර ඹ පැලවත් යුගපත් නැඟැ රණකුසසිරි උසු ලා
බි ඹ පලුවැනි රතු දෙයදර සමවිය දලපබ ලා

72 බඹකතඳිඳු, සරස්වතීනම් කාන්තාව ජයගත්තාවූ; එකත ගේ, ඒකාන්තාවගේ; දෙව්දුනුසරි, ඉන්‍ද්‍රචාපදෙකක් සමානවූ හෙවත් දෙව්දුනුදෙකක් සමානවූ; බැමසඟලා, බැමදෙක; දුටු, දර්ශනයකළාවූ; ලෙව්සත, ලොකවාසී සත්වයන්ගේ; සිත, චිත්තය; ලොබලා, ලොභකොට; නිඹපතමෙන්, කොසඹපත්‍ර (යුග්ම) යක් මෙන්; බබලසි, බබලන්නේය; යුගපත්, පත්‍රයුග්මයක් ඇත්තාවූ; රඹපැලවත්, රම්භාගච්ඡයක් වැනිවූ හෙවත් කෙසෙල් පැලයක් වැනිවූ; නැඟැ, නාසිකාව; රණකුස, ස්වර්ණාඞ්කුසයක්හුගේ හෙවත් රත්රන් අකුස්සක්හුගේ; සිරි, ශ්‍රීය (ශොභාව); උසුලා, උද්වහණයකෙරෙයි; බිඹපලුවැනි, බිම්බාඵලවැනිවූ හෙවත් ඉදුනාවූ කෙම්ගෙඩිසමාන පැහැඇත්තාවූ; රතු, රක්තවර්ණවූ; දෙයදර, දෙතොල; පබලාදලසමවිය, ප්‍රවාලාංකුර දෙකක්හා සමානවූයේය.

73 ඉ ඳු ව ර ඉඳු නිල්මිණිසරි එකුමරිදිගු නුව නා
සි රි ස ර දෙඅදර දළදිව් කෙම්මුවසර රඳ නා
සු දු ත ර දත් මුවරද පෙල සමවිය තිති දිලෙ නා
පිය ක ර තුන් හිරරැඳි ගෙළසක ජයගෙණ සොබ නා

73 එකුමරි, ඒකුමාරිකාවගේ; දිගුනුවනා, දීර්ඝවූනෙත්‍රයෝ; ඉඳුවර; නිලොත්පලහා; ඉඳුනිල්මිණිසරි, ඉන්‍ද්‍රනීලමාණික්‍යයන්හාද සමානවූවාහුය; සිරිසර, ශ්‍රීයෙන්සාරවූ; දෙඅදර, අධරයුග්මයක් ඇත්තාවූ;දළ,දත්හා;දිව්,ජිහ්වාවක්ද;කෙම්,කර්ණිකාවක්ඇත්තාවූ මුවසර, මුඛනැමැතිපද්මයෙන්; රඳනා, රඤ්ජනයවත්නාවූ; සුදුතර, අතිශයින්ශුභ්‍රවර්ණවූ; දත්, දන්තයෝ; තිති, නිරන්තරයෙන්; දිලෙනා, දිලියෙන්නාවූ; මුවරදපෙළසමවිය; මකරන්ද පඞ්ක්තිය සමානවූයේය; පියකර, ප්‍රියකරන්නාවූ; තුන්හිරරැඳි, රේඛාත්‍රය කින්රංජිතවූ; ගෙළ, ග්‍රීවයතෙම; සකජයගෙණ, ශංඛයපරදවා; සොබණා, ශොභමානවූයේය,

74 එ ර ව ණ කර කත මල්දම් වැනිවිය ඇගෙ දෙක රා
සපි රු ණ පියයුරුයුග රන් තිසර රඳහු අයු රා
පි ය ව න නැබ රන්පියුමෙකි වසා රොදලිතික රා
සසොබන සිහිනිග මදරද දුනුම්ටවැනි පව රා

74 ඈගේ, ඒකාන්තාවගේ; දෙකරා, හස්තයුග්මය; (අත්දෙක) එරවණකර, ඓරාවණ හස්තිරාජයාගේ සොඬහා; කතමල්දම්වැන්නිය, කෘතමාලාදාමයක්ද සමානවූයේය, හෙවත් ඇසලමල් දමක්ද වැනිවූයේය; සපිරුණු, සම්පූර්ණවූ; පියයුරුයුග, පයෝධරයුග්මය; රත්හිසරරදහු, ස්වර්ණහංසරාජයන්හුගේ; අයුරා, ආකාරවූයේය; පියවන, ප්‍රියවත්නාවූ; නැබ, නාභිතොමෝ; රත්පියුමෙකි, රක්තපද්මයෙක්ය; වසාරොද, වසාරාජිතොමෝ; අලිනිකරා, භෘංගසමූහයක්හා සමානවූයේය; පවරා, උතුම්වූ; සසොබන, ශොභාසහිතවූ; සිහින්ඉඟ, සිහින්වූ කටිප්‍රදෙශය; මදරද, අනංගයාගේ; දුනුම්ටවැනි, දුන්නෙහිමිට වැනිවූයේය.

75 උ තු රු එකත සොවුන් ගඟෙහි පුලිනතලෙව් උකු ලා
සොඳු රු වටොර මනරම් රඹකඳ සිරිගෙණ බබ ලා
උ තු රු සයුරනැගි බුබුලෙව් සපිරුණු දණසඟ ලා
මි යු රු ගෙලෙව් දුවුදනමන පිණවන දඟයුග ලා

75 උතුරු, උතුම්වූ; එකත, ඒකාන්තාවගේ; උකුලා, ඇකය තොම; සොවුන්ගඟෙහි; සෞවනනැමැති ගංගාවෙහි; පුලිනතලෙව්, වාලුකාතලයක් වැන්නේය, හෙවත් වැලිතලාවක් වැනිවූයේය; සොඳුරු, යහපත්වූ; වටොර, වෘත්තෝරු යුග්මය හෙවත් වටවූ කලවාසඟල; මනරම්, මනොරම්‍යවූ; රඹකඳ, කදලිස්කන්ධයන් දෙදෙනෙකුගේ; සිරිගෙණ, ශොභාවගෙණ; බබලා, බබලන්නේය; සපිරුණු, සම්පූර්ණවූ; දණසඟලා, ජානුයුග්මය; උතුරු සයුර, උත්තරසාගරයෙහි; නැගි, නැංගාවූ; බුබුලෙව්, බුබුලුදෙකක්වැනිවූ වාහුය; දුවුදන, දුටුවාවූ ජනයන්ගේ; මනපිණවන, සිත්පිණවන්නාවූ; දඟයුගලා, ජංඝායුග්මය හෙවත් කෙඬාදෙක; මියුරුගෙලෙව්, මොනරකරක් බඳුවූයේය.

76 ර ත ඟි ලි දල සුසැදුනු එකුමරිවර පදතඹ රා
ග ත දි ලි යෙන මෙබඳුරුවින් ජයගෙණ කත්නිත රා
සි ත දි ලි වන යොවුන් සයුර සපැමිණ සිටි එත රා
නැත පි ළි රූ ලිය මෙකතට සුරසරහැර ලොත රා

76 රතඟිලි, රක්තවර්ණ අංගුලිනැමැති; දල, පත්‍රයෙන්; සුසැදුනු, මනාව සැරසුනාවූ; වර, උතුම්වූ; පදතඹරා, පාදපද්මයක් ඇත්තාවූ; ගතදිලියෙන, ශරීරයෙන් දිලියෙන්නාවූ; මෙබඳුරුවින්, මෙබඳුවූ රූපශ්‍රියෙන්; එකුමරිවර, ඒකුමාරිකා උත්තමීතොමෝ නිතරා, නිරන්තරයෙන්; කත්, කාන්තාවන්; ජයගෙණ, ජයග්‍රහ

ණයකොට; සිතදිලිවන, චිත්තයෙන් ඇදහිලිවත්නාවූ;යොවුන් සපුර, යෞවනසාගරයාගේ; එතරා, එතරට; සපැමිණසිරි, සම් ප්‍රාප්තවසිරියාවූ; මෙකතට, මේකාන්තාවට; සුරසරහැර, දිව්‍යස්ත්‍රී න්හැර; පිළිරූලිය, ප්‍රතිරූපස්ත්‍රීහු, හෙවත් සමානවූස්ත්‍රීහු; ලො, තරෑ, ලෝකාභ්‍යන්තරයෙහි; නැත, නැත්තාහුය.

77 මෙ බ ඳු අනගි ලකුණුදැරූ එකුමරි සිරි රඳ නා
නො ම ඳු වරගණන් නලලත තිලකෙව් දිසි සොබ නා
ත රි ඳු විලස කලාසපිරි යොවුනගපත් වෙමි නා
ප සි ඳු ව මුලු දඹදිවැතුළ බැබලූ රූ සිරි නා

77 මෙබඳු, මේආකාරවූ; අනගි, අනඝවූ: ලකුණුදැරූ, ලක්ෂණ දරන්නාවූ; සිරිරඳනා, රූපශ්‍රීයෙන් රංජිතවූ; නොමඳු, අමන්දවූ හෙවත් බොහෝවූ: වරගණන්, උත්තමාඞ්ගණාවන්ගේ; නලලත, ලලාටයෙහි; තිලකෙව්, තිලකාභරණයක්මෙන්; දිසි, දෘශ්‍යමාන වූ; සොබනා, ශොභමානවූ; එකුමරි, ඒකුමාරිකාතොමෝ; කලාස පිරි, (ශොඩශ) කලාවෙන් සම්පූර්ණවූ; තරිඳුවිලස, චන්ද්‍රයාගේවි ලාසයෙන්; යොවුනගපත්වෙමිනා, යෞවනභාවයෙන් අග්‍රප්‍රාප්ත වෙමින්; මුලුදඹදිවතුළෑ, සකල ජම්බුද්වීපය ඇතුලත්හි; රූසිර්නා, රූපශ්‍රීයෙන්; පසිදුව, ප්‍රසිද්ධව; බැබලූ, භ්‍රාජිතවූවාය (බැබලුවාය.)

78 දී ව මතුරෙන් දපණයකල නාමණෙවිය ලෙසි නා
න ව දිමු තෙන් වැසිනොදිලුන සඳමෙන් සොමිකිර ණා
ලොව පිරි මි න් නොදකම එක්පාවිමනෙහි වස නා
සි ව කත වන් එකුමරිසඳ පස්කම්රස නොදැ නා

78 දිවමතුරෙන්, දිව්‍යමන්ත්‍රයකින්; දපණයකළ, මැඩපවත්ව නලද්දවූ; නාමණෙවිය ලෙසිනා, නාගමාණවිකාවක්පරිද්දෙන්ද; නවදිමුතෙන්, අභිනව වලාවකින්, හෙවත් අලුත් වලාකුලකින්; වැසි, ප්‍රතිච්ඡන්නව හෙවත් වැසී; සොමිකිරණා, සෞම්‍යකාන්ති ශූන්; නොදිලුන, නොදිලියෙන්නාවූ: සඳමෙන්, චන්ද්‍රයා මෙන්ද; ලොව, ලොකයෙහි; පිරිමින්, පුරුෂයන්; නොදැකම, දශී නයනොකොටම; එක්පාවිමනෙහි, එකපාද විමානයෙහි, හෙවත් එකස්තම්භ මාලිගාවෙහි; වසනා, වාසයකරන්නාවූ: සිවකතවන්, උමාවවැනිවූ; එකුමරිසඳ, ඒකුමාරිකා උත්තමීතොමෝ; පස්කම් රස, පචකාමරසය; නොදැනා; ජානනයනොකොට.

79 ය හ ලු ලියන්ගෙන් ඇසුකල පස්කම්රස වෙසෙ සා
සි ය ලු ගතෙහි ඇවිලීය්ය රාගගින්න නොලෙ සා
ම හ ලු දෙම්ව් පියනටවත් ලජ්ජානැති පිණි සා
සි ය ලු ලොවෙහි ගින්නක්නැත රාගගින්නසදී . ශා

79 යහලුලියන්ගෙන්, යහලුවූස්ත්‍රීන්ගෙන්; පස්කම්රසවෙසෙසා, පඤ්චකාමරස විශෙෂය; ඇසුකල, ඇසූකාලයෙහි; නොලෙසා, වහා;, සියලුගතෙහි, සකලශරීරයෙහි; රාගගින්න, රාගාග්නියතෙම; ඇවිලීගිය, ඇවිලීගියේය; මහලුදෙමව්පියනටවත්, මහලුවූ මාතෘ පිතෘන් දෙදෙනාහටවත්; ලජ්ජා නැතිපිණිසා, ලජ්ජා නැතිවීම්පිණිස; සියලුලොවෙහි, සමස්තලොකයෙහිම; රාගගින්න සදිසා, රාගාග්නියහා සමානවූ; ගින්නක්නැත, ගින්නක් නැත්තේය. *

80 ර ද සොර සතුරන් දිය ගිනි යන රුදුබියමෙප සා
අ ද ග ර නා පොලොන් මතග සිහ දිවිවගවල සා
ත ද ගොර යක්බූ රකුසන්ගෙන් වනබිය වෙසෙ සා
සෙද නොර නොව රාගඇල්ම ඇතිහටවෙයී අව සා

80 රද, රජුන්කෙරෙන් වන්නාවූ භයද; සොර, සොරුන්කෙරෙන් වන්නාවූ භයද; සතුරන්, ශත්‍රූන්කෙරෙන් වන්නාවූභයද; දිය, ජලයෙන්වන්නාවූභයද; ගිනි, ගින්නෙන් වන්නාවූද; යන මෙරුදුබියපසා, කියනලද්දවූ මේ රෞද්‍රවූ පඤ්චවිධය හෙවත් රජ සොර සතුරු දිය ගිනි යයි කියනලද මේ පස්වගීයෙන් උපදින්නාවූ නපුරුවූ භයපසද; අදගර, පිඹුරන්ගෙන්ද; නාපොලොන්. නාගයන්ගෙන්හා පොලඟුන්ගෙන් වන්නාවූද; මතඟ, ඇතුන්ගෙන් වන්නාවූද; සිහ, සිංහයන්ගෙන් වන්නාවූද; දිවි, ශාර්දූලයන්ගෙන් වන්නාවූද හෙවත් කොටින්ගෙන් වන්නාවූද; වග, ව්‍යාඝ්‍රයන්ගෙන් වන්නාවූද; වලසා, තරච්ඡයන්ගෙන් වන්නාවූද හෙවත් වලසුන්ගෙන් වන්නාවූද; තද, සම්බන්ධවූ; ගොර, දරුණුවූ; යක්බූරකුසන්ගෙන් වන, යක්‍ෂභූත රාක්‍ෂසයන්ගෙන් වන්නාවූ; බියවෙසෙසා, භයවිශෙෂයද; සෙද, ශීඝ්‍රව හෙවත් වහාම; නොරනොව, නොරනොවී; අවසා, අවශ්‍යයෙන්; රාගඇල්මඇතිහට, රාගයෙන් ඇලීම ඇත්තා (වූසත්වයා) හට; වෙයී, වන්නේය.

81 ලො ව ඇති හැමබිය හැමදුක් හැම විපත්ද නපු රු
නො ව ලඟ පැමිණෙයි රාගාලයකලහට නිබො රු
සු ව විදැවිසු එකුමරිසඳ රාගසිතින් රුදු රු
ලොව පවතින විලස රාජකුලයට කලෙ නිස රු

81 ලොවැ, ලොකයෙහි; ඇති, විද්‍යමානවූ; නපුරු, කෲරවූ; හැමබිය, සියලුභයද; හැමදුක්, සකලදුඃඛයද; හැමවිපත්ද, සකල

*'නත්ථිරාග සමො අග්ගි' යනාදීවශයෙන් බුද්ධධර්මයෙහිද තිබෙයි.




(33 පිට.) එකසැටවන ශාලාවෙන් කුමාරි පලායාම.

විපත්තියද; රාගාලයකළහට, රාගයෙන් ආලයකරණලද තැනැත්තාහට; නිබොරු, බොරුනොවම; නො වලහපැමිණෙසි, නොවලහාම(නොවැළක්ම) පැමිණෙසි; සුවවිඳවිසු. සැපවිඳිමින් වාසයකළාවූ; එකුමරිසඳ, ඒකුමාරිකා උත්තමියවිසින්; රුදුරු, රෞද්‍රවූ; රාගසිතින්, රාගචිත්තයෙන්: ලොවපවතින විලස, ලොක යෙහි පවතිත්නාවූ පරිද්දෙන්; රාජකුලයට, රාජවංශයට; නිසරුකළේ, නිස්සාරවූ අවමානයක් කරණලද්දීය

82 එලෙ ස ට කුමරි තොමද, පස්කම් රසෙහි නොමිඳ ඇලුමෙන් උමතුකතසෙ, කිසිත් නොදැ නා
ගහ සෙ ට දිනිඳු පවර, අත්හැර විලඹු නිකර, පත්සඳ අවරගිරට, පබාරුගෙ ණා
ඇ ය හ ට පිහිට දෙගුරු, කිරිමවු සමග ඇමති, මුරකළ සෙබළ සොබළ, යෙහෙලිඅහ නා
මෙහැම ට සොරාගෙයින්, නික්මිහැරිය දෙරින්, වේමග ගෙවාගොසින්, ඇතුළුපුරෙ නා

82 එලෙසට, එපරිද්දෙන්; කුමරිතොමද, (මේ) රාජ කුමාරිකාතොමෝද; නොමඳ, අම්ඳුවූ; පස්කම් රසෙහි, පඤ්චකාම රසයෙහි; ඇලුමෙන්, ඇලීමෙන්; උමතුකතසෙ, උම්මත්තක ස්ත්‍රියක්පරිද්දෙන්; කිසිත්නො දැනා, කිසිවක්නොදැන; ගහසෙට, ගෘහයත්ට ශ්‍රෙෂ්ඨවූ; පවරදිනිඳු, උතුම්වූ සූර්‍ය්‍යදිව්‍යරාජයා; විලඹුනිකා ර, තඩාකාම්බිකා සමූහයා හෙවත් විල්නැමැති කාන්තාසමූහයා; අත්හැර, පහකොට; පබාරුගෙණා, කාන්ති යගෙණ; අවරගිරට,අපර පර්වතයට; පත්සඳ, ප්‍රාප්තවූකාලයෙහි; ඇයහට, ඒකාන්තාවහට; පිහිට, පිහිටවූ; දෙ ගුරු, මවුපියන්හා; කිරිමවුසමග, ක්ෂීරමාතෘන්හා හෙවත් ඇතිකළම්මුන්හා සමග; ඇමති, අමාත්‍යයන්හා; මුරකළ, මුරකළාවූ; සොබළ, යෝධභටයන්හා; සෙබළ, සේවාභටයන්හා; යෙහෙලිඅහනා, යහලු කාන්තාව න්ද; (යන) මෙහැමට, මෙසියලුදෙනාහට; සොරා, සැඟවී; ගෙයින් නික්මී, ගෘහයෙන් නික්මිලා; හැරිය දෙරින්, විවෘතකරණලද ද්වාරයෙන්; වේමග ගෙවා, වීථිමාර්ගය ගෙවාගෙණ; ඇතුළුපුරෙනා, අභ්‍යන්තරනගරයෙ න්; ගොසින්, ගමනයකොට, හෙවත් ගොසින්.

83 නිල ඹ ර නැගුණු සොඳු රු, උල්කාපාත අයු රු, මැඩ ගණඅඳුරු රුදු රු, මගට පැමි ණා
හැම ව ර යකුන් වසන, මහඅඹුසොහොන් තිබෙණ, නොකගොර සඳුන්ගහණ, එමහමගි නා
පි රි ව ර වෙමින් දිලෙන, හැමතරුකැලන් බැහැර, හරිමින් තනිවඳුවන, සඳුඟග සිර නා
දිව ස ර ලෙයින් තනිව, කම්සැප ලොබින් එදින, නිසිබියනොවී එසන, සඳෙහි ලයි නා

83 නිලඹර, නීලාම්බරයෙහි හෙවත් නීලවර්ණාකාශයෙහි; නැගුණු, නැගුණාවූ; සොඳුරු, සඟපත්වූ; උල්කාපාත අසුරු, උල්කාපාතයක් මෙන්; අඳුරු, අන්ධකාරය; මැඬගණ, මර්දනය කරගණ, නොහොත් ගණඅඳුරු, ඝණාන්ධකාරය; මැඩ, මර්දනයකොට; රුදුරුමගට, රෞද්‍රවූමාර්‍ගයට; පැමිණා, පැමිණ; හැමවර, සෑමකල්හි; යකුන්වසන, යක්‍ෂයන් වාසය කරන්නාවූ; මහඅමුසොහොන් තිබෙණ, මහත්වූ ආමකසුසාන තිබෙන්නාවූ; නෙක ගොරසපුන්, අනෙකවිධවූ දරුණු සර්පයන්විසින්; ගහණ, ගැවසිගත්තාවූ; එමහමගිනා, ඒ මහාමාර්‍ගයෙන්; පිරිවර වෙමින්, පරිවාරවෙමින්; දිලෙන, දීලියෙන්නාවූ; හැමතරුකැලන්, සකල තාර කාසමූහයන්; බැහැරහරිමින්, අත්හැරලමින්;තනිව, එකලාව; දිවන, ධාවනයකරන්නාවූ; සඳුගෙසිරිනා, ච න්‍ද්‍රයාගේශොභාවෙන්ද; තනිව, හුදකලාව; එදින, එදවස්හි; කම්සැපලොබින්, (පඛ) කාමසම්පත්තියෙහිලො භයෙන්; තනිව, හුදකලාව; දිවසරලෙසින්, දිව්‍යස්ත්‍රියක්මෙන්; කිසිබියනොවී, කිසිත්භයක්නොව; ලසිනා, ශීඝ්‍රව හෙවත් වහා; එයනසඳෙහි, ගමනය කරන්නාවූ ඒ කාලයෙහි·

84 නෙක බඩුරැගෙණ එවිට, වෙළඳම්පිණ්ස එරට, සපැමිණි වෙළඳු පෙරට, පැමිණි එර ද
දැ ක එම්වෙළඳු සොඳව, සතුටුව තමන්වෙතට, කැඳවූ වෙළඳ දෙ වූ ව, විය බිරි ද
දු ක හැර එවුන් සමග, විඳිමින් එ කම් සැපත, ලළුරට නමැති රට ට, ය න සෙ ප සි ද
සැ ක නොව දෙදෙනඑදින, උමයඟනිසුරු සිරින, වනමැදතුරට පැමිණ, ගියෝ එරු ද

84 නෙක බඩුරැගෙණ, නොයෙක් භාණ්ඩගෙණ; එවිට, තත්කාලයෙහි; එරට, ඒරාෂ්ට්‍රයට; වෙළඳම් පිණ්ස, වෙළඳම්පිණ්ස; සපැමිණි, සම්ප්‍රාප්තවූ; වෙළඳු, වාණිජ ජනයන්ගේ; පෙරට, අභිමුඛයට; පැමි ණි, පැමිණියාවූ; එරදු, ඒරාජධිතාව; එම්වෙළඳු, ඒවාණිජ ජනයෝ; දැක, දර්‍ශනයකොට; සොඳටසතුටුව. මනාව සන්තුෂ්ටව; තමන්වෙතට, තමන්ගේ සමීපයට; කැඳවූ වෙළඳදෙටුව, ආමන්ත්‍රණයකලාවූ ජ්‍යෙෂ්ඨවා ණිජයාහට; බිරිඳුවිය, භාර්‍ය්‍යාවූවාය; දුකහැර, දුඃඛය අත්හැර; එවුන්සමග, ඒවාණිජ ජ්‍යෙෂ්ඨයාහා සමග; එකම්සැපත, ඒ (පඛ) කාමසම්පත්තිය; විඳිමින්, විඳිනය කරමින්; පසිඳු, ප්‍රසිද්ධවූ; ලළුරටනමැති, ලළුයන නමක් ඇත්තාවූ රාෂ්ට්‍රයට හෙවත් ලාටදෙශයට; යනසේ, ගමනය කරණ පරිද්දෙන්; එදින, ඒ දිනයෙහි; දෙදෙන, (ඒ) දෙදෙනා; උමයඟනිසුරුසිරින, උමයඩගනාවහා ඊශ්වරයාගේශ්‍රියෙන්; සැකනොව, සැකය න්නැතිව; එරුදු වනමැදතුරට, ඒමහාවන මධ්‍යයාගේ අභ්‍යන්තරට නොහොත් ඒ රෞද්‍රවූ වනය මැදට; පැමිණ, පමිණිලා; ගියෝ, ගමනය කළාහුය.

85 සත් දලි නා සල දලි නා කුදු දලි නා දිගු දලි නා
හෙම්දලි නා කිරි දලි නා සිරි දලි නා සිරි පෙලි නා
යුග දලි නා තුන් දලි නා සිව් දලි නා පස් දලි නා
සැදි එව නා යන දෙදෙනා දු වුළු දී නා තුවු සිති නා

85 සත්දලිනා, සප්තපර්ණී වෘක්ෂයෙන්ද; සලදලිනා, අශ්ව ත්‍ථ වෘක්ෂයෙන්ද; කුදුදලිනා, අඳුරගසින්ද; දිගුදලිනා, දීඝ්‍රපත්‍ර වෘක්ෂයෙන්ද හෙවත් වැටකේ ගසින්ද; හෙම්දලිනා, අත්තන ග ච්ඡයෙන්ද; කිරිදලිනා, කිරිපලු වෘක්ෂයෙන්ද: සිරිදලිනා, ඇද්දෙ මට ගසින්ද; සිරිපෙලිනා, බිල්ව වෘක්ෂයෙන්ද හෙවත් බෙලිගසි න්ද; යුගදලිනා, යුග්මපත්‍ර වෘක්ෂයෙන්ද, හෙවත් කොබලීලගසි න්ද; තුන්දලිනා, ත්‍රිපත්‍රවෘක්ෂයෙන්ද;* සිව්දලිනා, චතුසුද්ද ගසි න්ද; පස්දලිනා, එරඬවෘක්ෂයෙන්ද; (යනමේ වෘක්ෂපඞ්ක්තියෙ න්) සැදිඑවනා, සජ්ජිතවූ ඒවනය; තුවුසිතිනා, සන්‍තුෂ්ටවූචිත්ත යෙන්; යන, ගමනයකරන්නාවූ; දෙදෙනා, ඒජනයෝ දෙදෙනා; එදිනා, ඒදවස්හි; දුවු, දක්නය කලෝය.

86 සොරකදි රා රිටු ම හ රා කුමු කුතු රා එකළු හ රා
පර ම ද රා එ ස ම ද රා නිදර ද රා අගරු තු රා
සුව ද හ රා දව ල හ රා පණස ව රා මිදි තු ව රා
යුතු මෙතු රා වන අතු රා කුම රි ව රා දු ටි එ ව රා

86 සොරකදිරා, සරලගස්හාඛදිරවෘක්ෂයෙන්ද, හෙවත් හොර ගසින්හා කිහිරි ගසින්ද; අරිටුමහරා, අරිෂ්ට වෘක්ෂයෙන්හා මහරි ගසින්ද, හෙවත් කොසඹගසින්හා මාරාගසින්ද; කුමුකුතුරා, කු මුකවෘක්ෂයෙන්ද, හෙවත් පුවක්ගසින්ද; එකළුහරා, ඒ කෘෂ්ණ සාර වෘක්ෂයෙන්ද හෙවත් කළුහර ගසින්ද; පරමදරා, පරගසින් හා මදුර වෘක්ෂයෙන්ද; එසමදරා, ඒ සමදරා ගසින්ද; නිදර දරා, දෙවදාර වෘක්ෂයෙන්ද; අගරුතුරා, අගිල්ගසින්ද; සුවදහරා, සුගන්ධසාර වෘක්ෂයෙන්ද හෙවත් චන්දන වෘක්ෂයෙන්ද; දවල හරා, ශ්වෙතසාරවෘක්ෂයෙන්ද;† පණසවරා, පණාවෘක්ෂයෙන් හා වරාගච්ඡයෙන්ද, හෙවත් කොස්ගසින්හා වරාගසින්ද; මිදිතු වරා, මිදිගසින්හා තුවරගසින්ද; (යන) මෙතුරා, මේ වෘක්ෂයන් ගෙන්; යුතු, යුක්තවූ; වනඅතුරා, අරණ්‍යාභ්‍යන්තරය; එවරා, ඒ (යන්නාවූ) කාලයෙහි; කුමරිවරා, කුමාරිකා උත්තම්තොමෝ (උතුම්වූ) කුමාරිකාතොමෝ; දුටි, දක්නය කළාය.

---

* "ත්‍රිපර්ණී,‖ ත්‍රිණ්ත්‍රිණි ප්‍රතිපත්‍රං පර්ණාන්‍යස්‍ය කිංශුකෙ වන කාර්පාසන්‍යාංසි" තිබෑවින් ත්‍රිපත්‍රයනු එරබදුහෝ වල්කපුබව හැගෙ.

† "ශ්වෙතසාර, ශ්වෙතසාරො අස්‍ය ශුක්ලඛදිරෙපි" පෙණෙන හෙයින් ශ්වෙතසාරයනු හෙලකිහිරිබවද දතයුතුයි.

87 ලි ඟ ස බ ඳ නු රු සමු ඳ මල් පල ඳ සිරි එ ස ඳ
වැ ඳ ස ප ඳ එ හි න් බ ඳ මල් හි ඟි ඳ කළ නියා ඳ
සොඳ සුව ඳ ඇ ති නි බ ඳ වන ස මු ඳ ඇසු ව න ඳ
එ ව න මැ ඳ එ වි ඳ වි ඳ දෙදෙනසෙඳ ගියෝ එ ඳ

* 87 ලිඟසබිඳ, ලතාසම්බන්ධවූ; නුරුසමුඳ, වෘක්ෂසමූහයා; මල් පලඳ, පුෂ්පඵලදායකව; සිරිඑසඳ, සිරියාවූ ඒකාලයෙහි; එහි, ඒ වෘක්ෂයන්හි; සපඳ, ෂට්පදීහු (භෘඞ්ගයෝ); වැඳැ, ප්‍රවිෂ්ටව; සො ඳ, ශෝභනවූ; සුවඳඇති, සුගන්ධවත්වූ; මල්හිඟිඳ, පුෂ්පයන්හිහි සිඳනයකොට; කළනියාඳ, කරණලද නාදයට; නාඳ, සනතුෂ්ටවූ; වනසමුඳ, වනසමූහයාදෝහෝ නොහොත් විරහ ස්ත්‍රීසමූහයා; නි බඳ, නිරන්තරයෙන්; ඇසුව, ආශ්‍රයකොට; එවනමැඳ, ඒවනම ධ්‍යයෙහි; දෙදෙන, (ඒ) දෙදෙනා; එවිඳවිඳ, ඒ විඥානයකොට; සෙඳ, ශ්‍රීව; එඳ, එදවස්හි; ගියෝ, ගමනයකළාහුය.

88 මළින ව ලා ලියෙනිවෙලා සිරි ලක ලා රුකිනව ලා
පල බර ලා අතු නැම් ලා මුණු කර ලා එම ඉදී ලා
නෙදඳකැ ලා කත එක ලා බිම වැටි ලා තුබු එප ලා
ගෙණඅවු ලා වෙනඅවු ලානොදැනෙකලා ගියෝ ප ලා

† 88 මළිනවලා, පුෂ්පයෙන් ආකූලවූ; ලියෙනි, ලතායෙන්; වෙ ලා, වෙසීනව හෙවත් දැවිලිලා; ලකලාසිරි, අලංකෘතව සිරියාවූ; ඊලාරුකින්, වනවෘක්ෂයන්ගේ; පලබරලා, ඵලභරිතව හෙවත් ඵලයෙන් බරව; අතුනැම්ලා, ශාඛානම්‍රවහෙවත් කිණිහිනැමී; මුණුකරලා, මෝරමින්; එම්ඉදීලා, එම අතිපක්වභාවයට පැමිණ; නෙදඳකැලා, නොයෙක් පක්ෂිසමූහයා; කතඑකලා, අනුභවකර න්නාවූ ඒකාලයෙහි; බිමවැටිලාතුබු, භූමියෙහි පතිතව තිබුනාවූ; එපලා, ඒඵලයන්; අවුලාගෙණ, එකතුකොට ගණිමින්; වෙනඅ වුලා නොදැනා, (තමන්ට මතු පැමිණෙන්නාවූ) ආරාවුල නො දැන; එකලා, ඒ කාලයෙහි; පලාගියෝ, පිටත්වගියෝය, හෙව ත් පනා ගියාහුය

89 දඳ නිසා රා එවන තු රා තුරු සිස රා හිඳ නොව රා
ඉඳුනොව රා එපෙල ඉ රා රසය ළු රා බී ම ද රා
තුටිනෙත රා උතුන් කා රා පැනපිය රා ඟඬහ ස රා
කුමරිවි රා සවස් පු රා ඇසිනොවරා ගන අත රා

* මෙම 87වෙනි 88වෙනි දෙකව් මෙසේසත්හලීනුමුත් කාව්‍යකා රීගේ අදහස නොදන්නාඅයට අනුමානසහිතවේ.

† මෙහි "විලාරුකින්" යනු සම්බන්ධියෙහි කරණවිභක්තිසි.

89 එවනතුරා, ඒ අරණ්‍යාභ්‍යන්තරයෙහි හෙවත් ඒ වනය අතරෙහි; දදණිකරා, පක්ෂිසමූහයෝ; තුරු සිසරා, වෘක්ෂයන් සිසාරා; නොපටා, නොපැලකී; යිඳැ, හිඳිම්කොට හෙවත් වාසය කොට; එවරා, ඒකාලයෙහි, ඉදුනු, ඉදුනාවූ; එපෙල, ඒඵලයන්; ඉරා, විදාරනකොට හෙවත් පලා; මදුරා, මධුරවූ; රසඋරා, රසඋරා; බී, පානයකොට; තුටිණි, සන්තොෂයෙන්; එතරා, උත්තරිතාව හෙවත් එතරව, නොහොත් එතරා, ඒකාලයෙහි; උනුන්කාරා, අන්‍යොන්‍යයන් (ඔවුනොවුන්) කරා; පියරා, පක්ෂප්‍රසාරණයකොට, හෙවත් පියාසර කොට; පැන, උල්ලංඝනය කොට; (පැනලා) ගබගසරා, ගඩින්නාවූ හඬරැගෙන්; කුමරිවරා, (ඒ) කුමාරිකා උන්නම්; යහඅතරා, ගමනය කරන්නාවූ අතරෙහි; නොපරා, නොපැලකී; සවන්පුරා, කර්ණපූරණයකොට, හෙවත් කන්දෙකපුරා; ඇසී, ඇසුවාය.

90 රඹ අර ණා බිඳැ හර ණා නද කර ණා නෙක වර ණා
තුටු සිති නා රැව් දෙමි නා නිති රඟ ණා මියුරැ ග ණා
සරඟ ග ණා විදැ මර ණා එහි සර ණා සබර ග ණා
දැකැ එව නා පහදෙදෙනා තුටු සිති නා ගියො එදි නා

90 රඹ අරණා, රම්‍යාරණ්‍යයන්; බිඳැ හරණා, බිඳ හරින්නාවූ; නදකරණා, නාදකරන්නාවූ; නෙකවරණා, නොයෙක් වාරණයන්ද, හෙවත් නොයෙක් හස්තීන්ද; තුටුසිතිනා, තුෂ්ටවූ චිත්තයෙන්; රැව්දෙමිනා, රාවදෙනයකරමින්; නිති, නිරන්තරයෙන්; රඟනා, නෘත්‍යකරන්නාවූ හෙවත් නටන්නාවූ; මියුරැගණා, මයුර සමූහයන්ද; එහි, ඒ අරණ්‍යයෙහි; සරණා, සඤ්චාරණය කරන්නාවූ; සරඟගණා, සාරඞ්ග සමූහයා, හෙවත් මුවසමූහයා, විදැමරණා; විදමරන්නාවූ; සබරගණා, වැදි සමූහයන්ද; දැකා, දර්ශනයකොට; එවනා, ඒවනයෙහි; යන, ගමනකරන්නාවූ; දෙදෙනා, (වෙලඳදෙටුහා ඒකුමාරිකාවද යන) දෙදෙනා; දැකා, දර්ශනයකොට; තුටුසිතිනා, සන්තුෂ්ටවූ චිත්තයෙන්; එදිනා, එදවස්හි; ගියෝ, ගමනය කළෝය.

91 නෙගජරැලා මැදපැනැ ලා මුදුනප ලා රැගෙණගෙලා
කන එක ලා විකුම්බ ලා ඇතිලක ලා මියුදු කැ ලා
නෙමුවකැලා බිය කර ලා විසු එක ලා නොකසදු ලා
දකැනොව්ලා සිත බිය ලා දෙදෙනෙකලා ගියෝ ව ලා

91 නෙගජරැලා, නොයෙක් හස්තිසමූහයාගේ; මැදපැනැලා, මධ්‍යසට්පැන; මුදුනපලා, මස්තකය විදාරණයකොට, හෙවත් හි

සපලා; මොලා, හිස්මොල; රැගෙණ, ග්‍රහණයකොට; එකලා, හුදකලාව; කත, භක්‍ෂනය කරන්නාවූ, නොගොත් එකලා, ඒකාලයෙහි; විකුම්බලා ඇති, වික්‍රමහා ශක්තිය ඇත්තාවූ; මිගිඳුකැලා, සිංහසමූහයන්ද; එකලා, ඒකාලයෙහි; නෙමුවකැලා, නොයෙක් මෘගසමූහයන්; බියකරලා, භයකොට; විසූ, වාසයකලාවූ; නෙක්සදුලා, නොයෙක් ශාර්දූලයන්ද; නොවලාදැකැ. නොවලාහාදැක; සිතබියලා, සිත්හි භයහැර; එකලා, තත්කාලයෙහි; වලා, අරණ්‍යයෙහි; ගියෝ, ගියාහුය.

92 මග දෙප සා සිටි සර සා නෙතුරුරැසා එක විල සා
එවන නි සා සිටිය;ව සා හැම දව සා සිල් විම සා
හැර අල සා වඩන උ සා රැකි තව සා නෙකතව සා
යන එලෙ සා කුමරිනො සා දැකසක සා ගියනොල සා

92 මගදෙපසා, මාගීයාගේ දෙපාර්‍ශ්වය; එකවිලසා, එකාකාරයෙන්, සරසා, සජ්ජිතකොටහෙවත් අලංකාරකොට; සිටි, සිටියාවූ; නෙතුරුරැසා, නොයෙක් වෘක්‍ෂසමූහයන්ද; එවනනිසා, ඒ වනයනිසා හෙවත් ඒවනය ආශ්‍රයකරගෙණ; හැමදවසා, සැමදවස්හි; සිල්විමසා, ශීල විමංසනයකොට; (සිල්සොයමින්) වසා, වාසයකොට; සිටිය, සිටියාවූ; අලසාහැර, ආලශ්‍යය පහකොටහෙවත් අලසබවහැර; උසාවඩනා, උත්සාහ වඩන්නාවූ; රැකිතවසා, කෙලශ තාපනය රක්‍ෂාකලාවූ; නෙකතවසා, නොයෙක් තාපසයන්ද; එලෙසායන, එපරිද්දෙන් යන්නාවූ; කුමරි, කුමාරිකා තොමෝ; සකසා, සකස්කොට; දැකැ, දර්‍ශනයකොට; තොසා සන්තුෂ්ටව; නොලසා, අනලස්ව; ගිය, ගමනයකලාය.

93 ඉදුරැ ස ඳු මන නත් ඳු කල නත් ඳු සර මෙන් ඳු
පිපිනොම ඳු නෙකකුන් ඳු අර වින් ඳු හස කන් ඳු
ඇති හැම ඳු පිරි චන් ඳු කර මෙන් ඳු දල කන් ඳු
දු ටි එ ස ඳු සර කන් ඳු දුක් සින් ඳු මන බන් ඳු

93 ඉඳුරැසඳු, ශක්‍රදෙවේන්ද්‍රයා විසින්; මනනන්ඳුකල, මනොනන්දනය කලාවූ හෙවත් චිත්ත සන්තෝෂය කලාවූ; නන්ඳුසර මෙන්ඳු, නන්ඳුනම් දිව්‍යොධ්‍යානවමෙන්; පිපි, ප්‍රබුද්ධවූ; නොමඳු, බොහෝවූ; නෙකකුන්ඳු, නොයෙක් කොඳහා; අරවින්ඳු, කෙරවයන්හි; හසකන්ඳු, හංස සමූහයා; ඇති, විද්‍යමානවූ; හැමඳු, සැමකල්හි; චන්ඳුකර මෙන්ඳු, චන්ද්‍රකාන්තිය මෙන්; පිරි, සම්පූර්ණවූ; දලකන්ඳු, ජලසකන්ධයන් ඇත්තාවූ; සරකන්ඳු, තඩාකසමූහයන්ද; එසඳු, ඒකාලයෙහි; මනබන්ඳු, චිත්තයෙහිබැඳුනාවූ; දුක්සින්ඳු, දුඃඛච්ඡෙදනය කොට හෙවත් දුක් නැතිකොට; දුටි, දර්‍ශනය කලාය.




(39 පිට.)

කුමාරිය සහ වෙළඳජනයා අතරට සිංහයා පැමිණීම.




... පිට.) සිංහයා තමාසිට කුමාරි ගිඳුවාගෙණ යාම.

94 සොඳ එම ගා සිටිය ල ගා මත මත ගා අනෙක ව ගා
පැන මුර ගා යන නොමගා නෙකසරගා කෙළිනර ගා
නැගී ගිර ගා කිඳුරුර ගා සිටින ර ගා එම නර ගා
යනමෙර ගා කුමරි ම ගා නොවම්ලගා ගිය එම ගා

94 සොඳඑමගා, යහපත්වූ ඒමාගීයාගේ; ලගා, ආසන්නයෙහි; සිටිය, සිටියාවූ; මතමතගා, මත්තගජයින්ද; අනෙකවගා, නොයෙක් ව්‍යාඝ්‍රයන්ද, නොහොත් අනෙකවගා, නොයෙක්වගී ඇත්තාවූ; මතමතගා, මත්ත මාතඟයන්ද, හෙවත් මතැතුන්ද; මුරගා, කැගසා; පැන, පැනලා; නොමගා, අමාර්ගයෙහි; යන, ගමනය කරන්නාවූ; නෙකසරගා, නොයෙක් මෘගයන්ගේ; කෙළිනරගා, ක්‍රීඩාකරණ ආකාරයන්ද; ගිරගා, පර්වතමස්තකයට; නැගී, ආරූඪවූ; කිඳුරු, කින්නරයන් විසින්; රගාසිටින, නෘත්‍යකොටසිටින්නාවූ; රගා, ආකාරයන්ද; එමනරගා, ඒමනෝරම්‍යවූ ආකාරයන්ට; මෙරගා, මෙයාකාරයෙන්; මගායන, මාර්ගයෙහි ගමනගකරන්නාවූ; කුමරි, කුමාරිකාතොමෝ; ලගානොවම, සමීප නොවීම නොහොත් ලගානොවම; ( ලගානොවීම ) එම්ගා, ඒමාගීයෙහි; ගිය, ප්‍රයානයකලාය.

---

95 මෙ බ ඳු වනසිරි බලා එකුමරි වෙලඳදෙවු සමගින් එ ද
ප සි ඳු වනමැද සුදුසුඉඩම්කැ රැනිවාතැන් ගත්තේ ද
නොමඳු තදරළු පරළු බලතර මිගරදෙක් අවුදින් සෙ ද
වෙ ල ඳු දැකා උනතුරට සෙනෙහඬ විලසනදකරමින් [illegible] ද

95 මෙබඳු, මෙයාකාරවූ; වනසිරි, වනශෝභාශ්‍රී; බලා, අවලොකනයකොට; එකුමරි, ඒකුමාරිකාව; වෙලඳදෙවු සමගින්; වාණිජජ්‍යෙෂ්ඨයාහා සමග; හෙවත් ප්‍රධාන වෙළඳුහා සමග; එදුරු, එදවස රාත්‍රියෙහි; පසිඳුවනමැද, ප්‍රසිද්ධවූ වනමධ්‍යයෙහි; සුදුසුඉඩම්කැ, සුදුසුවූ තැනෙක්හි; නවාතැන්ගත්තේද, නිවාසස්ථාන ග්‍රහණය කලකල්හි, හෙවත් නැවතීසිටීම ගත්කල්හි; නොමඳු, බොහෝවූ; තද, ඝනබ්ධවූ; රළුපරළු, රෞද්‍රවූ ප්‍රකෘතියෙන් රෞද්‍රවූ; බලතර, අතිශයින් බලවත්වූ; මිගරදෙක්, මෘගරාජයෙක් තෙම; සෙඳ, ශීඝ්‍රව; අවුදින්, ආගමනයකොට; වෙලඳු දැකා, වාණිජයන්දැක; උන්අතුරට, ඔවුන්ගේඅභ්‍යන්තරයට; සෙනෙහඬවිලස, අසනිනාදයක්මෙන්; නදකර, නාදකොට; පිණුසඳ, පැන්නකල්හි.

96

එ න ද අසමින් වෙලඳුබියගෙණ බිසවඇරලා ගියක ලං
නොමද රුසිරෙන් සුරඟණකමෙක් දිලෙන එනරුණ බිසවදූකලා
සි ර ද රතිසැප විඳිමිසිතමින් පැමිණ බියගැර පසන්කර ලං
එ ල ද තමපිට ඉඳුවමින් ගෙණගොසින් ගිරිලෙණ තුලෙහි ලා

96 වෙළඳු, වාණිජයෝ (වෙළඳජනයෝ;) එනදඅසමින්, ඒ සිංහරාජයාගේ නාදයඅසමින්; බියගෙණ, භයගෙණ; (බියවෙලා) බිසවඇරලා, රාජකුමාරිකාව අත්හැරලා; ගියකලා, ගියකල්හි; නොමඳරුසිරෙන්, අමන්දවූ රූපශ්‍රී කාරණකොටගෙණ; සුරඟණකමෙන්, දිව්‍යාංගණාවක්මෙන්; දිලෙන, බබලන්නාවූ; එතරුණබිසවදැකලා, තරුණවූ ඒරාජකුමාරිකාව දැකීමයකොට; සිරද, සිංහරාජතෙම; රතිසැප, රතිසැපය; විඳිමි සිතමින්,විඳිමි යි සිතමින්; පැමිණිබියහැර, පැමිණියාවූභය අත්හරවා; පසන්කර ලා, ප්‍රසන්නකොට; එලඳ, ඒ රාජකුමාරිකාව; තමපිට, තමන්ගේ පිටෙහි; ඉඳුවමින්, ඉන්දවමින්; ගෙණ ගොසින්; හැරගෙණගොස්; ගිරිලෙණ තුළෙයි, පර්වත ගුහාව ඇතුළෙහි; ලා, බහා; (හිඳුවා.)

97

රති සැපතවිඳ එලඳසමඟින් සත්දිනක් එහි වසමි නා
රුති ගොදුරු කනපිණිස පිටතට යන්ටනික්මි සැකයෙ නා
නිති නොයනයමෙන් එකතවෙනතක ගල්දෙරක්එහි වසමි නා
නැති සියලු උපකරණ ගෙණදී බිසවසිත තුටුකරමි නා

97 එලඳසමගින්, ඒ රාජකුමාරිකාවන් සමග; රතිසැපත, පංච කාමසම්පත්තිය; විඳ, විඳිනයකොට; සත්දිනක්, සතියක්මුළුල් ලෙහි; එහි, ඒගල්ගුහාවෙහි; වසමිනා, වාසයකරමින්; රුතිගො දුරු, රුචිවූ ආහාර; කනපිණිස, අනුභවකිරීමපිණිස; පිටතට, පිටත්හි; යන්ට, යාමපිණිස, නික්මි, නික්මිලා; සැකයෙනා, ශංකාවෙන්; නිති, නිරන්තරයෙන්; එකත, ඒකාන්තාව; වෙනඅත ක, අන්අතකට; නොයනමෙන්, ගමනය නොකරණ පරිද්දෙ න්; එහි, ඒගල්ගුහාවෙහි; ගල්දෙරක්, ගල්ලෑලිදොරක්; වසමි නා, වසමින්; නැති, (එහි) නැත්තාවූ; සියලුඋපකරණ, සියලුඋ පකරණයන්; ගෙණවුත්දී, ගෙණත්දීලා; බිසව, (ඒ) රාජකුමාරි කාවගේ; සිත, චිත්තය; තුටුකරමිනා, සන්තොෂකරමින්.

98

සතොස වියපුතු තමන්සියකුල සිහදෙනුන්වත් ලොබනොකොට හැ ර
එ අ ස යනඑන ඇතුන්දුටුවත් ගොදුරුඇලය සිතීනි දුරුක ර
නිදෙ ස දෙවහණ සිරින්බබලන බිසවසඟ සිහරදහු ගොරත ර
මෙලෙ ස තිරිසන් මිනිස්එදෙදෙන සඳේලපලෙස විසුපෙමක ර

98 තමන්, තමාවිසින්; සතොසවියපුතු, සන්තුෂ්ට වියපුතුවූ; සියකුල, ස්වකීය ජාතියෙහි; සිහදෙනුන්වත්, සිංහධේනුන්වද ලොබනොකොටහැර, ලොභය නොකොට අත්හැර; එඅස, ඒ සමීපයෙහි; යනඑන. ගමනා ගමනය කරන්නාවූ; ඇතුන් දුටු වත්, හස්තීන් දකීනය කෙලේද; ගොදුරුඇලය, ගොචරයෙහි

ආශාව; සිතිනිදුරුකරු, චින්තායෙන්දුරුකොට; නිදෙස, නිදෝ
ෂවූ; දෙව්ගණසිරිත්, දිව්‍යාංගණාවකගේ ශ්‍රීයෙන්; බබලන, බබ
ලන්නාවූ; බිසව්සහ, රාජකුමාරිකාවසමග; ඝොරතර, ඝොරත
රවූ; සිහරදනු, සිංහරාජයාද; මිනිස්, මනුෂ්‍යවූ රාජකුමාරිකාවද;
තිරිසන්මිනිස් එදෙදෙන, තිරශ්චීනය මනුෂ්‍යය (යන) ඒදෙදෙනා:
සඳේ, චන්ද්‍රයාගේ; ලපලෙස, ලාඤ්ජණයමෙන් හෙවත් සලකුණ
මෙන්: මෙලෙස, මෙයාකාරයෙන්, පෙම්කරු, (ඔවුනොවුන්කෙ
රෙහි) ප්‍රෙමයකොට; විසූ, වාසයකළෝය.

99 ක රු මයෙන් පෙර මෙලෙස මිගිඳුට අසුවවසනා බිසව වා
ද රු ගැබෙක්විය මහත්පින්ඇති සිහිව මව්පිය එම්වි වා
දු රු ව ආබව සිතා ඔවුනැර ඉතා තදදුක් විඳිනා කල වා
දූ රු නෙ දෙලදුක් ලකුණුළ්බිසව දරුපතට වන විලසවා

99 පෙර, පූර්වයෙහි; (කරණලද්දාවූ) කරුමයෙන්, (පාප) කර්
මයක් හේතුකොටගෙණ; මෙලෙස, මෙයාකාරයෙන්; මිගිඳුට, සිං
හරාජයාහට; අසුවී, අසුවෙලා; වසනා, වාසයකරන්නාවූ; බිස
වටං, (ඒ) රාජකුමාරිකාවට; මහත්පින්ඇති, මහත්පුණ්‍යවන්තවූ;
දරුගැබෙක්විය, දරු ගැබෙක් වූයේය; එම්විටා, ඒ කාලයෙහි;
මව්පිය, මාතෘපිතෘන්; සිහිව, සිහිව්; ඔවුන්ඇර, ඒමාතෘපිතෘන්
අත්හැර; දුරුවආබව, (ඔවුන්කෙරෙන්) දුරුවෙලාආබව්; සිතා,
චින්තනයකොට; තදදුක්, තදවූදුකක්; විඳිනකලටා, විඳිනයක
රණකල්හි; දරුළපතට, දරුකොත්පත්තියපිණිස; වනවිලසටා,
වන්නාවූ පරිද්දෙන්; එබිසව, ඒ රාජකුමාරිකාතොමෝ; නෙදෙ
ලදුක්ලකුණු. නොයෙක්දෙලදුක්ලකුණු; දැරූ, ධාරණයකළාය.

100 සොඳු රු සිහිනිහ ඉතාදලවිය සුරතඳර සුදුමැලි වි යේ
ම හ රු රන්කඳ ලෙසට බැබළුන පිරිසිරුර සුදුමැලිවි යේ
ත ඹු රු වන් වත මලානිකවිය පියයුරන්පුඩු කළු වි යේ
බ දු රු රතිකෙළි ඇළුම්මඳවිය දුබුලාඹුල්රස පිය වි යේ

100 සොඳුරු, සුන්දරවූ; සිහින්ඉහ, කෘෂවූ මධ්‍යප්‍රදේශය, හෙ
වත් සිහින්වූ තුනටිය; ඉතාදලවිය; ඉතාදැඩිවූයේය; සුරතඳර,
අතිශයින් රක්තවර්ණවූ අධරය හෙවත් යහපත් රතුපැහැඇති දෙ
තොල; සුදුමැලිවියේ, සුදුමැලිවූයේය; මහරු, මනොඥවූ; රන්
කඳලෙසට, ස්වර්ණස්කන්ධයක්මෙන්; බැබළුන, බැබළුනාවූ; පිරි
සිරුර, පිරුණාවූශරීරයද; සුදුමැලිවියේ, සුදුමැලිවූයේය; තඹුරු
වන්වත, පියුමක්වැනිවූ මුහුණද; මලානිකවිය, මලානිකවූයේය;
පියයුරන්පුඩු, පයොධරයන්ගේ අග්‍රයන් හෙවත් දෙතනපුඩු; කළු

වීයේ, කෘෂණ විෂීවූයේය; බදුරා, මනොඥවූ; රතිකෙළි, රති ක්‍රීඩාවට; ඇළුම්මඳවිය, ආලයමඳවූයේය; දුඹුලැඹුල්රස, දුඹුල්ර ෂයටහා ආම්ලරෂයන්ට; පියව්ගේ, ප්‍රිය (මනාප) වූයේය.

101

මෙසුරු දෙලදුක් ලකුණුදුකළුම මිගිඳු තැනතැන ඇවිදවනමැ ද
මි සුරු පලවැලගෙණැත්කවමින් වෙනත්උවටැන් කරණඑමස ද
එ දරු ගැබ මොහොරමින් දසෙකඩමස්පිරිමෙන් පැහැරවිලිරද
කු මරු කුමරිය යනදෙබින්නක් පසූතකලෙ එම්බිසව මනනා ද

101 මෙසුරු, මේ (උක්ත) ප්‍රකාරවූ; දෙලදුක්ලකුණු, දෙහල දුඃඛලක්‍ෂණය; දැක, දැකලා; එමමිගිඳු, ඒසිංහරාජතෙම; වන මැද, වනමධ්‍යයෙහි; තැනතැන, තන්හිතන්හි; ඇවිද, සඤ්චර ණයකොට (ඇවිදලා;) මිසුරුපලවැල, මිහිරිවූඑලාඑල හෙවත් මුහුකරඉදුනාවූ ඵලාඵල; ගෙණැත් කවමින්, ගෙණවුත් අනුභව කරවමින්; වෙනත්, අන්‍යවූද; උවටැන්, උපස්ථානයන්; කරණ එමසඳ, කරන්නාවූ එමකාලයෙහි; එදරුගැබ, ඒදරුගැබ; මො හොරමින්, මුහුකරමින්; දසෙකඩමස්පිරිමෙන්, දසමසක්හා එ ක්අඩමසක් පිරිමෙන්; විලිරදපැහැරැ, විලිරදයපහරා; (ප්‍රසූත වීමටහටගත්නාවූ බඩරුජාවහටගෙණ) කුමරුකුමරියයන, කුමා රයාය කුමාරිකාවයයි කියන්නාවූ; දෙබින්නක්, නිවුන්දරුදෙ දෙනෙක්; මනනද, චිත්තසන්තොෂකරන්නාවූ; එබිසව, ඒකුමා රිකාතොමෝ; පසුතකළේ, ප්‍රසූතකළාය.

---

102 එ ස ද දෙගුරුවර සොඳි නා—සෙද,
පැහැ ද තරිඳු රැස් වන්මෙන් කිර ණා
සු හ ද කුමරුනට සොබ නා—යලි,
පෙම ද ව බත්දීලා සත්මසි නා

102 එසඳ, තත්කාලයෙහි; දෙගුරුවර, මාතෘ පිතෘ දෙදෙනා; සොඳිනා, යහපත්ව; සෙද, වහා; තරිඳුරැස්වන්, චන්ද්‍රකාන්තිය වන්නාවූ; කිරණාමෙන්, ක්‍ෂීරාණ්වයමෙන් හෙවත් කිරිමුහුදමෙ න්, සෙද, වහා; පැහැදැ, ප්‍රසන්නව; සොබනා, ශොභනවූ; සුහදකුමරුනට, සුභෘදවූකුමාරවරුන්ට; යලි, නැවත; පෙමදව, ප්‍රෙමයෙන්ආර්ද්‍රව හෙවත් ප්‍රෙමයෙන් තෙත්ව; සත්මසිනා, සත් මාසයකින්; බත්දීලා, බත්අනුභවකරවා.

103 කු ම රු ට සිහබා නම් නා—නං,
කු ම රි ට සිහවල්ලිය යන නම් නා
මෙලෙසට නම්ලත් දෙදෙ නා—සූර,
න රි ඳු ට සමවී වැඩුනහ කෙමෙ නා

103 කුම්රුට, කුමාරයාහට; සිහබාහනමිනා, සිංහබාහුයන නාමයෙන්ද; නං, නැගණිවූ; කුමරිට, කුමාරිකාවහට; සිහවල්ලියයනනම්නා, සිංහවල්ලියයිකියන නාමයෙන්ද; (ව්‍යවහාරකලෝය,) මෙලෙසට, මෙයාකාරයෙන්; නම්ලත්, නාමලාභිවූ; දෙදෙනා, (ඒකුමාරකුමාරිකා) දෙදෙනා; පූරතරිඳුටසමවී, පූරපසලොස්වක චන්ද්‍රයාහා සමානව; කෙමෙනා, ක්‍රමයෙන්; වැඩුනාහ, වර්‍ධනයවූහුවෝ. (වැඩුනෝ)ය.

104 සක්විති මිහිපති සදි සා—සක්,
රුවන ලැබූසිත තුටුකර විග සා
දුක්නොව මව්පිය සතො සා—සක්,
දෙකමෙන් කුමරුන් රැකිහුය වෙසෙසා

104 සක්රුවන්ලැබූ, චක්‍රරත්නයලැබුවාවූ; සක්විති මිහිපතිසදිසා, චක්‍රවර්ති රජකෙණෙක් සමානව; විගසා, ශීඝ්‍රව; සිතතුටුකර, චිත්තයසන්තුෂ්ටකොට; මව්පිය, මාතෘපිතෘහු දෙදෙනා; දුක්නොව, දුකක්නොවී; සතොසා, සන්තොෂඇතිව; සක්දෙකමෙන්, අක්‍ෂියුග්මයමෙන්; වෙසෙසා, විශෙෂයෙන්; කුමරුන්, කුමාරයන්; රැකිහුය, රක්‍ෂාකළාහුය.

105 සිහබා කුමරිඳු සඳු වා—වස්,
සොළස සපිරිසඳ ගොස්මව් වෙත වා
සුරතල් තෙපුලෙන් එවි වා—තම්,
වෙනස අසයි මවගෙන් මේ ලෙස වා

105 එවිටා, එකල්හි; සිහබාකුමරිඳුසඳුවා, සිංහබාහු කුමාරොත්තමයාහට; සොළස වස්, ෂොඩශවර්‍ෂයක්, හෙවත් දහසාවුරුද්දක්; පිරිසඳ, සම්පූර්‍ණවූකල්හි; මව්වෙතවා, මෑණියන්ගේ සමීපයට, ගොස්, ගමනයකොට; සුරතල් තෙපුලෙන්, සුරතල්වචනයෙන්; තම, තමාගේ; වෙනස, වෙනස්බව; මවගෙන්, මෑනියන්ගෙන්; මෙලෙසටා, මේආකාරයෙන්; අසයි, අසන්නේය, නොහොත් ඇසූයේය.

106 සොඳුරු මෑනියනි නඳ නා—මෙම,
න පු රු වෙනෙහි නිරතුරු වම වසනා
කෙස රු ව දූ අපි දෙදෙ නා—පිය,
අ පු රු නොවන්නට කාරණ කුම නා

106 නඳනා, සන්තුෂ්ටවූ; සොඳුරු, සෞන්දර්‍යයිවූ; මෑනියෙනි, මෑනියන්වහන්ස; නිරතුරුවම, නිරන්තරයෙන්ම; මෙම නපුරු වෙනෙහි, මේ නපුරුවූ වනයෙහි; වසනා, වාසය කරන්නාවූ;

කෙසරුවද, සිංහරාජයාහට ජාතකවූ; අපිදෙදෙනා, අප්මත්තු දෙදෙනා; පියඅයුරු නොවන්නට, පිතෘහුගේ ආකාර නොවීම පිණිස; කාරණකුමනා, කාරණය කවරේද.

107 මෙලෙස ඇසූවිට කුම රූ—යලි,
එ බ ස ට එබිසව පවසයි මෙයු රූ
දි යෑ ස කුලග තිලකයු රූ—දස,
සි යෑ ස සදිසි වගුනිරිඳුට මහ රූ

107 කුමරූ, කුමාරයාවිසින්; මෙලෙසඇසූවිට, මෙයාකාරයෙන් විචාළකල්හි; යලි, නැවත; එබසට, ඒවචනයට; එබිසව, ඒරාජ කුමාරිකාතොමෝ; මෙයුරූ, මේආකාරයෙන්; පවසයි, කියන් නිය නොහොත් කීවාය; (ඒකෙසේදයත්) දියෑසකුලග, සූර්‍ය්‍යවංශයට අග්‍රවූ; තිලකයුරු, තිලකාභරණයක් වැනිවූ; දසසියෑසසදිසි, දහසක් ඇස්ඇති ශක්‍රදෙවෙන්‍ද්‍රයාහා සමානවූ; මහරූ, මනොඥවූ; වගුනිරිඳුට, වඟුනරෙන්ද්‍රයාහට.

108 දූ ව නොයෙක් සැපතින් වැඩි ලා—මම,
බෝ ව කරපුපවකින් පෙර මෙක ලා
මේ ව න මැදටම වැදි ලා—විත්,
සී ර ද හට අසුවීමෙන් මෙක ලා

108 දූව, ජාතකවී; නොයෙක්සැපතින්, නොයෙක් සම්පත්තීයෙන්; වැඩිලා, වර්ධනයවෙලා; මම, අප්මත්තොමෝ; පෙර, පූර්‍වයෙහි; බෝවකරපුපවකින්, බොහෝව කරණලද්දාවූ පාපකර්‍මයක් කාරණකොටගෙණ; මෙකලා, මේවර්තමානකාලයෙහි; ඇවිත්, අවුදින්; මේවනමැදටම, මේඅරණ්‍යමධ්‍යයටම; වැදිලා, ප්‍රවිෂ්ටවෙලා; මෙකලා, දැන්කාලයෙහි; සීරදහට, සිංහ රාජයාහට; අසුවීමෙන්, අසුවීමහේතුකොටගෙණ, (වසඟවීමෙන්)

109 දැ න් විඳිනා දුක් නොම දේ—හැම,
අ න් තිමකර කියනට බැරි මෙස දේ
වෙ ත් ව උපන්බව මෙලෙ දේ—පුත,
මෙ ත් න මෙකාරණයයි කී එස දේ

109 දැන්, මේකාලයෙහි; නොමදේ, අමන්දව; විඳිනා, විඳින්නාවූ; හැමදුක්, සකලදුඃඛයන්; මෙසදේ, මේඅවස්ථාවෙහි; අන්තිමකර, පර්‍ය්‍යන්තකොට හෙවත් කෙළවරකොට; කියනට, කියන්ට; බැරි, නොහැක්කේය; පුත, පුත්‍රයානෙනි; මෙලෙදේ, මේ ආකාරයෙන්; වෙත්වඋපන්බව, වෙනස්ව උපන්නාවූ භාවය; (නම්)

මෙන්න මෙකාරණයයි, මෙන්න මේ කාරණයයිකියා; එසඳේ, ඒකාලයෙහි; කී, කීවාය.

110 මෙලෙස බිසෝවර කීබ සා—ඇසූ,
නි දෙ ස සිංහබා කුමරිඳු විම සා
දි ගැ ස කෙනෙක් පෙර දව සා—මෙම,
වි ල ස මිගෙක්සඟ විසුවෙද කෙදෙසා

110 මෙලෙස, මේආකාරයෙන්, බිසෝවර, රාජකුමාරිකා උත්තමියවිසින්; කීබසා, කියනලදවචනය; ඇසූ, ඇසුවාවූ; නිදෙස, නිර්දෝෂවූ; සිංහබා කුමරිඳු, සිංහබාහු නම් කුමාරතෙම; විමසා, පරීක්ෂාකොට; පෙරදවසා, පූර්වකාලයෙහි; මෙම විලස, මේආකාරයෙන්; දිගැසකෙනෙක්, දීර්ඝාක්ෂිකෙනෙක් හෙවත් ස්ත්‍රියක්තොමෝ; මිගෙක්සඟ, මෘගයෙක්හාසමග; කෙදෙසා, කවරප්‍රදේශයෙක්හි; විසුවෙද, වාසයකළේදැ (යි.)

111 ය න බස කියමින් එක ලා—ගුණ,
නැ ණ බලඇති කුමරිඳුසඳ ලක ලා
ව න යෙන් යනමෙන් සිත ලා—ගැල,
වෙ න් උවමක්කළෙමෙලෙසින් නුමුලා

111 යනබස, යනමේවචනය; කියමින්, කථනයකරමින්; එකලා, ඒකාලයෙහි; ගුණනැණබලඇති, ගුණහා ඥානබලඇත්තාවූ; ලකලා, අලංකෘතවූ; කුමරිඳුසඳ, කුමාරෝත්තම තෙමේ; වනයෙන්යනලෙස, අරණ්‍යයෙන් යන්නාවූආකාර; සිතලා, චින්තනයකොට; නුමුලා, මුළානොවී; ගැලවෙනඋවමක්, ගැලවෙන්නාවූ උපමාවක්; මෙලෙසින්, මේමතුකියනආකාරයෙන්; කෙළේ, කෙළේය.

---

112 මි ග ප ති ගොදුරට ගියවිට වල වා
ර ති ප ති සමවත් කුමරිඳු රුව වා
බ ල ඇ ති බව දැනගැණුමට ඔහු වා
බ ර ඇ ති මහ ගල්දොර හැර පිට වා

112 මිගපති, මෘගරාජන්වූ සිංහයා; වලවා, අරණ්‍යයට; ගොදුරට, ගොචරයපිණිස; ගියකල, ගියාවූකාලයෙහි; රුවවා, රූප(ශ්‍රී)යෙන්; රතිපතිසම්වන්, අනංගයාහාසමානවූ; කුමරිඳු, කුමාරෙන්ද්‍රයාවිසින්; ඔහුවා, ඕහට; බලඇතිබව, ශක්තිඇත්තාවූ භාවය; දැනගැණුමට, දැනගැණීමපිණිස; බරඇති, භාරයඇත්තාවූ; ගල්දොර, ගල්ලෑලිදොර; පිටවාඇර, පිටවිවෘතකොට.

113 දු  ර ට පනස් යොදුනක් ගොස් නොලසි න
පෙ ර වරු අවුදින් ගල්දෙර වසමි න
පෙ ර සිටි විලසට හුන්සඳ ගිරිලෙ ණ
ගොර සිරද සපැමිණි ඒනොමදැ න

113 පනස්යොදුනක්දුරට, පනස්යොදුන්දුරට; ගොස්, ගොසින්; නොලසින, අනලස්ව; පෙරවරු, පූර්වාග්ණයෙහි හෙවත් අළුයම්වේලෙහි; අවුදින්, ආගමනයකොට; ගල්දෙරවසමින, ගල්දෙර වසමින්; ගිරිලෙණ,ගල්ගුහාවෙහි; පෙරසිටිවිලසට, පූර්වයෙහිසිටිය පරිද්දෙන්; හුන්සඳ, උන්නාවූකාලයෙහි; ඒනොමදන; ඒකාරණය දැනනොගෙණ; ගොරසිරඳ, දරුණුවූසිංහරාජතෙම; සපැමිණි, සම්ප්‍රාප්තවූයේයහෙවත්(ගොදුරුපිණිසගොස්)ආයේය.

114 මෙමලෙද තමබල විමසා එදි නා
පෙරලෙද සිරද ගොදුරට ලොබි නා
ගි ය ස ද වනමැද දිනකෙක සෙදි නා
ම වු ල ද නැගණිය ගනඑම දෙදෙ නා

114 එදිනා, ඒදවස්හි; මෙමලෙද, මෙයාකාරයෙන්; තමබල, තමන්ගේබලය; විමසා, පරීක්‍ෂාකොට; පෙරලෙද, පූර්වයෙහිමෙන්; සිරද, සිංහරාජයා; ගොදුරටලොබිනා, ගොචරපිණිසලොභයෙන්; වනමැද, වනමධ්‍යයට; ගියසඳ, ගමනයකල කල්හි; සෙදිනා, වහා; එකදිනෙක, එක්දිනයෙක්හි; මවුලඳ නැගනියගන, මාතෘකාන්තාවහා නැගණියෝයයි කියන්නාවූ; එම දෙදෙනා, එමදෙදෙනා.

115 ත  ම දෙකරත හිඳුවා නික්මෙමි නා
හැ ම බිය ඇති එම වනපෙත මැදි නා
නොම දුරු මගෙකින් දිවගෙණ ගොසි නා
ග ම කට සපැමිණි මිනිසුන් වස නා

115 තමදෙකරත, තමාගේ දෙකරෙහි; හිඳුවා, හින්දවාගෙණ; නික්මෙමිනා, නික්මෙමින්; හැමබියඇති, සියලුභයඇත්තාවූ; එමවනපෙතමැදිනා, එම වනපඩකතියගේ මධ්‍යයෙන්; නොමදුරු මගෙකින්, දුරුනොවූ මාර්ගයකින්; දිවගෙණ ගොසිනා, දිවගෙණගොස්; මිනිසුන් වසනා, මනුෂ්‍යයන් වසන්නාවූ: ගමකට, (එක්තරා) ග්‍රාමයකට; සපැමිණි, සම්ප්‍රාප්තව.

116 නොමතු රු සෙවනෙහි දනගණ හැසිරෙ න
වි සිතු රු මහනුගයක් දැක බබල න
එ කුම රු එම රුකසෙවනෙහි උන්නු න
තොරතු රු අසමින් ගම්වැසි හැමදෙ න




(46 පිට.) සිංහබා කුමරු මෑණියන් සහ නැගණියන්ද කරතබාගන ගල්ගුහාවෙන් පලායාම.

116 දනගණහැසිරෙන, ජනසමූහයා සඤ්චාරණයකරන්නාවූ; නො
මතුරුසෙවනෙහි, අතරක් නොමැත්තාවූ සෙවණෙක්හි; විසිතු
රු, විචිත්‍රවූ; බඹලන, බඹලත්නාවූ; මහනුගයක්, මහාන්‍යග්‍රො
ධවෘක්ෂයක්; දැක, දර්ශනයකොට; එකුමරු, ඒ(සිංහබාහු)කුමාර
යා; එමරුක්සෙවනෙහි, එමවෘක්ෂඡායාවෙහි; උන්තැන, උන්ක
ල්හි; ගම්වැසි හැමදෙන, (ඒ)ග්‍රාම්වාසී සියලුජනතෙම; තොර
තුරුඅසමින්, විශෙෂ විභාගඅසමින්.

---

117 එ ක ල බිසව මයිල්රජුගෙ පුත්වන කුමරෙක් ගරුත ර
ප බ ල සෙනෙවිරත් තනතුරු ලබාවැජඹි එමපුරව ර
ල ක ළ බිසවකී තොරතුරු නොවරදවා ඇසූඑමව ර
සෙබ ල කෙණෙක් ගොස්එපුරට සෙනෙවිරදුට සැලකළව ර

117 එකල, ඒකාලයෙහි; බිසව, (ඒ)රාජකුමාරිකාවගේ; මයි
ල්රජුගේ, මාතුලරාජයාගේ හෙවත් මාමාවන රජහුගේ; ගරු
තර, අතිශයින්ගරුවූ; පුත්වනකුමරෙක්, පුත්‍රවූකුමාරයෙක්තෙ
ම; පබල, අතිශයින් බලවත්වූ; සෙනෙවිරත්තනතුරු, සෙනාප
තිස්ථානාන්තරය හෙවත් සෙනානායක තනතුර; ලබා, ලබාගෙ
ණ; එමපුරවර, උතුම්වූඒනුවරෙහි; වැජඹි, විජෘම්භිත වූයේය
හෙවත් පැලඹුනේය; ලකළ, අලංකෘතවූ; බිසවකීතොරතුරු; රා
ජකුමාරිකාවවිසින් කියනලද විශෙෂවිභාගයන්; නොවරදවා, වි
රොධනොකොට හෙවත් වැරදීමනොකොට; ඇසූඑමවර, ඇසූඑ
මකාලයෙහි; සෙබලකෙණෙක්, සෙවකහට කෙණෙක්; එපුරට
ගොස්, ඒනුවරටගොසින්; සෙනෙවිරදුට, (පූර්වොක්ත)සෙනානා
යකයාහට; සැලකළවර, කීකල්හි.

118 ඒ බ ස අසා ඉතාසතුටු සෙනෙවිරදහු එපුරසම ත
බෙරැස විලස සමකරවා ලදපස්මල් ඉසැම්හව ත
තියැ ස මිතුරු නුවරවිලස සැරසිලිකර නිමවිඅන ත
එලෙ ස වෙනෙන් ආතුන්දෙන මගුලෙන් කැඳවාතමවෙ ත

118 එබසඅසා, ඒවචනයඅසා; ඉතාසතුටු, අතිශයින් සන්තුෂ්ට
වූ; සෙනෙවිරදහු, සෙනාපතීහු විසින්; සමතඑපුර, සියලුමඒ න
ගරය; බෙරැසවිලස, භෙර්තලයක්මෙන්; ( බෙරඇසක්මෙන් )
සමකරවා, සමතලකරවා; මගවත, මහාමාර්ගයෙහි; ලදපස්මල්,
ලාජපඤ්චමපුෂ්පයන් හෙවත් විලඳ සමන්පිච්ච කැකුළු අඹ සුන්ස
හල් හීතණ යනමේ පස්මල්; ඉසැ, සිඤ්චනයකොට; (ඉසලා) තියැ
සමිතුරු නුවරවිලස, වෛශ්‍රවණයාගේ නගරය පරිද්දෙන් හෙව
ත්වෙසමුනි රජහුගේ ආළකමන්දානම් නුවරමෙන්; අනතසැරසි

ළිසර, අනන්තවූ සැරසිලිකොට; නිමවී, නිෂ්ඨාකොට; එලෙස, එයාකාරයෙන්; වෙනෙත්, වනයෙන්; ආතුන්දෙන, ආගමනය කළාවූ ජනයන් තුන්දෙනා; තමවෙත, තමාගේසමීපයට; මඟුලෙන්, මඞ්ගල්‍යයෙන්; කැඳවා, කැඳවාගෙණ.

119 ස රි වන සුරඟණ එබිසව රුවන්රැසෙක සිටුවාසෙ ද
සි රි න විලස සෙනෙවිරදුට අබිසෙස්කරමින් මනන ද
පි රි යනකර තිරිසන්හට අසුව පළමු විඳිදුක්න ද
සි රි පති සිරිකත විලසින් එදෙදෙන සැපවිඳිනාස ද

119 සුරඟණසරිවන, දිව්‍යාංගනාවක්හා සමානවූ; එබිසව, ඒ රාජකුමාරිකාව; සෙද, එක්‍ෂණයෙහි; රුවන්රැසෙක, රත්රන් රැසෙක්හි; සිටුවා, සිටුවමින්; සිරිනවිලස, චාරිත්‍රවූ පරිද්දෙන්; මනනඳ, චිත්තසන්තොෂවූ; සෙනෙවිරදුට, සෙනානායකයාහට; අබිසෙස්කරමින්, අභිෂෙකකරමින්; තිරිසන්හට, තිරශ්චීනයාහට; අසුව, අසුලා; පළමු, ප්‍රථමයෙන්; විඳි, විඳිනයකළාවූ; නදදුක්, සම්බන්ධවූදුඃඛය, පිරියනකර, පයඝීනනකොටහෙවත් කෙළවරකොට; සිරිපති, විෂ්ණුහා; සිරිකත විලසින්, ශ්‍රීකාන්තාව පරිද්දෙන්; එදෙදෙන, ඒදෙදෙනා; සැපවිඳිනාසඳ, සැප විඳින් නාවූකාලයෙහි.

120 ගොදු රු පිණිස ගියසීරද නදකරපැනැ ඇතුන්මැද ට
රු දු රු නියෙන් ඔවුන්සිරස පලමින් මොලකමින්සොඳ ට
ගැ ඹු රු කෙසර නදකරමින් සතුටින් පිණපිණා එවි ට
සොඳු රු තමන් බිසවුන්සඟ පස්කම්සැප විඳිනලෙස ට

120 ගොදුරුපිණිස, ගොචරපිණිස හෙවත් ආහාරඅනුභවකිරීමපිණිස; ගියසීරද, ගමනයකළාවූ සිංහරාජතෙම; නදකර, (සිංහ)නාදකොට; ඇතුන්මැදට, හස්තීන්ගේමධ්‍යයට; පැනැ, උල්ලංඝණයකොටහෙවත් පැනලා; රුදුරුනියෙන්, රෞද්‍රවූනඛයෙන්; ඔවුන්, ඒඇතුන්ගේ; සිරසපලමින් හිසපලමින්, සොඳට, යහපත්ව; මොලකමින්, හිස්මොල අනුභවකරමින්; එවිට, එකාලයෙහි; ගැඹුරු, ගම්භීරවූ; කෙසරනාදකරමින්, සිංහනාදකරමින්; සතුටින්පිණපිණා, සන්තොෂයෙන් පිනමින්; සොඳුරු, යහපත්වූ; තමන්බිසවුන්සඟ, තමන්ගේරාජකුමාරිකාවන්හාසමග; පස්කම් සැපවිඳිනලෙසට, පඤ්චකාමසම්පත්තිය විඳිනයකරණපරිද්දෙන්.

121 වි ග ස ට ගිරිලෙණටඅවුත් බලාදෙදරු සහ බිසව ද
එ ම් වි ට නොම්දැක බලවත් සෝගිනිඇවිලී තමහ ද
ද ස න ට වැනිවැනිබලා නෙත්කඳුලැලි ගලානොම ද
තම හ ට ඉවසිය නොහැකිවැ විලාපබස්කියයිමෙලෙ ද

121 වීගසට, ශීඝ්‍රව; ගිරිලෙණට අවුත්, පර්වතගුහාවට අවුත්; දෙදරුසත, දූරකසන්දෙදෙනාසමග; බියවද, රාජකුමාරිකාවද; බලා, අවලෝකණයකොට; නොදැක, දර්ශනයනොකොට; එම විට, එකල්හි, තමහද, තමාගේචිත්තයෙහි; බලවත්, බලවත්වූ; සෝගිනි, ශොකාග්නිය; ඇවිලී, ඇවිල; දසතට, දශදිශාවට; වැන්වැත්, කම්පාවෙමින; බලා, නිරීක්ෂණයකොට; නොසෑද, බොහෝවූ; නෙත්සදුලලී, නෙත්‍රවාෂ්ප ජලධාරාවන්; ගලා, වගුරුවා; තම්හට, තමාහට; ඉවසියනොහැකිවැ, සහනයකලනොහී; මෙලෙද, මෙබඳුවූ; විලාපබස්, විලාපවචනයන්; කියසි, කියත්තේය නොහොත් කීයේය.

---

122 එ ක, දිවිලෙස විසූ මබිසෝස ද
නෙ ක, සුරතල් බස්දෙන හැමස ද
ස ක, සුරු මගෙ දරු දෙදෙනා සො ද
කි ක, ලක දකිනෙම් මම සිතලෙ ද

122 එකදිවිලෙස, එකප්‍රාණයක්මෙන්; විසූ, වාසයකලාවූ; මබිසෝසඳ, මාගේ උතුම් රාජකුමාරිකාවද; හැමසඳ, සෑමකල්හි; නෙක සුරතල් බස්දෙන, නොයෙක් සුරතල් වචන දෙන්නාවූ; මගෙ, අජ්ජුත්තුගේ; සකසුරු, ඇස් (දෙක) වැන්නවූ; සොඳ, යහපත්වූ; දරුදෙදෙනා, දෙදරුවන්ද; මම, අජ්ජුත්තෙමි;. කිකලක, කවරකාලයෙක්හි; සිතලෙද, සිත්වූ පරිද්දෙන්; දකිනෙම්, දර්ශනයකරන්නෙම්දෝ.

123 අ න්, තිරිසන් සත්ලොවැ නොකල දේ
දැන්, කල මට ලයදුක්විය ත දේ
සු න්, කලහොත් නියමය මෙමලෙ දේ
ඉ න්, කාටත් දුක් පැමිණෙසි ත දේ

123 ලොවැ, ලොකයෙහි; අන්තිරිසන්සත්, අන්‍යතිර්යග්විජාතීවයන් විසින; නොකලදේ, නොකලාවූදෙය; කල, කලාවූ; මට, මාගේ; ලය, චිත්තයට; තදේදුක්විය, සම්බන්ධවූදුඃඛයක්වූයේය; නියමය, උත්පත්තිය ගැළපෙන අයුරිනියම්වූ ස්වභාවධර්මය; සුන්කලහොත්, ජේදනය කලහොත් නැවත් ලොකස්වභාව කඩකලහොත්; ඉන්, එකාරණකොටගෙණ; මෙමලෙදේ, මෙපරිද්දෙන්; කාටත්, කවුරුහටත්; තදේදුක්පැමිණෙයි, තදවූදුක් පැමිණෙන්නේය.

124 අ ර, තොහී පව්වෙක් නැත මාතු ලා<br>
පෙ ර, පව කිහිපිදැ තිරිසන්කු ලා<br>
සු ර, ඟණවන් කිසවට ලොබවෙ ලා<br>
ගොර, තර දුක්විය මට දැන්ක ලා

124 අරණෙහි, අරණ්‍යයෙහි; මාතුලා, මාහාසමානවූ; පව්වෙක්, පාපිෂ්ඨයෙක් හෙවත් අතිශයින් ලාමකතැනැත්තෙක්; නැත, නැත්තේය; පෙරපව්කිහි, පූර්වයෙහි (කරණලද්දාවූ) පාපයක් කාරණකොටගෙණ; තිරිසන්කුලා, තිරශ්චීනජාතියෙහි; ඉපිදැ, උත්පත්තිවෙලා; සුරඟණවන්, දිව්‍යාංගණාවක්වැනිවූ; කිසවට, (රාජ) කුමාරිකාවකට; ලොබවෙලා, ලොභිව; දැන්කලා, මේවත්මානකාලයෙහි; මට, මාහට; ගොරතර දුක්විය, අතිශයින් දරුණුවූ දුඃඛයක්වූයේය.

125 ම ත්, වූත මම කම්සැපතෙහි අ පි ත්<br>
ක ත්, සමගවැ වැසලා මනතු පි ත්<br>
ල ත්, සැප දැන් නැතිවි යෙහෙම්පි පි ත්<br>
අ ත්, පිට පව පලදුන් සැපිදු පි ත්

125 කම්සැපතෙහි, (පඤ්ච) කාම සම්පත්තියෙහි; අපින්, ලොභයෙන්; මත්වූත, මත්වූ; මනතුපින්, චිත්තතුෂ්ටියෙන්; කත්සමගවැ, කාන්තාවක්හාඑක්ව, හෙවත් මනුෂ්‍ය රාජකුමාරිකාවක්හා සමග; වැසලා, වාසයකොට; ලත්සැප, ලද්දාවූසම්පත්තිය; දැන්, අධුනාකාලයෙහි හෙවත් මේකාලයෙහි; එහෙම්පිපින්, සියල්ල ම නොහොත් සියළුආකාරයෙන්; නැතිවිය, නැතිවූයේය; අත්පිට, ආත්මයපිට හෙවත් ඉහාත්මභාවයෙහි; පව, පාපය; පලදුන්සැපි, විපාකදුන්නාවූආකාරය; දුටින්, දුටුයෙමි.

126 වෙල, දකු සඟ යන කිසවක්දැ කා<br>
දු ල, රූදැලම් අසුචි නොවල කා<br>
එ ල, දුන් ගෙණවුත් කම්සැපත කා<br>
බ ල, ගිරිලෙණ ලාහර දීරැ කා

126 වෙලදකුසඟයන, වෙළඳ (ජනය) කුසමග යන්නාවූ; කිසවක්දැකා, රාජකුමාරිකාවක්දැක; දුලරූදැලට, බබලන්නාවූරූපශ්‍රී නැමැති දැලට; නොවලකා, නොවැලකී; අසුවෙලා, අසුවී; කම්සැපතකා, කාමසම්පත්තිය තකීණයකොට, හෙවත් පඤ්චකාම සම්පත්තිය කල්පණාකොට; එලදුන් ගෙණවිත්, ඒකාන්තාව ඈර ගෙණඅවුත්; බලගිරිලෙණලා, බලවත්වූ ගල්ගුහාවෙක්හි බහා; අහරදී, (බාද්‍යභොජ්‍යාදි) අංහාරදානයකොට; රැකා, රක්‍ෂාකොට.

127 උ න්, සමයින් කම්සැප විඳිමි නා
අ න්, අපකුල සිදෙනුන් හරිමි නා
ම න්, කල එම නොදැනුම් කමගැ ණා
දැ න්, මට පැමුණුනි දුක් අපම ණා

127 උන්සමයින්, ඒකාන්තාවසමයෙහි; කම්සැපවිඳිමිනා, (පච) කාමසම්පත් විඳිමින්; අපකුල, අපගේජාතියෙහි; අන්සිදෙනුන්, අන්‍යවූ සිංහධෙනූන්; හරිමිනා, අත්හරිමින්; මන්කල. මවිසින් කරණලද්දවූ; එමනොදැනුම්කමගැණා, එමමෝඩකමනිසා; දැන්, මෙකාලයෙහි; මට, අප්මත්හට; අපමණා, අප්‍රමාණවූ; දුක්, දුඃඛයක්; පැමුණුනි, ප්‍රාප්තවිය.

128 ඉ න්, අපකුල සිදෙනුන් දුටුතැ නේ
උ න්, වත කෙසෙ බලතෙම් දෙවිය නේ
පි න්, නැණමද තිරිසන් බවගැ ණේ
දැ න්, ලියො තිරනැතිවග නොදැනු නේ

128 ඉන්, එසේහෙයින්; අපකුල සිදෙනුන්, අපගේ ජාතියෙහි සිංහධෙනූන්; දුටුතැනේන්, දර්ශනයකල ස්ථානයෙහි; දෙවියනේ, (අහෝ)දිව්‍යයනි; උන්වත, ඒසිංහධෙනූන්ගේ වක්ත්‍රයන් හෙවත් ඒසිංහධෙනූන්ගේමුහුණු; කෙසෙබලතෙම්, කවර ආකාරයකින් බලන්නෙම්ද; පින්නැණමද, පින්හා ඥනයමදවූ; තිරිසන්බවගැණේ, තිරශ්චීනභාවයනිසා; දැන්, මේකාලයෙහි; ලියො, ස්ත්‍රීහු; තිරනැතිවග, ස්ථිරනැත්තාවූභාවය; නොදැනුනේ, ජානනය නුවූයේය.

129 පි ය, සුතනඹුවන් වත් නැත මෙ දෑ
පි ය, යුරු සිඹිතෙම් මම කවර දෑ
ශි ය, කල අඹුදරු මාහැර සෙ දෑ
වි ය, මට මේදුක් සිහබාස දෑ

129 මෙදෑ, වර්තමානජාතියෙහි හෙවත් මේජාතියෙහි; පියසුතනඹුවන්වත්, ප්‍රියවූ(දූ) පුත්‍රයන්හා භාර්‍ය්‍යාවෝද; නැත, නැත්තේය; මම, අප්මත්තෙමේ; කවරදෑ, කවරජාතියෙක්හි නොහොත් කවරකාලයෙක්හි; පියයුරුසිඹිනෙම්, පයොධරයන්සිඹින්නෙම්ද; සෙදෑ, වහා; අඹුදරු, අඹුදරුවන්; මාහැර, අප්මත්හු පහකොට; ශියකලැ, ගමනයකළකල්හි; මට, අප්මත්හට; සිහබාසදෑ, සිංහබාහු කුමාරයානිසා; මෙදුක්, මේදුඃඛයතෙම; විය, වූයේය.

130 තු රු, පති සස ලපලෙස සමයි යෝ
ද රු, දෙදෙනෙක් වනතුරු වසමි නේ
දු රු, කර මවෙතට තුබු තදසෙ නේ
ක රු, මයමයි මගෙ උන් සැහවු නේ

130 තුරුපති සසලපලෙස, චන්ද්‍රයාගේ සසලාංඡනය පරිද්දෙන්; සමගිනේ, සංයෝගව; දරුදෙදෙනෙකුවනාතුරු, දරුවන්දෙදෙනෙක් උපදිනාතාක්කල්: වනමිනේ, වාසයකරමින්: මාඳිතට තුබූ. මාකෙරෙහිතිබූ වූ; නාදෙසෙනේ, සතාඩිවද් සෙනෙහය; දුරුකර, දුරුකොට; උන්, ඔවුන්; සැහවුනේ, සැහවූහේ (නම්;) මගේ, අත්මත්හුගේ; කාරුමයමයි, (පූර්වයෙහිකර ඵලදපාප) කර්මයක්මය.

131 සැ ම, සැපදෙන හිමිහට කරම ද
ස ම, දරු දසයක් ඇතිවත් ව ද
ක ම, නැති හොර හිමියෙක් දුටුස ද
පෙ ම, වෙති කත් ඔහුටම වැඩිත ද

131 සැමසැපදෙන, සියලුසම්පත්තිය දෙන්නාවූ; හිමිහට, ස්වාමියාහට; දැකරම, ජානනකොටම; වද, පශුතකොට; සම්දරුද සෑක්, සම්පූර්ණවූදරුවන් දසදෙනෙක්; ඇතිවත්, ඇතිවූකල්හිද; කමනැති, ප්‍රයොජනයක්නැත්තාවූ; හොරහිමියෙක්. චෞර ස්වාමියකු හෙවත් හොරපුරුෂයකු; දුටුසඳ, දකිනාකාලකල්හි; කත්, කාන්තාවෝ; ඔහුටම, ඒසොරහිමියාහටම; වැඩි, අධිකවූ; තද ප්‍රෙමවෙති, සතඩිවූ ප්‍රෙමය ඇතිවෙත්ය.

132 එ ම, වග මම තිරිසන් වූනුනි සා
නොම, සැලකිම් සියියෙන් එදව සා
මේ ම, නොදැනම කම්සැප විඳිනි සා
නි ම, නැති දුක්විය අද තදලෙ සා

132 එම්බග, ඒබව; මම, අස්මත්ශබ්ද වාච්‍යතෙමේ; තිරිසන් වනුනිසා, තිරශ්චීනයෙක්වූහෙයින්; එදවසා, ඒකාලයෙහි; සිහියෙන්, ස්මෘතියෙන්; (සිහිකිරීමෙන්) නොමසැලකිම්, සාලක්ෂණය නොකෙලෙම් හෙවත් නොසැලකුයෙමි; මෙමනොදැනම, මේබව ජානනය නොකොටම; කම්සැප, (පඤ්ච) කාම සම්පත්තිය, විඳිනිසා, විඳිනාලදහෙයින්; අද, මේකාලයෙහි; තදලෙසා, තදවූආකාරයෙන්; නිමනැති, නිමාවක් නැත්තාවූ; (ප්‍රමාණාතික්‍රාන්තවූ) දුක්විය, දුඃඛයක්වූයේය.

133 අ ප, සියකුල සිදෙනුත් සිරිය දී
කැ ප, ගෙණ බිසවක් සමගින්යෙ දී
අ ප, කල නොතරම්කම මෙලොව දී
ස ප, ලව අත්පිට දුක්වනල දී

133 අප, අපගේ; සියකුල, ස්වකීය ජාතියෙහි; සිදෙනුත්සිරියදී, සිංහධෙනුත්සිරියදී; බිසවක්, රාජකුමාරිකාවක්; කැපගෙණ,

සැපකොටගෙණ; සම්හින්සෙදී, (ඈ)හාසම්ගනෙයදිලා; අපකළ, අපවිසින් කරණලද්දවූ; නොහරම්සාම, ප්‍රමාණ නොවන්නාවූ ක්‍රියාව හෙවත් නොනැහෙනතාම; මෙලොවදී, මේලෝකයෙහිදී; සපලව, සඵලවී; අන්පිට, ඉහාත්මයෙහිම; වනදුක්ලදී, වියෝග දුක් ලැබූයෙමි.

---

134 මෙලෙස එම සිර ද<br>
වියොදුක් කියා ඇතිලෙ ද<br>
ඇවිද මුලු වනමැ ද<br>
නොදැකැ දරුවන් සමග බිසව ද

134 මෙලෙස, මේආකාරයෙන්; එමසිරද, ඒසිංහරාජතෙමේ; ඇතිලෙද, විද්‍යමානවූ ආකාරයෙන්; වියොදුක්කියා, වියොගදුඃඛ යන්නියා; මුලුවනමැද, සියලුවනමධ්‍යයෙහි; ඇවිදැ, අන්වේෂණයකොට හෙවත් ඇවිදිමින්; දරුවන්සමග, දරුවන්දෙදෙනා සමග; බිසවද, රාජකුමාරිකාවද; නොදැකැ, දර්ශනයනොකොට.

135 යලිදු ඒඒ තැ න<br>
තුරු ලිය ලැහැප් බලමි න<br>
ලසොවින් වෙවුලමි න<br>
කියසි දුක්මුසු තෙපුල් මෙලෙසි න

135 යලිදු, නැවතද; ඒඒතැන, ඒඒස්ථානයෙහි; තුරුලියලැහැප්, වෘක්ෂලතාගුල්පයන් හෙවත් රුක් වැල් පඳුරුවල: බලමින, අවලොකනයකරමින්: ලසොවින්, චිත්තශොකයෙන්: වෙවුලමින, වෙවුලමින්: මෙලෙසින, මෙපරිද්දෙන්: දුක්මුසුතෙපුල්, දුඃඛයෙන්මිශ්‍රවූ වචනයන්: කියයි, කියන්නේය නොහොත් කීය.

---

136

තුරුහිමිවලදිමි නා, ලිය ළිය. ලෙලදෙන අතු අති නා<br>
සාමුව දරු රැගෙ ණා, බිඟුරැව්, සුරුතල් පිය බසි නා<br>
මුවරද මුදු දස නා, පුල්මල්, මනහර දුල් වති නා<br>
අමපල යුග තෙනෙ නා, දිගු නිල්, දල නෙත ගින් වැගෙ නා

136 ලියලිය, ලතානැමැතිකාන්තාවෝ හෙවත් වැල්නැමැතිස්ත්‍රීහු; තුරුහිමිවලදිමිනා, වෘක්ෂනැමැතිස්වාමීන් ආලිඞ්ගණයකොට; ලෙලදෙන, චඤ්චලවන්නාවූ; අතුඅතිනා, ශාඛානැමැති හස්තයෙන්: සාමුවදරු, ශාඛාමෘගනැමැතිදරුකයන්; රැගෙණා, ග්‍රහණයකොට: බිඟුරැව්, භෘංගරාවනැමැති හෙවත් මීමැස්සන්ගේ ශ

ඛනැමැති; සුරුතල්පියබසිනා, සුරුතල්ප්‍රියවචනයෙන් යුක්තව: මුවරඳ, මකරන්දනැමැති හෙවත් මල්රේණුනැමැති; මුදුදසනා, මෘදුවූ දන්තපඞ්ක්තියෙන් යුක්තවූ; පුල්මල්, ප්‍රඵුල්ලපුෂ්පනැමැති: මනහර, සිත්කලුවූ; දුල්වත්නා, දිලියෙනලද වක්ත්‍රයෙන්; අමප ල, අමෘතඵලනැමැති හෙවත් මිහිරිඵලනැමැති: යුගතෙනෙනා, පයෝධර යුග්මයෙන්ද: දිගුනිල්, දික්වනීලවර්ණවූ; නෙතගින්, නෙත්‍රාග්‍රයෙන් හෙවත් ඇස්කොලවරින්; දලවැගෙනා, ජලයවග නය වන්නාවූ.

137

පිණිබිඳු නෙත් දලි නා, ප ර පු වු, නදගඬ යෙන් හඬ නා
තුරුලිය දැකැනොමි නා, සිත් පි ත්, නැතිතොප මදුකගැ ණා
මෙලෙසට හඬනතැ නා, මම දැන්, බිසවුන් දරු දෙදෙ නා
නොමදකැමගෙනෙතිනා, කෙලෙසක, වැවෙමි දිවිලදි නා

137 පිණිබිඳු, නීහාරබින්දුනැමැති; නෙත්දලිනා, නෙත්‍රජල යෙන් හෙවත් කඳුලෙන්යුක්තව; නොමිණා, අප්‍රමාණවූ; පරපුවු නද, කොවුල්ලන්ගේ ශබ්දනැමැති; හඬයෙන්හඬනා, ශබ්දයෙ න් හඬන්නාවූ; සිත්පිත්නැති, සිත්පිත්නැත්තාවූ; තුරුලිය, වෘ ක්‍ෂලතාවෙනි: තොප, යුෂ්මත්හු; මදුකගැණා, මාගේදුඃඛය ගැ ණ; මෙලෙසට, මෙයාකාරයෙන්; හඬනතැනා, විලාපකියන්නාවූ කාලයෙහි: මම, අස්මත්තෙමේ: දැන්, වර්තමානකාලයෙහි: බි සවුන්, බිසවද: දරුදෙදෙනා, දූරකයන්දෙදෙනාද: මගෙනෙ තිනා, මාගේනේත්‍රයෙන්: නොමදැකැ, දර්ශනයනොකොට; දිවි ලදිනා, ජීවිතයලදින්: කෙලෙසක, කවරප්‍රකාරයකින්: වැවෙමි, සහනයවෙම්ද (ඉවසම්ද.)

138

මෙමහිමතුරුනොමි නේ, සුදු වෙල, තුරුසළු හැරලමි නේ
පුලකොකවැලසොබනේ, මුතු හ ර, කඩකර ඉස නෙතැ . නේ
රැග දෙ න සල සලනේ, සි කි පි ල්, වරල උනා ලමි නේ
ගඟුලැලි කඳුළු මෙ නේ, ඉ ස ඉ ස, වලපිනා ගිරිලිය නේ

138 මෙමහිමතුරු, මේ හිමාලය වනාභ්‍යන්තර යෙහි හෙවත් මේහිමාලයවනය ඇතුලෙහි: නොමිණේ, බොහෝසෙයින්: සුදු වෙල, ශුභ්‍රවල්ලානැමැති; උතුරුසළු, උත්තරීසාටකයන්: හැරලමි නේ, විවෘතකොටලමින්: සොබනේ, ශෝභමානවූ: පුල, බබල න්නාවූ: කොකවැල, බලාකපඞ්ක්තිනැමැති; මුතුහර, මුක්තාහා රය: නෙතැනේ, නොයෙක්තන්හි: කඩකර, බඳනයකොට හෙ වත් ගලවා: ඉසැ, ඉසිමින්; සලසලනේ, නොයෙක් පර්වතපා සං;

සිකිපිල්, මයුරපිඤ්ඡනැමැති හෙවත් මොනරපිලිනැමැති; වරල උනාලම්හේ, කෙශකලාපය මුදාලමින්; රහදෙන, සෑනෑදන සකරන්නාවූ; කඳුලුමෙහේ, බාෂ්පජල ධාරාවන්මෙන් හෙවත් කඳුලුධාරාවන්මෙන්; ගඟුල්ඇලි, ගංගානිර්ඣරජලධාරාවන්; ඉසැඉසැ, ශෝචනයකොටගෙනාට; වලපින, විලාපකියන්නාවූ; සිරිලියනේ, පර්වතනැමැති කාන්තාවේනී.

139

තොපිමගෙ දුක දැකලා, සිත්නැති, මෙලෙසට හඬනක ලා
එක දිවි ලෙස වැසැ ලා, සතතින්, පස් කම් සැප විඳැ ලා
මට වියොගිනිදී ලා, අඹුදරු, සැඟවී මා හැර ලා
සියබව සිතෙනක ලා, එකතින්, නොතිබෙයි ම පණින ලා

139 සිත්නැති, අචිත්තකවූ හෙවත් සිත්නැත්තාවූ; තොපි, යුෂ්මත් තැනැත්තියෝ; මගෙ, මාගේ; දුකදැකලා, දුඃඛයදකිමින්; මෙලෙසට, මෙපරිද්දෙන්; හඬනකලා, හඬන්නාවූ කාලයෙහි; සතතින්, නිරන්තරයෙන්; පස්කම්සැපවිඳැලා, පඤ්චකාමසම්පත්තිය වින්දනයකොට; එකදිවිලෙස, එකප්‍රාණයක්මෙන්; වැසැලා, වාසයකොට; අඹුදරු, අඹුදරුවෝ; මාහැරලා, මාඅත්හැර; සැඟවී, ගුප්තව හෙවත් සැඟවිලා; මට, අස්මත්හට; වියොගිනිදීලා, වියෝගයින්නදී; සියබව සිතෙනකලා, සියබව සිතෙන්නාවූකාලයෙහි; එකතින්, ඒකාන්තයෙන්; මපණිනලා, මාගේප්‍රාණවාතයතෙම; නොතිබෙයි, නොපවත්නේය.

140

නිල් දිගු සිනිඳු කෙසා, සෙවලැති, බිඟු පෙල සුනිලව සා
ලොල් වන නිලිපුලැ සා, සරණින, මුවරද දසන රු සා
දුල්වැ එකුල සරසා, තන ගස, රළ සළ පටිනිව සා
විල්කත මෙවනනි සා, සිටි තොපි, ම සුතඹු නුදුටුදැ සා

140 නිල්දිගු, නීලවර්ණවදීඝවූ; සිනිඳුකෙසා, ස්නිග්ධවූකෙශකලාප නැමැති; සෙවලැති, ශෛවාලඇත්තාවූ; බිඟුපෙළ, භෘංගාවලී නැමැති; සුනිලවසා, අතිනීලවූ වසාරාජියක් ඇත්තාවූ; ලොල්වනනිලිපුලැසා, ලොහවත්නාවූ නීලොත්පලවැනි ඇස් ඇත්තාවූ; සරණින, පියුම්නැමැති මුඛඇත්තාවූ; මුවරද දසනරුසා, මකරඤ්දනැමැති දංෂ්ට්‍රාකාන්ති ඇත්තාවූ; දුල්, බබලන්නාවූ; වැලි, වාළුකාස්ථලනැමැති; උකුලසරසා, ජඝණස්ථලයෙන්සැරසී; තනගස, පයොධරනැමැති හංශයන්; රළසළපටිනි, තරංගනැමැති සාටකපට්ටයෙන්; වසා, ඡාදනයකොට; මෙවනනිසාසිටි; මෙව

නය ආශ්‍රයකොට සිටියාවූ; විල්කත, තඩාගකාන්තාවෙනි හෙවත් විල්නැමැති ස්ත්‍රියෙනි; නොපි. පුෂ්පත්හු; මයුතඹු, මාගේ අඹුදරුවන්; ඇසාහුදුවූද, ඇසින්හුදුවූවෝද; (දෙඇස්න්හුදුවූවෝද.)

141

මෙවෙනෙහි විසුනිති නේ, බල තර, තද තෙද නොදෙවිය නේ
වියොදුක් ගිනි කදි නේ, මට වන්, හද වත දයි තදි නේ
නිදිමත නැත එයි නේ, පිත කුත්, බඩගිනි මට නොදැ නේ
නොකිහැකි තදදුකි නේ, මගෙ දිවි, නොරැකෙයි අද මෙයි නේ

141 මෙවෙනෙහි, මේ වනයෙහි; නිතිනේ, නිරන්තරයෙන්; විසු, වාසයකරන්නාවූ; බලතර, අතිශයින් බලවත්වූ; තදතෙද, සම්බන්ධවූ තෙජස් ඇත්තාවූ; නොදෙවියනේ, නොයෙක් දිව්‍යරාජයෙනි; තදිනේ, තදවූ ආකාරයෙන්; මටවන්, මාහට වන්නාවූ; වියොදුක් ගිනිකදිනේ, වියොගදුඃඛ නැමැති වහ්නිස්කන්ධයෙන්; හදවත, හෘදයවස්තුව; තදිනේ, තාපීන්; දයි, දවයි; එයිනේ, ඒ කරණකොටගෙණ; මට, මාහට, නිදිමතනැත, නිදිමතකුත් නැත්තේය; පිතකුත්, සන්තෝෂයකුත්, බඩගිනි, ක්ෂුධාග්නියද, නොදැනේ, නොදැනේය; අද, අදදවස්හි; මෙයිනේ, මේ (මට) වූ; නොකිහැකි, නොකියහැක්කාවූ; තදදුකිනේ, තදවූ දුක කරණකොටගෙණ; මගෙ, මාගේ; දිවි, ජීවිතයතෙම; නොරැකෙයි, රක්‍ෂානොවන්නේය.

142

උරපියපලුසම ගා[*], පුල්මල්, වැද එන මදසුල හා
ගොරගිනි සිළුසෙඇ හා, වැද දයි, සඳ ගිම දුනි ගර හා
මියුරඬ ඇති විහ හා, නද වනි, දෙකණට යවුල්ර හා
මගෙ අඹුදරු නොල හා, වියඉන්, මට වනි මෙදුක් සු හා

142 උරපියපලුසම්ගා, චන්දන පල්ලවයන්හා සමග හෙවත් සඳුන්දලුහා සමග; පුල්මල්, ප්‍රඵුල්ලපුෂ්පයන්ට; වැදඑන, වැදීඑන්නාවූ; මදසුලගා, මන්දමාරුතයාතෙම (මදසුළඟ;) ඇඟා, ශරීරයට; වැදැ, ප්‍රවිෂ්ටව; ඝොරගිනිසිළුසෙ, දරුණුවූ වහ්නි ශිඛා පරිද්දෙන්; දයි, දවන්නේය; සඳ, චන්ද්‍රතෙම: ඉහගා, සූර්‍ය්‍යයා පරිද්දෙන්; ගිමදුනි, ග්‍රීෂ්ම ද්‍යුතය කෙළේය; මියුරඬඇති, මධුරනාදඇත්තාවූ; විහඟා, පක්ෂීන්ගේ; නද, නාදය; දෙකණට, කර්ණයුගලයට; යවුල්රහා, අයශ්ශූලයන්මෙන් හෙවත් යකඩහුල්

* "උරපිය සළුසමගා," බොහෝ පොත්හි.

මෙත්; වනි, වන්නේය; මගෙ, අප්මත්තුගේ; අඹුදරා, අඹුදරුවෝ නොලභාවිය, සමීපනොවූහ; එසින්, ඒකාරණයෙන්; මට, මාහට; මෙදුක්සුභාවන, මෙදුක්සමූහය වන්නේය.

143 සි ර ද මෙබඳු වනසෝදුක් නපලම් න
බෝලෙද මහ හිමගමැද ඇවිද තැනතැ න
කැ ම ද නොලැබ සියගත දුබලව ගොසි න
ඒ ල ද නිසා පිටිසර ගමකට පැමි න

143 සිරද, සිංහරාජතෙම; මෙබඳු, මේආකාරවූ; වනසෝදුක්, විරහශෝකදුඃඛය; නෙපලමින, කියමින්; මහහිමය, මහාහිමාල යාගේ; මැද, මධ්‍යයෙහි; තැනතැන, තත්හිතත්හි; බෝලෙද, බොහෝසෙයින්; ඇවිදැ, ආහිඩනයකොට; කැමදනොලැබ, ආ හාරයදනොලබා; සියගතදුබලව්ගොසින, ස්වකීයශරීරය දුර්වල භාවයටගොසින්; ඒලදනිසා, ඒකාන්තාවනිසා: පිටිසර ගමකට, ප්‍රත්‍යන්තග්‍රාමයකට හෙවත් පිටිසරකට පැමිණ, ප්‍රාප්තව.

144 සි රි ස ද එගම් වැසියෙක් දැකැ එසිර ද
බි ය වැද සිතට එබිසව නතු පැවසි සෙ ද
මන න ද වෙමි නෙවිට ඔහුහැර ගොස්තොම ද
සිරි ල ද එපුර වටසැදි ගම්වලට වැ ද

144 සිරිසද, සිරියාවූකාලයෙහි; එගම්වැසියෙක්, ඒ ග්‍රාමයෙහි වාසිමනුෂ්‍යයෙක්; එසිරද, ඒසිංහරාජයා; දැකැ, දශීනයකොට; සිතටබියවැදැ, චිත්තයටභයවැදී; සෙද, වහා; එබිසව, ඒරාජකු මාරිකාවගේ; නතු, තත්ත්වය; පැවසි, ප්‍රකාශකෙළේය; එවිට, එ කල්හි; මනනදගවමින්, චිත්තයෙන් සන්තුෂ්ටවෙමින්; ඔහුහැර ගොස්, ඒමනුෂ්‍යයා අත්හැරගොසින්; නොමදසිරිලද, බොහෝ ඓශ්වර්‍ය්‍යම් ලද්දවූ; එපුරවටසැදි, ඒනගරයට හාත්පස්හිසැදුනාවූ; ගම්වලටවැදැ, ගම්වලටවැදී.

145 සෙන හ ඩ සියගණන් එකවිට ගසනමෙ න
පැ න පැන තැනින්තැන ගොස් නදකරණදි න
ද න ග ණ කන්පැලී ලෙහෙනුතුරා ගොසි න
තැන තැන මලහ ඒඒ ගම්වල නොවි න

145 එකවිට, එකවාරයෙහි; සියගණින් සෙනහඩ, ශතසංඛ්‍යා අසනිශබ්දයන්; ගසනමෙන, ගසන්නාක්මෙන්; තැනින්තැන, (ඒ ඒ) තත්හි; පැනපැන, පනිමින්පනිමින්; ගොස්, ගමනයකොට; නදකරණදින, (සිංහ) නාදකරණකල්හි; දනගණ, ජනසමූහයා

ගේ; කන්පැලී, කන්පැලිලා; ලෙහෙනු තුරාගොසින, රූසිරියඉති රිගොස් හෙවත් ලේඉතිරීගොස්; එළගම්වල, ඒඒ ග්‍රාමයන්හි; නොමින්, ප්‍රමාණයක්නැති සමූහයා; තැන තැන, (ඒඒ) තන්හි; මලුන, මළානුය.

146 ප වු නු ගම් නියම්ගම් එද නව් වල ට
වැටු නු සෙනෙව් ඔහුවැදැ ලොව නසනව් ට
ගැටු නු දනෝ එකතුව ගොස් එනුවර ට
සි ටි නු බැරිය මහ කොලහල කළකල ට

146 පටුනුගම් නියම්ගම් එදනව්වලට, පට්ටනග්‍රාම නිගමග්‍රාම ඒ ජනපදවලට; වැටුනුසෙනෙව්, පතිතවූසෙනාක්මෙන්; ඔහු, ඒ සිංහරාජයා; වැදැ, වැදී; ලොවනසන්විට, ලොකයනාශනකල්හි; ගැටුනුදනෝ, (එයින්) ගැහැටුනාවූ ජනයෝ; එකතුව, එකතුවෙලා; එනුවරටගොස්, ඒ නුවරටගොසින්; සිටිනුබැරිය, සිටීමනොහැක්කේයසික්යා; මහකොලහල කළකලට, මහත් කොලාහාල කළකල්හි.

147 සු ග ඳු රූ මුදුන බබලන සරකර අයු ර
පි වි තු රූ තෙදින් හැමදන තඹර නඳක ර
වි සි තු රූ සිහසුනෙහි වැඩහිඳගෙණ පව ර
බු වි සු රූ තුමා මෙලෙසින් ඇසිය පෙමක ර

147 සුගඳුරුමුදුන, සුගන්ධරපර්වත මස්තකයෙහි; බබලන, භ්‍රාජමානවන්නාවූ; සරකරඅයුර, සූර්‍ය්‍යයාසේ නිවූ; පිවිතුරුතෙදින්, පවිත්‍රවූ තෙජස කරණකොටගෙණ; හැමදනතඹර, සියළු ජනනැමැති තාමරසයන්; නඳකරු, සන්තුෂ්ටකොට; පවර, උතුම්වූ; විසිතුරු, විචිත්‍රවූ; සිහසුනෙහි, සිංහාසනයෙහි; වැඩහිඳගණෑ, නිෂද්‍යකොට හෙවත් හිඳගණ; බුවිසුරුතුමා, පෘථිවීශ්වරතෙමේ, හෙවත් උතුම්වූ රජතෙමේ; පෙමකරු, ප්‍රෙමයකොට; මෙලෙසින්, මෙයාකාරයෙන්; ඇසිය, (ඔවුන්ගේඒකථාව) ශ්‍රවණයකෙළේය හෙවත් විචාළේය.

148 ග ම ගම වැසිදනෝ මෙපුරට ඇවිත්සෙ ද
නි ම නොව හඩා වැලපීමෙන් දුකිත්ත ද
කි ම කොලහලකළේ මගෙකිසි දෙසකට ද
ම ම එම අසම් ඇතිසැටි කියව් කීස ද

148 ගමගම්වැසිදනෝ, ගම්ගම්හි වාසයකරන්නාවූ ජනයෝ; සෙද, වහා; මෙපුරට, මේනගරයට; ඇවිත්, ආගමනයකොට; නිමනොව, නිෂ්ඨානොවී; තදදුකින්, සනිබිඩවූදුඃඛයෙන්; හඬා



(58 පිට.) සිංහයාගෙන් පීඩා විඳිනලැබූ ගම්වාසීන් ඒ බව රජහට දැන්වීම.

වැලපීමෙන්, හඬාවිලාපකීමෙන්; කොලහලකෙළේ, කෝලාහල
කෙළේ; කිම්, කිමෙක්ද; මගෙක්සි දෙසකටද, මාගේ කිසිම දෙ
ෂයකටද; මම, අත්මත්තෙමේ; එංඅසමි, ඒකාරණය විචාරමි;
ඇතිසැටි, තත්ත්වාකාරය හෙවත් ඇත්තාවූ ස්වභාවය; කියවනීසඳ,
(ප්‍රකාශකොට කියවියයි කීකල්හි.

149 හි මි ස ඳ නුඹ දෙසෙක් කිසිකලකවත් කො ද
මි ග ර ද තුමෙක් හිමගෙන් අවුදින් මෙස ද
ත ද න ද කර අප රටවල සත් නොම ද
එකලෙ ද වැනසුබව බැරිනියනු මහර ද

149 මහරද, මහරජ්ජුරුවන් වහන්ස; හිමිසඳනුඹ, ස්වාමීවූ
නුඹවහන්සේගේ; කිසිකලකවත්, කිසි කාලයෙක්හිවිත්; දෙසක්
කොද, දෙෂයක් කොයින්ද; මෙසඳ, මේකාලයෙහි; මිගරදතු
මෙක්, මෘගරාජජාතතාමයෙක් තෙම, හෙවත් සිංහරාජජාතතාම
යෙක්; හිමයෙන්අවුදින්, හිමාලයෙන් ආගමනයකොට; තදනද
කර, තදවූනාදකොට; අපරටවල, අපගේරටවල්හි; නොමදස
ත්, බොහෝවූසත්වයන්; එකලෙදවැනසුබව ඒකාකාරයෙන්විනා
ශකළභාවය; කියනුබැරි, කීම් නොහැක්කේය.

150 අ පදෙ ගු රු න් අ ප ම සි ල න් මුතුන්හු ද
අ ප අ ඹු ව න් අ ප ද රු ව න් සොහොයුරුද
අ ප මි තු ර න් වැඩ ක රු ව න් හැමදෙන ද
නැසු සැටි දැ න් කොසිලෙසකි න් කියනෙමු ද

150 අපදෙගුරුන්, අපගේමව්පියන්ද; අපමසිලන්, අපගේ මා
තුලයන්ද; මුතුන්හුද, අපගේමුත්තනුවන්ද; අපඅඹුවන්, අපගේ
භාය්‍යාවන්ද; අප දරුවන්, අපගේ දූරකයන්ද; සොහොයුරුද,
අපගේ සහෝදරයන්ද; අපමිතුරන්, අපගේමිත්‍රයන්ද; වැඩකරු
වන් හැමදෙනද, වැඩකාරුවූ සියලුජනයන්ද; නැසූසැටි, නැසූආ
කාරය; දැන්, මේකාලයෙහි; කොසිලෙසකින්, කවර ආකාරය
කින්; කියනෙමුද, කියන්නෙමෝ(යසිනියා)ද.

151 අ ප ම ණ ඉසුරු ඇති දදවෙළඳ ගොවිකු ල
හැම ද න වනසමින් අපගම් අගම්ක ල
වි ද ස න කර නොරපු බල මහබල සෙබ ළ
දු වූ තැන මැරිය පෙත්වාලා තමාබ ල

151 අපමණඉසුරුඇති, අප්‍රමාණඓශ්වර්‍ය්‍යඇත්තාවූ; දදවෙළඳ
ගොවිකුල, බ්‍රාහ්මණ වෛශ්‍ය ගොවිකුලයන්හිවූ; හැමදන වනස
මින්, සියලුජනයන් විනාශකරමින්; අපගම්, අපගේ ග්‍රාමයන්;

අගම්කල, අග්‍රාමකෙළේය; විදසනකර, විධ්වංශනයකොට සෙව ත් නසා; නෙරපූ, පහකළාවූ; බල, බලඇත්තාවූ; මහබලසෙබල, මහත්සෙනගඇති සෙවාහටයන්ද;තමාබල, තමාගේබලය; පෙන් වාලා, පෙන්වමින්; දුටුතැන, දශීනයකළාවූ ස්ථානයෙහිදී; මැරිය; මැරූයේය.

152 පි රි ස ඳ සොමි උවන පියයුරු රණතිස ර
ම ද ර ද දුනුම්වෙව් මැදදෙස ඇතිපව ර
සු ර ර ද ලියෙව් රූසිරැති අඟණන් නොහැ ර
මි ග ර ද ගම් මැදවපැන මැරිය නදක ර

152 පිරිසඳ, පූර්ණචන්ද්‍රතැමැති; සොමිඋවන, සෞම්‍යවූ මුහුණු ඇත්තාවූ; පියයුරු, පයෝධර තැමැති; රණතිසර, ස්වර්ණහංශ යන් ඇත්තාවූ; මදරදදුනුම්වෙව්, අනංගයාගේ දුන්නෙහි මිටප රිද්දෙන්; මැදදෙසඇති, මධ්‍යප්‍රදෙශ ඇත්තාවූ; පවර, උතුම්වූ; සුරරදලියෙව්, ශක්‍රදිව්‍යරාජයාගේ භාර්‍ය්‍යාවන්මෙන්; රූසිරැති, රූපශ්‍රී ඇත්තාවූ; අඟණන්, ස්ත්‍රීන්ද; මිගරද, මෘගරාජ තෙම; නොහැර, අත්නොහැර; ගම්මැදවපැන, ග්‍රාමයන්ගේ මධ්‍යයට පැනලා; නදකර, (සිංහ)නාදකොට; මැරිය, නැසූයේය.

153 න න බරණින් සැරසූ කිරිබොන ලද රූ
පැ න අවුදින් නදකර මැරුවයි කෙස රූ
ගු ණ නැණයෙන් අගපත් හිමිසඳ මහ රූ
වෙ න තිරිසන් නැසුවග කියනුද කවු රූ

153 නන්අබරණින්, නොයෙක්ආභරණයෙන්; සැරසූ, සජ්ජි තකළාවූ; කිරිබොනලදරූ, කිරිබොන්නාවූ ලදරුවන්ද; කෙස රූ, සිංහරාජතෙම; පැනඅවුදින්, පැනලාඅවුත්; නදකර, සිංහනා දකොට; මැරුවයි, මැරූයේය; මහරූ, මනොඥවූ; ගුණනැණ යෙන්, ගුණයෙන්හා ඥානයෙන්; අගපත්, අග්‍රප්‍රාප්තවූ; හිමිසඳ, ස්වාමීන්ද්‍රයානෙනි; වෙනතිරිසන්, අන්‍ය තිරශ්චීනයන්; නැසුවග, නැසූආකාරය; කවුරූ, කවරෙක්; කියනුද, කියන්නේද.

154 ලොව ර කි නා පින්වත් නිරිඳුනි දැන ට
මෙ ම ලෙ සි නා නැසුවොත් අපගෙ මුලුර ට
කි ම ලැබෙ නා පල ඉන් මෙබිය පුරුකො ට
නොව ල සි නා සෙතකල මැනව මෙ අප ට

154 ලොවරකිනා, ලොකවාසීන් රක්‍ෂාකරන්නාවූ; පින්වත්නි රිඳුනි, පුණ්‍යවන්ත නරෙන්ද්‍රයානෙනි; දැනට, මේකාලයෙහි; මෙම ලෙසිනා, මෙයාකාරයෙන්; අපගෙමුලුරට, අපගේසියලුරට; නැසු

ගවාත්, නැසුව්හොත්; ලැබෙනාපල, ලැබෙන්නාවූ ඵලය; කිම, කවරේක්ද; ඉන්, එසේහෙයින්; මෙබඳුරුකොට, මෙහෙය පත කොට; නොවලසිනා, අනලස්ව; නොඅපව, නොඅප(හැමදනා) හට; සෙතකලමැනව, ශාන්තිය කලහොත් යෙහෙකි.

---

155 මෙලෙස ට ගම්වැසි හැමදෙන එරදුට සැලකල විගසි න
ලෙ ව න ට පැමුණුනු එබියට වගුරදතුම තද ලසොවි න
සු ද ය ට ගොස් මිගිඳු මරණ විලසට රැස්කර මැතිග ණ
මොනව ට අණදී වදල සේක මෙලෙස ලොවට පෙම් න

155 ගම්වැසි හැමදෙන, ග්‍රාමවාසී සියලූ ජනයාවිසින්; මෙලෙසට, මේආකාරයෙන්; එරදුට, ඒවගුරජහට; සැලකල විගසින, සැලකලාවූක්‍ෂණයෙහි; ලෙවනට, ලොකවාසීන්ට; පැමුණුනු පැමිණියාවූ; එබියට, ඒභිතියෙන්; වගුරදතුමා, වගුරාජෝත්තමයා; තදලසොවින, සන්බද්ධවූ චිත්තශොකයෙන්; සුදසටගොස්. සුධර්මපිණිස ගොසින්; මියිඳුමරණවිලසට, මෘගෙන්ද්‍රයා මරණපරිද්දෙන්; මැතිගණරැස්කර, අමාත්‍යසමූහයා රැස්කොට; මෙලෙස, මේආකාරයෙන්; ලොවටපෙමින, ලොකයාහට ප්‍රෙමයෙන්; මොනවට, මනාකොට; අණදීවදලසේක, අණදුන සේක.

156 බ ල ත ර යුදකර පෙර දිනුමට සෙනෙහැති ඇමතිවරු නි
රුදු ත ර මිගරදෙක් අවුත් අපසතුරට නසනබැව් නි
පූ ව ත ර සිව්රඟ සෙන්ගෙණ ගොස් යුදකර * එහුම්රම් නි
දු රු ක ර එව් අපරටපත් විපත් එබිය නොප බලයෙ නි

156 පෙර, පූර්ව(කාල)යෙහි; බලතරයුදකර, අතිශයින්බලවත්වූ යුධකොට; දිනූ, ජයගත්තාවූ; මටසෙනෙහැති, අෂ්මත්හට සෙනහ ඇත්තාවූ; ඇමතිවරුනි, අමාත්‍යවරුනි; රුදුතරමිගරදෙක්, අතිශයින්රෞද්‍රවූ සිංහරාජයෙක්; අවුත්, ආගමනයකොට; අපසතුරට, අපසන්තකවූරට; නසනබැව්නි, නාසනකරණහෙයින්; පූවතර සිව්රඟසෙන්, ප්‍රසිඬවූචතුරඞ්ගණීසෙනාව; ගෙණගොස්, හැරගෙණගොසින්; යුදකර, යුධකොට; එහුම්රම්නි, ඒබහුමරම්න්; අපරටපත්, අපගේරටට පැමිණියාවූ; විපත්එබිය, විපත්යි නැමැති ඒභිතිය; නොපබලයෙනි, යුෂ්මතුන්ගේබලයකරණකොටගෙණ; දුරුකරඑව්, දුරුකොටඑවිය.

157 සසොබණ රදු වදහල බස අසමින් මැතිවරු හැමදෙ න
එ ම ස ණ යෙන් අණබෙරකර මහසෙන් රැස්වන විලසි න
ස ර ස න සැර කඩු අඩයටි සඳසක්ඇ නනාවිරුගෙ ණ
අ ප ම ණ සිව්රඟ සෙන්සහ නිරිඳුන් වැදෑ අවසරගෙ ණ

---

* මෙසේ පොත් කීපයකම තිබෙණ නුමුත් බහුමරම්න කීවත් වරදනැහැ.

157 සසොබණ, සශොභනවූ; රදු, රජහු විසින්; වදනලබන, වදළාවූවචනය; මැතිවරුහැමදෙන, අමාත්‍යවරුසියල්ලදෙනා; අසමින්, ශ්‍රවණයකරමින්; එමසණෙයන්, එක්ෂණයෙහි; මහසෙන් රුස්වනවිලසින, මහාසේනාවරුස්වනාපරිද්දෙන්; අණබෙරකරු, ආඥභෙරියකොට හෙවත් අණබෙරගස්වා; සරසන සැරකඩු අඩයටි සඳසක්අෑ, දුනු ඊ කඩු අඩයටි චක්‍රචක්‍රආදිවූ; නානවිරුගෙණ, නානායුධයන්ගෙණ; අපමණ සිවිරඟසෙන්සඟ, ප්‍රමාණයක් නැත්තාවූ චතුරඞ්ගිණි සෙනාවසමග; තිරිළුන්වැදෑ, නරෙන්‍ද සානට වැදලා; අවසරගෙණ, අවකාශය හැරගෙණ.

158 ප  ස තු රු ගොසකර පෙරටුව ගොඩයන සිඳුරද විලස  ට
යු  ද ක රු මහ සෙනග ගොසින් එම්සිරද සිටි පියස  ට
නොම තු රු වට කරමින් අවියෙන් අවි ගැවසෙන තරම  ට
වි  සි තු රු අවි ලෙලවා සිය දහස්විදුලි ගසන රඟ  ට

158 ගොඩයන සිඳුරදවිලසට, ගොඩයන්නාවූ සමුද්‍රයමෙන්: පසතුරුගොස, පඤ්චාංගිකතූර්‍ය්‍යඝොෂාව; පෙරටුවකර, පෙරටුකොට හෙවත් ඉදිරියෙහිකොට; යුදකරු මහසෙනඟ, යුධකරන්නාවූ මහාසෙනාව: එමසිරද සිටිපියසට, එමසිංහරාජයා සිටියාවූ ප්‍රදෙශයට; ගොසින්, ගමනයකොට; අවියෙන්අවි ගැවසෙනතරමට, ආයුධයෙන් ආයුධය ගැවසෙන්නාවූ ප්‍රමාණයට; නොමතුරු, අතුරක්නැතිව; වටකරමින්, සිසාරමින්: සියදහස්විදුලි ගසනරඟට, ශතසහශ්‍ර විද්‍යුල්ලතාවන් පහරන්නාක්මෙන්; විසිතුරු අවිලෙලවා, විචිත්‍රවූආයුධයන් ලීලොපෙත කරවා.

159 ර  ණ බෙර කරවා රුදුතර ඔල්වරසන් දෙමින් කුරි  රු
සෙ න සුවහස් ගසනවිලස කළ රණගොස අසාකෙස  රු
ව  න මැද ඔත්පලින් නැගිට කරබුරවා සොඳ විසිතු  රු
පැ  න අහසට ඔබිනොබ බමණයකරු සිය විදුලිඅසු  රු

159 රණබෙරකරවා, යුධභෙරිනාදකරවා; කුරිරු, ක්‍රූරවූ; රුදුතර, අතිශයින් රෞද්‍රවූ; ඔල්වරසන්දෙමින්, උත්කෘෂ්ටශබ්දදෙමින් හෙවත් උස්වූශබ්ද පවත්වමින්; සුවහස්සෙන ගසනවිලස, ලක්‍ෂගණන් සෙන ගසන්නාක්මෙන්; කළරණගොස, කරණලද යුධඝොෂාව; කෙසරු, සිංහරාජතෙම; අසා, ශ්‍රවණයකොට; වනමැද ඔත්පලින්, වනමධ්‍යයෙහි හොත්තාවූ ස්ථානයෙන්; නැගිටැ, උද්ගතව; සොඳවිසිතුරු, යහපත් විචිත්‍රවූ; කරබුරවා, ග්‍රීවය දිගුකොට හෙවත් ග්‍රීවකරනගා; අහසටපැන, ආකාශයට උල්ලංඝිතවී; සියවිදුලිඅසුරු, විද්‍යුල්ලතා ශතයක්මෙන්; ඔබිනොබ බමණයකරු, ඇතමැත කරකැවී.



සිංහයා විසින් ශූඩසමුද්‍රව පරාජයකිරීම.

(63 පිට.)

160 ප ළ කරමින් සිරදැවිකුම් නද කරැ වැදැ සෙනග මැද ට
දු ල තර ඇත්අස් සමගින් දුටුදුටුසත මරණෙමවි ට
බ ල යුදයෙන් සිත් බියගෙණැ කටුබැදිවල පැනැවිගස ට
එ ළ වාගණැ එතෙයිසිතා පසුබලමින් දුවනකල ට

160 සිරදැවිකුම්පලකරමින්, සිංහරාජයාගේ වික්‍රමයපෙන්වමින්; නදකරැ,(සිංහ)නාදකොට; සෙනගමැදටවැදැ, සේනාවගේ මධ්‍යයටවැදී; දුලතර ඇත්අස් සමගින්, අතිශයින් බබලන්නාවූ හස්ති අශ්වයන්හා සමග; දුටුදුටුසත; දර්ශනයකලකළ සත්වයන්; මරණෙමවිට, මරන්නාවූ ඒකාලයෙහි; බලයුදයෙන්, බලවත්වූයුද්ධයෙන්; සිත්බියගෙණැ, චිත්තයටභයගෙණ; විගසට, ශීඝ්‍රව; කටුබැදිවලපැනැ, කණ්ටකාරණ්‍යයට පැන; එළවාගණැ එතෙයිසිතා, (පසුපස්සේ)ලුහුබැඳ එන්නේයයිසිතා; පසුබලමින්, පස්සබලමින්; දුවනකලට, ධාවනයකරණකල්හි.

161 සි ර දුට අසුනොවී සිටිය ඉතිරිහසුන් එනබවදැ ක
සි ර දුමයයි සිතා ඉතා තදබියගෙණැ දිව්නොවල ක
වෙ ර ඇඳිවත් කටුදැවටි ඉරි රැඳුනු බවත් නොදැ ක
දු ර ට ගොසින් වැටිගත්තු මරණින් ගැලවී වැදැදු ක

161 සිරදුට, සිංහරාජයාහට; අසුනොවිසිටිය, අසුනොවීසිටියාවූ; ඉතිරිහසුන්, ඉතිරිවූඅශ්වයන්; එනබවදැකැ, ආගමනයකරණබව දැක; සිරදුමයයිසිතා, සිංහරාජයාමයයි චින්තනයකොට; ඉතාතද බියගෙණැ, අතිශයින් තදවූ භයගෙණ; නොවලකදිව්, නොවැලැක ධාවනයකොට; වෙරඇඳිවත්, ශරීරයෙහි අච්ඡාදනය කරණලද්දවූ වස්ත්‍රයන්; කටුදැවටි, කටුවල ඇවිනී; ඉරී, ඉරීලා; රැඳුනු බවත් නොදැකැ, රැඳුනුබවද නොදැක; මරණින්ගැලවී, මරණයෙන් ගැලවීලා; දුකවැදැ, දුඃඛයට්ප්‍රවිෂ්ටව; දුරටගොසින්, දූරස්ථානයටගොස්; වැටීගත්තු, වැටීගත්තාහුය.

162 මෙලෙස ට කටු ඇනී අයෙක් සියල් සිරුැර ලේගාග ණ
සි න ද ට කන් පැලුනු අයෙක් සමහරු අපගත වතුරෙ ණ
වි ග ස ට දුව වැටීඅයෙක් අනපය තුනටිය බිඳග ණ
කැ ල ය ට වැදැ ඒඒතැන සැඟවීසිට මරණ බියෙ න

162 මෙලෙසට, මෙයාකාරයෙන්; අයෙක්, සමහරකෙණෙක්; සියල්සිරුැර, සකලශරීරයෙහි; ලේගාගණ, ලේගාගණද; සිනදට, සිංහනාදයෙන්; කන්පැලුනු අයෙක්, කන්පැලුනාවූ සමහරකෙණෙක්ද; සමහරා, ඇතම්කෙණෙක්; අපගතවතුරෙන, පහවූ වස්ත්‍රයෙන් උපලක්ෂිතවද; අයෙක්, සමහරකෙණෙක්; විගසටදිව්,

ශීඝ්‍රව ධාවනයකොට; අතපසතුනපිය බිඳගෙණ, හස්තපාදයන් හා තුනපිය බිඳගෙණද; කැලයටවැදැ, අරණ්‍යයටප්‍රවිෂ්ටව; මර ණබියෙන, මරණභීතියෙන්; ඒඒතැන, ඒඒස්ථානයෙහි; සැඟවී සිට, ගුප්තවසිට.

163 පැ ල දි බරණ ඇඳිවත් අවි පසතුරු තැනතැන දමමි න
මු ල දී දෙඩාගිය කටමැත සිතාතදින් ලජ්ජායෙ න
කොල අතු ඇඳැ ලෙලෙහෙපෙරමින් ගියගියතැන් වලින්සෙමින
ග ල වාගණ පණපමණක් එකතැනකට රැස්වසොඳි න

163 පැලඳිබරණ, පලඳිනලද ආභරණහා; ඇඳිවත්, අච්ඡාදන ය කරණලද වස්ත්‍රහා; අවි, ආයුධහා; පසතුරු, පඤ්චාංගිකතූර්‍ය්‍යයන්; තැනතැන, තත්හිතත්හි; දමමින, දමමින්; මුලදිදෙඩාගිය, ප්‍රථමයෙන් කථාකොට ගියාවූ; කටමැතසිතා, කටමැතයන් චින්තනයකොට; තදින් ලජ්ජායෙන, තදවූලජ්ජායෙන් උපලක්ෂිතව; කොලඅතුඇඳැ, කොලඅතු ඇඳගෙණ; ලෙලෙහෙ පෙරමින්, ලේවැගිරෙමින්; පණපමණක්ගලවාගණ, ප්‍රාණයපමණක්ගලවාගණ; සෙමින, සුහුසුලුහොවී; ගියගියතැන්වලින්, ගියගියස්ථානවලින්; සොඳින, යහපත්ව; එකතැනකටරැස්ව, එකස්ථානයකට රාශිභූතව.

164 වි ය රු වැටුන අයවිලසට කිසිවත් නොමදැන එමවි ට
රු දු රු ලෙසට හඬාවැලප ඉලව් වලම්දී එමවි ට
කෙස රු සුදෙන් මැරුම් නොකා ආබව සිතමින් බලය ට
සොඳු රු නිරිඳු වෙතට අවුත් සිරිපදවැඳැ කිව් මෙලෙස ට

164 එමවිට, ඒකාලයෙහි; වියරුවැටුන අයවිලසට, විකාරයට වැටුණු අයමෙන් හෙවත් පිස්සුවැටුනාවූ අයමෙන්: කිසිවත් නොමදැනැ, කිසිත්දෙයක් ජානනයනොකොට; රුදුරුලෙසට, රෞද්‍රවූ ආකාරයෙන්; හඬාවැලප, හඬාවිලාපකියා; එමවිට, ඒකාලයෙහි; ඉලව්වලම්දී, ඉලව්ව වලාමයන වචනයන්කියා; කෙසරුසුදෙන්, සිංහසුඛයෙන්; මැරුම්නොකා, මරණානුභවය නොකොට හෙවත් මරණයටනොපැමිණ; ආබව, ආගමනයකළභාවය; බලයටසිතමින්, බලයක්කොට සිතමින්; සොඳුරු නිරිඳුවෙතට, යහපත්වූ නරේන්ද්‍රයාගේ සමීපයට; අවුත්, ආගමනයකොට; සිරිපද වැඳැ, ශ්‍රීපාදයන් වැඳලා; මෙලෙසට, මෙයාකාරයෙන්; කිව්, කථනය කළාහුය.

165

මි ග කියා සිහයුදට ගිය සෙබළුන්කෙරෙන් එකසෙබලෙකු ත්
මි ග රදුගෙ ඉදිරියට යනලෙස අඩියකුත් නොතිබිය කොහෙ ත්
මි ග පතිහුනද අසාදෙසවන් පැලී මළහුය නොයෙක් ස ත්
මි ග රදුට අසුවෙමින් මැරූ ඇත්අස් මිනිස් ගණනක් නොමැ ත්

165 මිගකියා, එඩිතරවමනකියා; සිහයුදටගිය, සිංහයාහායුද්ධය ටගියාවූ: සෙබළුන්කෙරෙන්, සේවාභටයන්කෙරෙන්; එකසෙබ ලෙකුත්, එකසේවාභටයෙක්ද; මිගරදුගෙ, මෘගරාජයාගේ; ඉදි රියට යනලෙස, අභිමුඛයට යනපරිද්දෙන්; කොහෙත්අඩියකුත්, කිසිත්අඩියක්ද හෙවත් එකපියවරක්ද; නොතිබිය, නොතැබූයේ ය; මිගපතිහු, මෘගෙන්ද්‍රයාගේ; නදඅසා, ශබ්දයශ්‍රවණයකොට; නොයෙක්සත්, නොයෙක්සත්වයෝ; දෙසවන්පැලී, කර්ණයුග්ම යපැලී; මළහුය, මැරුණාහුය; මිගරදුට, මෘගරාජයාහට; අසුවෙ මින්, අසුවීමෙන්; මැරූ, මාරණයකළාවූ; ඇත්අස්මිනිස්, හස්ති අශ්වමනුෂ්‍යයන්ගේ; ගණනක්නොමැත්, සංඛ්‍යාවක්නැත්තේමය.

166

ඉ තු රු ළඳුඅපි දිවගොසින් මහකටුලැහැප්වල වැදී ලා
ව තු රු අබරණ නනවි පසතුරු තැනින්තැන මග දමා ලා
සි රු රු සිඳැබිඳැ ගොසින් තැනතැන පැහැර ගල්මුල් ඇනී ලා
සි වු රු පෙරවූ විලස රත්විය මෙඅප ඇඟ ලේරැඳී ලා

166 ඉතුරුළඳු අපි, ඉතිරිවූ අපිතුමූ; දිවගොසින්, දිවගෙණ ගොස්: මහකටුලැහැප්වල වැදීලා, මහත්වූ කණ්ටක ගුල්මයන්ට වැදී; වතුරුඅබරණ, වස්ත්‍රාභරණයන්හා; නනවිපසතුරු, නානා ප්‍රධාන පචතූර්යයන්; මගැ, මාර්ගයෙහි: තැනින්තැනදමාලා, තැ න්හිතැන්හිදමා; තැනතැනපැහැර, තැන්තැන්හිහැපිලා; ගල්මු ල්ඇනීලා, ගල්හාමුල්ඇනී; සිරුරුසිඳැබිඳැගොසින්, ශරීරයඡෙ ද්‍යභෙද්‍යවගොස්; මෙඅප, මේඅපගේ; ඇඟලේරැඳීලා, ශරීරයෙ හිලේරැඳී; සිවුරුපෙරවූවිලසවිය, චීවරපාරුම්පණය කළාක්මෙ න්වූයේය.

167

ලොවට අගපත් හිමිසඳිති පඩිනොලැබෙතත් අපහැමට අදසි ට
අ ප ට බැරිමය සුදකරත්නට තදවිකුම් මිගරදෙකු ලඟසි ට
සු බ ට අපගෙන් වැඩක් ඇතහොත් කුමටඇරියෙද මෙබඳුසටන ට
දැන ට මිගිඳකුලවා අප මැරවුමෙන් වනපතු මොකද කිරිදු ට

166 ලොව්ටඅගපත්, ලොකයාහටඅග්‍රප්‍රාප්තවූ; හිමිසඳිනි, සඳා මිඳුයාණෙනි; අපහැමට, අපසියලුදෙනාහට; අඳසිට, අඳආදී කොට: පඬිනොලැබෙතත්, පඬිනොලැබෙත්තේවීනමුත්; අපම, අපහට; තද්විකුම්, තදවික්‍රමඇත්තාවූ; මිගරදකුලහසිට, සිංහ රාජයකුගේ සමීපයෙහි සිටගෙණ; යුදකරන්නට, යුඩකිරීමට; බැරිය, නොහැකිමය; නුඹට, නුඹවහන්සේට; අපගෙන් වැඩ ක් ඇතහොත්, අපගෙන්වැඩක් ඇත්තේනම්; මෙබඳුසවනට, මෙ බඳුවූ යුඩයක්පිණිස; කුමටඇරියෙද, (අප)කුමක්පිණිසයවූයේද; දූනට, මේකාලයෙහි; මිගිදෙකුලවා, සිංහරාජයකුලවා; අපමැර වූමෙන්, අපගේ මැරවීම හේතුකොටගෙණ; නිරිඳුට, නරේන්ද්‍ර යානන් වහන්සේට; වනපල මොකද, ( සිඛ ) වන්නාවූ ඵලය කවරෙක්දැ(පිකිචව්ය.)

---

168 මෙලෙස සැලකල ස      ද
සිහ යුදට ගිය මැතිසෙ      ද
රද සිතට දුක්වැ      ද
ඔවුන් තුටුකරැ තෙපුල් දීසො      ද

168 සිහයුදට, සිංහරාජයාහාසමග යුඩකිරීමපිණිස; ගියමැති, ගමනයකළාවූ මන්ත්‍රින්විසින්; මෙලෙස සැලකලසද, මෙගස්කීකල්හි; සෙද, වහා; රදසිතට, රජහුගේ චිත්තයට; දුක්වැදැ, දුක්වැදී; ඔවුන්, ඒමන්ත්‍රීන්ට; සොදතෙපුල්දී, සඟපන් වචනදී; තුටුකර, සන්තොෂකොට.

169 හැර පිටත ඔවුනැ      ම
මැතින් ගෙන්වා එවලෙ      ම
ලෙව් සතට සාරපෙ      ම
මේලෙස පැවසී වදන් මනර      ම

169 ඔවුන්ඇම, ඒසියලුඅමාත්‍යයන්; පිටතහැරැ, පිටත(යවා)හැර; එවලෙම, ඒකාලයෙහිම; මැතින්ගෙන්වා, අමාත්‍යයන්ගෙන්නවාලා; ලෙව්සතට, ලොක වාසී සත්වයාට; පෙමකරැ, ප්‍රේමයකොට; මනරම, මනොරම්‍යවූ; වදන්, වච නයන්; මෙලෙස, මෙයාකාරයෙන්; පැවසි, කීයේය.

---

170 මැ ති වරුනි මසුදහසකින්බැඳි පියල්ලක්ගෙණැනබාඇතුපිට
අ ති දරුණු මිගරදුගෙ ඉසසිදැයසමක්ගෙණවුන් දුනොත්මෙඅප ම
ව ති සුරුදසහ මෙරත්දහසද ඔහුටදෙනබව කියාතුටුකොට
ඉ ති සියලු වගුරටෙහිඅපසතු ලව්ව් අණබෙර ඉනාවිගස    ට

170 මැතිවරුනි, අමාත්‍යවරුනි; මසුදහසකින්බැඳි, මාසකශහශ්‍රයකින් බඳනා ලද්දාවූ හෙවත් මසුදහසක්නබාබැන්දවූ; පියල්ලක්, පොට්ටලිකාව (පොදිය)ක්;

ගෙණ, ග්‍රහණයකොට; ඇතුළුවතබා, හස්තිරාජයාගේ පිටෙහිතබා; අතිදරු ණු විගරදුගෙ, ඉතාදරුණුවූ මෘගරාජයාගේ; දෙසිදෑ, ශීඝ්‍රවිච්ඡේදයකොට ගෙ වත් ඉසකපා; යමෙක්, යමෙක්තෙම; මෙඅපට, මම්අශ්මත්හට; ගෙණැවුත්දු නොත්, ග්‍රහණයකොට අවුත් දුන්නේවීනම්; වතිපුරුදසහ මෙරන්දහසද, වසතු ඓශ්වර්‍ය සහ මේරත්රන් දහසද; ඔහුට දෙනබවකියා, ඔහට දානයකරණබව කියා; තුටුකොට, සන්තොෂකොට; ඉති, මෙසේකියා; ඉතා විගසට, අතිශීඝ්‍රව; අපසතු සියලු වගුරටෙහි, අපසත්තකවූ සියලු වගුරටෙහි; අණබෙරලවව්, ආඥාහෙරිය ප්‍රසිඩකරව් හෙවත් අණබෙර ගසව් (යයි කීයේය.)

---

171 මැතිසඳහු මෙලෙසී  නා
ලැවූ අණබෙර අසමි  නා
එම්ගරද පුත්ව  නා
සිංහබානම් කුමරු විගසී  නා

171 මෙලෙසින, මේආකාරයෙන්; මැතිසඳහු, මන්ත්‍රිජනයන් විසින්; ලැවූ අ ණබෙර, ප්‍රසිඩකලාවූ අණබෙර ශබ්දය; එම්ගරද පුත්වන, ඒසිංහරාජයාහට පුත්‍රවූ; සිංහබානම් කුමරු, සිංහබාහුනම්වූ කුමාරතෙම; අසමින, අසමින්; විගසින, විගසකින්.

172 ගොසින් තම මවුරුව  නා
අණබෙර ලැවූ එපව  නා
දන්වාලා නැව  නා
මෙලෙස පැවසී වදන් නොමරු  නා

172 තමමවුවෙන, තමාගේ මෑනියන්ගේ සමීපයට; ගොසින්, ගමණයකො ට; අණබෙරලැවූ එපවත, ආඥාහෙරිය ප්‍රසිඩකලාවූ ඒප්‍රවෘත්තිය; දන්වාලා, ඥා පනය කොට; නැවත, පසුව; මෙලෙස, මෙයාකාරයෙන්; නොමරුන, රුචි නොවන්නාවූ; වදන්, වචනයන්; පැවසී, කීයේය.

---

173 අ ම්ම  මම ගොසින් සීරදහු මර  මි නා
දෑ ම්ම  හිස ගෙණැත් වගුරදු දක්ව  මි නා
නි ම්ම  නැති නොයෙක් යසඉසුරු ලබ මි නා
ර ම්ම  වන සුරුවින් දවසරිමි නී  නෑ නා

173 අම්ම, මෑනියන් වහන්ස; මම, අශ්මත්තෙමේ; ගොසින්, ගමනයකො ට; සීරදහු, සිංහරාජයා; මරමින, මරමින්; දෑත්ම, අධුනා කාලයෙහිම; හිස ගෙණැත්, ශීර්ෂය ගෙණඅවුත්; වගුරදහු, වගුරජහට; දක්වමින, දර්ශනයකරමි න්; නිම්මනැති, නිෂ්ඨාවක් නැත්තාවූ; නොයෙක් යසඉසුරු; නොයෙක්යශෛ ශ්වර්යයන්; ලබමින, ලබමින්; රම්මවනසුවෙන්, සිත්කළුවූ සැපයෙන්; දවසරී මි කීතැන, කල්යවමියි කීකල්හි.

174 එබසට මීයිඳුවෙ ත්
සිත ඇති ඉතා බලව ත්
කිසෝසඳ යහප ත්
මෙලෙස පැවසී පුතුට පෙමයු ත්

174 එබසට, (මෙසේකී)ඒවචනයට; මීයිඳුවෙත්, සිංහරාජයාකෙරෙහි; ඉතා බලවත් සිතඇති, ඉතාබලවත් සිත් ඇත්තාවූ; යහපත්, යහපත්වූ; කිසෝසඳ, රාජකුමාරිකා උත්තමිතොමෝ; පුතුට, පුත්‍රයාහට; පෙමයුත්, ප්‍රේමයෙන්යුක් තව; මෙලෙස පැවසී, මෙයාකාරයෙන් කිවාය.

---

175 පු ත එ ලෙ සි න් ඇතත් තොපබල විකුම් ස ර
නැත දෙලොවින් වැඩක් මැරුවොත් පියකෙ ස ර
නා ත ඉ සු රේ න් පිරුණත් එම වෙයිනො ස ර
සි ත තා බ මි න් මෙවග නොය යුදට එකෙ ස ර

175 පුත, පුත්‍රයානෙනි; එලෙසින්, ඒසිංහරාජයා මරණපරිද්දෙන්; තොප, නුඹත්හට; බලවිකුම්සර, ස්ථිරවූ බලවික්‍රමයක්; ඇතත්, ඇත්තේවිනමුත්; පියකෙසර, පියාවූ සිංහරාජයා; මැරුවොත්, මැරුයේවිනම්; දෙලොවින්, උභය ලොකයෙන් හෙවත් මෙලෝ පරලෝ දෙකින්; වැඩක්නැත, වෘද්ධියක් නැත් තේය; (එපමණකුත්නොව) අනත ඉසුරෙන් පිරුණත්, අනන්තවූ ඓශ්වර්‍ය්‍යයෙ න් පූරිතවූයේවිනමුත්; එමසරනොවෙයි, එය සාරනොවන්නේය; (යත) මෙවග, මේකාරණය නොහොත් මේඅභිප්‍රාය; සිතැතබමින්, චිත්තයෙහිස්ථාපනය කර මින්; එකෙසර, (පියාවූ)ඒසිංහරාජයාහා සමග; යුදටනොය, යුධකිරීම පිණිස නොයව(යිකීවාය.)

---

176

මෙලෙස එබිසව දෙවරක්ම නවතමින් සිටිසඳ එකුම රා
එ ලෙ ස තෙවැනිව ලැවූ අණබෙර අසාගොස් මවටත්සො රා
ස තො ස වී එම අණබෙරය නවතමින් සපැමිණ රජුක රා
සි යැ ස ලෙසරැකි තමා පියවන සිරදු මරණෙම් කීව රා

176 මෙලෙස, මෙයාකාරයෙන්; එබිසව, ඒරාජකුමාරිකාව; දෙවරක්ම, දෙ වාරයක්ම; නවතමින් සිටිසඳ, නවත්වමින් සිටිකල්හි; එකුමරා, ඒකුමාරතෙම; එලෙස, එපරිද්දෙන්; තෙවැනිවැ, තුන්වෙනිව; ලැවූඅණබෙර, ඝොෂාකරවන ලද අණබෙර ශබ්දය; අසා, ශ්‍රවණයකොට; ගොස්, ගොසින්; මවටත්සොරා, මාතෘවටදසොරා; සතොසවී, සන්තුෂ්ටවව; එමඅණබෙරය, ඒ අණබෙරය; නවතමින්, නවත්වමින්; රජුකරා සපැමිණ, රජහුගේ සමීපයට සම්ප්‍රාප්තව; සියැසලෙසරැකී, සවකීයඅක්ෂිය පරිද්දෙන් රක්ෂාකළාවූ; තමාපියවන, තමාගේ පිතෘවූ; සිරදු මරණෙම් කීවරා, සිංහරාජයා මරන්නෙමියි කීකල්හි.




(69 පිට.) සිංහබාකුමාරතෙම සිංහයා විද මැරීම.

177

නි රි දු එබැට පිණාසතුටින් සුහද කුමරුනි විකුම්සරුව න
මි ශි දු ශිසගෙණැ දුනොත්මෙඅපට සෙනෙවිරත්නනතුරුද සමගිණ
නොම දු නොකසව් ඉසුරුදී නොප තුටුකරන්නෙම්කීසඳ එනර ණ
ප සි දු එකුමරු නිරිඳුපදසර නැමදැ අවසර රැගෙණැ විගසි න

177 නිරිඳු, නරේන්ද්‍රතෙම; එබසට, (කුමාරයාවිසින් කියනලද) ඒවචනයට; සතුටින්පිණා, සන්තොෂයෙන් පී‍්‍රණිතව; විකුම්සරුවන, වික්‍රමයෙන්සාරවූ; සුහදකුමරුනි, යහපත් සිත්ඇති කුමාරයෙනි; මෙඅපට, මේඅෂ්මත්හට; මිශිදුශිස, මෘගෙන්ද්‍රයාගේ ශිෂ්‍යය; ගෙණැදුනොත්, ග්‍රහණයකොට දුන්නේවීනම්; සෙනෙවිරත් නනතුරුද සමගින, සෙනාපති ස්ථානාන්තරද සමග; නොමදු, මද නොවූ; නොක සව්ඉසුරුදී, නොයෙක් සකලෛශ්වර්‍ය්‍ය දානයකොට; නොපතුටුකරන්නෙම්, යුෂ්මත්හු සන්තුෂ්ට කරන්නෙම්සිකියා; එනරන, ඒරජ්ජුවිසින්; කීසඳ, කීකල්හි; පසිදු එකුමරු, ප්‍රසිද්ධවූ ඒකුමාරතෙම; විගසින, වහා; නිරිඳු, නරේන්ද්‍රයාගේ; පදසරනැමද, පාදපද්මයට නමස්කාරකොට; අවසර රැගෙණැ, අවසරයගෙණ.

178

පි වි ස වනයට එසිරද දැකැ වරෙන් සිහරද පුදට නොලසි න
කි බ ස අසමින් ඉතාසතුටුවැ මිගිඳු එකුමරු ලඟටඑනතැ න
වි ග ස විසපෙව් කරල්ගියක් රැගෙණැ කෙසරුට විදපිසරොසින
එලෙස විදිඒ සැරය ආපසුබලා වැටුණෙය මිගිඳු කුළුණෙ න

178 වනයටපිවිසැ, වනයට ප්‍රවිෂ්ටව; එසිරදදැකැ, ඒසිංහරාජයා දැකලා; සිහරද, සිංහරාජයානෙනි; නොලසින, අනලස්ව; පුදටවරෙන්, පූජාකිරීමපිණිස වරෙන්යයි; කීබසඅසමින්, කියනලද වචනය අසමින්; ඉතාසතුටුවැ, අධික සන්තොෂව; මිගිඳු, සිංහරාජයා; එකුමරුලඟට, ඒකුමාරයාගේ සමීපයට; එන තැන, ආගමනය කරණකල්හි; විගස, එක්ෂණයෙහි; විසපෙව්, විෂපොවනලද්දාවූ; කරල්ගියක් රැගෙණ, කැරලිගියක් හැරගෙණ; කෙසරුට, සිංහරාජයාහට; සරොසින, ක්‍රොධසහිත වීමෙන්; විදපි, විද්දේය; එලෙසවිදි ඒසැරය, එසේවිද්දාවූ ඒගිය; මිගිඳුකුළුණෙන, මෘගෙන්ද්‍රයාගේ කරුණාව හෙතුකොටගෙණ; ආපසුබලා, ආපසුදිශාවබලා; වැටුණෙය, පතිතවූයේය.

179

දෙ වෙ නි වරවිදි හිගසත් එම ලෙසට බිමහුනුබව ද දැකැ ලා
තෙ වෙ නි එකුමරු විදිනබවදුටු සිරදහු මෙත් අඩුවෙ ලා
න දි නී එසැරය සිරුර වදිමින් සිදුරුකර බිම හුනුක ලා
එබලෙ නි වැඩි සිරදහු එතනම වැටුනී කයබල සුන්වෙ ලා

179 දෙවෙනිවර, ද්විතියවාරයෙහි; විදිහිගසත්, විදිනලද හීගසද; එමලෙසට, එපරිද්දෙන්ම; බිමහුනුබවද, භූමියෙහි පතිතවූබවද; දැකැලා, දක්මින්; තෙවෙනි, තුන්වෙනිවාරයෙහි; එකුමරු විදිනබව, ඒකුමාරයා විදින්නාවූබව; දුටුසිරදහු, දක්නාලද සිංහරාජයාගේ; මෙත්අඩුවෙලා, මෛත්‍රියඅඩුවී; එසැරය,

ඒහීය; නදිනි, නදින්; සිරුරවදැමින්, ශරීරයෙහි වදිමින්; සිදුරුකර, (ශරීරය) සිදුකරමින්; බිමහුනුකලා, භූමියෙහි පතිතවූකල්හි; බෙලෙහිවැඩී, බලයෙන්අධිකවූ; සිරදහු, සිංහරාජයාගේ; කයබලසුන්වෙලා, ශරීරබලයසුන්වී; එතනම වැටුනි, (හෙතෙම) ඒස්ථානයෙහිම වැටුනේය.

---

180 සැ ර ප හ රි න් වෙහෙසට පත් එසිර ද
දැ කැවි ග ස් න් සිහබා කුමරු මනන ද
පෙරබැතියෙ න් රැකිබව සිහිකර එස ද
මෙම වි ල සි න් දුක්මුසු බස් කියයිත ද

180 සැරපහරින්, හීපහරින්; වෙහෙසටපත්, විහෙසප්‍රාප්තවූ; එසිරද, ඒසිංහරාජතෙමේ; විගසින්, වහා; මනනද, සිත්සතුටුවූ;. සිහබාකුමරු, සිංහබාහුකුමරයා; දැකා, දර්ශනයකොට; එසද, එකල්හි; පෙර, පූර්වයෙහි; බැතියෙන්රැකිබව, භක්තියෙන් රක්‍ෂාකළබව; සිහිකර, අනුස්මරණයකොට; මෙමවිලසින්, මේ (මතුකියන) පරිද්දෙන්; දුක්මුසුබස්, සතඃඛවූදුඃඛමිශ්‍රවූ වචනයන්; කියසි, කථනය කෙරෙයි නොහොත් කීය.

---

181 ම ම, තොප දකිනට ආවෙමි අ නේ
කි ම, මට දුක් දුන්නේ මෙලෙසි නේ
පෙ ම, වන තොප දකිතොත් දරුව නේ
මෙ ම, තොපදුන් දුක් මට නොමදැ නේ

181 මම, අශ්මත්තෙමේ; අනේ, අහෝ; තොපදකිනට, යුශ්මත්හුගේ දර්ශනය පිණිස; ආවෙමි, ආගමනයකෙළෙමි; මට, අශ්මත්හට; මෙලෙසිනේ, මෙයාකාරයෙන්; දුක්දුන්නේ, දුඃඛයදුන්නේ; කිම, කිමෙක්ද; දරුවනේ, එම්බා දරුවෙනි; පෙමවන, ප්‍රේමයඇතිවන්නාවූ, තොපදකිතොත්, යුශ්මත්හුදක්නේ විනම්; තොපදුන්, යුශ්මත්හු විසින්දෙනලද්දාවූ; මෙමදුක්, මෙමදුඃඛය; නොමදැනේ, නොම ජානනය වන්නේය.

182 සු ත, නඹුවන් දක්නට ආනි සා
සි ත, ලැදිනොව මට විදිබව අ සා
ව ත, සඳවන් තොප මවු මිහුලැ සා
සි ත, දුක්නොවැ ඉදීනෙද කොයිලෙ සා

182 සුතනඹුවන් දක්නට, අඹුදරුවන්ගේ දර්ශනය පිණිස; ආනිසා, ආගමන කලබැවින්; සිතැලැදිනොවැ, චිත්තයෙහි ලබ්ධියක් ඇතිනොවී හෙවත් සිතෙහි ආලයක් නැතිව; මටවිදිබුවඅසා, මාහට විදිනලදබව අසමින්; සඳවත් වන, චන්ද්‍රයාවැනි මුහුනක් ඇත්තාවූ; තොප, තොපගේ; මවුමිසුලැසා, මාතෘකාන්තාතොමෝ; කොයිලෙසා, කවරආකාරයකින්; සිතදුක්නොවැ, චිත්තයෙහි දුක්නොවී; ඉදිනෙද, හිඳින්නීද.

183 දු ක්, විඳැ පෙර තොප ඇතිකල ස ඳු
එ ක්, ගුණ ලවයක් නැතිවම හ ඳු
දු ක්, මට දුන් ගොරතර ලෙස අ ඳු
ම ක්, කර ඉවසම් දැන් පුතස ඳු

183 පෙර, පූර්වයෙහි; දුක්විඳැ, දුඃඛවින්දනයකොට; තොපඇතිකලසඳු, යුෂ්මත්ප්‍රවර්ධනයකලහෙයින්; හඳු, චිත්තයෙහි; එක්ගුණලවයක්, එක් ස්වල්පවූ ගුණයක්; නැතිවම, අවිද්‍යමානවම; අඳු, අඳදවස්හි; ගොරතරලෙස, අතිශයින් භයානකවූ ආකාරයෙන්; මටදුන්දුක්, මාහටදෙනලද දුඃඛය; පුතසඳු, පුත්‍රෝත්තමයෙනි; දැන්, අධුනාකාලයෙහි; මක්කර ඉවසම්, කුමක්කොට සහනය කෙරෙම්ද.

184 එ ම, මිගරද මෙලෙසින් කීක ලා
කු මු, රිඳු සිහබා නම් දුක්වෙ ලා
ත ම, අතතුබු දුහුගී බැහැර ලා
ල ම, දීය අත ගසමින් අසුහෙ ලා

184 එමමිගරද, එමසිංහරාජයා; මෙලෙසින් කීකලා, මෙයාකාරයෙන් කීකල්හි; සිහබානම්කුමරිඳු, සිංහබාහුනම්වූ කුමාරොත්තමතෙම; දුක්වෙලා, දුක් ඇතිව; තමඅතතුබුදුහුගී, තමාගේ හස්තයෙහිතිබුණාවූ දුනුහී; බැහැරලා, පිට තදමා; ලමදිය අතගසමින්, හෘදයෙහි හස්තප්‍රහරණය කරමින් හෙවත් ලෙහි අත්ගසමින්; අසුගෙලා, සුසුම්හෙලා හෙවත් සුසුම්ලමින්.

185 පෙ ර, තම මවු සමගින් තුන්දෙ නා
තො ර, නොව රැකිබව සිහියට ගෙ ණා
ම ර, ණට පත් සිරදුට වැඩියෙ නා
ත ර, ලසොවින් හැඬි මෙම කියම් නා

185 පෙර, පූර්වයෙහි; තමමවුසමගින්, තමාගේ මාතෘවහාසමග; තුන්දෙනා, මැනියෝය නැගණියෝය තමාය යන තුන්දෙනා; තොරනොව, තොරනොවී; රැකිබව, රක්‍ෂාකලබව්; සිහියටගෙණා, සිහියටගෙණ; මරණටපත්, මරණයට පැමිණියාවූ; සිරදුට වැඩියෙනා, සිංහරාජයාටවැඩියෙන්; මෙමකියම්නා, මෙම වචන කියමින්; තරලසොවින්, තදවූ චිත්තශොකයෙන්; හැඬී, රොදනයකොළේය හෙවත් ඇඬුයේය.

---

186 ග ජ කු බු ප ල ප ලා, බුදිමින් ඉස මො ලා
නොම හිඳැ වලතු ළා, සුතනඹුවන් ලො ලා
ඇ වි දි ත් උ ද ක ලා, මරණට පත් වෙ ලා
තිබෙණ මෙතුඹබ ලා, වියමට දුක් ද ලා

186 ගජකුබුපලපලා, හස්තීන්ගේ කුම්භස්ථලයන් විදාරණය කොටකොට; ඉසමොලා, හිස්මොල; බුදිමින්, අනුභවකරමින්; වලතුළා, වනය ඇතුලෙහි; නොමහිඳැ, වාසයනොකොට; සුතනඹුවන්ලොලා, අඹුදරුවන්ට ලොභකොට;

උදකලා ඇවිදිත්, තනිව ඇවිදිත්; මරණට, මරණයට; පත්වෙලාතිබෙන, පැමිණ තිබෙන්නාවූ; මෙතුඹලා, මේපුෂ්මත්හුබලා; මට, මාහට; දලාදුක්විය, දැඩිවූදුකක්වූයේය.

187 වන මැද එක ලෙ සේ, ඇවිදැ නොමිද ලෙ සේ
ගෙණනොක පලර සේ, ලා ගිරිලෙණ කු සේ
දී අ ප රු නි ලෙ සේ, ඇතිකලෙ දෙස ක සේ
ඉත් පල දු නි මෙ සේ, තුඹට මෙදුක් රැ සේ

187 වනමැදඑකලෙසේ, වනමධ්‍යයෙහි එකාකාරයෙන්; ඇවිදැ, හැසිරිලා; නොමදලෙසේ, අනල්පවූ ආකාරයෙන්; නෙකපලරසේගෙණැ, නොයෙක් ඵල රසයන්ගෙණ; ගිරිලෙණකුසේලා, පර්වතගුහාව ඇතුලෙහිබඟා; අපරුනිලෙසේදී, අප්මත්හට රුචිවූපරිද්දෙන්දී; දෙසකසේ, අක්ෂිවන්‍දය පරිද්දෙන්; ඇතිකලේ, වර්තනයකෙළේය; ඉත්, එසේහෙයින්; තුඹට, පුෂ්මත්හට; මෙදුක්රැසේ, මේදුඃඛරාශිය; මෙසේපලදුනි, මෙයාකාරයෙන් පලදුන්නේය.

188 යක් දරු නිති ලෙ සේ, වාචිනි දුක් රැ සේ
යක් මවු පිය කු සේ, නොවාවිසිය එ සේ
පෙර සිටි එන බ සේ, බොරුනැත්බව මෙ සේ
දැන් අත් පිට ල සේ, දුටුවෙමි තතු ලෙ සේ

188 නිතිලෙසේ, නිරන්තරාකාරයෙන්; යක්දරු, යක්‍ෂ දරුකයෝ හෙවත් යක්‍ෂයන්ගේ දරුවෝ; දුක්රැසේ, දුඃඛසමූහය; වාචිනි, වාචිත්යහෙවත්ඉවසත්ය; එසේ, එපරිද්දෙන්; යක්මවුපිය, යක්‍ෂවූ මාතෘ පිතෘන්ගේ; කුසේ, කුක්‍ෂියෙහි; නොවාවිසිය, සහණය නොකරත්ය; (යනමෙය) පෙරසිට, පෙරකාලයෙහි පටන්; එනබසේ, (පැවත)එන්නාවූ වචනය; මෙසේ, මේආකාරයෙන්; බොරුනැතිබව, සැබැබව; දැන්, වර්තමානකාලයෙහි; තතුලෙසේ, තත්වූපරිද්දෙන්; ලසේ, වහාම; අත්පිටදුටුවෙමි, ඉහාත්මභාවයෙහිදීම දැක්කෙමියි කියාද හැඬූයේය.

189 මට පිය පිය ව නා, මිගරද මැරුවෙ නා
මෙලොව සි ය ලු ද නා, ගරහයි නොම දී නා
පර ලොවැ රු දු ව නා, සිව් අවයෙහි දී නා
දුක් වි දැ නොපම ණා, මිදෙම්ද කොයි දී නා

189 මටපිය, මාහට ප්‍රියස්වභාව ඇත්තාවූ; පියවනා, පිතෘවූ; මිගරද මැරුවෙනා, සිංහරාජයා මැරූහෙයින්; මෙලොවැ සියලූදනා, මේලොකයෙහි සියලූජනතෙම; නොමදිනා, බොහෝසෙයින්; ගරහයි, ගර්හාකෙරෙයි; පරලොවැ, පරලොකයෙහි; රුදුවනා, රෞද්‍රවත්තාවූ; සිව්අවයෙහිදිනා, (නරකාදී)සතරඅපායෙහි ජන්තව (ඉපද්;) නොපමණා, ප්‍රමාණයක් නොවත්තාවූ; දුක්විදැ, දුක්විඳලා; කොයිදිනා, කවරකලෙක්හි; මිදෙම්ද, (ඒසතරඅපායෙන්) මිදෙම්දෝ.

190 අප සිය ඇස ලෙ සා, රැකැ වැඩු නොවල සා
මිගරද ගුණ රැ සා, සිතට නොගෙණැ මෙ සා
ගිවිස නිරි ඳු බ සා, නපුරක් කල නි සා
දෙලොවින් දුක් රැ සා, මට විය එකලෙ සා

190 අප, අස්මත්හු; සියඇසලෙසා, ස්වකීයඅක්ෂීන්මෙන්; නොවලසා, අනලස්ව; රැකැවැඩු, රක්‍ෂාකොට වර්ධනයකළාවූ; සිඟරද ගුණරැසා, සිංහරාජයාගේ ගුණසමූහය; සිතටනොගෙණ, චිත්තයටනොගෙණ; නිරිදුබසා, රජහුගේවචනය; ශිවිසැ, ශිවිසගෙණ හෙවත් පිළිගෙණ; මෙසා, මෙබදුවූ; නපුරක්කලනිසා, සාහසික ක්‍රියාවක් කළනිසා· නොහොත් මෙබඳුවූනපුරු විපාකදායකවූපාපයක් කළහෙයින්; මට, අස්මත්හට; දෙලොවින්, (මෙලෝපරලෝ) දෙකින්; එකලෙසා, එකාකාරයෙන්; දුක්රැසාවිය, දුඃඛය රැස්වූයේය නොහොත් දුක්සමූහයක්වූයේය.

191 මෙලෙස කු ම ර ව රා, හඬමින් සිපිව රා
මි ග ර ද ක න් පු රා, අසමින් එමස රා
වි ග ස දෙයැස ඇ රා, බලමින් එකුම රා
පෙ ර වි දි දු ක් ත රා, පවසයි මෙමයු රා

191 කුමරවරා, කුමාරෝත්තමයා; මෙලෙස, මෙයාකාරයෙන්; හඬමින්සිපිව රා, හඬමින්සිපියකල්හි; මිගරද, සිංහරාජයා; කන්පුරා, කණ් පූරණයකොට; එමසරා, ඒශබ්දය; අසමින්, ශ්‍රවණයකරමින්; විගස, ශීඝ්‍රව; ඇස්දෙක ඇරා, අක්ෂිද්වය නිම්ලනයකොට හෙවත් ඇස්දෙකඇර; එකුමරා බලමින්, ඒකුමරු වා බලමින්; තරා, තදවශයෙන්; පෙරවිදිදුක්, පූර්වයෙහි වින්දනයකලාවූ දුඃඛයන්; මෙමයුරා, මේආකාරයෙන්; පවසයි, ප්‍රකාශකරයි.

---

192

පෙර දි නේ තොප මවහනේ වෙළඳකු*ගෙණේ සෙනෙහසනේ
ස ම ගිණේ ඔහු මහ වෙ නේ මැද යන තැ නේ මම දකිමි නේ
කරසෙ නේ එකතට මෙ නේ න ද ක ර මි නේ ගොස්වත්තැනේ
බියගෙණේ එ වෙ ළ ද ග ණේ ඇ ය හ රි මි නේ බැදිවත්දි නේ

192 පෙරදිනේ, පූර්වකාලයෙහි; තොපමවහනේ, තොපගේමාතෘකාන්තාව; වෙළඳකුගෙණේ, වෙළඳජනයකුවිසින් හැරගෙණ; සෙනෙහසනේ, ස්නෙහාධ්‍යාශයෙන්; ඔහුසමගිණේ, ඔහුසමග; මහවෙනේමැද යනතැනේ, මහා වනමධ්‍යයෙහි යනකල්හි; මමදකිමිනේ, මම(ඇ)දකිමින්; එකතට, ඒ(තොපගේමාතෘ)කාන්තාවට; මෙනේසෙනේකර, චිත්තස්නෙහයකොට; නදකරමිනේ, (සිංහ)නාදකරමින්; ගොස්වත්තැනේ, ගොසින් වැදුනුනත්හි නොහොත් ගොසින් වැදුනුකල්හි; එවෙළඳගණේ, ඒවාණිජ(ජන)සමූහයා; බියගෙණේ, භයගෙණ; ඇයහරිමිනේ, (තොපගේමාතාවූ) ඈ අත්හරිමින්; බැදිවත්දිනේ, අරණ්‍යයට වන්කල්හි.

---

* ප්‍රථමපාදයෙහි වෙළඳකුගෙණේයිද, සතරවෙනි පාදයෙහි එවෙළඳගණේයිද, පෙණෙයි.

193

අදරිනා එම්වරඟ නා පිටතබමි නා ගෙහාස් වීගසි නා
ගිරිලෙණා සිටුවා ගණා පලරසයෙනා තුටුකරමි නා
උමඟණා සහිසුරුමෙනා රත්රසමෙනා තදබැතියෙ නා
සතතිනා රතිසැපතිනා මනපිණමි නා වසනාදී නා

193 එමවිරඟනා, ඒ උත්තමාංගනාව; අදරිනා, ආදරයෙන්; පිටතබමිනා, පිහටහිතබමින්; විගසිනා ගොස්, වහා ගොස්; ගිරිලෙණාසිටුවාගණා, පර්වතගුහා වෙහි සිටුවාගෙණ; පලරසයෙනා, ඵලරසයෙන්; තුටුකරමිනා, සතුටු කරමින්; උමඟනාසහිසුරුමෙනා, උමයංගණාවනා ඊශ්වරයාමෙන්ද; රත්රසමෙනා, රත් රත්හා රසඳියමෙන්ද; තදබැතියෙනා, දැඩිවූ භක්තියෙන්; සතතිනා, නිරන්තර යෙන්; රතිසැපතිනා, රතිසැපයෙන්; මනපිණමිනා, චිත්තය පිණවමින්; වස නාදිනා, වාසයකරණකාලයෙහි.

194

අපස ද දරුපිළිසි ද කුසසිපිස ද දෙලදුක් වැ ද
වනමැ ද විදුරුතිලෙ ද පලරසයො ද දී දෙලමු ද
දිවිලෙ ද රකිනාල ද මවිසින් එ ද සිටගැබසො ද
පිරිස ද මස්විලිරු ද වියතද ලෙ ද එකතටසෙ ද

194 අපසඳ, අශ්මත්හුසඳහා; කුස, කුක්ෂියෙහි; දරු, දරුකයෙන්; පිලිසිඳ, පිළිසිඳගෙණ; දෙලදුක්වැද සිටිසඳ, දෙහලදුඃඛයවැදිසිටිකල්හි; වනමැදවිදා, වනමධ්‍යෙහි හැසිර; රුතිලෙද, කැමතිවූ ආකාරයෙන්; පලරසයොදදි, ඵල රස යොජිතකොටදී; දෙලමුද, දෙහලදුඃඛය මුක්තකොට හෙවත් දෙලදුක හැතිකර; එදසිට, ඒදවසෙහිපටන්; මවිසින්, මාවිසින්; සොද, යහපත් ආකා රයෙන්; දිවිලෙද, ජීවිතයමෙන්; රකිනාලද දරුගැබ, රක්‍ෂාකරණලද දරුක ගර්භය ඇත්නී; මස් පිරිසඳ, මාස සම්පූර්ණවූකල්හි; එකතට, ඒ (තොපගේමාතා) කාන්තාවට; සෙද, ශීඝ්‍රව; තදලෙද, තදවූපරිද්දෙන්; විලිරුදවිය, විලිරුජා හටගත්තේවිය.

195

එමවි වා මගෙගෙදහොතටා වැදුදෙදෙන වා දරු පෙම්කො වා
පිටත වා මම ගොදුර වා නොමගොස්සිටා නදනොමකො වා
එකත වා වැදුදසි වා රිසිරිසිවි වා රසහරසෙ වා
විකුම වා දත බිගකො වා තැනතැනසි වා ගෙණැදීතු වා

195 එමවිවා, එසමයෙහි; මගෙගෙදහොතටා, මාගේගෘහස්ථවජ්‍රයට; වැදූ, ප්‍රශූතකලාවූ; දරුදෙදෙනටා, (කුමාරය කුමාරිකාවය යන)දරුකයන් දෙදෙනාව; පෙම්කොටා, ප්‍රේමය(ඇති)කොට; මම, අශ්මත්නෙම; පිටතටා, පිටසථානයක ට; ගොදුරටා, ගොචර(ග්‍රහණය)පිණිස; නොමගොස්සිටා, නොගොස්සිට; නො මනදකොටා, (සිංහ)නාදද නොමකොට; වැදුදසිටා, ප්‍රශූතවූ දිනයෙහි පටන්; එකතටා, ඒකාන්තාවට; රිසිරිසිවිටා, රුචිරුචිවූ කාලයෙහි; සෙටා, යහපත්වූ; රසහරගෙණදී, රසවත්වූ ආහාරගෙණවුත්දී; තුටා, සන්තුෂ්ටව; තැනැතැනැ

සිටා, තත්සිතත්සිසිට; ඒකුමටඅංදන, ඒකුමයපිළිස ආවාවූ ජනයන්; සියනො මා, ගයණකාව.

## 196

සඳමෙනේ වත සිඹිම් නේ තද සතුටි නේ දරු වඩිම් නේ
සුබ ග ණේ යුත්මොහොති නේ බත් දෙවම් නේ සත්මසකි නේ
එමදි නේ නම් තබම් නේ දෙදෙනමණගණේ දරුකෙළිම් නේ
මෙලෙසිනේ පුතු සමගි නේ දුවරකිම් නේ දවසරිම් නේ

196 තදසතුටිනේ, තදවූ සන්තොෂයෙන්; දරුවඩම්නේ, දරුවන් වඩමින්; සඳමෙනේ වත සිඹිම්නේ, චන්‍ද්‍රයාවැනි මුහුණු සිඹිමින්; සත්මසකිනේ, සත් මාසයකින්; සුබගණේයුත් මොහොතිනේ, යහපත්වූ ගණයෙන්යුක්තවූ මුහුර්තය කින්; බත්දෙවම්නේ, බත්දෙවමින්; එමදිනේ, එදවස්හි; නම්තබම්නේ, නම් තබමින්; දරුදෙදෙනම ගෙණේ, දරුවන් දෙදෙනාම හැරගෙණ; කෙළිම්නේ, ක්‍රීඩාකරමින්; මෙලෙසිනේ, මේආකාරයෙන්; පුතු සමගිනේ, පුත්‍රයා සමගින්; දුවරකිම්නේ, හිතාවද රක්‍ෂාකරමින්; දවසරිම්නේ, දවස්යවමින්.

## 197

වයසි නා දරුඑදෙදෙ නා හට සොළොස්වස පිරෙණාතු රූ
* මව්සි නා තද දුක්ගෙ ණා රැකිගෙමිදිදි රස අමයු රූ
අදරි නා තෙපි මෙලෙසිනා ඇතිකළනිසා මට මෙනපු රූ
අදදී නා විය තෙ සිරි නා තොප පවතිවා හිමි දිවයු රූ

197 එදරුදෙදෙනාහට, ඒදරුවන් දෙදෙනාහට; වයසිනා, වයසින්; සොළොස්වස් පිරෙණාතුරු, ෂොඩශවර්ෂය පිරෙණතෙක් හෙවත් දහසාවුරුදු පිරෙණතෙක්; මව්සිනා, අම්මාත්තෙම; අමයුරු, අමෘතාකාරවූ; රසඅහරදිදි, රසවත්වූ ආහාරදානයකොටකොට; තදදුක්ගෙණා, ඝනබවවූ දුක්ගෙණ; රැකිගෙමි, රක්‍ෂාකෙළෙමි; මෙලෙසිනා, මෙයාකාරයෙන්; අදරිනා, ආදරයෙන්; තෙපි, පුත්‍රවත්හු; ඇතිකළනිසා, වර්ධනයකළහෙයින්; මට, මාහට; අදදිනා, අදදවස්හි; මෙනපුරුවිය, මේනපුරවූයේය; තොප, පුත්‍රමත්තෙම; තෙසිරිනා, නොයෙක ඓශ්වර්‍යයෙන් උපලක්‍ෂිතව; (නොයෙක් යසඉසුරු ඇතිව) දිවයුරුහිමි, දිවාකර යා මයහිඳකොට හෙවත් (සඳ)හිරු දෙදෙනා ලොකයෙහි පවත්නාතාක්කල් මිහුල්ලෙහි; පවතිවා, ප්‍රවෘර්තිතවේවා හෙවත් ජීවත්ව පවතීවයි කියේය.

## 198

වනක ලා පති සිරිසු ලා දිලි පිරික ලා පති ලපතු ලා
නොවික ලා මට එක්වෙ ලා සිපි මවුක ලා සහ ගුණව ලා
මන ක ලා තොප නංක ලා වද මෙමක ලා මා සිහික ලා
නොවමු ලා කිය තොපබ ලා මගෙ දුක්කැ ලා දැන් ගියප ලා

* "මව්සිනා" යනු ප්‍රථමා විභක්තියගේ අර්ථයෙහි කෘත්‍යුප්‍රහත්තියි.

198 චන, චක්‍රය කරණකොටගෙණ හෙවත් මුහුණ කරණකොටගෙණ; කලාපතිසිරි, චන්ද්‍රයාගේ ශොභාව; උපුලා, උපුලන්නාවූ; දිලි, බබලන්නාවූ; පිරි, සම්පූර්ණවූ; කලාපතිලපතුලා, චන්ද්‍රයාගේ ලාඤ්ඡනයහා සමානවූ හෙවත් චන්ද්‍රයාගේ ශශලාංඡනයමෙන්; නොවිකලා, විකලනොවී; මට, අශ්මත්හට; එක්වෙලාසිටි, එක්වෙලා සිටියාවූ; නොප, යුෂ්මත්හුගේ; මවුකලා සහ, මාතෘකාන්තාව හාසමග; ගුණඅවලාසිටි, ගුණයෙන් ආකූලව සිටියාවූ; නංකලාවද, බුහුණනි කාන්තාවටද හෙවත් නැගණියටද; මෙමකලා, අධුනා කාලයෙහි; මාසිහිකලා, අශ්මත්හු විසින් අනුෂ්මරණය කරණලද්දීයයි; මුලානොව, මුලානොවී හෙවත් නුමුලාසිව; කිය, කථනයකරව; නොපබලා, යුෂ්මතුන්දර්ශනය කොට; මගෙ, අශ්මත්හුගේ; දුක්කැලා, දුඃඛසමූහය; දැන්, මේකාලයෙහි; පලාගිය, පහව ගියේය(සිඝියාද හැඩුයේය.)

---

199 ස තො ස වී කුමරුහට මරණ පත්ක ලා
මෙ ලෙ ස පෙර විඳපු දුක්රැස කියනක ලා
එ ලෙ ස දරුකුමරු විදිසැරෙනි තදබ ලා
වි ග ස සැහවුනෙයි සිරදුගෙ පණන ලා

199 මරණපත්කලා, මරණප්‍රාප්තකලාවූ; කුමරුහට, (සිංහබාහු) කුමාරයාහට; සතොසවි, සන්තුෂ්ටව; මෙලෙස, මෙයාකාරයෙන්; පෙර, පූර්වයෙහි; විඳපුදුක්රැස, විඳිනය කරණලදදුක් සමූහය; කියනකලා, කියන්නාවූකාලයෙහි; එලෙස, එපරිද්දෙන්; දරුකුමරු, පුත්‍රවූ (සිංහබාහු) කුමාරයා විසින්; තදබලා, තදබලව; විදිසැරෙනි, විජ්ඣනය කරණලද සැරපහර කරණකොට ගෙණ; විගස, (ඒ)ක්ෂණයෙහි; සිරදුගෙ, (පිතෘවූ) සිංහරාජයාගේ; පණනලා, ප්‍රාණවාතයතෙම; සැඟවුනෙයි, නිලීනවිය හෙවත් නැතිවූයේය.

---

200

කුමරුස ද දැකැඑසිර ද මලබවඑස ද දුක්වැදැනොම ද
නිරිඳුස ද බස්ගිවිසසෙ ද පියම්හිදුවි ද මැරුවෙම්සුහ ද
තියම්නෙ ද හඬමින්අම ද යලිකඩුවඇ ද මිගිඳුගෙපිය ද
සිරසසි ද ගෙණැමගටවැද එනකලටඑ ද ගම්වැසිසමු ද

200 කුමරුසඳ, (ඒසිංහබාහුනම්වූ) කුමාරෝත්තමතෙම; එසඳා, ඒ කාලයෙහි; එසිරඳ, (තමාගේ පිතෘවූ) ඒසිංහරාජයා; මලබව, මැරුණුබව; දැකා, දර්ශනයකොට; එසඳා, ඒකාලයෙහි; නොමදා, අමන්දවූ; දුක්වැදැ, දුඃඛයටප්‍රවිෂ්ටව; නිරිඳුසඳා, නරේන්ද්‍රොත්තමයාගේ; බස්ගිවිස, වචනයපිළිගෙණ; සෙඳ, ශීඝ්‍රව; සුහඳ, සුහෘදවූ; පියම්හිදු, පිතෘවූ මෘගෙන්ද්‍රයා; විඳ, විදලා; මැරුවෙම්කියමින්, මෘරණයකොළෙම්යි කියමින්; අමඳා, අමන්දව හෙවත් බොහෝසේ; හඬමින්, රොදනයකරමින්; යලි, නැවත; කඩුවඇද, ඛඩ්ගය ඇදගෙණ; පියඳ, ජනකපිතෘවූ; මිගිඳුගේ, මෘගෙන්ද්‍රයාගේ; සිරසසිදාගෙණ, ශිරසකපාගෙණ; එඳ, ඒදවස්හි; මගටවැද, මාර්ගයටපැමිණ; එනකලට, එන්නාවූ කාලයෙහි; ගම්වැසි සමුද, ග්‍රාමවාසී (ජන) සමූහතෙම.

## 201

එබව අ සා නෙකපඬුරුරැ සා ගෙණැමගටබැ සා කුමරුට දීයැ සා
රට වන සා සිරිවිඳුන සා පටසෙනසල සා කළුපිහිටනි සා
සියලුදි සා වෙහිඑකවිල සා පලවියතොල සා ඔබවිකුම්රැ සා
නෙතුතිබසා පවසාමෙලෙසා හැමපඬුරුරැ සා දීඑමවිග සා

201 එබවඅසා ඒ(සිංහරාජයාමැරූ) බවඅසා; නෙකපඬුරුරැසාගෙණැ, නොයෙක් පඬුරුසමූහය ගෙණ; මගටබැසා, මාර්ගයටබැස; දීයැසාකුමරුට, ලොකයට ඇසක්වැනිවූ (සිංහබාහු) කුමාරයාට; රටවනසාසිරි, රටවිනාශකොටසිටියාවූ; මිහිඳුනසා, සිංහරාජයානසා; අපට, අප(හැම)ට; සෙනසලසා, ශාන්තියසලස්වා; කළුපිහිටනිසා, කරණලද ප්‍රතිෂ්ඨාවනිසා; සියලුදිසාවෙහි, සියලු(දශ)දිශාවෙහි; එකවිලසා, එකාකාරයෙන්; ඔබ විකුම්රැසා, ඔබවහන්සේගේ වික්‍රම සමූහය; තොලසා, අනලස්ව; පලවිය, වැප්තවූයේය හෙවත් පැතුරුණේයයි; නෙතුතිබසා, නොයෙක්ස්තුති වචන; පවසා, ප්‍රකාශකොට; මෙලෙසා, මේආකාරයෙන්; එමවිගසා, එසැණයෙහි; හැමපඬුරුරැසාදී, (ඒ) සියලු පඬුරුසමූහයදී.

## 202

එකලෙසිනා පලයුරුනෙළිනා ගොඩබැසදවනා සිඳුරඳුවිසි නා
නොවපමණිනා පසතුරුගොසිනා කුඩකොඩිරැගෙණිනා වසමින්ගුව ණිනා
දෙනනොමිණිනා ඔල්වරහඬිනා නෙකතුතිගොසිනා හැමදනකර ණිනා
මෙබඳුම නා මහපෙළහරිනා කුමරිඳුසොබ නා නුවරටපැමි ණිනා

202 පලයුරුනෙළිනා, මහත්වූ ප්‍රලයානිලය කරණකොටගෙණ හෙවත් ලොකය විනාශකරන්නාවූ කල්පාන්ත පවනින්; ගොඩබැස, ගොඩබැසලා; දවනා, ධාවනය කරන්නාවූ; සිඳුරඳුවිසිනා, සමුද්‍රයාහා; එකලෙසිනා, ඒකාකාරවූ: නොවපමණා, ප්‍රමාණයක්නැත්තාවූ; පසතුරුගොසිනා, පචතූර්‍ය්‍ය ඝොෂාවෙන් යුක්තව; කුඩකොඩිරැගෙණා, ඡත්‍රධවජගෙණ; ගුවනාවසමින්, අවකාශය ඡාදනය කරමින්; නොමිණා, ප්‍රමාණයක්නැතිව; දෙන ඔල්වරහඬිනා, පවත්වන්නාවූ උක්කුෂ්ඨි ශබ්දයෙන් නොහොත් ප්‍රමාණයක්නැති ජනයාගේ ඔල්වරහඬින්යුක්තව; හැමදන කරණා, සියලු ජනයන් විසින් කරණලබන්නාවූ; නෙකතුතිගොසිනා, නොයෙක්ස්තුති ඝොෂාවෙන් යුක්තවූ; මෙබඳු, මෙසාකාරවූ; මහාමහපෙළහරිනා, යහපත්වූ මහා ප්‍රාතිහාර්‍ය්‍යයෙන් යුක්තව; සොබනා, ශොභනවූ; කුමරිඳු, කුමාරෙන්ද්‍රතෙම; නුවරටපැමිණා, නගරප්‍රාප්තව.

## 203

සිරියස ද තම එමුත්ස ද සුරපුරට වැ ද සත්දින ගත ද
කුමරුස ද ගෙණආමියි ද හිසදකිනලෙ ද මවුබිසෝස ද
සමගඑ ද නැගණිදතොරද ගොස්එමමියි ද හිසවැලඳව ද
සිරසහ ද අනගසමිනෙද හැඹුවසිඑල ද කියමින්මෙලෙ ද

203 සිරියසදා, සිරියකල්හි; තම එමුත්සදා, තමාගේ එමුත්පානුවූ රජ්ජුරුවන්; සුරපුරටවැද, දිව්‍යලොකයට ප්‍රවිෂ්ටව හෙවත් කාලක්‍රියාකොට පරලොව ගියාවූ; සත්දිනගතද, සත්තාහ (සති) යක් ඉක්මුනුකල්හි; කුමරුසදා, කුමා

රසාවීසිත්; ගෙණආ, හැරගෙණආවාවූ; මිහිදා, සිංහරාජ(යාගේ;) හිසදකිනලෙද, හිස දකිනපරිද්දෙන්; මවුබිසෝසඳා, මාතෘවන්ද්‍රිකාවහා; නැගණිද, බුහුණනිනොමෝද; නොරදාගොස්, නොනැවතිගොසින්; එම මිහිදාහිස, එමසිංහරාජයාගේහිස; වැලඳබඳ, බඳආලිඞ්ගණයකොට හෙවත් අල්ලාවැලඳගෙණ; සිරසහද, හිසෙහිගා ලයෙහි; අනගසමින්, අත්ගසමින්; එද, ඒද්නයෙහි; එලදා, ඒකාන්තානොමෝ; මෙලෙදකියමින්, මේආකාරකියමින්; හැඬුවයි, හැඬුවාය.

204

පෙර දී නේ මටලොබයෙනේ පිටතබමි නේ ගෙණැගොස්වනේ
ගල්ලෙණේ මා ලාග ණේ රත් රසමෙ නේ පලකරුසෙ නේ
නැතතැනේ විදැ මහව නේ පල රස අ නේ ගෙණැදීග ණේ
වෙනවෙනේ සළු බරණි නේ තුනු සරස නේ මය දීනදී නේ

204 පෙරදිනේ, පූර්වකාලයෙහි; මට ලොබයෙනේ, මාහට ලොභයෙන්; පිට තබමිනේ, පිටෙහි තබමින්; වනේ ගෙණගොස්, අරණ්‍යයට ගෙණගොසින්; ගල්ලෙණේ, ගල්ගුහාවෙක්හි; මාලාගණේ, මාහිඳුවාගණ; රත්රස මෙනේ, රත්රත්හා රසදියමෙන්; සෙනේපලකරු, ස්නෙහය ප්‍රකාශකොට; මහවනේ, මහාරණ්‍යයෙහි; නැතතැනේ ඇවිදැ, තන්හිතන්හිහැසිර; දීනදීනේ, දවසක් පාසා; අනේපලරස, නොයෙක් ඵලරසයන්; ගෙණැදීගණේ, ගෙණවුත්දී; වෙනවෙනේසළුබරණිනේ, අනෘඅනෘවූ වස්ත්‍රාභරණයෙන්; තුනුසරසනේමය, ශරීරය සරහන්නේමය.

205

පෙරක ලා දරුගැප්වෙ ලා දෙලදුක්වෙ ලා මං සිටික ලා
උදක ලා වම හැමදෙ ලා එම පසිඳ ලා දුක් දුරැක ලා
මුහුක ලා යින් පසුළු ලා ගැබ වැදු ක ලා දරු මනක ලා
නොමහෙ ලා බිමදෙනොන ලා ගණ සිඹදු ලා වත පෙමක ලා

205 පෙරකලා, පූර්වකාලයෙහි; මා, අශ්මත්තැනැත්තිය; දරුගැප්වෙලා, දරුගැබක් ඇතිවෙලා; දෙලදුක්වෙලාසිටිකලා, දොහලදුඃඛයක් ඇතිවසිටිකල්හි; උදකලාවම, එකලාවම; එමහැමදේලා, ඒසියලුම දොහලයන්; පසිඳැලා, ප්‍රච්ඡින්නයකොට හෙවත් සියලුආකාරයෙන් ඒදෙලදුක සන්සිඳුවා; දුරැකලා, දුරැකොට; එලාගැබ, ඒලපටිවූ දරුගර්භ; මුහුකලායින්පසු, පරිණතවූ කාලයෙන්පසු; මනකලා, මනොකලාවූ; දරුවැදුකලා, දරුකයා ප්‍රශුතකළ කල්හි; බිමනොමහෙලා, (ඒප්‍රශූතකලාවූ ලදරුවා) බිමනොහෙලා; දෙනොන ලාගණ, හස්තයුග්මය බහා හෙවත් අත්දෙකපා; පෙමකලා, ප්‍රෙමයකොට; දුලා, දිලියෙන්නාවූ; මනකලාදරු, මනෘකලාවූ දරුකයාගේ; වතසිඹ, මුහුණසිඹ.

206

එ ම වැ දූ පුතු සමග දූ යන එපසි දූ දරු අපබ දූ
මෙ හ රි දූ දැකැ කරමු දූ සිත දිවිබ දූ සෙනෙහස රැ දූ
අඹබ දූ හැම රස ගෙ දූ හර දී එ දූ දරු රැකැ සැ දූ
හිමිස දූ ඇති ගුණක දූ ඔබ පිරිසි දූ සම්විය ඉ දූ

206 එමවැදු, එම්පුණුතකලාවූ; අපබද, අපගාසම්භාවූ; පුතුසමඟද සහ, පුත්‍රයාසමඟ ඩීතායසි කියනලද්දාවූ; එපසිදුදරු, ප්‍රසිද්ධවූ එදරුකයන්; මෙහසිදු, මේසිංහරාජතෙම; දැකැ, දර්ශනයකොට; සිතමුදුකර, චිත්තය මෘදුකොට; දිවිබදු සෙනෙහසරිද්ද, ජීවිතයමෙන් ස්නෙහාබද්ධයශය රදවනලද්දාවූ; අමබදු,අමෘතකාරවූ; හැමරසයෙදු, සියලුරස යොදනලද්දාවූ; අහරදී, ආහාරදානයකොට; එදුදරු, ඒ දුපුත්‍රයන්; රැකැ, රක්ෂාකොට; සැදු, සාදනලද්ද (වර්ධනයකරණලද්ද) වූ; හිමිසදු, ස්වාමීපුත්‍රයාතෙනි; ඔබ, ඔබවහන්සේගේ; ඇසිගුණකද, විද්‍යමානවූ ගුණසමූහය; පිරිසිදු, පරිශුද්ධවූ හෙවත් අභ්‍රමිහිධූමරජොරාහු සංඛ්‍යාත පඤ්චොපක්ලෙශයන් කෙරෙන් විනිර්මුක්ත හෙයින් පිරිසිදුවූ; ඉදුසම්වේය, චන්ද්‍රයා සමානවූයේය.

207

වයසි නා සොළසක්වනා තුරුමෙදෙදෙනා දරුසමගි නා
අපගැ ණා මහදුක්ගෙණා රැකි නිතිනය නා සියනෙතමෙ නා
ඔබගු ණා එමනොමදැනා සැරපහරි නා විදැ මරම් නා
මෙම වි නා සය කරම් නා හලෙ පුතුවී නා කවුරුද වෙ නා

207 වයසිනා, වයසින්; සොළසක්වනාතුරු, ෂොඩශයක් වෙනතෙක්; හෙවත් දහසය අවුරුද්දක් සම්පූර්ණවනතුරු; මෙදරුදෙදෙනා සමගිනා, මේදරුවන් දෙදෙනාගාසමග; අපගැණ, අපනිසාද; මහදුක්ගෙණ, මහත්වූ දුඃඛයගණිමින්; නිතියෙනා, නිරන්තරයෙන්; සියනෙතමෙනා, ස්වකීය නෙත්‍රයමෙන්; රැකි, රක්ෂාකලාවූ; ඔබඑමගුණ, ඔබවහන්සේගේ එමගුණයන්; නොමදැනා, ජානනය නොකොටම; සැරපහරිනා, සැරප්‍රහාරයෙන් (හීපහරින්;) විදැමරම්නා, විදලා මරම්න්; මෙමවිනාසය කරම්නා, මෙමවිනාශයකරම්න්; හලේ, හැරියනෑසැත්තේ; පුතුවීනා, (ඔබවහන්සේගේ) පුත්‍රයාහැර; වෙනකවුරුද, අන්කවරෙක්දෙ ( කියා හැඬිය. )

208

හිමිස ද පලවැලස ද පට වනමැ ද ගියකලසෙ ද
ලෙණහි ද සැඟවීඑ ද අපිනොමර ද මෙහිආස ද
තදලෙ ද සිතදුක්වැ ද ගිරිලෙණර ද ලානොමහි ද
රටමැ ද විත්මෙමලෙ ද දුක්විදැව ද ලේ අපස ද

208 හිමිසදා, ස්වාමීපුත්‍රයානෙනි; අපට, අපහැමදෙනාට; පලවැලසදා, එලපත්‍රාදිය (ගෙණඒම) සඳහා, වනමැදගියකලැ, වනමධ්‍යයට ගියකල්හි; සෙද, එසන්ධ්‍යාවෙහි; ලෙණහිදා, ගල්ගුහාවෙහිද; අපි, අප්මත්තු; එද, ඒ දවස්හි; නොමරදා, (එහි)නොරැඳී; සැගවී, නිලීනව හෙවත් සැඟවිලා; මෙහිආසදා, මෙහි ආගමනය කළහෙයින්; තදලෙද, තදවූආකාරයෙන්; සිතදුක්වැද, චිත්තසව දුක්වැදී; ගිරිලෙණ, ගල්ලෙණෙහි; රදාලානොමහිදා, රදානොමහිද; රටමැද ඇවිත්, රටමධ්‍යයට ආගමනයකොට; මෙමලෙද, මෙපරිද්දෙන්; දුක්විද වදලේ, දාමවිඥානයකොට වදලේ; අපසදා, අප්මත්තු සඳහාය (කී කියාද හැඬිය.

209 පල තුරු වල සො දා, දිනුබෝ නුගස දා
එම්තුරුවල සෙ දා, නැසුමට ගියතලදා
මෙහිම්ගටම දා, මපුත්කුමරු වි දා
මැරුවෙය පියර දා, ඉන් මට දුක් තදා

209 පලතුරුවල, ඵලවෘක්‍ෂයන්හි; සොදා, යහපත්ව; දිනුබෝනුගසද, ජනිතවූ අශ්වත්‍ථන්‍යග්‍රොධයන්නිසා හෙවත් (යහපත්ව) උපන් බෝගස් නුගගස් නිසා; වල, අරණ්‍යයෙහි; එම්තුරු, එම්වෘක්‍ෂයන්; සෙදා, වහා; නැසුමට ගියතලදා, නාස්තියට ගියාක්මෙන්; මෙහිම්ගටමදා, මේස්වාමි (වූ සිංහරාජයා) හටම ජාතකවූ; මපුත්කුමරු, මාගේපුත්‍රවූ කුමාරතෙම; පියරදා, පිතෘවූ (සිංහ)රාජයා; විදා, විජ්ඣනයකොට හෙවත් විදලා; මැරුවෙය, මාරණයකෙළේය; ඉන්, ඒ කරණකොටගෙණ; මට, මාහට; තදදුක්, තදවූදුකක්වූයේය.

210 තනතුරු සිරිප තා, ගොසින් නිරිඳුවෙ තා
මරණෙම් පවස තා, කියමින් නොනව තා
මබස නොගෙණැසිතා, විදැමැරි සියපි තා
අනේ මගේපු තා, කලපව තදි ඉ තා

210 තනතුරු සිරිපතා, තනතුරුහාඓශ්වර්‍ය්‍යයන් ප්‍රාර්‍ත්‍ථනාකොට; නිරිඳුවෙතා ගොසින්, නරේන්‍ද්‍රයාකරා ගොස්; නොනවතා, නොවරදවා; මරණෙම් පවසතා, (සිංහරාජයා) මරන්නෙම්යි කියමින්; මබස, මාගේවචනය; සිතානොගෙණැ, චිත්තයට ග්‍රහණය නොකොට; සියපිතා, තමාගේපියවූ(සිංහරාජයා;) විදැමැරි, විදලා මාරණයකෙළේය; අනේමගේපුතා, අහෝමාගේ පුත්‍රයාවිසින්; කලපව, කරණලදපාපය(තම්;) ඉතාතදි, අතිශයින් ස්තබ්ධවියයි කියාද හැඬූවාය.

211 මෙලොවැසැපතති රා, නැතිවග * මම්ඳු රා
මපුතුට කීව රා, ගොසින් මටත්සො රා
සියපිය විදැ ම රා, කලපව ගොරත රා
දුක්විඳැ සිව්නි රා, ගෙවනෙද කොයිව රා

211 මෙලොවැ සැපත, ඉහලොකසෞඛ්‍යය හෙවත් මේලොකයෙහි විඳිනු ලබණ සියලුම සම්පත්තිය; තිරානැතිවග, ස්ථිරරහිතභාවය; මම, මා; ඉදුරා, යහපත්කොට; මපුතුට, මාගේපුත්‍රයාහට; කීවරා, කීකල්හි; මටත්සොරා ගොසින්, මාහටද සොරාගොස්; සියපියවිදැමරා, ස්වකීයවූ පියාහට විදලාමරා; ගොරතරා කලපව, කරණලද ඝොරතරවූපාපය; සිව්නිරා දුක්විදැ, සතරඅපායදුක් විඳලා; කොයිවරාගෙවනෙද, කවරකාලයෙක්හි ක්‍ෂයකරන්නේද හෙවත් නැති කරන්නේදැ(යි කියා හැඬූවාය.)

212 නලවනැ දිනුන ලා, දවසි එහැම න ලා
එම්ලෙසනොවමු ලා, නුඹටම දෑවෙ ලා
මතුසින් බිහීවෙ ලා, වැඩිවිය පැමිණී ලා
සිරි මෙකුමරුපු ලා, නුඹතැසි රුපුවෙ ලා

---

* මම්නිරායිද පොත්වල, මමයනු කාලසප්තමී ප්‍රථමාවිභක්ති වියයුතුයි.

212 නළවනා, හුණවනයෙහි; දිනුහලා, උපන්නාවූ ගින්නෙනම; එනැම හලා, එසියලුමහුණවනය; දවයි, දවන්නේය; එමලෙස, එපරිද්දෙන්ම; නොවමුලා, මුලානොවී; තුඹවම දවෙලා, තුඹවහන්සේටම ජනකවෙලා; මකුසින් හිහිවෙලා, මාගේකුක්ෂියෙන්ප්‍රසූතවී; වැඩිවිය පැමිණිලා, වෘඩිප්‍රාප්තව හෙවත් වැඩිලා; පුලාසිරි, ජවලිතව සිටියාවූ; මෙකුමරු, මේකුමාරතෙමේ; රුදුවෙලා, රෞද්‍රවී; තුඹනැසී, තුඹවහන්සේ මැරුණේය(සිකිනාද හැඬුවෝය.)

213 තුඹ නිරිසත්නි සා, කිසිවක් නොවිම සා
නොමහිඳැ ලෙණකු සා, ඇවිඳින් අපනී සා
හිමි මලබව අ සා, යලි දැකැ සියඉ සා
මටවන් දුක්රැ සා, කියනෙමි කොයිලෙ සා

213 හිමි, ස්වාමීයෙනි; තුඹනිරිසත්නිසා, තුඹවහන්සේ නිරන්විතවූනිසා; කිසිවක් නොවිමසා, කිසිත් විමසීමක් නොකොට; ලෙණකුසානොමහිඳැ, ගල්ගුහාවෙහි නොහිඳ; අපනිසා ඇවිදින්, අපහැමදෙනානිසා අවුත්; මලබවඅසා, මලබව අසාද; යලි, නැවත; සියඉසාදැකැ, ස්වකීයයිෂ්ඨය දශීනයකොටද; මටවන්දුක්රැසා, මටවන්නාවූ දුක්සමූහය; කොයිලෙසා කියනෙම්, කොයිආකාරයකින් කියන්නෙම්දැයි(කියාද හැඬුවාය.)

---

214 මෙලෙසට එ රදහ නා
සමග දුදරු තුන්දෙ නා
සිරද ගුණ කියමි නා
හඬා වැලපි නිසෝවූනැ නා

214 මෙලෙසට, මෙයාකාරයෙන්; එරදහනසමග, ඒරාජකුමාරිකාවහාසමග; දුදරුතුන්දෙන, දුහිතෘ පුත්‍රයන තුන්දෙනා; සිරදගුණ කියමින, සිංහරාජයාගේ ගුණකියමින්; හඬාවැලපී, රොදනයකොට විලාපකියා; නිසෝවූනැන, නිශ්ශෝකාවූකල්හි හෙවත් ශොකතුනිවූකල්හි.

215 සියලුම එවගුර ට
වසන දන ගණ සෙටදෙ ට
සිහබා කුමරිඳු ට
අනත තුතිකොට තුටුවැ එමවිට

215 සියලුම එවගුරට, ඒසියලුම වංගරාෂ්ට්‍රයෙහි; වසන, වාසයකරන්නාවූ; සෙටදෙට, ශ්‍රෙෂ්ඨජෝෂ්ඨවූ; දනගණ, ජනසමූහයා; සිහබාකුමරිඳුට, සිංහබාහුනම් කුමාරොත්තමයාහට; අනතතුතිකොට, අනන්තවූ ස්තුතිකොට; තුටුවැ, සන්තොෂව; එමවිට, එක්ෂණයෙහි.

216 ඇමතිවරු හැමදෙ නා
අවම්ගුල් වෙස් ගණිමි නා
අපමණ පෙලහරි නා
මිගිඳු හිසගෙණැ දවාහරිම් නා

216 ඇමතිවරු හැමදෙන, සියලු අමාත්‍ය ජනයෝතුමූ; අවමඟුල්වෙස් ගණිමින, අවමංගල්‍යවේශ ගණිමින්; අපමණ පෙලහරින, අප්‍රමාණවූ ප්‍රාතිහාර්‍යයෙන් යුක්තව; මිහිදු, මහින්ද්‍රයාගේ; හිසගෙණ, ශීර්ෂයගෙණ; දවාහරිමින, දවාහරිමින්.

---

217 නුවරු හැමදෙන එක්වසොයමින් පවරමැතිගණ සමගිනා
සොඳුරු එපුරට නුදුරු මහහිමවතක්දැකැ එහිසපැමි ණා
එතුරු ලියමුල්.ගල්උගුළුවා එබිමසමකර සදමි නා
ඇදුරු වරු වඩුසතර තෙරපත් කැඳවමින් රැස්කරමි නා

217 පවරමැතිගණසමගිනා, උතුම්වූ අමාත්‍ය සමූහයාහා සමග; නුවරුහැමදෙන එක්ව, සකල නාගරික ජනයන් එක්ව; සොයමින්, පරීක්‍ෂාකරමින්; සොඳුරුඑපුරට, සුන්‍දරවූ ඒනගරයට; නුදුරු, සමීපවූ; මහහිමවතක්, මහහිමාලය වස්තුවක් හෙවත් මහත්වූ වනප්‍රදෙශයක්; දැකැ, දර්‍ශනයකොට; එහිසපැමිණා, එහිසම්ප්‍රාප්තව; එතුරු ලිය ගල් මුල් උගුලුවා, ඒවෘක්‍ෂලතා ගල්මුල් උඩරණය කරවා; එබිම, ඒභූමිප්‍රදෙශය; සමකොට සදමිනා, සමකොට සරහමින්; වඩුසතර තෙරපත්, වඩ්ඩකිශාස්ත්‍රයෙහි එතරට පැමිණියාවූ; ඇදුරුවරු, ආචාර්‍යව රයන්; කැඳවමින්, ආමන්ත්‍රණය කරමින්; රැස්කරමිනා, රැස්කරමින්; හෙවත් ඒස්ථානයට එකතුකරමින්.

218 ඉදුරු පුරවරඅසුරු මාහැඟි උතුම්නුවරක් කරමි නා
සොඳු රු එපුරට පවරසිහබා පුරය යනනම තබමි නා
අබි රු සිහබා කුමරුහට එමනුවර රජසිරි දෙවමි නා
මහ රු සිහවල්ලිය කුමරි අගබිසෝ කරතැබු එමදි නා

218 ඉදුරුපුරවරඅසුරු, (උතුම්වූ) ශක්‍රපුරයවැනිවූ; මාහැඟි, මහාර්ඝවූ; උතුම් නුවරක් කරමිනා, උත්තම නගරයක් කරමින්; සොඳුරු එපුරට, යහපත්වූ ඒනගරයට; පවර සිහබාපුරය යන, උත්තමවූ සිංහබාහුපුරයයි කියන්නාවූ; නම තබමිණා, නාමයතබමින්; අබිරුසිහබාකුමරුහට, නිර්භීතවූ සිංහබාහුකුමාරයාහට; එමනුවර රජසිරි, ඒනගරයෙහි රාජෛශ්වර්‍ය්‍යය; දෙවමිනා, දානයකරවමින්; මහරු, මහාර්ඝවූ හෙවත් යහපත්වූ; සිහවල්ලියකුමරි, සිංහවල්ලි කුමාරිකාව; අගබිසෝකර, අග්‍රමහෙසිකාවකොට; තැබුඑමදිනා, පිහිටවූඑකාලයෙහි.

219 එරද එබිසව සමග දසරජදමින් ලෙව්සතරකිණ අතරා
නොමද මහපින් බලැති දෙතිසක් කුමරුලබමින් පියතරා
නිබද පුරඳුරුසිරින්බබලා සියලුසැපවිඳැ සෙකල වරා
සුහද නෑසිය දුක්මුහුදලා කෙළෙල්කලුරියගොර තරා

219 එරද, ඒරාජයා; දසරජදමින්, (දානශීලාදි) දශරාජධර්මයෙන්; ලෙව්සතරකිණඅතරා, ලොකවාසී සත්වයා රක්‍ෂාකරණකාලයෙහි; නොමද මහපින්බලැති, අමන්දවූ මහත්පින්හාශක්ති ඇත්තාවූ; පියතරා, අතිශයින් ප්‍රියකාවපුතුවූ; දෙතිසක්කුමරු ලබමින්, ද්වාත්‍රිංශත් කුමාරයන් ලබමින් හෙවත් රාජකුමරා



(83 පිට.) විජය කුමාරයා සහ පිරිවර ලංකාවට ගොඩබැසීම.

වරු නිස්දෙත්තෙක් ලබමින්; නිබඳ, නිරන්තරයෙන්; පුරඳුරුසිරින්, පුරන්ද්‍ර ශ්‍රීයෙන්; බබලා, භ්‍රාජිතව හෙවත් ශක්‍රදේවේන්ද්‍ර විලාශයෙන් දිලිහී; සියදුසැප විඳැ, සකලසම්පත්ති වින්දනයකොට; කෙළවරා, අවසානයෙහි; සුහදනැසිය, සුහෘද්වූ ස්වකීයඥාතිජනයන්; දුක්මුහුදලා, දුක්නැමැති සමුද්‍රයෙහි බහා; ඝෝර තරා කලුරියකෙළේ, අතිශයින් දරුණුවූ කාලක්‍රියාව කෙළේය හෙවත් මියපර ලොව ගියේය.

220 ප ව ර එරජුගෙ කුමරුනතුරෙන් විජයබාතම්දෙටකුමරවර
ස ත ර තුමමොක්පුරට සපැමිණි දිනම නැවරාඅවුත්සිරිසර
ප ත ර ලක්දිවැ තම්මැත්තනම්පුරටගොඩබැසැයකුන්දුරුකර
වි ත ර නැති සව්සිරින් රජකෙළෙ මෙලක පළමුව මිණිස්වසකර

220 පවරඑරජුගෙ, උතුම්වූ ඒරාජයාගේ; කුමරුන්අතුරෙන්, කුමාරයන් අතුරෙන්; විජයබාතම් දෙටකුමරවර, විජයබාහුනම්වූ ජ්‍යෙෂ්ඨ කුමාරෝත්තම තෙම; සතරතුම, ශාස්තෘවූ උතුම් සර්වඥයන් වහන්සේ; මොක්පුරට සපැමිණි දිනම, මොක්ෂපුරයට සම්ප්‍රාප්තවූ දිනයෙහිම හෙවත් නිරුපධිශේෂ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පා නිවන්පුරයට පැමිණිදවසෙහිම; නැවරා, නෞකාරූඪව හෙවත් නැව්නැගී; අවුත්, ආගමනයකොට; සිරිසර, ශ්‍රීසාරවූ; පතර, මහත්වූ; ලක්දිවැ, (මේ) ලංකාද්වීපයෙහි; තම්මැත්තනම්පුරට, තම්මැන්නනම්වූ නගරයට; ගොඩබැසැ, ගොඩබැසලා; යකුන්දුරුකර, (එහිවාසයකළාවූ) යක්ෂයන් දුරුකොට; මෙලක, මේලංකාද්වීපයෙහි; පළමුව, පළමුවෙන්ව; මිනිස්වසකර, මනුෂ්‍යවාසයකොට; විතරනැති, ප්‍රමාණයක්නැත්තාවූ; සව්සිරින්, සකලෛශ්වර්‍ය්‍යයෙන්යුක්තව; රජකෙළේ, රාජ්‍යයකළේය.

221 මෙම රදුටසත්වෙනිව සිරිලක රජපැමිණි තදතෙදටදිනකර
හි ම කිරණබඳු යසින්බැබලූ දෙවනිපෑතිස්නරණ ගරුතර
අ ම ඇදුරු සුත දඹදිවින්වැඩි මිහිඳුමාහිමි සඳහු දුටුව ර
පෙම සිතින් බණඅසා සතුටුව, තෙරුවනෙහි සැදැහැතිවබලතර

221 මෙමරදුව, මේ(යශෝයුක්තවූ)රජතුම; සත්වෙනිව, සත්වන්නෙහි හෙවත් සත්වෙනිවාරයෙහි; සිරිලක, ශ්‍රීලංකාද්වීපයෙහි; රජපැමිණි, රාජ්‍යපදප්‍රාප්තවූ; තදතෙදට, ස්තබ්ධවූ තේජස කරණකොටගෙණ; දිනකර, සූර්‍ය්‍යයාබඳුවූ; යසින්, කීර්තිය කරණකොටගෙණ; හිමකිරණබඳු, චන්ද්‍රයාසමානව; බැබලූ, විරාජමානවූ; ගරුතර, ගෞරවතරවූ; දෙවෙනිපෑතිස් නරණ, දෙවානං පියතිස්ස නම්වූ මහාරාජෝත්තමතෙම; දඹදිවින්වැඩි, ජම්බුද්වීපයෙන් (මේලංකාවට) වැඩමවා වදාළාවූ; අමඇදුරුසුත, අමාත්‍යාචාර්‍ය්‍යපුත්‍රවූ හෙවත් සර්වඥපුත්‍රවූ; මිහිඳුමාහිමිසඳහු, මහාමහින්ද්‍රස්ථවිර ස්වාමීන්වහන්සේ; දුටුවර, දර්ශනයකළ කාලයෙහි; පෙමසිතින්, ප්‍රේමචිත්තයෙන් හෙවත් ශ්‍රද්ධාචිත්තයෙන්; බණඅසා, ධර්මශ්‍රවණය කොට; සතුටුවැ, සන්තුෂ්ටව; තෙරුවනෙහි, (බුද්ධාදී) රත්නත්‍රය කෙරෙහි; බලතරසැදැහැතිව, අතිශයින් බලවත්වූ ශ්‍රද්ධාවන්තයෙක්ව.

222 බුදු ස සුන් හිරුඋදකරවිය මෙලකඹරදිවු අඳුරුදුරුක ර
පිළිවෙළින් ලක්දිවෙහි ඉන්පසුරජකරපු රජතුමෝ'පැහස ර
තාදබැතින් බුදුසසුන්රැකැ වැඩිදිවුණුකරමින් තමන් දිවිපුර
ස ම සිතින් නෙකකුසල් කරමින් ලදහසුරනර ඉසුරුනොවිතර

222 මෙලකඹර, මේ(ශ්‍රී) ලංකාවීප නැමැති ආකාශයෙහි; දිවුඅඳුරුදුරුකර, (මිථ්‍යා)දෘෂ්ටිනැමැති අන්ධකාරය දුරුකොට; බුදුසසුන්හිරු, සර්වඥශාසන නැමැති සූර්යයා; උදකරවිය, පහළකරවූයේය හෙවත් බුඩශාසනය බැබලවූයේය; ලක්දිවෙහි, (මේශ්‍රී) ලංකාවීපයෙහි; ඉන්පසු, එයින්පසුකාලයෙහිද; පිළිවෙළින්, පටිපාටියෙන් හෙවත් අනුක්‍රමයෙන්; රජකරපු, රාජ්‍යයකළාවූ; පැහසර, ප්‍රඥාසාරවූ; රජතුමෝ, රාජෝත්තමයෝද; තදබැතින්, තදවූභක්තියෙන්; තමන් දිවිපුර, තමන්ගේ ජීවිතයමෙන්; බුදුසසුන්, සර්වඥශාසනය; වැඩිදිවුණුකරමින්, වැඩිවර්ධනයකරමින්; රැකැ, රක්ෂාකොට; සමසිතින්, සත්සිඳුනාවූ චිත්තයෙන්; නෙකකුසල්කරමින්, නොයෙක් කුශලකර්මයන්කොට; නොවිතර, ප්‍රමාණයක් නැත්තාවූ; සුරනරඉසුරු ලදහ, දිව්‍යමනුෂ්‍ය සම්පත් ලැබූවාහුය.

---

223 මෙ ලක ට රජපැමිණී නිරිඳෙ පවා හැ ම
මෙලෙස ට අනත පින්කරමින් පමානො ම
තිලො ව ට උතුම් සැපලත්හුය නිමාව ම
ක දි ම ට පින් කරව් සුදනනි අසාමෙ ම

223 මෙලකට, මේලංකාවීපයෙහි; රජපැමිණී, රාජශ්‍රීයට පැමිණියාවූ; හැම නිරිඳුපවා, සියලුනරේන්ද්‍රයෝපවා; මෙලෙසට, මේ(උක්ත)ප්‍රකාරයෙන්; නොම පමා, ප්‍රමාදනොවී නොහොත් අනොපමෙය්‍යවූ; අනතපින්කරමින්, කෙළවරක් නැත්තාවූ පුණ්‍යකර්මයන් කරමින්; තිලොවටඋතුම්, ත්‍රෛලොක්‍යයට උතුම්වූ; සැප, සම්පත්තිය; නිමාවම, නිෂ්ඨාකොටම; ලත්හුය, ලැබූවාහුය; සුදනනි, සජ්ජනයෙනි; මෙමඅසා, මෙයශ්‍රවණයකොට; කදිමට, යහපත්ව; පින්කරව්, පුණ්‍යකර්මයන් කරව්.

---

224

ප ව ර රජසිහ නිරිඳුසිරිපද කමලසෙව්මැතිතුරෙන් සසොබන
නොහැර පැවතා දිසාපති පිළිවෙළින් නෙකසව්ඉසුරු ලබමි ණ
ස ත ර වනයුද මැදකෝරළේ දිසාපතිඳුට මුනුපුරාව න
තු ස ර ගරගිර තුසරකරහර සදිසියසසින් බැබලුනොපම ණ

224 පවර, උතුම්වූ; රජසිහනිරිඳු, රාජසිංහනම්වූ රජහුගේ; සිරිපද කමල සෙව්, ශ්‍රීපාදපද්මය සෙවනයකළාවූ; මැතිඅතුරෙන්, අමාත්‍ය (මන්ත්‍රී)යන් අතුරෙන්; සසොබන, සශොභනවූ; නෙකසව්ඉසුරු, අනෙකප්‍රකාරවූ සකලෛශ්වර්යයන්; විඳිමින, විඳිනයකරමින්; දිසාපතිපිළිවෙළින්, දිසාපතිවරුන්ගේ පටිපාටියෙන්; නොහැරපැවතආ, අත්නොහැර පැවතිආවාවූ; යුදසතරවන, යුඩයෙහි චතුරවූ හෙවත් යුඩකිරීමට දක්‍ෂවූ; මැදකෝරළේ, මැදකෝරළයෙහි; දිසාප

නිදුව, දිශාපතීන්ද්‍රයාහට; මුතුබුරාවත, නතෑවූ හෙවත් මුතුපුරුවූ; තුසර, හිමරස; හරගිර, කෛලාශපර්වතය; තුසරකර, චන්ද්‍රයාය; හර, මුක්තාහාරය නොහොත් මහේශ්වරයාය යනමේ ලොකසම්මත උත්තම මංගල්‍ය වස්තූන්හා; සදිසි, සාදෘශ්‍යවූ; නොපමණ, ප්‍රමාණාතික්‍රාන්තවූ; යසසිත්, කීර්තියෙන්; බැබලූ, විරාජමානවූ.

225

කලණ සිරිදැරු කොලඹවාසල දෙවෙනි මහමුදලිඳුගෙනන්දන
නොමිණ පරදෙස් වදන්සමගින් සතරතොරතුරු සිතසෙදැනගෙණ
පැමිණ මාතරපුරට කොත්සේප්‍රුවේ තුප්පහිකමලබාග ණ
වසන හෙන්ද්‍රික් සරම්මුකවෙටි මුදලිසඳුකල යදුමපිළිගෙ ණ

225 කලණසිරිදැරු, කල්‍යාණශ්‍රී ධාරණයකලාවූ හෙවත් සහපත්වූ ශොභාවක් ඇත්තාවූ; කොලඹවාසල, කොළොම්බු නගරයෙහි රාජමන්දිරයෙහි; දෙවෙනි මහමුදලිඳුගෙ නඳන, ද්විතීයමහාමුදලීන්ද්‍රයානන්ගේ පුත්‍රවූ; නොමිණ, බොහෝසෙයින්; පරදෙස්වදන් සමගින්, අන්‍යදෙශවාසීන්ගේ භාෂාවන්හා සමග; සතරතොරතුරු, ශාස්ත්‍රවිශෙෂ විභාගයන්; සිතසෙදැනගෙණ, සිත්වූ පරිද්දෙන් ජානනයකොට; මාතරපුරට පැමිණ, මහාතිර්ථාභිධාන පුරප්‍රවරයට ප්‍රාප්තව; කොත්සේප්‍රුවේ, අධිකරණශාලාවෙහි හෙවත් නඩුශාලාවෙහි; තුප්පහිකමලබාගණ, තුප්පහිනිලය ලබාගණ; වසන, වාසයකරන්නාවූ; හෙන්ද්‍රික්සරම් මුකවෙටි මුදලිසඳු, හෙන්ද්‍රික්සරම් මොහොට්ටි මුදලිමන්ත්‍රීශ්වරයන් විසින්; කලයදුම පිළිගෙණ, කරණලද ආරාධනා ප්‍රතිග්‍රහණයකොට.

226

සකවසින් එක්දහස් සත්සිය දෙසාළිසකට පැමිණිමෙ ව සේ
රිකහයෙන් යුත් බක්මසෙහි පුර පෑලවියලත් සිකුරු ද ව සේ
නෙකසිරින් සැදි ගොඩපිටියෙ මහවෙහෙර නිරතුරුවසනසුව සේ
සිකපෙමින් රැකි කිරම දම්නඳ යති මෙකව්කරු නිමවි සි ත සේ

226 සකවසින්, (ශ්‍රීමත්) ශකරාජවර්ෂයෙන්; එක්දහස් සත්සිය දෙසාළිසකට එකශහශ්‍ර සප්තශත ද්වාචත්වාරිංශත් වර්ෂයට හෙවත් එක්දහස් සත්සිය හතළිස් දෙවෙනි වර්ෂයට; පැමිණීමෙවසේ, ප්‍රාප්තවූ මේවර්ෂයෙහි; රිකහයෙන්යුත්, සූර්‍ය මාසයෙන් හවෙනිදින යෙදුනාවූ; බක්මසෙහි, චෛත්‍රමාසයෙහි හෙවත් බක්මසෙහි පුරපෑලවියලත් සිකුරුදවසේ, ශුක්ලපක්ෂයෙහි පෑලවියනම් තිථියලැබූ සිකුරාදා දවස්හි; නෙකසිරින්සැදි, නොයෙක් ඓශ්වර්‍යයෙන් සැරසුනාවූ; ගොඩපිටියේ, ගොඩපිටිනම් ග්‍රාමයෙහි; මහවෙහෙර, මහාවිහාරයෙහි; නිරතුරු, නිරන්තරයෙන්; සුවසේවසන, සැපවූපරිද්දෙන් වාසයකරන්නාවූ; සිකපෙමින්රැකි, ශික්ෂාවන් ප්‍රෙමයෙන් රක්ෂාකරන්නාවූ හෙවත් බුදුන්විසින් පණවනලද ශික්ෂාපදයන් ආදරයෙන් රකින්නාවූ; කිරම දම්නඳයති, කිරමනමැති ග්‍රාමයෙහිජාතවූ ධම්මානන්දනම්වූ තපස්විතෙම හෙවත් හිරිවාපත්තුවේ තංගල්ලද්ස්‍රෙක්කෝට අසිහි වලස්මුලුනානායකම් පිහිටි කිරමයයිප්‍රසිද්ධවූ ග්‍රාමයෙහි උපන්නාවූ ධම්මානන්දස්ථවිරයන් වහන්සේ; සිතසේ, සිත්වූපරිද්දෙන්; මෙකව්කරු, මේකාව්‍යයකොට; නිමවී, නිෂ්ඨාකෙළේය.

---

227 ස සි ය විජයබා නරනිඳුහුගෙ පුව ත
මෙසි ය බසින් කවිකළ නෙකවිරිතයු ත
දෙ සි ය සවිස්සක් කවිගෙයන් නිමිමේපො ත
ඈ සි ය යුතුය සුදනන් තුටුකරු නෙසි ත

227 සසිය විජයබා නරනිඳුහුගේ, ස්වකීයයන් සහිතවූ විජයබාහු නරෙන්ද්‍රයා ගේ හෙවත් නෑයන්හා විජයබාහුනම් (මහ) රජ්ජුරුවන්ගේ; පුවත, ප්‍රවෘත්තිය; මෙසියබසින්, මේස්වකීය (සිංහල) භාෂාවෙන්; කවිකළ, කාව්‍යයෙන් (රචනා) කරණලද්දාවූ; නෙකවිරිතයුත, නොයෙක් වෘත්තයෙන්යුක්තවූ; දෙසියසවිස්ස ක් කවියෙන්, ද්විශතෂට්විංශති කාව්‍යයකින් හෙවත් දෙසිය විසිහයක් කවියෙන්; නිම්මෙපොත, නිෂ්ඨාකරණලද මෙපුස්තකයතෙම; සුදනන්, සජ්ජනයන් විසි න්; නෙසිතතුටුකර, ත්‍රිවිධ චිත්තය සන්තුෂ්ටකොට හෙවත් ආදි මධ්‍ය පර්‍යන්ත ශානයසි කියනලද තුන්ස්ථානයෙහි පැවැත්තාවූ චිත්තය සතුටුකොට; ඈසියයු තුය, ශ්‍රවණය කටයුත්තාහුය.

228 මි ත් වෙත් වා සියලුසත් ඔවුනොවුන්හ ට
සි ත් වේත් වා පින්කරමින් හැසුරු ම ට
සෙත් වෙත් වා මෙලොවැසව්ලෙව් සතුන්හට
අ ත් වෙත් වා මතු මොක්පුර අපහැම ට

228 සියලුසත්, සකල සත්වයෝතුමූ; ඔවුනොවුන්හට, අන්‍යොන්‍යයන්හට; මිත්වෙත්වා, මිත්‍රයෝවෙත්වා; පින්කරමින් හැසුරුමට, පුණ්‍යකර්‍මයන්කොට හැ සිරීමපිණිස; සිත්වෙත්වා, චිත්තයෝද ඇතිවෙත්වා; මෙලොවැ, මේලොකයෙ හි; සව්ලෙව්සතුන්හට, සකලලොකවාසී සත්වයන්හට; සෙත්වෙත්වා, ශාන්ති ය(සිඩ)වේවා නොහොත් ලෙව්සතුන්හට, ලොකවාසී සත්වයන්හට; මෙලොවැ, මේලොකයෙහි ඇත්තාවූ; සව්සෙත්වෙත්වා, සියලුශාන්තීහු(සිඩ) වෙත්වා; මතු, අනාගතයෙහි; අපහැමට, අපසියලුදෙනාහට; මොක්පුර, නිර්‍වාණපුරය; අත් වෙත්වා, හස්තප්‍රාප්තවේවා හෙවත් ලැබේවා.

229 අ මි පි ය බ ස් දුන් තුන්ලොව හිමිසුග ත
ගුණනිය රු ස් පලමුව පළකළ අන ත
මෙම සි ය බ ස් මල්දම් නමැති කවිපො ත
ලොවැසියව් ස් පවතිවා තුටුකරු නෙස ත

229 අමපියබස්, අමෘතාකාරවූ ප්‍රියවචන; දුන්, දානයකලාවූ; හෙවත් අමෘ තමහා නිර්‍වාණයට ප්‍රියවන්නාවූ ධර්‍මය දෙශනාකර වදාළාවූ; තුන්ලොවහිමි, ත්‍රි විධලොක ස්වාමිවූ හෙවත් කාමලොකය රූපලොකය අරූපලොකය යන තුන් ලෝවාසීන්ට ස්වාමි (එකනායක)වූ සර්‍වඥයන් වහන්සේගේ; අනන්තගුණ නියරුස්,

අනන්තවූ ගුණගණඥනරාශිය හෙවත් (10) දශවෙනි කවියෙන් කියනලද නොයෙක් ගුණගණඥන සමූහය; පලමුව පළකළ, ප්‍රථමකොට ප්‍රකාශකළාවූ; සියබස් මල්දම් නමැති, ස්වකීයභාෂා පුෂ්පදාමයයියන නාමයක් ඇත්තාවූ හෙවත් ස්වකීය සිංහලභාෂා මල්දමයයි යනනම් ඇත්තාවූ; මෙමකව්පොත, මෙම්කාව්‍ය පුස්තකය; ලොවැ, ලොකයෙහි; නෙසත, නොයෙක්සත්වයන්; තුටුකර, සන්තුෂ්ටකොට; සියවස්පවතිවා, ශතශහශ්‍ර සංඛ්‍යාධික වර්ෂයන් මුලුල්ලෙහි ප්‍රවාර්තිත වේවා හෙවත් පවතිවා.

---

සන්න සහිත සියබස් මල්දම නිමි.

සි ධි ර ස්තු .

---

1 දෙ සා ලි ස් දහසක් යොදුන් උස යුගඳුරග මතුපිහිටි සුරපු ර
ලෙ සා දෙ ස් දෙසපතළ සිරිලක වසන සිරිපිරි ගාලූපුරව ර
පු වේ රි ස් ඇල්බට් සිල්වා සුදන සිරිවදීන පෙමාද ර
ඉ තා තො ස් වී කල සදුම්ගෙණ දුහුන දනවෙන කුළුරුමෙත්ක ර

2 මෙ ල ක් දිවැ බුදුසසුන් ඇතිකල දෙවෙනි පෑතිස් නිරිඳු බැව න
නැ ත ක් සැදැහැති මහානාරජ කෙරෙව් මාගම් පුරෙහි සසොබ න
මැ ණි ක් යටාල වෙහෙර දෙක අඳිපතිව නිවසන සුගත් නන්ද න
නි ම ක් නැතිපින් ලබණුවස් තංගල්ලෙ තෙරසඳ ජිනරතනය න

3 ස ක ව සි ත් එක්දහස් අටසිය තුදුස්වෙනි වස සපැමි තේ
රි වි ගො සි ත් පත්වූ තුලාරැස පුර තෙළෙස්වක් බුදදි තේ
කි වි ර සි ත් යුත් මෙසියබස් මල්දමට සන්නේ ලියමි තේ
නිමකො පි ත් අත්කෙලෙය පින්රැස් ගණිව් එපින් සුදන තේ

4 පි ත් රැ ගෙ ණා දුන් මෙම් සතොසින් සුද න
මි න් ගො සි නා සැම දෙව්සිරි විද පම ණි
ද මි දෙ ස නා මතු සන්නට බුදුවෙමි න
මෙ ත් දි ය නා දැක බණසා යව් නිව ණ

5 ප බ ද පිණෙ න් මෙම හැසිරෙන තුරුස ස ර
නො ම ද වෙ මි න් පැණසර දත් දෙම්නි ස ර
පෙ ම ද ද න න් හට කලණැදුරුව ප ව ර
ම ම ද උ තු න් පැමිණෙම්වා නිවන් පු ර

6 මේ සි ය බ ස් මල්දම සන්නේ බල න
නේ සු ව හ ස් දනගණ පැණ කරදිවු න
මා සැ ඩ රැ ස් දලදිනු සිම් මුලුදෙර ණි
ලෝවැ ඩ ව ස් පවතිවා නොනසිම් න

---

## 10 (දශ) වෙනි කවියෙහි, සඳහන් කරණලද තුදුස් බුද්ධඥානාදි ධර්මයෝනම්.

---

1. දුක්ඛෙඤාණං බුද්ධඤාණං දුක්ඛසමුදයෙ. පෙ. දුක්ඛනිරෝධෙ. පෙ. දුක්ඛනිරෝධ ගාමිනී පටිපදාය ඤාණං බුද්ධඤාණං. අත්ථපටිසම්භිදෙ. පෙ. ධම්මනිරුත්තිපටිභාන පටිසම්භිදෙ ඤාණං. පෙ. ඉන්ද්‍රිය පරෝපරියත්තෙ. ආසයානුසයෙ. යමක පාටිහීරෙ. මහාකරුණා සමාපත්තියා. සබ්බඤ්ඤුතං ඤාණං. අනාවරණං ඤාණං බුද්ධඤාණං.

මෙහිසංක්ෂෙප අදහසනම්.

1 දුඃඛසත්‍යයෙහි පැවති බුද්ධඥානයද. දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යයෙහි පැවති බුද්ධඥානයද. දුඃඛනිරෝධාර්‍ය්‍ය සත්‍යයෙහි පැවති බුද්ධඥානයද. දුඃඛ නිරෝධගාමිනි ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යයෙහි පැවති බුද්ධඥානයද. අර්ථප්‍රතිසම්භිදායෙහි පැවති බුද්ධඥානයද. ධර්මප්‍රතිසම්භිදායෙහි පැවති බුද්ධඥානයද. නිරුක්ති ප්‍රතිසම්භිදායෙහි පැවති බුද්ධඥානයද. ප්‍රතිභාන ප්‍රතිසම්භිදායෙහිපැවති බුද්ධඥානයද. ඉන්ද්‍රිය පරෝපරියත්තය දැනීමෙහි පැවති බුද්ධඥානයද. ආසයානුසය දැනීමෙහි පැවති බුද්ධඥානයද. යමකප්‍රාතිහාර්‍ය්‍යයෙහි පැවති බුද්ධඥානයද. මහාකරුණා සමාපත්තියෙහි පැවති බුද්ධඥානයද. සර්වඥතාඥානයද. ආවරණයක් නැත්තාවූ බුද්ධඥානයද, යනමොහු තුදුස් බුද්ධඥානයෝනම් වෙත්.

පටිසම්භිදා මාර්‍ගාදියෙහි වැඩිවිස්තර.

### ෂඩ්අභිඥවෝනම්.

2 ඉද්ධිවිධා දිබ්බසොතො පරචිත්ත විජානනා,
පුබ්බෙනිවාසානුස්සති දිබ්බචක්ඛුති ඡළධා.

2 ඍද්ධිවිධඥානය, දිව්‍යශ්‍රොත්‍රඥානය, අනුන්ගේ සිත්දන්නා ඥානය, පෙරවිසූ කඳපිළිවෙළ දන්නාඥානය, යන පස හිඥවන්හා ආශ්‍රවක්ෂයකරඥානයද යන මොහු ෂඩ් අභිඥවෝ නම්වෙත්.

කායබල දසයහා ඥානබල දසයනම්.

### එහි කායබල දසයනම්.

3 කාලාවකඤ්ච ගඞ්ගෙය්‍යං පණ්ඩරං තම්බපිඞ්ගලං,
ගන්ධමංගල හෙමඤ්ච උපොසථ ඡද්දන්තිමෙදස.

3 මෙහි දක්වනලද හස්තිකුලයන්ගේ අනුසාරයෙන් කායබල දසය දතයුත්තේය, ඒකෙසේදයත්; මධ්‍යම පුරුෂයන් දසදෙනෙකුගේ කායබලය කාලාවකකුලයෙහි එක ඇතෙකුට ඇත්තේය, කාලාවක කුලයෙහි ඇතුන් දසදෙනෙකුගේ බලය ගඞ්ගෙය්‍යනම් කුලයෙහි එක ඇතෙකුට ඇත්තේය, ගඞ්ගෙය්‍යනම් කුලයෙහි ඇතුන් දසදෙනෙකුගේ බලය පණ්ඩරනම් කුලයෙහි එකඇතෙකුටද, යනාදිවශයෙන් ඡද්දන්ත කුලයදක්වා අභිනවගොස් ඡද්දන්ත කුලයෙහි ඇතුන් දසදෙනෙකුගේ බලය එක සර්වඥයන් වහන්සේ කෙනෙකුගේ කායබලය වන්නේය.

### ඤාණබලදසයනම්.

4 ඨානාඨානං විපාකෝච මග්ගංසබ්බත්ථ ගාමිනං,
නානාධාතු යොලොකෙ මධිමුත්තිච පාණිනං;
ජානාති ඉන්ද්‍රියානංසො පරෝපරිය තංමුනි,
ඣානාදීසං කිලෙසාදි ඤාණංවිජ්ජාතත යංතථා.

සංක්ෂෙප අදහස.

4 විය හැකි නොවිය හැකිදේ දන්නා ඨානාඨානඥානයද, කර්මවිපාක දන්නා විපාකඥානයද, සියලු ගතිවල සත්වයන්ගේ ගමන් දන්නා සබ්බත්ථගාමිනී ඥානයද, සත්වයන්ගේ ධාතුවිශෙෂ දන්නා අනෙකධාතුඥානයද, සත්වයන්ගේ සංස ඥාන ඇදුම්දන්නා අධිමුක්තිඥානයද, ඉන්ද්‍රිය පිළිවෙළ දන්නා ඉන්ද්‍රිය පරොපරියත්තඥානයද, ධ්‍යානාදීන්ගේ කිලුටුවීමහා පිරිසිදුවීම දන්නාඥානයද, යනමේ ඥානසතහා සමග පූර්වේනිවාසානුස්මෘති ඥානයආදි ත්‍රිවිද්‍යාවෝද යනමොහු සර්වඥයන් වහන්සේගේ ඥානබල දසයනම්වේ. වැඩිවිස්තර අභිධර්මයෙහි ඥාණවිභංගාදියෙහි ප්‍රකාශයි.

### අෂ්ටවිද්‍යාවෝනම්.

5 විපස්සනා ඤාණ මනොම යිද්ධි,
ඉද්ධිප්පභෙදො පිච දිබ්බසොතං;
පරස්ස චෙතො පරියාය ඤාණං,
පුබ්බෙ නිවාසානු ගතඤ්ච ඤාණං:
දිබ්බච චක්ඛා සවසංඛ යොච.
එතානි ඤාණානි ඉධට්ඨ විජ්ජා,

5 විදර්ශනාඥානය, මනොමයඍද්ධිඥානය, ඍද්ධිප්‍රභෙද ඥානය, දිව්‍යශ්‍රොත්‍රඥානය, තමන්ගේ සිතින් අනුන්ගේ සිත පිරිසිද දන්නාඥානය, පූර්වේ නිවාසානුස්මෘතිඥානය, දිව්‍යචක්ෂුර්ඥානය, ආශ්‍රවක්ෂයකරඥානය, යනමොහු අෂ්ටවිද්‍යාවෝයි.
මෙහිද වැඩිවිස්තර විශුද්ධිමාර්ගාදියෙහි.

### අටළොස් ආවේනික ධර්මයොනම්.

6 අතීතංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, අනාගතංසෙ අප්පටිහතංඤාණං පච්චුප්පන්නංසෙ අප්පටිහතං ඤාණං, ඉමෙහිතීහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො සබ්බං කායකම්මංඤාණ පුබ්බංගමංඤාණානු පරිවත්තං සබ්බංවචීකම්මං පෙ. සබ්බං මනොකම්මං ඤාණපුබ්බංගමං ඤාණානු පරිවත්තං ඉමෙහිතීහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො නත්ථිඡන්දස්සහානි නත්ථිධම්මදෙසනායහානි නත්ථිවිරියස්සහානි නත්ථි සමාධිස්සහානි නත්ථි පඤ්ඤාය හානි නත්ථි විමුත්තියාහානි ඉමෙහි වාදසහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො නත්ථිදවා නත්ථිරවා නත්ථිඅප්ඵුතං නත්ථිවේගායිතත්තං නත්ථිඅව්‍යාවටමනො නත්ථිඅප්පටිසංඛා නුපෙක්ඛාති, ඉමෙ අට්ඨාරස ආවේණිකධම්මානාම.

සංක්ෂෙප අදහස

6 අතීත අනාගත වර්තමාන යන තුන්කල්හි නොපැකිල පවත්නා ඥානය ඇතිබවද, මේ ත්‍රිවිධඥානයෙන් යුක්තවූ භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේගේ කාය වාක් මනො කර්මයද, මේසඳින් යුක්තවූ භාග්‍යවතුන් වහන්සේගේ ඡන්දයාගේද ධර්මදෙශනාවගේද වීර්‍ය්‍යයාගේද, සමාධියගේද ප්‍රඥාවගේද විමුක්තියගේද හානියක් නැතිබවද, මේ දොළොස් ධර්මයෙන් යුක්තවූ භාග්‍යවතුන් වහන්සේගේ ක්‍රීඩාඅභිප්‍රායක් නැතිබවද, බලාත්කාර ක්‍රියා නැතිබවද, නුවණින් තුරුවූ දෙයක් නැතිබවද, ඉක්මන්ක්‍රියාවක් නැතිබවද, නිෂ්ප්‍රයෝජනවූ සිත්පැවතුම් නැතිබවද, අප්පටිසංඛාන උපෙක්ෂාතාවූ අඥාන මධ්‍යස්ථතාවක් නැතිබවද යනමොහු අටළොස් ආවේණික බුද්ධධර්මයෝනම් වෙති. මෙහිද වැඩිවිස්තර පටිසම්භිදා මාර්ගයෙහි.

## පසළොස් චරණ ධර්මයෝනම්.

7 සීලංවරං ඉන්ද්‍රි සංවරෝච,
මත්තඤ්ඤුතා ජාගරියානු යොගො;
සද්ධා හිරොත්තප්ප බහුස්සුතත්තං,
පරක්කමොචෙව සතීමතීච.

චත්තාරි ඣානානිච තානිමානි,
තිපඤ්චධම්මා චරණාති ඤෙය්‍යා;
එතානි විජ්ජාහිච සම්පයොගා,
සම්පන්න විජ්ජාචරණො මුනින්දො.

සංක්ෂෙප අදහස

7 උත්තම ශීලය, ඉන්ද්‍රිය සංවරය, භොජනයෙහි පමණ දැනීමය, නිද්‍රාරෑ නිදිමෙහි යෙදීමය, ශ්‍රද්ධාවය, පවට පිළිකුල්බවය, පවට බියඇතිබවය, බහුශ්‍රුතබවය, පරාක්‍රමය, සිහිය, ප්‍රඥාවය, ප්‍රථමධ්‍යානාදි ධ්‍යානසතරය යනමොහු පසළොස් චරණධර්මයෝයි. මෙහිද වැඩිවිස්තර විශුද්ධිමාර්ගයෙහි.

## චතුවෛශාරද්‍ය ධර්මයෝනම්.

8 සම්මාසම්බුද්ධස්සතෙ පටිජානතො ඉමෙධම්මා අනභිසම්බුද්ධාති තත්‍රවතමං සමණොවා බ්‍රාහ්මණොවා දෙවොවා මාරොවා බ්‍රහ්මාවා කොචිවා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං භික්ඛවෙන සමනුපස්සාමි එතංපහං භික්ඛවෙනිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි. ඛීණාසවස්සතෙ පටිජානතො ඉමෙආසවා අපරික්ඛීණාති තත්‍රවතමං සමණොවා. පෙ. විහරාමි. යෙඛොපනතෙ අන්තරායිකා ධම්මාවුත්තා නාලං පටිසෙවතො අන්තරායායාති තත්‍රවතමං සමණොවා. පෙ. විහරාමි. යස්සඛොපනතෙ අත්ථාය ධම්මොදෙසිතො සොනනීයාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයායාති තත්‍රවතමං සමණොවාබ්‍රාහ්මණොවා

දෙවොවා මාරොවා කොචිවා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං භික්ඛවෙ න සමනුපස්සාමි එතං පහං භික්ඛවෙ නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි.

මෙහිද අදහස.

8 සියලු දතයුතු ධර්මයන් අවබෝධ කෙළෙම්යි ප්‍රතිඥාදෙන සර්වඥයන් වහන්සේට මේධර්මයෝ තොපවිසින් අවබෝධ නොකරණ ලද්දෝයයි ඒ අවබොධ නොකරණලද ධර්මයන් විෂයෙහි ඒකාන්තයෙන් ලොකයෙහි ශ්‍රමණයෙක්හෝ බ්‍රාහ්මණයෙක්හෝ දෙවියෙක්හෝ මාරයෙක්හෝ බ්‍රහ්මයෙක්හෝ අන් කිසිවෙක්හෝ මට කාරණාසහිතව චොදනාකරන්නේද මහණෙනි මම ඒකාරණය නොදකිමි; මහණෙනි, මම ඒකාරණයද නොදක්මියි නිර්භයව පැමිණියෙමි විසාරදබවට පැමිණියෙමි වාසයකෙරෙමි.

තොපවිසින් ආශ්‍රවයෝ ක්‍ෂයකරණලද්දාහුයයි ප්‍රතිඥාදෙන්නාවූ-මට තොපවිසින් මේ ආශ්‍රවයෝ ක්‍ෂය නොකරණලද්දාහුයයි ඒ ක්‍ෂයනොකරණලද ආශ්‍රවයන් විෂයෙහි ඒකාන්තයෙන් මට ලොකයෙහි ශ්‍රමණයෙක්හෝ බ්‍රාහ්මණයෙක්හෝ දෙවියෙක්හෝ මාරයෙක්හෝ බ්‍රහ්මයෙක්හෝ අන්කිසිවෙක්හෝ කාරණාසහිතව චොදනාකරන්නේද යනමේකාරණය මහණෙනි මම නොදකිමි; මහණෙනි, මේකාරණය නොදක්නාවූ මම නිර්භයව පැමිණියෙමි විසාරදව වාසයකෙරෙමි. තොපවිසින් මාර්ගඵලාදිය ලැබීමට බාධකාවූයම් අන්තරායකර ධර්මකෙණෙක් අන්තරායකර ධර්මයෝයයි කියනලද්දාහුද ඔවුන් සෙවුනාහට මාර්ගඵලාධිගමයට අන්තරාවීම පිණිස නොපොහොසත් වන්නාහුයයි ඒඅන්තරායික ධර්මයන් විෂයෙහි ඒකාන්තයෙන් මට ලොකයෙහි ශ්‍රමණයෙක්හෝ බ්‍රාහ්මණාදී අන් කිසිවෙක්හෝ හෙතුසහිත කාරණයෙන් චොදනා කරන්නේද; මහණෙනි, මම ඒකාරණය නොදකිමි, මහණෙනි, ඒකාරණය නොදක්නාවූමම නිර්භයව පැමිණියෙමි විසාරදභාවයට පැමිණියෙමි වාසය කෙරෙමි.

තොපවිසින් යම් මාර්ගඵලාදියක් පිණිස ධර්මය දෙශනාකරණ ලද්දේද ඒධර්මය ඒ දෙශනාකරණලද පරිද්දෙන් කරණලද්දහුගේ යහපත්ව දුඃඛය ක්‍ෂයකිරීම පිණිස නොපැමිණෙන්නේයයි ඒධර්මයන් විෂයෙහි ඒකාන්තයෙන් මට ලොකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් අතුරෙන් කිසිවෙක් කාරණාසහිතව චොදනාකරන්නේද යනමේ කාරණයද, මහණෙනි, මම නොදකිමි; මහණෙනි, මේකාරණය නොදක්නාවූද මම නිර්භයව පැමිණියෙමි විසාරද භාවයට පැමිණියෙමි වාසය කෙරෙමි. යනමොහු චතුවෛශාරද්‍ය ධර්මයෝයි.- වැඩිවිස්තර මැදුම්සඟියෙහි සිහනාද සූත්‍රාදියෙහි.

## සතර සෘද්ධිපාදයෝ නම්.

9 ඡන්දිද්ධිපාදො චිත්තිද්ධිපාදො විරියිද්ධිපාදො වීමංසිද්ධිපාදොච.

අදහස.

9 ඡන්දර්ද්ධිපාදය, චිත්තර්ද්ධිපාදය, වීර්‍ය්‍යර්ද්ධිපාදය, විමංසාර්ද්ධිපාදය යනමොහුයි.

## සතර සතිපට්ඨාන ධර්මයෝනම්.

10 කායානුපස්සනා සතිපට්ඨානං, වෙදනානුපස්සනා සතිපට්ඨානං,

චිත්තානුපස්සනා සතිපට්ඨානං, ධම්මානුපස්සනා සතිපට්ඨානංච.

10 කායානුපස්සනා සතිපට්ඨානය, වේදනානුපස්සනා සතිපට්ඨානය, චිත්තානුපස්සනා සතිපට්ඨානය, ධම්මානුපස්සනා සතිපට්ඨානයද යනමේ සතරසතිපට්ඨානධර්මයෝයි.

## සප්ත බෝධ්‍යංග ධර්මයෝනම්.

11 සතිසම්බොජ්ඣංගො, ධම්මවිචය සම්බොජ්ඣංගො, විරියසම්බොජ්ඣංගො, පීතිසම්බොජ්ඣංගො, පස්සද්ධිසම්බොජ්ඣංගො, සමාධි සම්බොජ්ඣංගො, උපෙක්ඛා සම්බොජ්ඣංගොච.

11 ස්මෘති සම්බෝධ්‍යාංගය, ධර්මවිචය සම්බෝධ්‍යාංගය, වීර්‍ය්‍ය සම්බෝධ්‍යාංගය, ප්‍රීතිසම්බෝධ්‍යාංගය, ප්‍රශ්‍රබ්ධිසම්බෝධ්‍යාංගය, සමාධිසම්බෝධ්‍යාංගය, උපේක්ෂා සම්බෝධ්‍යාංගයද යනමොහුසප්ත බෝධ්‍යාංග ධර්මයෝනම්වෙත්.

## සිව්පිළි සිඹියාවෝනම්.

12 අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුත්තිපටිසම්භිදා, පටිභාන පටිසම්භිදා.

12 අර්ථප්‍රතිසම්භිදාවය, ධර්මප්‍රතිසම්භිදාවය, නිරුක්තිප්‍රතිසම්භිදාවය, ප්‍රතිභානප්‍රතිසම්භිදාවය යනුයි.

1 යංකිඤ්චි පච්චයුප්පන්නං විපාකාච ක්‍රියාතථා,
නිබ්බාණංභාසිතත්ථොති පඤ්චෙතෙ අත්ථසඤ්ඤිතා.

2 ඵලනිබ්බත්තා කොහෙතු අරියමග්ගොච භාසිතං,
කුසලාකුසලංචෙති පඤ්චෙතෙ ධම්මසඤ්ඤිතා.

3 තස්මිංඅත්ථෙච ධම්මෙච යාසභාව නිරුත්තිතු,
නිරුත්තිතිම නිද්දිට්ඨා නිරුත්ති කුසලෙහිසා.

4 ඤාණමාරම්ම ණංකත්වා තිවිධංපච්ච වෙක්ඛතො,
තිසුඤාණෙසු යංඤාණං පටිභානන්ති තංමතං.

1 හෙතුඵලයදන්නා නුවණය, විපාකසිත් දන්නා නුවණය, ක්‍රියාසිත් දන්නා නුවණය, නිර්වාණයදන්නා නුවණය, පාළිඅර්ථදන්නා නුවණය, යනමේ පචාර්ථය දන්නා නුවණ, අර්ථප්‍රතිසම්භිද නම්වේ

2 ඵලයඋපදනා හෙතුදන්නා නුවණය, සොවාන්ආදි සතරමාර්ගයන් දන්නා නුවණය, පාළියදන්නා නුවණය, කුසල්දන්නා නුවණය, අකුසල් දන්නා නුවණය, යනමේ පස දන්නා නුවණ ධර්මප්‍රතිසම්භිද නම්වේ.

3 ඒ අර්ථධර්මදෙක්හි යම් ස්වභාවනිරුක්තියෙක් ඇද්ද ඒස්වභාව පාළිවචනයෙක් ඇද්ද ඒප්පරිද්දෙන් දැනගන්නානුවණ නිරුක්ති ප්‍රතිසම්භිද නම්වේ.

4 ඒ ත්‍රිවිධඥානය අරමුණුකොට ප්‍රත්‍යවේක්ෂා කරන්නාහට දැනගන්නා නුවණ ප්‍රතිභාන ප්‍රතිසම්භිදානම්වේ. සතිපට්ඨාන ධර්මයන්ගේහා සිව්පිළිසිඹියාවන්ගේද වැඩිවිස්තර_විභඞ්ගප්‍රකරණාදියෙහි.